# චිත්‍ර කලාව

## ගුරු මාර්ගෝපදේශය

## 11 ශ්‍රේණිය

**(2016 සිට ක්‍රියාත්මක වේ.)**

**සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**ජාතික අධ්‍යාපන ආයතනය**
**මහරගම**
**ශ්‍රී ලංකාව**
www.nie.lk
info@ni.lk

චිත්‍ර කලාව

11 ශ්‍රේණිය

ගුරු මාර්ගෝපදේශය

ප්‍රථම මුද්‍රණය 2015

© ජාතික අධ්‍යාපන ආයතනය

සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව

වෙබ් අඩවිය : www.nie.lk
විද්‍යුත් තැපෑල : info@nie.lk

මුද්‍රණය :

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින්
සොෆ්ට්වේව් ප්‍රින්ටින් ඇන්ඩ් පැකේජින් (පුද්) සමාගමෙහි මුද්‍රණාලයේ
මුද්‍රණය කරවා ප්‍රකාශයට පත් කරන ලදී

# අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවුඩය

මෙම ගුරු මාර්ගෝපදේශය මගින් ගුරුභවතාට තම පාසල තුළ විෂය නිර්දේශය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වන මූලික දැ සැපයේ. විෂය නිර්දේශය ක්‍රියාත්මක කිරීමේ දී තම කාර්යයන්, දරුවාගේ බුද්ධි වර්ධනය කෙරෙහි මෙන් ම, චර්යාත්මක දියුණුව කෙරෙහි ද දිගු කාලීන බලපෑමක් ඇති කරවන බව ගුරුවරුන් නිරන්තරයෙන් ම සිහි තබා ගත යුතු වේ.

ප්‍රජානන සාධන මානය සම්බන්ධයෙන්, අනෙක් කරුණු අතරට, ඉගෙනීම ඉහළ මට්ටමකට ගෙන යාමට පහත සඳහන් කරුණු කෙරෙහි ද ගුරුවරුන් සැලකිලිමත් විය යුතු වේ.

- ශිෂ්‍යයා තම ජීවිත අරමුණු පිළිබඳ අවදියෙන් සිටීම සහ කළ යුතු කාර්යය, හැකියාවන්ට සහ අරමුණු සාධනයට අදාළ වීම.

- ශිෂ්‍යයා ක්‍රියාකාරීව ඉගෙනුම් කාර්යාවලියෙහි නිරත වීම. (ඉගෙනීම ශිෂ්‍ය කේන්ද්‍රීය ක්‍රියාවලියක් වීම.) කන්ෆියුසියස්ගේ කියමන සිහියට නගා ගන්න; ඇසෙන දේ අමතක වේ. දකින දේ අමතක නොවේ. කළ දේ ඉගෙන ගැනේ.

- ඉගෙනුම් වාතාවරණය, ධනාත්මක ව, අභියෝගාත්මක වී, ඉගෙනුම් මෙවලම්, උපකරණ, විද්‍යාගාර, විවිධ සම්පත් ආකාරවලට පිවිසුම පහසු වීම.

- ශිෂ්‍යයාට ක්ෂණික ධනාත්මක සහ නිර්මාණාත්මක ප්‍රතිචාරයන් ලබා දීම මගින්, ඉගෙනුම ක්‍රමානුකූල ව ඉහළ මට්ටමක අවශෝෂණයකින්, ශිෂ්‍යයාගේ දැනුම, කුසලතා සහ අරමුණු සමග අනුකලනයකට අවකාශ ඇති කිරීම.

අධ්‍යාපනයේ දී, රජයේ අපේක්ෂාව වනුයේ සියලු පාසල්වල සියලු දරුවන්ට, මූලික විෂය කරුණු අවශ්‍ය මට්ටමකට ග්‍රහණය කිරීමෙන්, විභාගයට මුහුණ දීමෙන් පසුව සාර්ථකත්වයේ සතුට විඳ ගැනීමේ හැකියාව ලබා දීම ය.

දරුවාගේ චර්යාත්මක වර්ධනයට අදාළ මානය සලකා බැලූ විට අධ්‍යාපනයේ පරමාර්ථය වනුයේ ප්‍රජානන හැකියාවන් වැඩ ලෝකය සමග සම්බන්ධ කිරීමයි. එබැවින් ගුරුවරුන් තමතින් විෂය නිර්දේශ ලබා දීමේ දී වර්ධනය කළ යුතු වන්නේ, පාසලින් බැහැර ලෝකය සමග ගනුදෙනු කිරීමට ශිෂ්‍යයාට අවශ්‍ය වන, දක්ෂතා සහ කුසලතා ය. එයින් සමහර වැදගත් ගණයේ හැකියාවන් පහත සඳහන් ක්ෂේත්‍රයන් හි වේ.

- කාර්යශීලී වැඩ ආචාර ධර්ම - සාධනීය ආකල්ප සහ නව නිර්මාණයට, සංරක්ෂණයට ඇති ළැදියාව

- අන්තර් පුද්ගල සම්බන්ධතා - කණ්ඩායම් වැඩ, විනය සහ කාර්යක්ෂම සන්නිවේදනය

- සදාචාරාත්මක හර - විවිධත්වයට ගරු කිරීම වැනි පුරවැසි වටිනාකම්වලින් හෙබි, සෘජු පුද්ගලයෙක්

අවසාන වශයෙන් මම සියලු විදුහල්පතිවරුන්ටත්, ගුරු භවතුන්ටත්, පාසල්වල අනෙක් කාර්ය මණ්ඩල සභිකයන්ටත්, ඉතා ඕනෑකමින් ඉගෙනුම් ඉගැන්වීම ක්‍රියාවලිය දෙස කළමනාකරණයේ ඒ 4 වශයෙන් හඳුන්වන පහත සඳහන් කරුණු මගින් තම සැලකිල්ල යොමු කරන මෙන් ඉල්ලීමට

කැමැත්තෙමි. එනම් ආකල්පය, විශ්ලේෂණය, ක්‍රියාව සහ වගවීමයි. ඔබ නියුක්ත වන කාර්යයෙහි (පාඩම ආදී වශයෙන්) අවසානයත්, මාර්ගයන් පිළිබඳ අදාළ සාධනීය ආකල්පයන්ගෙන් ආරම්භ කරන්න. එය සංවිධානය කර ගැනීම උදෙසා (වරු ඒකක ආදී වශයෙන්) තොරතුරු සොයා බලා ලබා ගෙන ඒවා විශ්ලේෂණය කරන්න. විකල්ප සලකා බලා ක්ෂණික ක්‍රියා (ප්‍රකාශ කිරීම, බාරදීම) කාර්යක්ෂමව ගන්න. ඔබ ප්‍රතිඵල අධීක්ෂණය, ඇගැයීම සහ මිනුම සම්බන්ධයෙන් (අයිතිය) වගකීම බාර ගන්න.

මේ හා සම්බන්ධ සියලු ගුරු භවතුන්ට, ඉගැන්වීමේ දීත් ඉගෙනීමේ දීත් සතුට අත්වේවා යයි ප්‍රාර්ථනා කිරීමට මම මෙය අවස්ථාව කර ගතිමි. අවශ්‍ය වුවහොත් මට ද පිටපතක් සහිතව ජාතික අධ්‍යාපන ආයතනයේ අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට මෙම ගුරු මාර්ගෝපදේශය පිළිබඳ ඔබේ අත්දැකීම් සහ නිරීක්ෂණ ලියා දන්වා එවීමට පසුබට නොවන්න.

**මහාචාර්ය ගුණපාල නානායක්කාර**
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම

## නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් හිමිගේ පණිවිඩය

ඉගෙනුම, පුළුල් ක්ෂේත්‍රයක විහිද යන්නකි. එය ජීවිත අතිමහත් බවට ද, ඉතා ම සරල බවට ද පත්කරයි. මනුෂ්‍යයා ඉගෙනුම් කුසලතාවෙන් උත්කෘෂ්ට ය. මානව සමාජ සංවර්ධනය කේන්ද්‍ර කොට ගත් රටක්, සමාජයක් බුද්ධිය විසින් හඳුනාගත් අසම්මතයන් බැහැර කිරීමට ද සුභාවිතයන් තුළින් නව ලොවක් නිර්මාණය කර ගැනීමට ද මෙවලම කරගනු ලබන්නේ ඉගෙනුමයි.

ඉගෙනුම සඳහා වටිනා යමක් ද, ඉගෙනුම් ක්‍රමවේද හා පහසුකම් ද අධ්‍යාපනය වටා නිර්මා-ණය විය යුතු ය. විෂය මාලාව, විෂය නිර්දේශ, මාර්ගෝපදේශ, සුසාධ්‍යකරුවන් ඉගෙනුම් ක්ෂේත්‍රයට එක්වනුයේ මේ ආකාරයෙනි.

නූතන ශ්‍රී ලංකාව ගෝලීය ප්‍රවණතාවන් මෙන් ම පුරාතන උරුමයන් ද සම්මිශ්‍රණය කර ගනිමින්, ස්වීය අධ්‍යාපන රටාවක් හිමි කරගෙන ඇත. කාලීන අවශ්‍යතා මත ප්‍රතිසංස්කරණ තුළින් වසර අටකට වරක් යාවත්කාලීන වන විෂය මාලාවේ ඉගෙනුම් සම්පතක් ලෙස මෙම ගුරු මාර්ගෝපදේශ නිර්මාණය වේ.

විෂයයෙහි අරමුණුවල සංගතතාව ජාතික මට්ටමින් පවත්වාගත යුතු ය. එහෙත් ගුරු මාර්ගෝපදේශයන්හි ඉගෙනුම් ක්‍රමවේදයන්, අකුරක්වත් වෙනස් නොකොට පිළිපැදිය යුත්තක් නම් නොවේ. විෂය නිර්දේශයෙහි නිපුණතා, නිපුණතා මට්ටම් සාධනය වීම සඳහා විෂය අන්තර්ගතය තුළින් ඉගෙනුම් පල සම්ප්‍රාප්තිය පිණිස ඉගෙනුම් ක්‍රමවේද නිර්මාණශීලී ව වෙනස්කර ගැනීමට සුසාධ්‍යකරුවන්ට පැහැදිලිව ම ඉඩක් ඇති බව සඳහන් කරමි. ශිෂ්‍ය සාධන ප්‍රතිශතය ඉහළ මට්ටමකට ගැනීම සඳහා උදව් වන, පහසුකම් සලසන ගුරු භූමිකාවට කිසියම් ප්‍රවේශයක් සඳහා නිර්මාණය වන ගුරු මාර්ගෝපදේශ ශික්ෂකයාහට ද, දෙගුරුනට ද භාවිත කළ හැකිය. අදාළ පෙළ පොතට සහකරුවකු වන ගුරු මාර්ගෝපදේශය තවත් පෙළ පොතක් නොවන බව දැන ගුරුභවතුන් ගුරු මාර්ගෝපදේශ හා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ සම්පාදිත අදාළ පෙළ පොත යන සම්පත් ද්‍රව්‍ය දෙක ම භාවිත කළ යුතු ය.

ඒ ඒ විෂයයන්හි සාධනය පිළිබඳ ඇගැයීම් සිදුකරන ජාතික මට්ටමේ පරීක්ෂකවරයෙකු වුව ද අපේක්ෂා කරන සාධන මට්ටම් විෂය ඉගැන්වීමට මග පෙන්වන සුසාධ්‍යකරුවන් විසින් පාඩම අවසානයෙහි පන්ති කාමරයේ දී දරුවන් සමග ප්‍රත්‍යක්ෂකරණයට පත්විය යුතු ය. එම ඒකාත්මික වීම සඳහා වූ ප්‍රබෝධාත්මක සංස්කෘතියක් ගොඩනගා ගැනීමට ගුරු මාර්ගෝපදේශය පහුරක්, යාත්‍රාවක් කරගනු ඇතැයි ආයාචනා පූර්වක ව අපේක්ෂා කරමි.

**පීඨාධිපති, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්**
**භාෂා මානව ශාස්ත්‍ර හා සමාජවිද්‍යා පීඨය**
**ජාතික අධ්‍යාපන ආයතනය.**

# පෙරවදන

සමාජ ප්‍රගමනයෙහි ලා මහඟු මෙහෙවරක නියැලෙන්නන් අතර ගුරුවරු ප්‍රමුඛ වෙති. ස්වකීය ජීවිතය සකස් කර ගැනීම සඳහා දරුවන්ට මග පෙන්වන්නෝ ද ගුරුවරු ය.

2015 වර්ෂයේ සිට ක්‍රියාත්මක කෙරෙන නව විෂය නිර්දේශයට අදාළ ඉගැන්වීම් කටයුතු සාර්ථක කර ගැනීම සඳහා ගුරුවරුන්ට පහසුකම් සැපයීමේ අරමුණින් මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහ මුද්‍රණය කර බෙද හැරීමට අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව කටයුතු කරයි. ජාතික අධ්‍යාපන ආයතනය මගින් සම්පාදිත මේ ගුරු මාර්ගෝපදේශය දරුවන්ට මනා ඉගෙනුම් පරිසරයක් නිර්මාණය කර දීමට අවශ්‍ය මග පෙන්වීම් ගුරුවරුන් වන ඔබ වෙත ලබා දෙනු ඇතැයි යන්න මාගේ විශ්වාසය යි.

මේ ප්‍රයත්නය යථාර්ථයක් වන්නේ මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය පරිශීලනයෙන් ලබන පරිචය ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා යොද ගැනීමට දරන උත්සාහය මත යි. ඒ සඳ කාර්යය සඳහා කැප වී සිටින ඔබට මාගේ ගෞරවය පිරිනමමි.

**අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්**
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව,
ඉසුරුපාය,
බත්තරමුල්ල.
2015.09.22

# විෂය හැඳින්වීම

අපේ මාතෘභූමියටත්, සංස්කෘතියටත්, සොබාදහම හා සමස්ත ජීව, අජීව විශ්ව ධාතුවටත් හිතකාමී පුරවැසියකු නිර්මාණය කිරීමේ පුළුල් ජාතික පරමාර්ථයෙන් පාසල් පද්ධතිය තුළ දරුවන්ට ඉගෙනීමට ලැබෙන සුවිශේෂතම විෂය සෞන්දර්ය විෂය යි. එය ජාතික අධ්‍යාපන ආයතනයේ සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව ලෙස අප විසින් හඳුනා ගන්නා ලද පහත දැක්වෙන සෞන්දර්ය විෂයයේ ජාතික දැක්ම කියැවීමෙන් ඔබට මැනවින් අවබෝධ වනු ඇත.

''සෞන්දර්යයෙන් සංස්කෘතිකමය ලැදියා පුබුදුවා, එමගින් නිර්මාණශීලී බව, සංවේදීතාව, දරා ගැනීම, ශ්‍රී ලාංකේය අනන්‍යතාව හා දේශානුරාගය වඩවා මාතෘ භූමිය කෙරෙහි සංවේදී වූ දරු කැලක් හා සමාජයක් බිහි කිරීම''

("To sensitize students and the community through aesthetics to the Mother Land, endowed with cultural pride, creativity, sensitivity, tolerance, partriotism and a sense of national identity")

දේශය ගොඩනැංවීමේ දී විශ්වය සමග යහ සබඳතා පවත්වා ගනිමින් පෙරට යන අනාගත පුරවැසියා කෙසේ විය යුතු ද යන්න ගැඹුරින් විමසා බැලීමත් සමග මෙතෙක් පැවති සෞන්දර්ය විෂයයේ ජාතික දැක්ම අතික්‍රමණය කොට මෙම 2015 නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණය දෙස නවමු දෘෂ්ටියක් හෙළා ඇති බව එනයින් ම ඔබට පැහැදිලි වනු ඇත.

උසස් රසඥතා ඥානයකින් යුතු මානව හිතවාදී චින්තනයෙහි හෙබි ක්‍රියාශීලී, සමාජානුයෝගී පුරවැසියකු ලෙස වැඩ ලෝකයට පිවිසීමට සෞන්දර්ය අධ්‍යාපනයෙන් ලබන ආධ්‍යාත්මික හා ශාරීරික ප්‍රබෝධය ඉවහල් කර ගැනීම අද්‍යතන සමාජ අවශ්‍යතාවකි.

සෞන්දර්ය අධ්‍යාපනයෙන් දරුවකු තුළ සොඳුරු මෙන් ම නිර්මාණශීලී හැකියා හා චිත්තනය ප්‍රවර්ධනය කිරීම ද විනය ගරුක, සදාචාරවත් අභිමානවත් පුරවැසියකු තැනීමේ වගකීම ඉටු කිරීම ද දෙවැනි වන්නේ ආගමෙන් මිනිසාට සැලසෙන සේවාවට පමණි.

එබැවින් විද්‍යා, ගණිත, වාණිජ, තාක්ෂණ හා භාෂා විෂයයන්ගෙන් ඥානනය වන මිනිස් සත්ත්වයාට මිනිස් ගුණ උරුම කරදෙන සෞන්දර්ය අධ්‍යාපනික විෂයයන් ඉගෙනීම එදාටත් වඩා අදට සහ හෙටට අත්‍යවශ්‍ය ම බැව් තරයේ ම කිව යුතු ව ඇත.

මෙම විෂයමාලා ප්‍රතිසංස්කරණයත් සමග අභිනවයෙන් 6 ශ්‍රේණියට පැමිණෙන දරුවන් නවමු චින්තනයක් ඇති අලුත් පරපුරක් ලෙස තැනුම උදෙසා පළමු ක්‍රියාකාරකමින් ම ස්වයං පෙලඹවීමක් ඇති වන පරිදි කැමැත්ත හා විශ්වාසය ගුරුවරයා විසින් දිනා ගත යුතු ය. ඒ සඳහා ටිබෙට් ජාතික එස්. මහින්ද හිමියන් අතින් විරචිත "ප්‍රාර්ථනාව" නම් වූ කුඩා ළමා ගීයක් දරුවාගේ ජීවන ප්‍රතිඥාවක් ලෙස දිනපතා පාඩම ඇරඹුමට පෙර ගැයුමට අපි යෝජනා කරමු.

| | | | |
|---|---|---|---|
| ස ස ස - | ස ස ස - | රි රි රි - | රි රි රි - |
| හො ඳ දේ s | හි ත මී s | හි තු දේ s | කි ය මී s |
| ස රි ස රි | ස ස රි - | රි ස රි ස | ස ස ස - |
| කි යු දේ s | ක ර මී s | ක ර මි න් | හැ දෙ මී s |

මෙම ප්‍රවේශයත් සමඟ ඇරඹෙන සෞන්දර්යයේ වින්දනාත්මක ඉගෙනුම ජාතික, සංස්කෘතික අනන්‍යතා හා විවිධ සම්ප්‍රදායයන් ස්පර්ශ කරමින් විශ්ව චින්තනයක් කරා දරුවාගේ දැනුම, හැකියා හා ආකල්ප පුළුල් කර ගැනීමට හැකි වන පරිදි විෂය කරුණු මෙහි දී අධ්‍යාපනික හා මනෝ විද්‍යාත්මක පදනමින් යුතු ව ක්‍රමික ව පෙළ ගස්වා ඇත.

එහි දී නායකත්වය, සහභාගිත්වය, ඉදිරිපත් වීම, සුහදත්වය, සාමූහිකත්වය, ඇගැයීම, සවන්දීම, පිළිගැනීම, බෙදාහදා ගැනීම, අන්‍යයන්ට ගරු කිරීම ආදී ආකල්ප සෑම සිසුවකු තුළ ම වර්ධනයට අවස්ථාව සැලසෙන පරිදි, අප විසින් යෝජිත ක්‍රියාකාරකම් තවදුරටත් සංවර්ධනය කරමින් ඉගෙනුම් ඉගැන්වීම් පරිසරය සකසා ගැනීමට ගුරුවරයකු වශයෙන් ඔබට ද ඉඩකඩ ඇත.

තවද දෛනික ජීවිතයේ දී මුහුණ දෙන විවිධ ගැටලුවලට සාර්ථක ව මුහුණ දී තර්කානුකූල ව හා නිර්මාණාත්මක ව චින්තනය මෙහෙයවා ඒවා විසඳාගැනීමට අවශ්‍ය පුද්ගල ශක්‍යතා වර්ධනය කිරීමට ද අප විසින් වත්මන් පරපුරට දායකත්වය සැපයිය යුතු ව ඇත.

එබැවින් ගුරු භවතුන් ලෙස ඔබ, මෙම ගුරු මාර්ගෝපදේශය පෙරට වඩා හොඳින් පරිශීලනය කරන්නේ නම් ඔබගේ ද චිත්තනයට අලුත් ආලෝකයක් හා ප්‍රබෝධයක් ලැබෙනු ඇත. ඒ ආලෝක කිරණ ජාතියේ දරු කැල මත පතිත ව ඔවුන් ද ඉමහත් ප්‍රබෝධයෙන් මෙම විෂයය ඉගෙනීමට යොමු වනු නො අනුමාන ය.

එසේ ම කායික හා මානසික සමබරතාවෙන් හෙබි සෞඛ්‍ය සම්පන්න මෙන් ම නීරෝගී දිවිපෙවතක් ගත කිරීමට අවශ්‍ය පුද්ගල ශක්‍යතා සංවර්ධනය කිරීම හා යහපත් අන්තර් පුද්ගල සම්බන්ධතා ගොඩනංවා ගනිමින් ජාතික හා ජාත්‍යන්තර තලයේ නොසැලී කටයුතු කිරීමට විචාරශීලී මනසකින් හෙබි පුද්ගලයකු බිහි කිරීමට වගවීම සෞන්දර්ය අධ්‍යාපන විෂය භාරව කටයුතු කරන ඔබ අප සැමගේ වගකීම වේ.

ඒ සඳහා 2015 වසරේ සිට 6 ශ්‍රේණියෙන් ඇරඹී ක්‍රියාත්මක වන මෙම නව ප්‍රතිසංස්කරණය දරුවන් හරහා අපි සැම නවමු ලොවකට පිවිසීමේ වැදගත් අවස්ථාවක් ලෙස දකිමින් උද්යෝග යෙන් හා අධිෂ්ඨානයෙන් වඩාත් ඵලදායි සේවාවක් සැලසීමට කැප වෙමු.

**අධ්‍යක්ෂ (සෞන්දර්ය)**
**ජාතික අධ්‍යාපන ආයතනය**

## විෂයමාලා කමිටුව

| | | |
|---|---|---|
| **උපදේශකත්වය හා අනුමැතිය** | : | ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය<br>ජාතික අධ්‍යාපන ආයතනය |
| **විෂය සම්බන්ධීකරණය** | : | එම්.ජී.ඒ.කේ.යූ.බණ්ඩාර මයා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය<br>සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව |
| | : | ඥානසිරි බී.ගමගේ මයා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය<br>සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව |
| **විෂය විශේෂඥ උපදෙස්** | | |
| මහාචාර්ය සුසිරිපාල මාලිම්බඩ | : | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය |
| ආචාර්ය ටී. සනාතනන් | : | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, යාපනය විශ්වවිද්‍යාලය |

**ලේඛක මණ්ඩලය**

**අභ්‍යන්තර සම්පත් දායකත්වය**

| | | |
|---|---|---|
| එම්. ජී. ඒ. කේ. යූ. බණ්ඩාර මයා | : | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව |
| ඥානසිරි බී. ගමගේ මයා | : | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව |
| රවීන්ද්‍ර තේන්නුවර මයා | : | කථිකාචාර්ය, සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව |
| චමරි තපස්වරගේ මිය | : | සහකාර කථිකාචාර්ය, සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව |
| මනෝරා ප්‍රේමතිලක මිය | : | සහකාර කථිකාචාර්ය, සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව |

**බාහිර සම්පත් දායකත්වය**

| | | |
|---|---|---|
| ආචාර්ය උපාලි රංජිත් රණවක | : | කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂ, බුලත්සිංහල |
| ශ්‍රීමති ඒකනායක මිය | : | කථිකාචාර්ය (බාහිර), කැලණිය විශ්වවිද්‍යාලය |
| ප්‍රසන්න රණබාහු මයා | : | කථිකාචාර්ය (බාහිර) සෞන්දර්ය විශ්වවිද්‍යාලය<br>කථිකාචාර්ය, පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය,<br>කැලණිය විශ්වවිද්‍යාලය. |
| එස්. ඒ. හර්ෂා මනෝජනී මිය | : | ගුරු උපදේශක, කලාප අධ්‍යාපන කාර්යාලය, හෝමාගම |
| එච්. ඒ සංජීවි මංජරී මිය | : | ගුරු උපදේශක, කලාප අධ්‍යාපන කාර්යාලය, කොළඹ |
| තුරෙ වීරසිංහම් තුෂ්‍යන්තන් මයා | : | ගුරු උපදේශක, කලාප අධ්‍යාපන කාර්යාලය, යාපනය |
| එච්. එම්. එස්. පී. එච්. බණ්ඩාර මයා | : | චිත්‍ර කලා ආචාර්ය, ශාන්ත සිල්වෙස්තර විද්‍යාලය, මහනුවර |

| | | |
|---|---|---|
| **භාෂා සංස්කරණය** | : | එස්. ඕ. ප්‍රනාන්දු මයා, ප්‍රධාන ව්‍යාපෘති නිලධාරි (විශ්‍රාමික)<br>ජාතික අධ්‍යාපන ආයතනය<br>මනෝරා ප්‍රේමතිකලක මිය, සෞන්දර්ය අධ්‍යාපන දෙපා. |
| **පිටකවර නිර්මාණය** | : | රවීන්ද්‍ර තේන්නුවර මයා, සෞන්දර්ය අධ්‍යාපන දෙපා. |
| **පරිගණක යතුරු ලියනය** | : | චමරි තපස්වරගේ මිය, සෞන්දර්ය අධ්‍යාපන දෙපා.<br>මනෝරා ප්‍රේමතිකලක මිය, සෞන්දර්ය අධ්‍යාපන දෙපා. |
| **විවිධ සහාය** | : | ඊ. එම්. වික්‍රමනායක මිය සෞන්දර්ය අධ්‍යාපන දෙපා.<br>ප්‍රේමරත්න පෙරේරා මයා සෞන්දර්ය අධ්‍යාපන දෙපා. |

## ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස්

මෙම ගුරු මාර්ගෝපදේශය, වර්ෂ 2016 සිට ක්‍රියාත්මක කිරීමට නියමිත චිත්‍ර කලාව 11 ශ්‍රේණිය විෂය නිර්දේශය පදනම් කරගෙන සම්පාදනය කර ඇත. පන්ති කාමර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සාර්ථක කර ගැනීම සඳහා මෙය ඔබ අතට පත් කෙරේ. මෙම පොත පරිශීලනයේ දී පහත සඳහන් කරුණු පිළිබඳ ව ඔබගේ විශේෂ අවධානය යොමු කරන්න.

- පාසලේ වාර්ෂික වැඩ සැලසුමට අනුකූල වන සේ කාලය කළමනාකරණය කරගන්න.

- ප්‍රධාන නිපුණතා 07 ක් යටතේ පෙළගස්වා ඇති අන්තර්ගතයෙහි 1.0 සිට 5.0 දක්වා වන ප්‍රායෝගික නිපුණතාවන්හි නිපුණතා මට්ටම් සඳහා ආදර්ශ ක්‍රියාකාරකමක් ඇතුළත් කර ඇත. එම නිපුණතා මට්ටම්වලට අදාළ ව යෝජනා කර ඇති මාතෘකා හෝ සුදුසු වෙනත්මාතෘකා පදනම් කරගෙන අනෙකුත් ක්‍රියාකාරකම් නිර්මාණය කරගන්න.

- 6.0 හා 7.0 නිපුණාතා සඳහා ක්‍රියාකාරකම් සැලසුම් කර ඇතත්, සුදුසු නිර්මාණශීලී ක්‍රමවේද භාවිත කර, අදාළ විෂය කරුණු සාක්ෂාත් වන සේ ක්‍රියාකාරකම් වෙනස් කර ගැනීමට ඔබට නිදහස ඇත.

- යෝජිත මෙන් ම සම්පාදනය කර ගන්නා ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමේ දී පහත සඳහන් කරුණු පිළිබඳ ව සැලකිලිමත් වන්න.

  I සෞන්දර්ය හෝ වෙනත් විෂය සමෝධානික රසවත් ඉදිරිපත් කිරීම් මඟින් ප්‍රබෝධාත්මක ආරම්භයක් ලබාගෙන සිසුන් පාඩමට ඇදබැඳ ගැනීම හා පෙර දැනුම විමසීමට පොලඹවා ගැනීම ඔස්සේ ක්‍රියාකාරකමට පිවිසිය යුතු ය.

  II සිසුන්ගේ ශක්‍යතා හඳුනා ගෙන නිර්මාණශීලී ඉගෙනුම් ක්‍රම භාවිත කර, ප්‍රතිපෝෂණ හා ඉදිරිපෝෂණ ලබාදෙමින් ක්‍රියාකාරකම අවසානයක් කරා ගෙන යැමෙන් අපේක්ෂිත ඉගෙනුම් පල වෙත ළඟා විය හැකි ය.

  III ඉදිරිපත් කිරීම්, ඇගයීම්, සමාලෝචනය, පසු වැඩ පැවරීම, ඇතුළත් ව සමස්ත පාඩම නිමා කිරීම.

- ගුරු මාර්ගෝපදේශය මගපෙන්වීමක් පමණි. විෂයබද්ධ ග්‍රන්ථ, අන්තර්ජාලය, වැනි මාධ්‍ය පරිශීලනය කිරීමෙන් ගුරුවරයා මෙන් ම ශිෂ්‍යයා ද දැනුමෙන් හා අවබෝධයෙන් සන්නද්ධ වීමෙන් ඉගනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය වඩාත් සාර්ථක කරගත හැකි වේ.

- හඳුන්වා දී ඇති සියලු ම නිපුණතා පුද්ගල පෞරුෂ සංවර්ධනය පදනම් කරගෙන ගොඩනගා ඇති බැවින් එම නිපුණතා 07 ම අනිවාර්යයෙන් ම ක්‍රියාත්මක කළ යුතු ය.

පහත වගුව අනුව ක්‍රියාකාරකම් වාර තුනට බෙදාගත හැකි ය.

| 1 වාරය | | | | 2 වාරය | | | | 3 වාරය | |
|---|---|---|---|---|---|---|---|---|---|
| ක්‍රියාකාරකම් අංකය | | | | ක්‍රියාකාරකම් අංකය | | | | ක්‍රියාකාරකම් අංකය | |
| 1.1.1 | 3.1.1 | 6.1.1 | 7.1.1 | 1.1.3 | 2.2.4 | 4.2.2 | 7.2.2 | 1.1.5 | 6.1.6 |
| 1.1.2 | 3.1.2 | 6.1.2 | 7.1.2 | 1.1.4 | 3.2.1 | 5.2.1 | 7.2.3 | 2.2.5 | 6.1.7 |
| 1.2.1 | 4.1.1 | 6.1.3 | 7.1.3 | 1.3.1 | 3.2.2 | 6.1.4 | 7.2.4 | 2.2.6 | 7.4.1 |
| 2.1.1 | 5.1.1 | 6.2.1 | 7.2.1 | 2.2.1 | 3.2.3 | 6.1.5 | 7.3.1 | 3.3.2 | 7.4.2 |
| 2.1.2 | | 6.3.1 | | 2.2.2 | 3.3.1 | 6.2.2 | | 3.3.3 | |
| | | | | 2.2.3 | 4.2.1 | 6.3.2 | | 4.2.3 | |

# පටුන


| | පිටුව |
|---|---|
| අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවුඩය | iii-iv |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් හිමිගේ පණිවුඩය | v |
| පෙරවදන | vi |
| හැඳින්වීම | vii-viii |
| විෂයමාලා කමිටුව | ix |
| ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස් | x |
| විෂය නිර්දේශය | xii-xxiv |
| ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස් | 01-149 |
| 10 ශ්‍රේණිය ගුරුමාර්ගෝපදේශයේ සංශෝධන | 150 |

# විෂය නිර්දේශය

# හැඳින්වීම

පාසල් පද්ධතියෙහි ක්‍රියාත්මක සමස්ත විෂයමාලාවෙන් "චිත්‍ර කලාව" විෂය වනාහී සුවිශේෂ වූවකි. නිර්මාණකරණයට හා වින්දනයට ප්‍රමුඛස්ථානයක් හිමිවන චිත්‍ර කලාව විෂයයෙන් සිදුවන්නා වූ සමාජ මෙහෙවර ඉතා වැදගත් ය. චිත්‍ර කලාවෙන් පුද්ගලයාගේ සුසමාහිත පෞරුෂය සංවර්ධනය වෙයි.

චිත්‍ර කලාව විෂය නිර්දේශයේ, විෂයබද්ධ නිපුණතා හතකින් දරුවා තුළ දැනුම, ආකල්ප, කුසලතා හා යහපත් ජීවන පුරුදු වර්ධනය කර ගැනීමෙහිලා අවධානය යොමු කර ඇත. විෂයබද්ධ නිපුණතාවල දී ප්‍රායෝගික ක්‍රියාකාරකම් වෙනුවෙන් නිපුණතා පහක් ද රසාස්වාදය හා කලා ඉතිහාසය අධ්‍යයනය සඳහා නිපුණතා දෙකක් ද වෙන් කර ඇත. ඒ අනුව එක් එක් ශ්‍රේණියේ වයස් මට්ටමට ගැළපෙන සේ විෂය අන්තර්ගතය, නිපුණතා මට්ටම් ඔස්සේ පෙළ ගස්වා ඇත.

විෂය නිර්දේශ සංස්කරණයේ දී පහත කරුණු කෙරෙහි වැඩි අවධානයක් යොමු කරන ලදී.

- ජාත්‍යන්තර චිත්‍ර කලාවේ නව ප්‍රවණතා
- ක්ෂේත්‍රයෙන් ප්‍රකාශිත නවමු අදහස්
- පාසල් පන්ති කාමර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ කරන ලද නිරීක්ෂණ හා සමීක්ෂණ

පළමුවන නිපුණතාව යටතේ වන මිනිස් රූප හා සත්ත්ව රූප ඇඳීම සඳහා වන මූලික අභ්‍යාස සඳහා නව නිපුණතා මට්ටම් සකස් විය. දෙවන නිපුණතාව යටතේ වන ස්වභාවික හා නිර්මිත පරිසරයේ මූලික හැඩතල හා හැඩ සඳහා නිපුණතා මට්ටම් ද නව තාක්ෂණය හා වැඩ ලෝකයට ඇවැසි දැනුම හා කුසලතා සාධනය වන ලෙසින් තුන්වන හා හතරවන නිපුණතාවන්ට අදාළ නිපුණතා මට්ටම් සකස් විය. ආකෘති නිර්මාණයෙන් ත්‍රිමාන බව පිළිබඳ සංකල්පය තවදුරටත් පසක් කරනු වස් පස්වන නිපුණතාව යටතේ නිපුණතා මට්ටම් සකසා ඇත. රසාස්වාදය හා කලා ඉතිහාසය පිළිබඳ දැනුම ලැබීම මෙන් ම විවිධ කෘතීන් අධ්‍යයනයෙන් ලත් දැනුම භාවිතයට ගැනීමට අවස්ථාව සැලසීම හයවන හා හත්වන නිපුණතාවන්හි නිපුණතා මට්ටම්වලින් සාධනය කිරීමට අපේක්ෂිත ය.

# ජාතික පොදු අරමුණු

පුද්ගලයාට හා සමාජයට අදාළ වන ප්‍රධාන ජාතික අරමුණු කරා ළඟාවීම සඳහා පුද්ගලයින්ට සහ කණ්ඩායම්වලට ජාතික අධ්‍යාපන පද්ධතියට සහාය විය යුතු ය.

වසර ගණනාවක් මුළුල්ලේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන අධ්‍යාපන වාර්තා සහ ලේඛන මගින් පුද්ගල හා ජාතික අවශ්‍යතාවන් සපුරාලීම සඳහා අරමුණු නියම කරනු ලැබීය. සමකාලීන අධ්‍යාපන ව්‍යුහයන් හා ක්‍රියාවලින් තුළ දැකිය හැකි දුර්වලතා නිසා ධරණීය මානව සංවර්ධන සංකල්ප රාමුව ඇතුළත අධ්‍යාපනය තුළින් ළඟාකර ගත යුතු පහත දැක්වෙන අරමුණු සපුරා ගැනීම අධ්‍යාපන පද්ධතිය සඳහා වූ තම ඉදිරි දැක්ම ලෙසට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ප්‍රත්‍යක්ෂ කොට ගෙන ඇත.

I මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පයක් මත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කර ගනිමින් ජාතික ඒකාබද්ධතාව, ජාතික සෘජු ගුණය, ජාතික සමගිය, එකමුතුකම සහ සාමය ප්‍රවර්ධනය කිරීම තුළින් ජාතිය ගොඩනැගීම සහ ශ්‍රී ලාංකීය අනන්‍යතාව තහවුරු කිරීම

II වෙනස් වන ලෝකයක අභියෝගයන්ට ප්‍රතිචාර දක්වන අතර ජාතික උරුමයේ මාහැඟි දායාදයන් හඳුනා ගැනීම සහ සංරක්ෂණය කිරීම

III මානව අයිතිවාසිකම් ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ දැනුවත් වීම, හෘදයාංගම බැඳීමකින් යුතු ව එකිනෙකා කෙරෙහි සැලකිලිමත් වීම යන ගුණාංග ප්‍රවර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මතයන් සහ ප්‍රජාතන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණ කිරීම සහ පවත්වා ගෙන යාමට සහාය වීම

IV පුද්ගලයින්ගේ මානසික හා ශාරීරික සුව සම්පත් සහ මානව අගයන්ට ගරු කිරීම මත පදනම් වූ තිරසාර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම

V සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාපණ හැකියාව, ආරම්භක ශක්තිය, විචාරශීලී චින්තනය, වගකීම හා වගවීම ඇතුළු වෙනත් ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය කිරීම

VI පුද්ගලයාගේ සහ ජාතියේ ජීවගුණය වැඩිදියුණු කෙරෙන සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායි කාර්යයන් සඳහා අධ්‍යාපනය තුළින් මානව සම්පත් සංවර්ධනය කිරීම

VII ශීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක් තුළ සිදු වන වෙනස්කම් අනුව හැඩගැස්වීමට හා ඒවා පාලනය කර ගැනීමට පුද්ගලයින් සූදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවන්ට සාර්ථක ව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම

VIII ජාත්‍යන්තර ප්‍රජාව අතර ගෞරවනීය ස්ථානයක් හිමි කර ගැනීමට දායක වන යුක්තිය සමානත්වය සහ අන්‍යෝන්‍ය ගරුත්වය මත පදනම් වූ ආකල්ප හා කුසලතා පෝෂණය කිරීම

(උපුටා ගැනීම - ජාතික අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාව 2003)

# මූලික නිපුණතා

අධ්‍යාපනය තුළින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා ඉහත සඳහන් ජාතික අරමුණු ඉටුකර ගැනීමට දායක වනු ඇත.

**(I) සන්නිවේදන නිපුණතා**

සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය මත තොරතුරු තාක්ෂණ ප්‍රවීණතාව යන අනුකාණ්ඩ 4ක් මත සන්නිවේදන නිපුණතා පදනම් වේ.

| | | |
|---|---|---|
| සාක්ෂරතාව | : | සාවධාන ව ඇහුම්කන් දීම පැහැදිලි ව කථා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරදි ව සහ නිරවුල් ව ලිවීම, ඵලදායි අයුරින් අදහස් හුවමාරු කර ගැනීම |
| සංඛ්‍යා පිළිබඳ දැනුම | : | භාණ්ඩ අවකාශය හා කාලය ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය |
| රූපක භාවිතය | : | රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති සහ වර්ණ ගළපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම |
| තොරතුරු තාක්ෂණ ප්‍රවීණතාව | : | පරිගණක දැනුම සහ ඉගෙනීමේ දී ද සේවා පරිශ්‍රයක් තුළ දී ද පෞද්ගලික ජීවිතයේ දී ද තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගී කර ගැනීම |

**(II) පෞරුෂත්ව වර්ධනයට අදාළ නිපුණතා**

- නිර්මාණශීලීබව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තීන්, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලී හා විග්‍රහාත්මක චින්තනය, කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයාගැනීම් සහ ගවේෂණය වැනි වර්ගීය කුසලතා
- සෘජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම වැනි අගයයන්
- චිත්තවේගී බුද්ධිය

**(III) පරිසරයට අදාළ නිපුණතා**

මෙම නිපුණතා සාමාජික ජෛව සහ භෞතික පරිසරයට අදාළ වේ.

| | | |
|---|---|---|
| සමාජ පරිසරය | : | ජාතික උරුමයන් පිළිබඳ අවබෝධය, බහුවාර්ගික සමාජයක සාමාජිකයන් වීම හා සම්බන්ධ සංවේදීතාව හා කුසලතා, සාධාරණ යුක්තිය පිළිබඳ හැඟීම, සමාජ සම්බන්ධතා, පෞද්ගලික චර්යාව, සාමාන්‍ය හා නෛතික සම්ප්‍රදායයන්, අයිතිවාසිකම්, වගකීම්, යුතුකම් සහ බැඳීම් |

ජෛව පරිසරය : සජීවී ලෝකයක, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස් වැල්, වනාන්තර, මුහුද, ජලය, වාතය සහ ජීවය - ශාක, සත්ත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදීබව හා කුසලතා

භෞතික පරිසරය : අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට ඒවායේ ඇති සම්බන්ධතාව, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍ය, සුව පහසුව, ස්වසනය, නින්ද, නිස්කලංකය, විවේකය, අපද්‍රව්‍ය සහ මලපහ කිරීම යනාදිය හා සම්බන්ධ වූ අවබෝධය, සංවේදීතාව හා කුසලතාව ඉගෙනීම, වැඩ කිරීම සහ ජීවත් වීම සඳහා මෙවලම් සහ තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීමේ කුසලතා මෙහි අඩංගු වේ.

**(IV)** වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතා

- ආර්ථික සංවර්ධනයට දායක වීම
- තම වෘත්තීය ලැදියා සහ අභියෝගතා හඳුනා ගැනීම
- හැකියාවනට සරිලන අයුරින් රැකියාවක් තෝරා ගැනීම සහ වාසිදායක හා තිරසර ජීවනෝපායක නිරත වීම යන හැකියාවන් උපරිම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුසලතා

**(V)** ආගම සහ සදාචාර ධර්මයන්ට අදාළ නිපුණතා

පුද්ගලයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාර ධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවන්ට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අගයයන් උකහා ගැනීම හා ස්වීයකරණය

**(VI)** ක්‍රීඩාව සහ විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා

සෞන්දර්යය, සාහිත්‍ය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටාවන් තුළින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්

**(VII)** ''ඉගෙනීමට ඉගෙනුම'' පිළිබඳ නිපුණතා

ශීඝ්‍රයෙන් වෙනස් වන සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් හරහා වෙනස්වීම් හසුරුවා ගැනීමේ දී හා ඊට සංවේදී ව හා සාර්ථක ව ප්‍රතිචාර දැක්වීමත් ස්වාධීන ව ඉගෙන ගැනීමත් සඳහා පුද්ගලයින්හට ශක්තිය ලබාදීම.

(උපුටා ගැනීම - ජාතික අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාව 2003)

# චිත්‍ර කලා විෂය අරමුණු

1. පරිසරය ඇසුරින් වින්දන ශක්තිය වර්ධනය.
2. නිර්මාණාත්මක චින්තනය හා නිර්මාණාත්මක කුසලතා වර්ධනය.
3. ඵලදායි දිවි පැවැත්මකට අවශ්‍ය කුසලතා හා ආකල්ප වර්ධනය.
4. දේශීය හා විදේශීය සංස්කෘතික අංගයන්ගේ අනන්‍යතා හඳුනා ගැනීම හා අගය කිරීම.
5. විචාර ශක්තිය වර්ධනය.
6. අනාගත වැඩ ලෝකයේ අභියෝගවලට මුහුණ දිය හැකි ධාරිතාවන්ගෙන් සමන්විත සමබර පෞරුෂ වර්ධනය.

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 01 පරිසරය ආශ්‍රිත තේමා යටතේ චිත්‍ර සංරචනය කරයි. | 1.1 මානව හා සත්ත්ව රූප පුළුල් ව අධ්‍යයනය කර චිත්‍ර සංරචනය කරයි. | ■ පරිසරය හා බැඳුණු මානව හා සත්ත්ව ක්‍රියාකාරකම්<br>■ විවිධ පරිසර ස්වභාවයන්<br>■ චිත්‍ර සංරචනය කිරීමේ මූලික සිද්ධාන්ත භාවිතය<br>• පරිමාණය හා පරිමාව<br>• පර්යාලෝකය<br>• ත්‍රිමාන ලක්ෂණ<br>• සමබරතාව<br>• හැඟීම් ප්‍රකාශනය<br>• නිර්මාණශීලී නිමාව<br>■ වර්ණ භාවිත කිරීමේ විවිධ ශිල්පක්‍රම<br>■ විවිධ නිර්මාණ ශෛලීන් | • චිත්‍ර සංරචන මූලික සිද්ධාන්ත භාවිත කරමින් පරිසරය හා බැඳුණු මානව හා සත්ත්ව ක්‍රියාකාරකම් ආශ්‍රිත තේමා චිත්‍රණය කරයි.<br>• වර්ණ භාවිත කිරීමේ විවිධ ශිල්ප ක්‍රම අත්හදා බලමින් චිත්‍ර නිර්මාණය කරයි.<br>• සාම්ප්‍රදායික හා ශෛලිගත චිත්‍ර සංරචන ක්‍රම භාවිත කරමින් නව නිර්මාණාත්මක චිත්‍ර සංරචනය කරයි. | 16 |
| | 1.2 අනුරාධපුර හා පොළොන්නරු යුගවල බිතුසිතුවම්හි කලා ලක්ෂණ අධ්‍යයනය කර චිත්‍ර සංරචනය කරයි. | ■ සම්ප්‍රදාය/ශෛලීය ලක්ෂණ<br>■ රේඛා හා හැඩතල<br>■ වර්ණ භාවිතය හා ශිල්ප ක්‍රම<br>■ සම්පිණ්ඩන සිද්ධාන්ත භාවිතය | | |
| | 1.3 මහනුවර යුගයට අයත් පහතරට විහාර බිතුසිතුවම් හි සාම්ප්‍රදායික කලා ලක්ෂණ ඇසුරෙන් චිත්‍ර සංරචනය කරයි. | ■ සාම්ප්‍රදායික චිත්‍ර සම්පිණ්ඩනය කිරීමේ සිද්ධාන්ත භාවිතය<br>• පරිමාණය හා පරිමාව<br>• ද්විමාන ලක්ෂණ<br>• සමබරතාව<br>• ප්‍රකාශන ශක්තිය<br>• නිර්මාණශීලී නිමාව<br>■ රේඛා හා රූප භාවිතය<br>■ තලය භාවිතය<br>■ වර්ණ භාවිතය හා ශිල්ප ක්‍රම<br>• දියසායම්<br>• පැස්ටල්<br>• පෝස්ටර් වර්ණ | | |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 2.0 පරිසරයේ පවත්නා වස්තු සම්පිණ්ඩ - නාත්මක ව චිත්‍රණය කරයි. | 2.1 විවිධ ස්වභාවික හා නිර්මිත වස්තු වෙන් වශයෙන් අධ්‍යයනය කර දළ සටහන් අඳියි. | ■ විවිධ ස්වභාවික හා නිර්මිත වස්තු රේඛාවෙන් අධ්‍යයනය<br>• රේඛාවේ විවිධතා<br>• ත්‍රිමාන ලක්ෂණ<br>• එළිය හා අඳුර | • ස්වභාවික හා නිර්මිත වස්තුවල විවිධත්වය හා ඒවායේ ගති ස්වභාව නිරීක්ෂණය කර දළ සටහන් අඳියි. | 16 |
| | 2.2 ස්වභාවික හා නිර්මිත වස්තු සම්පිණ්ඩනාත්මකව චිත්‍රණය කරයි. | ■ සම්පිණ්ඩනය කිරීමේ මූලික සිද්ධාන්ත<br>• පරිමාණය හා පරිමාව<br>• පර්යාලෝකය<br>• ත්‍රිමාන ලක්ෂණ හා එළිය අඳුර<br>• සමබරතාව<br>■ තලය භාවිතය<br>■ වයනය (මතුපිට ස්වභාවය)<br>■ වර්ණ මාධ්‍ය හා ශිල්ප ක්‍රම<br>• දියසායම්<br>• පැස්ටල්<br>• මිශ්‍ර මාධ්‍යය | • සංරචන මූලික සිද්ධාන්ත භාවිතයෙන් ද්‍රව්‍ය බලා ඇඳීමේ චිත්‍ර නිර්මාණය කරයි.<br>• විවිධ වර්ණ මාධ්‍යවලට උචිත ශිල්පක්‍රම භාවිතයෙන් වස්තුන්ගේ ත්‍රිමාන ලක්ෂණ හා ගති ස්වභාව මතුවන සේ වර්ණ කරයි. | |
| 3.0 පාරිභාරික අවශ්‍යතා සඳහා මෝස්තර නිර්මාණකරණයේ යෙදෙයි. | 3.1 නව සැලසුම් සංකල්ප හා විවිධ මාධ්‍ය භාවිතයෙන් නිර්මාණය කළ හැකි ගෘහ අලංකරණ භාණ්ඩ සඳහා සැලසුම් හා සැරසිලි නිර්මාණය කරයි. | ■ පරිසර අධ්‍යයනය<br>■ පාරිභාරික අවශ්‍යතා<br>■ මෝස්තර සිද්ධාන්ත<br>• සමබරතාව<br>• රිද්මය<br>• ඒකත්වය<br>■ සැලසුම් සංකල්ප<br>■ සැලසුම් නිර්මාණ ඇඳීම<br>• අලංකරණයට භාවිත වන බඳුන්<br>• දැවමය බිතු කැටයම් චිත්‍රණය | • නිර්මාණ අවශ්‍යතා සඳහා පරිසරය අධ්‍යයනය කරයි.<br>• පාරිභාරික අවශ්‍යතා පිළිබඳ අවබෝධයෙන් සැලසුම් හා සැරසිලි නිර්මාණය කරයි.<br>• සංයමයෙන් යුතු ව කටයුතු කරයි.<br>• නිර්මාණකරණයේ විධිමත් බව සඳහා පිළිවෙළින් ක්‍රියාවක නිරත වෙයි. | 16 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 3.2 සාම්ප්‍රදායික සැරසිලි ඒකක හා ඒවායේ වර්ණ භාවිත කර මුළුතල සැරසිලි නිර්මාණය කරයි.<br><br>3.3 නිර්මාණාත්මක සැරසිලි ඒකක භාවිත කර භාණ්ඩ සඳහා සැලසුම් හා සැරසිලි නිර්මාණය කරයි. | ■ මුළුතල සැරසිලි<br>• කුෂන් කවර<br>• මේස රෙදි<br>• පිත්තල බන්දේසි<br><br>■ රෙදි සැරසිලි<br>• දොර රෙදි<br>• සාරි පල්ලු<br>■ භාණ්ඩ නිර්මාණය<br>• විදුලි මේස ලාම්පු | | |
| 4.0 නිෂ්පාදන හා සේවා අවශ්‍යතා සඳහා ග්‍රැෆික් නිර්මාණ කරයි. | 4.1 විස්තීරණ තේමා යටතේ පෝස්ටර් චිත්‍ර නිර්මාණය කරයි.<br><br>4.2 විවිධ නිෂ්පාදන ප්‍රචාරණය සඳහා ග්‍රැෆික් නිර්මාණ කරයි. | ■ පෝස්ටර් චිත්‍ර<br>■ අවශ්‍යතා<br>■ සැලසුම<br>■ සන්නිවේදනාර්ථ<br>■ සංකේතාත්මක චිත්‍ර<br>■ අක්ෂර<br>■ මුද්‍රණයට යෝග්‍ය බව<br>■ ග්‍රැෆික් නිර්මාණ<br>• දවටන<br>• සුබපැතුම්පත්<br>• ලේබල් | • සන්නිවේදනාර්ථ, සංකේතාත්මක වර්ණ හා චිත්‍ර, අක්ෂර භාවිත කරමින් විස්තීර්ණ තේමා යටතේ පෝස්ටර් චිත්‍ර නිර්මාණය කරයි.<br><br>• මුද්‍රණයට සුදුසු පරිදි නිර්මාණකරණයේ යෙදෙයි. | 10 |
| 5.0 විවිධ මාධ්‍ය භාවිතයෙන් මූර්ති හා කැටයම් නිර්මාණය කරයි. | 5.1 සාම්ප්‍රදායික සැරසිලි මූලාශ්‍ර භාවිතයෙන් උන්නත කැටයම් නිර්මාණය කරයි. | ■ සාම්ප්‍රදායික සැරසිලි මූලාශ්‍ර<br>■ විවිධ මාධ්‍ය<br>■ උචිත බව<br>■ සම්පිණ්ඩනය<br>■ ශිල්ප ක්‍රම<br>■ නිර්මාණාත්මක බව | • සාම්ප්‍රදායික සැරසිලි මූලාශ්‍ර නම් කරයි.<br>• සම්ප්‍රදායික සැරසිලි මූලාශ්‍ර භාවිත කර උන්නත කැටයම් නිර්මාණය කරයි. | 06 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 5.2 ඇඟීමේ ශිල්ප ක්‍රමය භාවිතයෙන් මිනිස් රූ නිර්මාණය කරයි. | ■ විවිධ මාධ්‍ය<br>■ උචිත බව<br>■ සම්පිණ්ඩනය<br>■ ශිල්ප ක්‍රම<br>■ නිර්මාණාත්මක බව | • ඇඟීමේ ශිල්ප ක්‍රමය භාවිතයෙන් මිනිස් හිසක් නිර්මාණය කරයි. | |
| 6.0 ආගමික හා සංස්කෘතික අංග, දෙස් විදෙස් තෝරාගත් ශිල්පීන්ගේ කලා කෘතීන්, අද්‍යතන දෘශ්‍ය කලා කෘති හා ජනමාධ්‍ය ඇසුරින් හඳුනාගත් කලා නිර්මාණ විචාරශීලී ව රසාස්වාදයට ලක් කරමින් ස්වතන්ත්‍ර නිර්මාණ සඳහා භාවිතයට ගනියි. | 6.1 තෝරාගත් දේශීය ශිල්පීන්ගේ කලාකෘති රසාස්වාදය කරයි. | ■ තේමා, ශෛලිය, මාධ්‍ය හා ශිල්ප ක්‍රම, භාව ප්‍රකාශන, සංරචන ක්‍රම හා කලා ලක්ෂණ අධ්‍යයනය<br>• මුදලිඳු ඒ.සී.ජී.එස්. අමරසේකර<br>- යකැදුරු දියණිය<br>- විරැකියාව<br>• ස්ටැන්ලි අබේසිංහ<br>- කුඹල් හල<br>- පෙරහැර<br>• ජී. එස්. ප්‍රනාන්දු<br>- උළු පෝරණුව<br>- ගඩලාදෙණිය<br>• කේ. කනකසභාපති<br>- කියවන ළමයා<br>- කුකුල් පොරය<br>• ඒ. මාර්ක්<br>- සකුන්තලා<br>- මිනිසා සහ බල්ලන් මූර්තිය<br>• තිස්ස රණසිංහ<br>- දුෂ්කර ක්‍රියාව මූර්තිය<br>- කොළඹ රාජකීය විද්‍යාලයේ අල්ප උන්නත නිර්මාණය<br>• එච්. ඒ. කරුණාරත්න<br>- සඳපායා<br>- ''නම් නොකළ''(untitled) | • තෝරාගත් දේශීය ශිල්පීන්ගේ නිර්මාණ වෙන් වෙන් වශයෙන් හඳුනාගැනීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි.<br><br>• එම නිර්මාණවල සුවිශේෂ කලා ලක්ෂණ හඳුනාගෙන නම් කරයි.<br><br>• කලා නිර්මාණවල දැකිය හැකි ආභාස විමර්ශනය කරයි.<br><br>• දේශීය කලා නිර්මාණ රසවිඳීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි. | 11 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 6.2 දේශීය මුද්‍රිත මාධ්‍ය ආශ්‍රිත කලාත්මක අංග රසාස්වාදය කරයි. | ■ තේමා, ශෛලිය, භාව ප්‍රකාශන හා කලා ලක්ෂණ අධ්‍යයනය<br>• පුවත්පත් කාටූන් චිත්‍ර කලාව<br>- ඔබ්රි කොලට්<br>- යූනුස්<br>- ඩබ්. විජේසෝම<br>- කැමිලස් පෙරේරා<br>- ශිවඥානසුන්දරම්<br>• සන්නිදර්ශන චිත්‍ර කලාව<br>- සුමන දිසානායක<br>- වී. ශිව සුබ්‍රමනියම් | • ස්වයං නිර්මාණකරණයට ආභාස කර ගනියි.<br>• දේශීය මුද්‍රිත මාධ්‍ය ආශ්‍රිත කලා නිර්මාණ විමර්ශනය කරයි.<br>• මුද්‍රිත මාධ්‍ය ශිල්පීන්ගේ කලා නිර්මාණවල මූලික ලක්ෂණ විස්තර කරයි. | |
| | 6.3 තෝරාගත් විදේශීය ශිල්පීන්ගේ කලා කෘති අගය කරයි. | ■ වස්තු විෂය, කලා ආභාස (ශෛලිය), මාධ්‍යය හා ශිල්පක්‍රම, භාව ප්‍රකාශන, සංරචන ක්‍රම හා කලා ලක්ෂණ අධ්‍යයනය<br>• පැබ්ලෝ පිකාසෝ (Pablo Picasso)<br>- අවිග්නෝන්හි යුවතියෝ (Les Demoiselles d'Avignon)<br>- ගුවර්ණිකා (Guernica)<br>• හෙන්රි මුවර් (Henry Moore)<br>- රජ පවුල (King and Queen)<br>- වැතිරී සිටින රූව (Reclining figure) | • තෝරාගත් විදේශීය ශිල්පීන්ගේ නිර්මාණ හඳුනාගෙන නම් කරයි.<br>• එම නිර්මාණවල දැකිය හැකි විවිධ සුවිශේෂ කලා ලක්ෂණ හා ආභාස හඳුනාගෙන රසවිඳීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි.<br>• දෙස්, විදෙස් කලා නිර්මාණ සංසන්දනාත්මක ව විග්‍රහ කරයි. | |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 7.0 දේශීය, විදේශීය ඓතිහාසික චිත්‍ර, මූර්ති, කැටයම් හා ගෘහ නිර්මාණ කලාවන්හි අනන්‍යතා හඳුනාගෙන ඒවායේ කලාත්මක ලක්ෂණ නිර්මාණකරණයේ දී භාවිතයට ගනියි. | 7.1 අනුරාධපුර යුගයේ චිත්‍ර, මූර්ති හා කැටයම් නිර්මාණ අධ්‍යයනය කරයි. | ■ ඓතිහාසික පසුබිම, වස්තු විෂය, ශෛලිය, මාධ්‍යය හා ශිල්පක්‍රම<br>• සීගිරි චිත්‍ර<br>• සමාධි බුදුපිළිමය<br>• තොළුවිල බුදුපිළිමය<br>• අවුකන බුදුපිළිමය<br>• පන්කුලිය බුදුපිළිමය<br>• ඉසුරුමුණිය කැටයම් | • අනුරාධපුර යුගයේ කලා නිර්මාණවල කලාත්මක ලක්ෂණ විස්තර කරයි. | 18 |
| | 7.2 පොළොන්නරු යුගයේ චිත්‍ර, මූර්ති, කැටයම් හා ගෘහ නිර්මාණ අධ්‍යයනය කරයි. | ■ ඓතිහාසික පසුබිම, වස්තු විෂය, ශෛලිය, මාධ්‍යය හා ශිල්පක්‍රම<br>• තිවංක පිළිමගෙයි චිත්‍ර<br>• ගල් විහාරයේ බුදුපිළිම<br>• පොත්ගුල් විහාර පිළිමය<br>• නටරාජා ප්‍රතිමාව<br>• පාර්වතී පිළිමය<br>• ගණදෙවි පිළිමය<br>• කාරයික්කාල් අම්මයාර්<br>• සුන්දරමූර්ති ස්වාමි<br>• වටදාගෙය<br>• නිශ්ශංක ලතාමණ්ඩපය<br>• ශිව දේවාලය අංක 1 හා අංක 2 | • පොළොන්නරු යුගයේ කලා නිර්මාණවල සුවිශේෂතා හඳුනාගෙන නම් කරයි.<br><br>• පොළොන්නරු යුගයේ දී ශ්‍රී ලාංකීය කලා නිර්මාණවලට වූ බලපෑම් සහ ආභාසයන් විමසීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි. | |
| | 7.3 මහනුවර යුගයට අයත් පහතරට විහාර බිතු සිතුවම් අධ්‍යයනය කරයි. | ■ ඓතිහාසික පසුබිම, වස්තු විෂය, ශෛලිය, මාධ්‍යය, ශිල්පක්‍රම හා නිර්මාණ ශිල්පීන්<br>• කතලුව විහාර චිත්‍ර<br>- මහාධන සිටුවරයාගේ කතාව<br>⋆ සංගීතය හා විනෝද වීම | • මහනුවර යුගයට අයත් පහතරට විහාර බිතු සිතුවම්වල කලා ලක්ෂණ විස්තර කරයි. | |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | | - මහාසුතසෝම ජාතකය<br>★ රජමැදුරේ කාන්තාවෝ<br>• කරගම්පිටිය විහාර චිත්‍ර<br>- පොලඹවන බලවේග<br>- සිදුහත් උපත | | |
| | 7.4 ඉන්දියානු ඓතිහාසික යුගවල කලා නිර්මාණ අධ්‍යයනය කරයි. | ■ මෞර්ය, සුංග හා සාතවාහන යුගයට අයත් නිර්මාණවල ඓතිහාසික පසුබිම, වස්තුවිෂය, ශෛලිය, මාධ්‍යය හා ශිල්පක්‍රම, භාව ප්‍රකාශන, සංරචන ක්‍රම හා කලා ලක්ෂණ අධ්‍යයනය<br>• සාංචි ස්ථූපය<br>• සාංචි තොරණ කැටයම්<br>- ඡද්දන්ත ජාතකය<br>- බුදුන් සංකස්ස පුරයට වැඩම කිරීම<br><br>■ ගුප්ත යුගයට අයත් නිර්මාණවල ඓතිහාසික පසුබිම, වස්තු විෂය, ශෛලිය,මාධ්‍යය හා ශිල්පක්‍රම, භාව ප්‍රකාශන, සංරචන ක්‍රම හා කලා ලක්ෂණ අධ්‍යයනය<br>• සාරානාත් බුදුපිළිමය<br>• අජන්තා චිත්‍ර<br>- පද්මපානි බෝසත් රුව<br>- බුදුන් කිඹුල්වත්පුරයට වැඩම කිරීම | • ඉන්දියානු ඓතිහාසික කලා නිර්මාණවල කලාත්මක ලක්ෂණ විස්තර කරයි. | |

# ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්

**නිපුණතාව 1.0** : **පරිසර ආශ්‍රිත තේමා යටතේ චිත්‍ර සංරචනය කරයි.**

**නිපුණතා මට්ටම 1.1** : **මානව හා සත්ත්ව රූප ඇතුළත් පරිසරය පුළුල් ව අධ්‍යයනය කර චිත්‍ර සංරචනය කරයි.**

**ක්‍රියාකාරකම 1.1.1** : **"අඳුරු රැයක පුදබිමක අසිරිය"**

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02 යි

**ඉගෙනුම් පල** :
- විවිධ ආගමික අවස්ථාවල දක්නට ලැබෙන සුවිශේෂ ලක්ෂණ විස්තර කරයි.
- අඳුරු රැයක පුදබිමක සිද්ධි පිළිබඳ අවබෝධයෙන් කතා කරයි.
- චිත්‍ර සංරචන සිද්ධාන්ත භාවිතයෙන් මාතෘකාව චිත්‍රණය කරයි.
- විවිධ ආගමික සංස්කෘති ඇසුරින් නිර්මිත චිත්‍ර රස විඳිමින් අගයයි.

**ගුණාත්මක යෙදවුම්** :
- විවිධ ආගමික වතාවත් සහිත නිදර්ශන චිත්‍ර
- පාඩම සංවර්ධනය කිරීමට අවශ්‍ය ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ

**ක්‍රියාකාරකම් සැලසුම් කිරීම සඳහා උපදෙස්** :

**පියවර 1.1.1.1** :
- පාසල් පරිසරයට හා ආගමික සංස්කෘතියට ගැළපෙන පරිදි අභිමත ක්‍රමවේදයක් භාවිතයෙන් පාඩමට පිවිසෙන්න.
- විවිධ ආගමික සිද්ධි සහිත නිදර්ශන චිත්‍ර ළමයින්ගේ නිරීක්ෂණයට යොමුකරන්න.
- එවැනි සිද්ධිවල දැකිය හැකි සුවිශේෂ ලක්ෂණ කෙරෙහි අවධානය යොමුකරමින් සාකච්ඡාවක නිරතවන්න.
    - වත් පිළිවෙත් හා උත්සව අවස්ථා
    - මානව, සත්ත්ව ඉරියව්, ක්‍රියාකාරකම් හා හැඟීම් ප්‍රකාශනය
    - ඇඳුම් පැලඳුම්
    - සිද්ධියට අදාළ සංස්කෘතික පරිසරය හා අංග

(මිනිත්තු 10 යි)

**පියවර 1.1.1.2** :
- අභිමත පරිදි තෝරාගත් මාතෘකාව චිත්‍රණය කිරීමට සිසුන් යොමු කරවන්න.
- චිත්‍ර නිර්මාණය සඳහා අවශ්‍ය උපකරණ සිසුන්ට ලබාදෙන්න.
- සිසුන් ක්‍රියාකාරකමේ නිරත වන අතරතුර අවශ්‍ය මගපෙන්වීම් ලබාදෙන්න.
- නිම කෘති පන්තියේ ප්‍රදර්ශනය සඳහා සූදානම් කරවන්න.

(මිනිත්තු 50 යි)

පියවර 1.1.1.3 :
- සිසු නිර්මාණ පන්තියේ ප්‍රදර්ශනය කරමින් ස්වයං විචාරයකට අවස්ථාව ලබා දෙන්න.
- සෙසු අයගේ නිර්මාණ පිළිබඳ ඇගයීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- සමස්තය ඇගයීමට බඳුන් කරන්න.

(මිනිත්තු 20 යි)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

පහත සඳහන් කරුණු පදනම් කරගෙන ඇගයීම් හා තක්සේරුකරණයේ යෙදෙන්න.

- විවිධ ආගමික උත්සව අවස්ථාවල දක්නට ලැබෙන සුවිශේෂ ලක්ෂණ විස්තර කිරීම
- චිත්‍ර සංරචන සිද්ධාන්ත භාවිත කරමින් මාතෘකාව චිත්‍රණය කිරීම
- විවිධ ආගමික සංස්කෘතීන් ඇසුරින් නිර්මිත චිත්‍ර රස විඳිමින් සාකච්ඡා කිරීම
- අන් අයගේ සිතුවම් රසවිඳිමින් අගය කිරීම

♦ **පහත සඳහන් මාතෘකා යටතේ අනෙකුත් ක්‍රියාකාරකම් සැලසුම් කරගන්න.**

1.1.2 ක්‍රීඩා තරගයක උද්වේගකර අවස්ථාවක් - කාලච්ඡේද 02
1.1.3 නියඟය ආ දා - කාලච්ඡේද 02
1.1.4 සංකල්පීය මාතෘකාවක් යටතේ චිත්‍රයක් - කාලච්ඡේද 02
1.1.5 එළිමහන් වෙළඳපළක් - කාලච්ඡේද 02

නිපුණතාව 1.0 : පරිසරය ආශ්‍රිත තේමා යටතේ චිත්‍ර සංරචනය කරයි.

නිපුණතා මට්ටම 1.2 : අනුරාධපුර හා පොළොන්නරු යුගවල සිතුවම් හි කලා ලක්ෂණ අධ්‍යයනය කර චිත්‍ර සංරචනය කරයි.

ක්‍රියාකාරකම 1.2.1 : "ඓතිහාසික පුවතක්"

කාලච්ඡේද සංඛ්‍යාව : 03 යි

ඉගෙනුම් පල :
- විවිධ ඓතිහාසික සිද්ධි නම් කරයි.
- ඓතිහාසික සිද්ධියක් නිරූපණයේ දී දැකිය හැකි මානව හා සත්ත්ව ඉරියව් හා ක්‍රියාකාරකම් විස්තර කරයි.
- අනුරාධපුර සහ පොළොන්නරු බිතු සිතුවම් ශෛලිය අනුගමනය කරමින් ඓතිහාසික සිදුවීමක් චිත්‍රණය කරයි.
- පැරණි බිතුසිතුවම් අධ්‍යයනයෙන් ලද දැනුම නව නිර්මාණ සඳහා යොදා ගනියි.
- අන් අයගේ නිර්මාණ අගය කරයි.

ගුණාත්මක යෙදවුම් :
- ඇමුණුම 1.2.1.1 ට ඇතුළත් ගවේෂණ/ කාර්ය උපදෙස් පත්‍රිකා
- අනුරාධපුර හා පොළොන්නරු යුගවල බිතු සිතුවම් නිදර්ශන
- සාම්ප්‍රදායික ශෛලීය ලක්ෂණ සහිත චිත්‍ර නිදර්ශන

ක්‍රියාකාරකම් සැලසුම සඳහා උපදෙස් :

පියවර 1.2.1.1 :
- ඓතිහාසික සිද්ධි සම්බන්ධ කතා පුවත් සිසුන්ගෙන් විමසන්න.
- එවැනි සිද්ධියක විශේෂිත ලක්ෂණ පිළිබඳ පහත සඳහන් කරුණු අවධාරණය වන පරිදි සාකච්ඡාවක් මෙහෙයවන්න.
  - මානව හා සත්ත්ව ඉරියව්, ක්‍රියාකාරකම් සහ හැඟීම් ප්‍රකාශනය
  - භාවිත ඇඳුම් පැලඳුම්
  - සිද්ධියට අදාළ සංස්කෘතික පරිසරය
- අනුරාධපුර සහ පොළොන්නරු යුගවල සිතුවම් සිසුන්ට ඉදිරිපත් කරමින් එම සිතුවම් හි දැකිය හැකි සුවිශේෂ ලක්ෂණ සාකච්ඡාවට ලක්කරන්න.
- එකී ලක්ෂණ භාවිත කර ඓතිහාසික පුවතක් චිත්‍රණය කළ හැකි ආකාරය සාකච්ඡා කරන්න.

( මිනිත්තු 15 යි)

පියවර 1.2.1.2 :
- ඇමුණුම් අංක 1.2.1.1 ට අදාළ ගවේෂණ/ කාර්ය උපදෙස් පත්‍රිකාව සිසුන්ට දෙන්න.
- ගවේෂණ/කාර්ය පත්‍රිකාවේ උපදෙස්වලට අනුව අනුරාධපුර සහ පොළොන්නරු සිතුවම් ශෛලිය අනුගමනය කරමින් ඓතිහාසික කතා පුවතක් නිර්මාණය කිරීමට සිසුන් යොමු කරවන්න.

- නිර්මාණකරණයේ දී සිසුනට අවශ්‍ය උපදෙස් හා මග පෙන්වීම් ලබාදෙන්න.
- එක් එක් සිසුන් නිම කළ කෘති පන්ති කාමරයේ ප්‍රදර්ශන කිරීමට සූදානම් කරවන්න.

(මිනිත්තු 90 යි)

පියවර 1.2.1..3 :

- සිසු නිර්මාණ පන්ති කාමරයේ ප්‍රදර්ශනය කරවන්න.
- නිර්මාණ පිළිබඳ ස්වයං ඇගයීමකට අවස්ථාව ලබාදෙන්න.
- සෙසු නිර්මාණ ඇසුරින් සංවර්ධනාත්මක අදහස් ඉදිරිපත් කිරීමට සිසුන්ට අවස්ථාව ලබාදෙන්න.

(මිනිත්තු 15 යි)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

පහත සඳහන් කරුණු පදනම් කරගෙන ඇගයීම් හා තක්සේරුකරණයේ යෙදෙන්න.

- තමා සිත් ගත් ඓතිහාසික සිදුවීමක සුවිශේෂතා ප්‍රකාශ කිරීම
- ඓතිහාසික සිද්ධියක් නිරූපණයේ දී මානව හා සත්ත්ව ඉරියව්වල ලක්ෂණ විස්තර කිරීම
- අනුරාධපුර සහ පොළොන්නරු බිතු සිතුවම් ශෛලිය අනුව චිත්‍ර නිර්මාණ කිරීම
- අන් අයගේ නිර්මාණ රසවිඳිමින් අගය කිරීම

**ඇමුණුම 1.2.1.1**

## ගවේෂණ /කාර්ය උපදෙස් පත්‍රිකාව

- පන්ති කාමරයේ ප්‍රදර්ශනය කළ අනුරාධපුර සහ පොළොන්නරු යුගවල සාම්ප්‍රදායික චිත්‍ර ශෛලිය ඇතුළත් නිදර්ශන හොඳින් නිරීක්ෂණය කරන්න.
- එම සිතුවම් ශෛලියේ දැකිය හැකි භාවපූර්ණ රේඛා හා හැඩතල භාවිතය, හැඟීම් ප්‍රකාශනය සහ සංගත වර්ණ භාවිතය වැනි සුවිශේෂ ලක්ෂණ අධ්‍යයනය කරන්න.
- එම සිතුවම්වල දක්නට ලැබෙන ශෛලිය අනුගමනය කරමින් ඓතිහාසික පුවතක සිත්ගත් අවස්ථාවක් චිත්‍රණය කරන්න.
- අනුරාධපුර සහ පොළොන්නරු යුගවල බිතුසිතුවම්වල විවිධ ශිල්ප ක්‍රම සහ වර්ණ ආශ්‍රිතව ලබා ගත් දැනුම ඓතිහාසික නිර්මාණ සඳහා අර්ථවත්ව යොදා ගන්න.
- වර්ණ යෙදීමේ දී ඔබ නිරීක්ෂණය කරන ලද නිදර්ශන සිතුවම්වල වර්ණ යොදා ඇති ආකාරය අනුගමනය කරන්න.
- ගුරුතුමාගේ/ ගුරුතුමියගේ උපදෙස් ලබාගන්න.
- නිර්මාණය කළ සිත්තම් පන්ති කාමරයේ ප්‍රදර්ශනය කිරීමට සූදානම් කරන්න.

**නිපුණතාව 1.0** : **පරිසරය ආශ්‍රිත තේමා යටතේ චිත්‍ර සංරචනය කරයි.**

**නිපුණතා මට්ටම 1.3** : **මහනුවර යුගයට අයත් පහතරට විහාර බිතුසිතුවම් ඇසුරින් චිත්‍ර සංරචනය කරයි.**

**ක්‍රියාකාරකම 1.3.1** : **"මංගල නැකතින් අතිනත් ගත්දා"**

**කාලච්ඡේද සංඛ්‍යාව** : 03 යි

**ඉගෙනුම් පල** :
- විවිධ සංස්කෘතීන්ට අයත් විවාහ මංගල උත්සව හා චාරිත්‍ර වත්පිළිවෙත්, ඇඳුම් පැළඳුම් සහ පරිසරය විස්තර කරයි.
- මහනුවර යුගයේ පහතරට සම්ප්‍රදායේ බිතු සිතුවම්වල චිත්‍රමය සිද්ධාන්ත අවබෝධයෙන් ප්‍රකාශ කරයි.
- විවාහ මංගල උත්සවයක සිත්ගත් අවස්ථාවක් සාම්ප්‍රදායික චිත්‍ර ශෛලිය භාවිතයෙන් චිත්‍රණය කරයි.
- සංයමයෙන් යුතුව නිර්මාණකරණයේ යෙදෙයි.
- නිර්මාණ රස විඳිමින් අගය කරයි.

**ගුණාත්මක යෙදවුම්** :
- ඇමුණුම් අංක 1.3.1.1 ට අදාළ ගවේෂණ /කාර්ය උපදෙස් පත්‍රිකා
- මහනුවර යුගයේ පහතරට විහාර බිතුසිතුවම් නිදර්ශන
- ශෛලිගත ස්වරූපයෙන් නිරූපිත විවිධ මානව, සත්ව ඉරියව් හා ශාක නිර්මාණ ඉරියව් සහිත චිත්‍ර
- සාම්ප්‍රදායික ශෛලියෙන් නිරූපිත නිදර්ශන චිත්‍ර

**ක්‍රියාකාරකම් සැලසුම් කිරීම සඳහා උපදෙස්** :

**පියවර 1.3.1.1** :
- පහතරට විහාර බිතු සිතුවම්වල දැකිය හැකි උත්සව අවස්ථා හා සම්බන්ධ සිතුවම් පන්ති කාමරයේ ප්‍රදර්ශනය කරන්න.
- එම නිර්මාණ ඇසුරෙන් පහත සඳහන් කරුණු අවධාරණය වන පරිදි සාකච්ඡාවක් මෙහෙයවන්න.
  - මානව රූප ඇඳීම හා හැඩතල සංරචනය
  - සැරසිලි මෝස්තර භාවිතය
  - පසුබිම යෙදීම
  - වර්ණ භාවිතය

(මිනිත්තු 15 යි)

**පියවර 1.3.1.2** :
- ඇමුණුම් අංක 1.3.1.1 ට අදාළ ගවේෂණ/ කාර්ය උපදෙස් පත්‍රිකාව සිසුන්ට බෙදා දෙන්න.
- තම සංස්කෘතියට උචිත පරිදි විවාහ මංගල උත්සවයක සිත්ගත් අවස්ථාවක් නිර්මාණය කිරීමට සිසුන් යොමු කරන්න.
- ගවේෂණ /කාර්ය පත්‍රිකාවේ උපදේශවලට අනුව නිර්මාණය සංරචනය කිරීමට සිසුන් මෙහෙයවන්න.

- නිර්මාණකරණයේ දී සිසුනට අවශ්‍ය උපදෙස් හා මඟ පෙන්වීම ලබාදෙන්න.
- නිම කෘති උචිත පරිදි පන්ති කාමරයේ ප්‍රදර්ශනය කිරීමට සූදානම් කරන්න.

(මිනිත්තු 90 යි)

පියවර 1.3.1.3 :

- සිසු නිර්මාණ පන්තියේ ප්‍රදර්ශනය කරවන්න.
- අහඹු ලෙස තෝරාගත් නිම කෘති ඇගයීමකට ලක් කරමින් සිසු අදහස් විමසන්න.
- පහතරට චිත්‍රවල දක්නට ලැබෙන චිත්‍රමය සිද්ධාන්ත කෙරෙහි අවධානය යොමු කරමින් සිසු නිර්මාණ සඳහා සංවර්ධනාත්මක අදහස් ලබා දෙන්න.

(මිනිත්තු 15 යි)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

පහත සඳහන් කරුණු පදනම් කරගෙන ඇගයීම් හා තක්සේරුකරණයේ යෙදෙන්න.

- විවිධ සංස්කෘතීන්ට අයත් විවාහ මංගල අවස්ථාවන්හි චාරිත්‍ර වාරිත්‍ර, ඇඳුම් පැලඳුම් විස්තර කිරීම
- පහතරට විහාර චිත්‍ර ශෛලීය ලක්ෂණ ප්‍රකාශ කිරීම
- නිර්මාණ සඳහා පහතරට විහාර චිත්‍ර ශෛලීය ලක්ෂණ අනුව චිත්‍ර නිර්මාණය කිරීම
- අන් අයගේ නිර්මාණ අගය කරමින් රස විඳීම

ඇමුණුම 1.3.1.1

## ගවේෂණ /කාර්ය උපදෙස් පත්‍රිකාව

- "මංගල නැකතින් අතිනත් ගත්දා"මාතෘකාව හා සම්බන්ධ විවිධ අවස්ථා සහිත නිදර්ශන චිත්‍ර හොඳින් නිරීක්ෂණය කරන්න.
- නිදර්ශන චිත්‍ර ඇසුරින් අභිමත සංසිද්ධියක් චිත්‍රණය කිරීමේ දී පහත සඳහන් පහතරට විහාර චිත්‍ර ශෛලීය ලක්ෂණ කෙරෙහි අවධානය යොමු කරන්න.
    - මානව හා සත්ත්ව ඉරියව්වල ස්වභාවය
    - ඇඳුම් පැලඳුම් භාවිතය
    - මෝස්තර හා සැරසිලි නිර්මාණ
    - පසුබිම නිමැවුම
    - වර්ණ හා රේඛා භාවිතය
- අවශ්‍ය අවස්ථාවන්හි දී ගුරුතුමාගෙන්/තුමියගෙන් උපදෙස් ලබාගන්න.
- නිර්මාණය කරන ලද සිතුවම් පන්ති කාමරයේ ප්‍රදර්ශනය සඳහා සූදානම් කරන්න.

**නිපුණතාව 2.0** : **පරිසරයේ පවත්නා වස්තු සම්පිණ්ඩනාත්මකව චිත්‍රණය කරයි.**

**නිපුණතා මට්ටම 2.1** : **විවිධ ස්වභාවික හා නිර්මිත වස්තු වෙන් වශයෙන් අධ්‍යයනය කර දළ සටහන් අඳියි.**

**ක්‍රියාකාරකම 2.1.1** : **" ද්‍රව්‍ය සම්පිණ්ඩන රේඛාවෙන් අධ්‍යයනය කරමු"**

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02 යි

**ඉගෙනුම් පල** :
- ධාරකය මත තබා ඇති භාණ්ඩ සමූහයේ එකිනෙකට වෙනස් වූ හැඩ හා මතුපිට ස්වභාව විස්තර කරයි.
- තලයට ගැළපෙන සේ පරිමාණානුකූල ව භාණ්ඩ සමූහය රේඛාවෙන් ඇඳ දක්වයි.
- චිත්‍ර ඇඳීමේ සිද්ධාන්ත භාවිත කර ද්‍රව්‍ය සමූහය තලය මත සම්පිණ්ඩනය කරයි.
- රේඛාවේ විවිධත්වය හා ශක්තීන් මතුකරමින් ද්‍රව්‍ය සමූහය අඳියි.
- අන් අයගේ නිර්මාණ රසවිඳිමින් ඇගයීමට ලක්කරයි.

**ගුණාත්මක යෙදවුම්** :
- ඇමුණුම් අංක 2.1.1.1ට ඇතුළත් ගවේෂණ/කාර්ය උපදෙස් පත්‍රිකා
- ද්‍රව්‍ය සම්පිණ්ඩනය ඇඳීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය
  - ඝනක හැඩැති වස්තුවක්, ටෙනිස් බෝලයක්, ප්ලාස්ටික් ජෝග්ගුවක්, ක්‍රෝටන් අත්තක්, මුද්‍රිත රෙදිකඩක්
  - භාණ්ඩ තැබීමට ධාරකයක්
- නිදර්ශන චිත්‍ර
- චිත්‍ර අඳින කඩදාසි හා පැන්සල් (2B, 4B, 6B)

**ක්‍රියාකාරකම් සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පියවර 2.1.1.1** :
- ධාරකය මත තැබූ ද්‍රව්‍ය සමූහය සිසුන්ගේ ඇස් මට්ටමට පහතින් තැබීමට කටයුතු කරන්න.
- භාණ්ඩ සමූහය සිසුනට හොඳින් නිරීක්ෂණය කිරීමට සලස්වන්න.
- ඒවායේ ඇති පරිමාණ, වයනය, වැනි විවිධතා පිළිබඳ සිසුන්ගෙන් විමසන්න.
- ප්‍රදර්ශනය කරන ලද ආදර්ශ ඇසුරෙන් භාණ්ඩවල සහ අතු රිකිල්ලේ ගති ලක්ෂණ, වයනය, පර්යාලෝකය, ත්‍රිමාන ලක්ෂණ, තලය භාවිත කිරීම ආදි කරුණු පිළිබඳ ව සාකච්ඡා කරන්න.
- විවිධ පැන්සල් වර්ග භාවිත කර ඇඳීමේ දී රේඛාවේ ශක්තිය පෙන්විය හැකි බව පෙන්වා දෙමින් පැහැදිලි කරන්න.

(මිනිත්තු 10 යි)

**පියවර 2.1.1.2** :
- ඇමුණුම 2.1.1.1ට ඇතුළත් ගවේෂණ/කාර්ය උපදෙස් පත්‍රිකාව සිසුන්ට ලබාදෙන්න.

- ගවේෂණ /කාර්ය උපදෙස් පත්‍රිකාව අනුව සිසුන් ක්‍රියාකාරකමේ යොදවන්න.
- ක්‍රියාකාරකමේ යෙදෙන සිසුන්ට අවශ්‍ය උපදෙස් හා මඟ පෙන්වීම ලබාදෙන්න.
- නිර්මාණ පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් කරන්න.

(මිනිත්තු 50 යි)

පියවර 2.1.1.3 :
- සිසු නිර්මාණ පන්තියට ඉදිරිපත් කරන්න.
- සිය නිර්මාණ පිළිබඳ ස්වයං ඇගයීමකට අවස්ථාව ලබාදෙන්න.
- පහත කරුණු මතුකරමින් සමාලෝචනයක යෙදෙන්න.
  - භාණ්ඩවල හැඩ විවිධත්වයෙන් යුක්ත බව
  - නිර්මාණයක සාර්ථකත්වයට නිරීක්ෂණය වැදගත් වන බව
  - රේඛා මාධ්‍ය භාවිතය මඟින් පර්යාලෝකය, ත්‍රිමාන ලක්ෂණ හා වයනය පෙන්විය හැකි බව (මිනිත්තු 20 යි)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

පහත සඳහන් කරුණු පදනම් කරගෙන ඇගයීම් හා තක්සේරුකරණයේ යෙදෙන්න.

- ද්‍රව්‍යවල දක්නට ලැබෙන විවිධතා විස්තර කිරීම
- ද්‍රව්‍ය සමූහය හොඳින් නිරීක්ෂණය කර රේඛා මඟින් තලය මත නිවැරදි ව සටහන් කර ගැනීම
- ධාරකය මත ඇති ද්‍රව්‍යවල විවිධ හැඩ රේඛා ඇසුරෙන් පරිමාණානුකූල ව සම්පිණ්ඩනය කිරීම
- රේඛාවේ ශක්තිය හා විවිධතා අනුව ද්‍රව්‍යවල ඇති ත්‍රිමානත්වය, පරිමාව හා පර්යාලෝක ලක්ෂණ මතු කර දැක්වීම
- එළිය අඳුර දැක්වීමේ ශිල්ප ක්‍රම උචිත පරිදි භාවිත කිරීම
- ද්‍රව්‍ය සමූහයේ දක්නට ලැබෙන එකිනෙකට වෙනස් වූ හැඩ හා ඒවායේ මතුපිට ස්වභාවය ඇඳ දැක්වීම

**ඇමුණුම 2.1.1.1**

## ගවේෂණ /කාර්ය උපදෙස් පත්‍රිකාව

- ඔබ ඉදිරියේ තබා ඇති ද්‍රව්‍ය සමූහය හොඳින් නිරීක්ෂණය කරන්න.
- එම වස්තු ඇස් මිට්ටමින් පහත පිහිටා ඇති හෙයින් එහි මාන 3ක් පෙනෙන අයුරු හොඳින් නිරීක්ෂණය කරන්න.
- එකිනෙක භාණ්ඩවල අති වෙනස්කම් හඳුනාගන්න.
- ද්‍රව්‍යවල ප්‍රමාණ, ඒවායේ ඝණත්වය, ත්‍රිමාන බව, මතුපිට ස්වභාවය, පර්යාලෝක ලක්ෂණ පිළිබඳ අවධානය යොමු කරන්න.
- සුදුසු ක්‍රමවේද භාවිත කර ද්‍රව්‍ය සමූහය තලයට ගැළපෙන සේ සම්පිණ්ඩනය කරන්න.
- නියමිත පැන්සල් භාවිත කර එළිය අඳුර හා වයනය මතුකරමින් රේඛාවෙන් ද්‍රව්‍ය සමූහය අධ්‍යයනය කරන්න.
- අවශ්‍යතා අනුව ගුරුතුමා/ගුරුතුමියගේ උපදෙස් හා මගපෙන්වීම ලබා දෙන්න.
- ඔබගේ නිර්මාණ පන්තියට ඉදිරිපත් කිරීමට සූදනම් කරන්න.

- **පහත සඳහන් මාතෘකා යටතේ අනෙකුත් ක්‍රියාකාරකම් සැලසුම් කරගන්න**

2.1.2 ඝනකාභ හැඩැති වස්තුවක්, වීදුරු බෝතලයක්, මල් සහිත රුක් අත්තන අත්තක්, ගස්ලබු ගෙඩියක්, මුද්‍රිත රෙදිකඩක් රේඛාවෙන් අඳිමු - කාලච්ඡේද 02

**නිපුණතාව 2.0** : **පරිසරයේ පවත්නා වස්තූන් සම්පිණ්ඩනාත්මක ව චිත්‍රණය කරයි.**

**නිපුණතා මට්ටම 2.2** : **ස්වභාවික හා නිර්මිත වස්තු සම්පිණ්ඩනාත්මක ව චිත්‍රණය කරයි.**

**ක්‍රියාකාරකම 2.2.1** : **''ද්‍රව්‍ය සමූහය වර්ණ මගින් චිත්‍රණය කරමු''**

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02 යි

**ඉගෙනුම් පල** :
- ස්වභාවික හා නිර්මිත වස්තුවල විවිධත්වය හා ඒවායේ ගති ස්වභාවය විස්තර කරයි.
- තලයට ගැළපෙන සේ පරිමාණානුකූල ව හා පර්යාලෝක ලක්ෂණ නිවැරදිව භාවිතයෙන් ද්‍රව්‍ය සමූහය සංරචනය කරයි.
- මූලික චිත්‍ර සිද්ධාන්ත භාවිත කර වර්ණ මාධ්‍යයට උචිත ශිල්පක්‍රම භාවිතයෙන් වස්තූන්ගෙන් ත්‍රිමාන ලක්ෂණ හා ගති ස්වභාවයන් මතුවන සේ වර්ණ කරයි.
- අන් අයගේ නිර්මාණ රසවිඳිමින් ඇගයීමට ලක්කරයි.

**ගුණාත්මක යෙදවුම්** :
- ඇමුණුම් අංක 2.2.1.1 ට ඇතුළත් ගවේෂණ/ කාර්ය උපදෙස් පත්‍රිකා
- ද්‍රව්‍ය සම්පිණ්ඩනය ඇඳීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය
  - සනකාභ හැඩැති වස්තුවක්
  - පෝච්චියක සිටුවන ලද මලක් සහිත ඇන්තූරියම් පැළයක්
  - වට්ටක්කා/ කොමඩු ගෙඩියක්
  - මුද්‍රිත රෙදිකඩක්
  - භාණ්ඩ තැබීමට ධාරකයක්
- චිත්‍ර අඳින කඩදාසි, පැන්සල් හා සුදුසු වර්ණ මාධ්‍යයක්
- නිදර්ශන චිත්‍ර

**ක්‍රියාකරකම් සැලසුම කිරීම සඳහා උපදෙස් :**

පියවර 2.2.1.1 :
- සපයාගත් භාණ්ඩ සිසුන්ට හොඳින් නිරීක්ෂණය කිරීමට සලස්වන්න.
- එම භාණ්ඩවල දක්නට ලැබෙන විවිධ හැඩ හා ප්‍රමාණ සිසුන්ගෙන් විමසන්න.
- ප්‍රදර්ශනය කරන ආදර්ශ චිත්‍ර ඇසුරින් ඒවායේ ගති ලක්ෂණ, වයනය, නිර්මාණයට උචිත පරිදි තලය භාවිත කිරීම, පර්යාලෝක හා ත්‍රිමාන ලක්ෂණ භාවිතය, වර්ණ මාධ්‍ය හැසිරවීමේ ක්‍රම ශිල්ප පිළිබඳ සාකච්ඡාවක නිරතවන්න.
- පැන්සල භාවිතයෙන් ද්‍රව්‍ය සමූහය තලය මත නිවැරදි ව ඇඳ, වර්ණ ගැන්වීමෙන් වඩාත් සාර්ථක නිර්මාණයක් කළ හැකි අයුරු සිසුන් සමග සාකච්ඡා කරන්න.

(මිනිත්තු 10 යි)

පියවර 2.2.1.2 :

- ඇමුණුම 2.2.1.1 ට ඇතුළත් ගවේෂණ/කාර්ය උපදෙස් පත්‍රිකාව සිසුන්ට කියවීමට සලස්වන්න.
- චිත්‍ර ඇඳීමේ උපකරණ සිසුන්ට බෙදා දෙන්න.
- ගවේෂණ/ කාර්ය උපදෙස් පත්‍රිකව අනුව සිසුන් ක්‍රියාකාරකමේ යොදවන්න.
- ක්‍රියකාරකමේ යෙදෙන සිසුන්ට අවශ්‍ය මඟපෙන්වීම හා ආදර්ශ සැපයීම සිදු කරන්න.
- සිසු නිර්මාණ පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් කරවන්න.

(මිනිත්තු 50 යි)

පියවර 2.2.1.3 :

- එක් එක් සිසුන් විසින් නිර්මාණය කරන ලද චිත්‍ර පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදෙන්න.
- සිසු නිර්මාණවල ගුණාත්මක ලක්ෂණ මෙන් ම සංවර්ධනය විය යුතු තැන් පෙන්වාදෙමින් ඊට අදාළ යෝජනා ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදෙන්න.
- පහත සඳහන් කරුණු මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.
  - දළ සටහන් ඇඳීමෙන් වස්තූන්වල හැඩ හොඳින් අධ්‍යයනය කළ හැකි බව
  - තබා ඇති ද්‍රව්‍ය සමූහයේ එකිනෙකට වෙනස් වූ මතුපිට ස්වභාව ඇති බව
  - ද්‍රව්‍ය මත අලෝකය පතිත වීමෙන් ත්‍රිමාන ලක්ෂණ මතු වී ඇති බව
  - ද්‍රව්‍ය සමූහය තබා ඇති ධාරකය තලයට සුදුසු පරිදි වෙනස් කර ඇඳීමේදී පර්යාලෝක ලක්ෂණ නිවැරදි ව පෙන්විය යුතු බව
  - විවිධ වර්ණ මාධ්‍ය හා ශිල්පක්‍රම භාවිත කිරීමෙන් පර්යාලෝකය, ත්‍රිමාන ලක්ෂණ හා මතුපිට ස්වභාවය පෙන්විය හැකි බව
  - උචිත පසුබිමක් යෙදීමෙන් ද්‍රව්‍ය සමූහය වඩාත් හොඳින් මතුකර පෙන්විය හැකි බව

(මිනිත්තු 20 යි)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

පහත සඳහන් කරුණු පදනම් කරගෙන ඇගයීම හා තකසේරුකරණයේ යෙදෙන්න.

- ද්‍රව්‍ය සමූහයේ එකිනෙකට වෙනස් වූ හැඩ හා මතුපිට ස්වභාව ඇති බව විස්තර කිරීම
- මූලික චිත්‍රමය සිද්ධාන්ත භාවිතයට ගැනීමෙන් වස්තූන්වල හැඩ නිවැරදි ව ඇඳීම
- විවිධ වර්ණ මාධ්‍ය හැසිරවීමේ ශිල්පක්‍රම භාවිත කිරීම
- අන් අයගේ නිර්මාණ රසවිඳිමින් ඇගයීම

ඇමුණුම 2.2.1.1

## ගවේෂණ /කාර්ය උපදෙස් පත්‍රිකාව

- ඔබ ඉදිරියේ තබා ඇති ද්‍රව්‍ය සමූහය හොඳින් නිරීක්ෂණය කරන්න.
- ද්‍රව්‍යවල මතුපිට ස්වභාවය එකිනෙකට වෙනස් ගති ලක්ෂණවලින් යුක්ත වන බව නිරීක්ෂණය කරන්න.
- ද්‍රව්‍ය මතට ආලෝකය පතිත වීම අනුව එළිය සහ අඳුර දිස්වන ආකාරයත් ත්‍රිමාන ලක්ෂණ මතු වී පෙනෙන ආකාරයත් හොඳින් නිරීක්ෂණය කරන්න.
- ද්‍රව්‍ය සමූහය තලයට ගැළපෙන සේ චිත්‍ර සිද්ධාන්ත භාවිතයෙන් සම්පිණ්ඩනය කරන්න. එහිදී,
  - ද්‍රව්‍ය සමූහය වර්ණ ගන්වන බැවින් කඩදාසිය මත පැන්සල් රේඛාව ලිහිල්ව හැසිරවීමට සැලකිලිමත් වන්න.
  - ද්‍රව්‍ය සමූහයේ සමස්ත හැඩය පිළිබඳ අවධානය යොමු කර කඩදාසි තලයට උචිත පරිදි සටහන් කර ගන්න.
  - එක් එක් ද්‍රව්‍යවල ප්‍රමාණ පිළිබඳ සැලකිලිමත් වෙමින් සුදුසු පරිමාණ ලබා ගැනීමේ ක්‍රමයකට අනුව ද්‍රව්‍ය සමූහය පැන්සල් රේඛාවෙන් අඳින්න.
  - තලයට හා ඇඳගත් ද්‍රව්‍ය සමූහයට ගැළපෙන පරිදි පර්යාලෝක ලක්ෂණ හොඳින් පෙනෙන සේ ධාරකය අඳින්න.
- ඔබ භාවිත කරන වර්ණ මාධ්‍යයට අනුව ශිල්පක්‍රම යොදා ගනිමින් ද්‍රව්‍ය සම්පිණ්ඩනය වර්ණ ගන්වන්න.
- ද්‍රව්‍යවලට අදාළ මතුපිට ස්වභාවය හා ත්‍රිමාන ලක්ෂණ නිවැරදි ව මතු කිරීමට උත්සාහ කරන්න. ද්‍රව්‍ය සංරචනය හොඳින් මතු වී පෙනෙන පරිදි චිත්‍රයේ පසුබිම සඳහා සුදුසු වර්ණයක් භාවිත කරන්න.
- අවශ්‍යතාව අනුව ගුරුතුමාගේ /තුමියගේ උපදෙස් ලබා ගන්න.
- ඔබගේ නිර්මාණය පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් කරන්න.

♦ **පහත සඳහන් මාතෘකා යටතේ අනෙකුත් ක්‍රියාකාරකම් සැලසුම් කරගන්න.**

2.2.2 සනකාභ හැඩැති වස්තුවක්, වීදුරු බෝතලයක්, රුක් අත්තන මල් සහිත කොළ අත්තක්, ගස්ලබු ගෙඩියක්, මුද්‍රිත රෙදිකඩක් චිත්‍රණය කරමු - කාලච්ඡේද 02

2.2.3 සනක හැඩැති වස්තුවක්, මැටි කලයක්, අරලිය මල් සහ කොළ සහිත අත්තක්, සිලිණ්ඩරාකාර වස්තුවක්, මුද්‍රිත රෙදිකඩක් චිත්‍රණය කරමු - කාලච්ඡේද 02

2.2.4 සනකාභ හැඩැති වස්තුවක්, ප්ලාස්ටික් ජොග්ගුවක්, තැඹිලි ගෙඩියක්, මල් සහ කොළ කිහිපයක් සහිත අත්තක්, මුද්‍රිත රෙදිකඩක් චිත්‍රණය කරමු - කාලච්ඡේද 02

2.2.5 සනකාභ හැඩැති වස්තුවක්, කුඩා ප්ලාස්ටික් බාල්දියක්, අත් පන්දුවක්/පා පන්දුවක්, පළල් පත්‍ර සහිත ක්‍රෝටන් අත්තක්, මුද්‍රිත රෙදිකඩක් චිත්‍රණය කරමු - කාලච්ඡේද 02

2.2.6 සනකාභ හැඩැති වස්තුවක්, මැටි ගුරුලේත්තුවක්, පළල් පත්‍ර සහිත ක්‍රෝටන් අත්තක්, වීදුරුවක දැමූ බීම බටයක්, පින්සලක්, මුද්‍රිත රෙදිකඩක් චිත්‍රණය කරමු - කාලච්ඡේද 02

**නිපුණතාව 3.0** : **පාරිභාරික අවශ්‍යතා සඳහා නිර්මාණකරණයේ යෙදෙයි.**

**නිපුණතා මට්ටම 3.1** : **නව සැලසුම් සංකල්ප හා විවිධ මාධ්‍ය භාවිත කර නිර්මාණය කළ හැකි ගෘහ අලංකරණ භාණ්ඩ සඳහා සැලසුම් හා සැරසිලි නිර්මාණය කරයි.**

**ක්‍රියාකාරකම 3.1.1** : ''දැවමය බිතු කැටයමක් චිත්‍රණය කරමු''

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02 යි

**ඉගෙනුම් පල** :
- දැවමය කැටයමක දැකිය හැකි සුවිශේෂ ලක්ෂණ විස්තර කරයි.
- පරිසරය ආශ්‍රිත හැඩතල මෝස්තරාකාර ලෙස භාවිතයට ගනියි.
- සංකීර්ණ හැඩ සරල ව අඳියි.
- දැවමය උන්නත කැටයමක් සඳහා සුදුසු සැලසුම් චිත්‍රයක් ඇඳ මාධ්‍යයට උචිත ලෙස වර්ණ කරයි.
- මනා සංයමයකින් යුතු ව කාර්යයෙහි නිරත වෙයි.
- අන් අයගේ නිර්මාණ රස විඳිමින් අගය කරයි.

**ගුණාත්මක යෙදවුම්** :
- දැවමය උන්නත කැටයම් හෝ ආදේශක
- ඇමුණුම 3.1.1.1ට අදාළ ගවේෂණ/කාර්ය උපදෙස් පත්‍රිකා

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**

**පියවර 3.1.1.1** :
- සුදුසු ක්‍රමවේදයක් භාවිත කරමින් දැව මාධ්‍යයෙන් නිම වූ කැටයමක් හෝ ආදර්ශකයක් ප්‍රදර්ශනය කරමින් පාඩමට පිවිසෙන්න.
- පහත සඳහන් කරුණු අවධාරණය කරන්න.
  - හැඩතල භාවිතය
  - සරල බව
  - උන්නත ලක්ෂණ
  - මාධ්‍යයේ ගති ස්වභාවය

(මිනිත්තු 15 යි)

**පියවර 3.1.1.2** :
- ඇමුණුම 3.1.1.1ට අදාළ ගවේෂණ /කාර්ය පත්‍රිකා සිසුනට බෙදා දෙන්න.
- "පරිසරය'' මාතෘකාව ලෙස යොදා ගනිමින් ලී කැටයමක් සඳහා උචිත සැලසුම් චිත්‍රයක් නිර්මාණය කිරීමට යොමු කරවන්න.
- අවශ්‍ය මග පෙන්වීම් ලබා දෙමින් වර්ණ කිරීමට යොමු කරවන්න.
- නිර්මාණය කළ සිත්තම් පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් කරවන්න.

(මිනිත්තු 50 යි)

**පියවර 3.1.1.3** :
- නිර්මාණය කරන ලද කෘති පන්තියට ඉදිරිපත් කරවන්න.

- ප්‍රදර්ශනය කරන චිත්‍රයන්හි ප්‍රබලතා හා දුබලතා සංවර්ධනය විය යුතු තැන් පෙන්වා දීමට අවකාශය ලබාදෙන්න.
- සමස්ත සමාලෝචනයක යෙදෙන්න.

(මිනිත්තු 15 යි)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

පහත සඳහන් කරුණු පදනම් කරගෙන ඇගයීම් හා තක්සේරුකරණයේ යෙදෙන්න.

- උන්නත දැව කැටයමක ඇතුළත් විය යුතු සුවිශේෂ ලක්ෂණ විස්තර කිරීම
- විවධ ස්ථාන අලංකාර කිරීම සඳහා දැවමය කැටයමකට උචිත සැලසුම් චිත්‍රණය කිරීම
- ශෛලිගත සරල හැඩතල අනුව පාරිසරික /ස්වාභාවික හැඩතල නිර්මාණය කිරීම
- සියුම් හා ත්‍රිමාන ලක්ෂණ සහිත ව අල්ප උන්නත කැටයම් සඳහා චිත්‍ර නිර්මාණය කිරීම
- අවශ්‍යතාවට උචිත පරිදි නිර්මාණකරණයේ යෙදීම

**ඇමුණුම 3.1.1.1**

## ගවේෂණ /කාර්ය උපදෙස් පත්‍රිකාව

- ඔබට සපයා ඇති ගවේෂණ /කාර්ය උපදෙස් පත්‍රිකාව හොඳින් කියවන්න.
- පන්තියේ ප්‍රදර්ශනය කරන ආදර්ශන, පින්තූර හොඳින් නිරීක්ෂණය කරන්න.
- එහි දැක්වෙන සංරචන හැඩතල, රිද්මය සහ වර්ණ භාවිතය නිරීක්ෂණය කරන්න.
- "පරිසරය" යන මාතෘකාව යටතේ දැවමය උන්නත කැටමයක් සඳහා උචිත සැලසුම් චිත්‍රයක් නිර්මාණය කරන්න.
- නිර්මාණය පහසුකර ගැනීම සඳහා සරල හැඩතල භාවිත කරන්න.
- අලංකරණය වැඩි කර ගැනීම සඳහා සරල හැඩතල මෝස්තරාකාර වන සේ සංවර්ධනය කරන්න.
- කැටයමක අල්ප උන්නත ස්වභාවය මතු කර දක්වන්න.
- නිර්මාණයේ මාධ්‍යයට අදාළ වර්ණ භාවිත කරන්න.
- අවශ්‍ය පරිදි ගුරුතුමාගේ /ගුරුතුමියගේ උපදෙස් ලබා ගන්න.

♦ **පහත සඳහන් මාතෘකා යටතේ අනෙක් ක්‍රියාකාරකම සැලසුම් කරගන්න.**

3.1.2 නිවස තුළ අලංකරණය සඳහා භාවිත වන බඳුනක් නිර්මාණය කරමු - කාලච්ඡේද 02

**නිපුණතාව 3.0** : **පාරිහාරික අවශ්‍යතා සඳහා නිර්මාණකරණයේ යෙදෙයි.**

**නිපුණතා මට්ටම 3.2** : **සාම්ප්‍රදායික සැරසිලි ඒකක හා ඒවායේ වර්ණ භාවිත කර මුළුතල සැරසිලි නිර්මාණය කරයි.**

**ක්‍රියාකාරකම 3.2.1** : **"මේස රෙද්දක් අඳිමු"**

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02 යි

**ඉගෙනුම් පල** :
- මේස රෙද්දක දැකිය හැකි සුවිශේෂ ලක්ෂණ විස්තර කරයි.
- සාම්ප්‍රදායික මෝස්තර ඒකක භාවිත කර මේස රෙද්දකට සුදුසු මුළුතල සැරසිල්ලක් නිර්මාණය කරයි.
- ජ්‍යාමිතික උපකරණ භාවිතයෙන් පරිමාණානුකූල ව අඳියි.
- අන් අයගේ නිර්මාණ රස විඳිමින් අගයයි.

**ගුණාත්මක යෙදවුම්** :
- මුළුතල සැරසිල්ලකට අනුව මෝස්තර යෙදූ විවිධ මේස රෙදි
- චිත්‍ර ඇඳීම සඳහා අවශ්‍ය උපකරණ
- සාම්ප්‍රදායික සැරසිලි මෝස්තර ඒකක සහිත චිත්‍ර නිදර්ශන

**ක්‍රියාකාකරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පියවර 3.2.1.1** :
- ඔබ අභිමත ක්‍රමවේදයකට අනුව මුළුතල සැරසිල්ලක් යෙදූ මේස රෙද්දක් පන්තියේ ප්‍රදර්ශනය කරමින් පාඩමට පිවිසෙන්න.
- පහත සඳහන් කරුණු අනාවරණය වන පරිදි සාකච්ඡාවක යෙදෙන්න.
  - භාවිත වන අවස්ථා
  - හැඩය
  - සැරසිලි යෙදී ඇති ආකාරය
  - වර්ණ
- සාම්ප්‍රදායික සැරසිලි ඒකක සහිත නිදර්ශන පෙන්වමින් මේස රෙද්දක් නිර්මාණයේ දී ඉහත ලක්ෂණ යොදා ගත හැකි ආකාරය සිසුන් සමග සාකච්ඡා කරන්න.

(මිනිත්තු 10 යි)

**පියවර 3.2.1.2** :
- චිත්‍ර ඇඳීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය උපකරණ බෙදා දෙන්න.
- සාම්ප්‍රදායික සැරසිලි ඒකක භාවිතයෙන් තමා අභිමත අයුරින් මේස රෙද්දක් නිර්මාණය කිරීමට සිසුන් යොමු කරවන්න.
- නිර්මාණය කිරීමේ දී පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කරවන්න.
  - ජ්‍යාමිතික උපකරණ භාවිතයෙන් අවශ්‍ය මිම්, පරිමාණ නිවැරදි ලෙස ලබා ගැනීම කළ යුතු බව
  - මේස රෙද්දක් යනු මුළුතල සැරසිල්ලක් බව

- නිම කෘතිය පිරිසිදු බවින් සහ මනා නිමාවකින් තිබිය යුතු බව
- නිර්මාණයට උචිත වර්ණ භාවිත කළ යුතු බව
- නියමිත තලය තුළ නිර්මාණය කර අවසන් කළ යුතු බව

- නිර්මාණ ඉදිරිපත් කිරීමට සූදානම් කරවන්න.

(මිනිත්තු 50 යි)

**පියවර 3.2.1.3** :

- සිසුන්ගේ නිර්මාණ ඉදිරිපත් කිරීමට සලස්වන්න.
- එකනෙකාගේ නිර්මාණ පිළිබඳ ඇගයීමකට හා සංවර්ධනාත්මක අදහස් ඉදිරිපත් කිරීමට යොමු කරවන්න.
- ඔබගේ අදහස් දක්වන්න.

(මිනිත්තු 15 යි)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්** :

පහත සඳහන් කරුණු පදනම් කරගෙන ඇගයීම් හා තක්සේරුකරණයේ යෙදෙන්න.

- මේස රෙද්දක තිබිය යුතු සුවිශේෂ ලක්ෂණ සහ එහි භාවිතය පිළිබඳ ප්‍රකාශ කිරීම
- නිවැරදිව ජ්‍යාමිතික උපකරණ භාවිත කිරීම
- සාම්ප්‍රදයික මෝස්තර ඒකකය මේස රෙද්දකට උචිත පරිදි පරිමාණානුකූල ව නිර්මාණය කිරීම
- නිර්මාණයේ සාර්ථකත්වය පිණිස මනා සංයමකින් යුතු ව කටයුතු කිරීම

♦ **පහත සඳහන් මාතෘකා යටතේ අනෙකුත් ක්‍රියාකාරකම් සැලසුම් කරගන්න.**

3.2.2 සාම්ප්‍රදායික ලක්ෂණ මතුවන සේ කුෂන් කවර නිර්මාණය කරමු - කාලච්ඡේද 02

3.2.3 සාම්ප්‍රදායික සැරසිලි ඒකක භාවිත කර වෘත්තාකාර පිත්තල බන්දේසියක් අඳිමු - කාලච්ඡේද 02

නිපුණතාව 3.0 : පාරිභාරික අවශ්‍යතා සඳහා නිර්මාණකරණයේ යෙදෙයි.

නිපුණතා මට්ටම 3.3 : නිර්මාණාත්මක සැරසිලි ඒකක භාවිත කර භාණ්ඩ සඳහා සැරසිලි නිර්මාණය කරයි.

ක්‍රියාකාරකම 3.3.1 : ''සාරි පල්ලුවක් අඳිමු''

කාලච්ඡේද සංඛ්‍යාව : 02 යි

ඉගැනුම් පල :
- සාරි පල්ලුවක සුවිශේෂ ලක්ෂණ විස්තර කරයි.
- විවිධ වූ පරිමාණයෙන් යුත් හැඩතල ගොනුකොට ඇඳීමට යොමුවෙයි.
- මනා සංයමයකින් යුතුව කාර්යයක නිරත වෙයි.
- හැඩතල ගැළපෙන ලෙස සකස් කිරීමෙන් ඇතිවන චමත්කාරය අගයයි.

ගුණාත්මක යෙදවුම් :
- සාරි පල්ලු මෝස්තර පින්තූර
- ගුණාත්මක ලක්ෂණ සහිත පල්ලුවකින් යුතු සාරියක්
- චිත්‍ර ඇඳීම සඳහා අවශ්‍ය උපකරණ

ක්‍රියකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :

පියවර 3.3.1.1 :
- සපයා ගන්නා ලද දෘශ්‍යාධාරකය සිසුන්ට ප්‍රදර්ශනය වන පරිදි පන්තියට රැගෙන එන්න.
- පහත දැක්වෙන කරුණු අවධාරණය කරමින් සාකච්ඡාව මෙහෙයවන්න.
  - සාරි පල්ලුව සාරියේ විශේෂ කොටසක් බව
  - මුළුතල සැරසිල්ලක් ලෙස භාවිත වන බව
  - එකම ඒකකයක් හෝ ඒකක කිහිපයක් භාවිත කළ හැකි බව
  - වර්ණ භාවිතය

(මිනිත්තු 15 යි)

පියවර 3.3.1.2 :
- සාරි පල්ලුවක් නිර්මාණය කිරීම සඳහා සිසුන් යොමු කරවන්න.
- නිර්මාණය කිරීමේ දී පහත දැක්වෙන ඒකක අභිමත පරිදි තෝරා ගැනීමට සිසුන්ට උපදෙස් දෙන්න.
  - ශාකමය හැඩතල
  - සත්ත්ව හැඩතල
  - ජ්‍යාමිතික හැඩතල
- එම හැඩතල නිර්මාණාත්මක ඒකකයක් ලෙස භාවිත කිරීමට මඟ පෙන්වන්න.
- නිර්මාණයට උචිත පරිදි ජ්‍යාමිතික උපකරණ භාවිත කිරීමට සිසුන්ට මග පෙන්වන්න.
- පාරිභාරික අවශ්‍යතාවට උචිත පරිදි සැරසිලි ඒකක භාවිතයට හා වර්ණ කිරීමට අවශ්‍ය උපදෙස් දෙන්න.
- නිම කෘති පන්ති කාමරයේ ප්‍රදර්ශනය කිරීමට සූදානම් කරවන්න.

(මිනිත්තු 50 යි)

පියවර 3.3.1.3 :

- සිසු නිර්මාණ පන්තියේ ප්‍රදර්ශනය කරවන්න.
- අහඹු ලෙස තෝරා ගත් සිසුන්ගේ නිම කෘති පිළිබඳ ස්වයං විවරණයකට අවස්ථාව ලබාදෙන්න.
- එම නිර්මාණ ඇගයීමට අනෙක් සිසුන් පොලඹවන්න.
- සිසු නිර්මාණ පිළිබඳ ප්‍රතිපෝෂණ සහ ඉදිරිපෝෂණ ලැබෙන පරිදි සමාලෝචනයක යෙදෙන්න.

(මිනිත්තු 15 යි)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

පහත සඳහන් කරුණු පදනම් කරගෙන ඇගයීම් හා තක්සේරුකරණයේ යෙදෙන්න.

- සාරි පල්ලුවක දැකිය හැකි ලක්ෂණ විස්තර කිරීම
- අභිමත මාතෘකාවක් චිත්‍රණය සඳහා තෝරා ගැනීම
- ජ්‍යාමිතික උපකරණ අවබෝධයෙන් යුතු ව භාවිත කිරීම
- අන් අයගේ නිර්මාණ ඇගයීමට ලක්කිරීම

♦ **පහත සඳහන් මාතෘකා යටතේ අනෙකුත් ක්‍රියාකාරකම් සැලසුම් කරගන්න.**

3.3.2 නිර්මාණාත්මක හැඩතල යොදා දොර රෙදි සඳහා සැරසිල්ලක් අඳිමු - කාලච්ඡේද 02

3.3.3 විදුලි මේස ලාම්පුවක් නිර්මාණය කරමු - කාලච්ඡේද 02

නිපුණතාව 4.0 : නිෂ්පාදන හා සේවා අවශ්‍යතා සඳහා ග්‍රැෆික් නිර්මාණ කරයි.

නිපුණතා මට්ටම 4.1 : විස්තීරණ තේමා යටතේ පෝස්ටර් චිත්‍ර නිර්මාණය කරයි.

ක්‍රියාකාරකම 4.1.1 : ''පෝස්ටර් චිත්‍රයක් නිර්මාණය කරමු.''

කාලච්ඡේද සංඛ්‍යාව : 03 යි

ඉගෙනුම් පල :
- පෝස්ටර් චිත්‍රයක තිබිය යුතු මූලික කරුණු විස්තර කරයි.
- විස්තීරණ තේමා ජනතාවට සන්නිවේදනය කිරීම සඳහා පෝස්ටර් චිත්‍ර උපයෝගී වන අවස්ථා සොයා බලයි.
- තෝරාගත් තේමාවක් යටතේ පොස්ටර් චිත්‍ර අඳියි.
- නිර්මාණය කර ගත් පෝස්ටර් චිත්‍රයට උචිත සංකේතාත්මක සහ අර්ථවත් ලෙස වර්ණ සහ තේමා භාවිත කරයි.
- නිර්මාණකරණයේ දී ද්‍රව්‍ය හා උපකරණ මනා සංයමයෙන් හසුරුවයි.

ගුණාත්මක යෙදවුම් :
- ඇමුණුම 4.1.1.1 ට ඇතුළත් ගවේෂණ/කාර්ය උපදෙස් පත්‍රිකා
- චිත්‍ර අඳින කඩදාසි, පිටපත් කරන කඩදාසි, පෝස්ටර් සායම්, පින්සල් පැන්සල්
- විවිධ තේමා යටතේ නිර්මාණය කළ පෝස්ටර් චිත්‍ර කිහිපයක්

ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :

පියවර 4.1.1.1 :
- විවිධ තේමාවන් යටතේ නිර්මාණය කළ පෝස්ටර් චිත්‍ර කිහිපයක් පන්තියේ ප්‍රදර්ශනය කරන්න.
- පහත සඳහන් කරුණු මතු කරමින් සිසුන් සමග සාකච්ඡා කරන්න.
  - පෝස්ටර් චිත්‍ර ග්‍රැෆික් චිත්‍ර ගණයට අයත් වීම
  - සිරස් හා තිරස් අතට නිර්මාණය කළ හැකි බව
  - පණිවුඩයේ වේගවත් බව පිළිබඳ සැලකිලිමත් වීම
  - සංකේතාත්මක සරල හැඩතල භාවිතය
  - අක්ෂර භාවිතයෙන් පණිවිඩය තීව්‍ර කළ හැකි වීම
  - අදහස නිරූපණය සඳහා වර්ණ උපයෝගී කර ගැනීම
  - මනා වූ නිමාවකින් යුක්ත වීම

(මිනිත්තු 15 යි)

පියවර 4.1.1.2 :
- ඇමුණුම 4.1.1.1 ට ඇතුළත් ගවේෂණ/කාර්ය උපදෙස් පත්‍රිකාව සිසුන්ගේ අවධානය යොමු කරන්න.
- චිත්‍ර අඳින කඩදාසි උපකරණ සිසුන්ට බෙදා දෙන්න.
- සුදුසු කාලීන විස්තීරණ තේමාවක් යටතේ පෝස්ටරයක් නිර්මාණය කිරීමට සිසුන් යොමු කරවන්න.

- නිර්මාණය අතරතුර සිසුන්ට අවශ්‍ය උපදෙස් මගපෙන්වීම් ලබා දෙන්න.
- නිර්මාණය කරන ලද පෝස්ටර් පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් කරන්න.

(මිනිත්තු 90 යි)

පියවර 4.1.1.3 :

- සිසුන්ගේ පෝස්ටර් චිත්‍ර පන්තියේ ප්‍රදර්ශනය කරවන්න.
- එම නිර්මාණ පිළිබඳ ව සිසුන්ට අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- පහත කරුණු මතු කරමින් තව දුරටත් සංවර්ධනය විය යුතු අංග පිළිබඳ සමාලෝචනයක යෙදෙන්න.
  - අදාළ තේමාවට සුදුසු වේගවත් සන්නිවේදන තේමා භාවිතය
  - හොඳ නිමාවකින් යුතු වීම
  - වචන ඉතා අඩුවෙන් අඩංගු වීම

(මිනිත්තු 15 යි)

**ඇගයීම් සහ තකසේරුකරණය සඳහා උපදෙස්**

පහත සඳහන් කරුණු පදනම් කරගෙන ඇගයීම් සහ තක්සේරුකරණයේ යෙදෙන්න.

- පෝස්ටර් චිත්‍රයක තිබිය යුතු මූලික කරුණු විස්තර කිරීම
- විස්තීරණ තේමා ජනතාවට සන්නිවේදනය කිරීම සඳහා පෝස්ටර් චිත්‍ර උපයෝගී වන අවස්ථා සොයා බැලීම
- නිර්මාණය කර ගත් පෝස්ටර් චිත්‍රයට උචිත සංකේත හා වර්ණ තේමාවට අර්ථවත් ලෙස භාවිත කිරීම
- නිර්මාණකරණයේ දී මනා සංයමයෙන් කටයුතු කිරීම
- අන් අයගේ නිර්මාණ අගයමින් රසවිඳීම

ඇමුණුම 4.1.1.1

## ගවේෂණ/කාර්ය උපදෙස් පත්‍රිකාව

- පන්තියේ ප්‍රදර්ශනය කරනු ලැබූ විවිධ තේමා යටතේ නිර්මාණය කරන ලද පෝස්ටර් චිත්‍ර වෙත ඔබේ අවධානය යොමු කරන්න.
- එම නිර්මාණවල දැකිය හැකි වර්ණ භාවිතය, සංකේත භාවිතය, තේමා යෙදා ගැනීම සරල බව හා ප්‍රකාශනයේ තීව්‍රතාව හොඳින් නිරීක්ෂණය කරන්න.
- තෝරාගත් කාලීන තේමාවකට සුදුසු සංකේතාත්මක රූප සඳහා දළ සටහන් අඳින්න.
- පැහැදිලි නිමාවක් සඳහා පිටපත් කිරීමේ කඩදාසියක් මගින් චිත්‍ර අඳින කඩදාසියට අදාළ සැලසුම පිටපත් කරගන්න.
- පණිවිඩය තීව්‍ර කිරීම සඳහා සුදුසු පරිදි අක්ෂර යොදන්න.
- අදාළ තේමාවට හොඳින් නිරූපණය වන සේ වර්ණ තෝරා චිත්‍රය වර්ණ කරන්න.
- පන්තියේ ප්‍රදර්ශනය සඳහා පෝස්ටර් චිත්‍ර සූදානම් කරන්න.

**නිපුණතාව 4.0** : **නිෂ්පාදන හා සේවා අවශ්‍යතා සඳහා ග්‍රැෆික් නිර්මාණ කරයි.**

**නිපුණතා මට්ටම 4.2** : **විවිධ නිෂ්පාදන හා සේවා ප්‍රචාරණය සඳහා ග්‍රැෆික් නිර්මාණ කරයි.**

**ක්‍රියාකාරකම 4.2.1** : **''දවටනයක් නිර්මාණය කරමු''**

**කාලච්ඡේද සංඛ්‍යාව** : **02 යි**

**ඉගෙනුම් පල** :
- දවටනයක තිබිය යුතු ප්‍රධාන ලක්ෂණ සාකච්ඡා කරයි.
- දවටනය මුද්‍රණයට සුදුසු අයුරින් නිම විය යුතු බව පිළිගනියි.
- දවටනයක් සැලසුම් කර වර්ණ ගන්වයි.
- නිර්මාණකරණයේ දී මනා සංයමයෙන් ක්‍රියා කරයි.
- අන් අයගේ නිර්මාණ අගයයි, රසවිඳියි.

**ගුණාත්මක යෙදවුම්** :
- ඇමුණුම අංක 4.2.1.1 ට ඇතුළත් ගවේෂණ/ කාර්ය උපදෙස් පත්‍රිකා
- චිත්‍ර අඳින කඩදාසි, පිටපත් කරන කඩදාසි, වර්ණ
- විවිධ භාණ්ඩ සඳහා භාවිත වන්නාවූ 'දවටන' ආදර්ශ කිහිපයක්

**ක්‍රියාකාරකම් සැලසුම් කිරීම සඳහා උපදෙස්:**

**පියවර 4.2.1.1** :
- විවිධ භාණ්ඩ සඳහා යොදාගන්නා ලද 'දවටන' කිහිපයක් පන්ති කාමරයේ ප්‍රදර්ශනය කරන්න.
- එම දවටන පිළිබඳ සිසුන් සමග සාකච්ඡා කරන්න.
  - – දවටන ග්‍රැෆික් සැලසුම් ගණයට අයත් බව
  - – දවටනයේ හැඩය හා ප්‍රමාණය
  - – ආකර්ශනීය සහ අර්ථාන්විත වීම
  - – සංකේතාත්මක සහ සරල බව
  - – නිෂ්පාදනයේ /සේවා අවශ්‍යතාව ප්‍රකාශ වීම
  - – වර්ණ හා අක්ෂර භාවිතයේ ස්වභාවය
- දවටනයට අඩංගු විය යුතු මූලික දෑ සාකච්ඡා කරන්න.
  - – නිෂ්පාදන ආයතනයේ හා වර්ගයේ නම
  - – මිල, බර, නිෂ්පාදිත දිනය
  - – කල් ඉකුත්වන දිනය
  - – ප්‍රමිති සහතිකය
- දවටනයක ආකර්ශනීයත්වය සහ නිමාව නිෂ්පාදනයේ ප්‍රචාරණයට විශාල මෙහෙයක් සිදු කරන බව පැහැදිලි කරන්න.

(මිනිත්තු 15 යි)

**පියවර 4.2.1.2** :
- ඇමුණුම 4.2.1.1 ට ඇතුළත් ගවේෂණ/කාර්ය උපදෙස් පත්‍රිකාව සිසුන් අතර බෙදා දෙන්න.
- අවශ්‍ය චිත්‍ර අඳින කඩදාසි, සායම් සිසුන්ට බෙදා දෙන්න.

- තමා අභිමත නිෂ්පාදනයක් සඳහා සුදුසු දවටනයක් නිර්මාණය කිරීමට සිසුන් යොමු කරවන්න.
- නිර්මාණකරණයේ දී සිසුන්ට අවශ්‍ය උපදෙස් සහ මග පෙන්වීම් ලබා දෙන්න.
- නිර්මාණය කරන ලද පෝස්ටර් පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් කරන්න. (මිනිත්තු 50 යි)

පියවර 4.2.1.3 :
- සිසුන්ගේ නිර්මාණ පන්තියේ ප්‍රදර්ශනය කරවන්න.
- එම නිර්මාණ පිළිබඳ සිසුන්ට ස්වයං ඇගයීමකට ඉඩ ලබාදෙන්න.
- පහත සඳහන් කරුණු පිළිබඳ අවධානය යොමු කරමින් සමාලෝචනයක යෙදෙන්න.
  - දවටනය අදාළ ආයතනයේ කාර්ය භාරයට ගැළපෙන හා සාර්ථක ප්‍රචාරණයක් සඳහා නිර්මාණශීලී විය යුතු වීම
  - පිරිසිදු හා පැහැදිලි නිමාවකින් යුතු වීම
  - මුද්‍රණය සඳහා සුදුසු වීම
  - විශාල කිරීමේ දී හෝ කුඩා කිරීමේ දී පැහැදිලි ව දර්ශනය වන සේ නිර්මාණය කිරීම

(මිනිත්තු 15 යි)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

පහත සඳහන් කරුණු පදනම් කරගෙන ඇගයීමේ හා තක්සේරුකරණයේ යෙදෙන්න.

- දවටනයක් නිර්මාණයේදී පිළිපැදිය යුතු මූලික පියවර විස්තර කිරීම
- නිෂ්පාදන ප්‍රවර්ධනයට උපකාර වන සේ දවටනය සඳහා හැඩතල භාවිත කිරීම
- මුද්‍රණයට සුදුසු පරිදි දවටනයක් සඳහා සැලසුමක් නිර්මාණය කිරීම
- අවශ්‍යතාවයට අනුව සුදුසු වර්ණ මාලාවක් යෙදීම

**ඇමුණුම 4.2.1.1**

## ගවේෂණ/ කාර්ය උපදෙස් පත්‍රිකාව

- ඔබට ඉදිරිපත් කරන ලද විවිධ 'දවටනයන් ' හොඳින් නිරීක්ෂණය කරන්න.
- එහි දක්නට ලැබෙන සුවිශේෂ අංග පිළිබඳ අවධානය යොමු කරන්න.
- ඔබට අභිමත නිෂ්පාදනයක් සඳහා සපයා දී ඇති කඩදාසිය මත දළ සටහනක් අඳින්න.
- එහිදී දවටනයක අඩංගු විය යුතු මූලිකාංග පිළිබඳ සැලකිලිමත් වන්න.
- මුද්‍රණ කාර්යයට සුදුසු වන ලෙස දවටනය සැලසුම් කරන්න.
- සරල බව, ආකර්ශනීය බව සහ නව්‍ය බවින් නිර්මාණය කිරීමට සැලකිලිමත් වන්න.
- සීමිත වර්ණ සංඛ්‍යාවක් මෙන්ම සුදුසු වර්ණ මාලාවක් භාවිත කිරීමට සැලකිලිමත් වන්න.
- අවශ්‍ය තැන්හි දී ගුරුතමාගේ උපදෙස් ලබා ගන්න.
- ඔබගේ නිර්මාණය පන්තියේ ප්‍රදර්ශනය සඳහා සූදානම් කරන්න.

♦ **පහත සඳහන් මාතෘකා යටතේ අනෙකුත් ක්‍රියාකාරකම් සැලසුම් කරගන්න.**

4.2.2 ඔබ කැමති මාතෘකාවක් යටතේ සුභපැතුම් පතක් නිමවන්න. - කාලච්ඡේද 03

4.2.3 දේශීය නිෂ්පාදනයක ඇසුරුම සඳහා සුදුසු ලේබලයක් නිමවන්න. - කාලච්ඡේද 02

නිපුණතාව 5.0 : විවිධ මාධ්‍ය භාවිතයෙන් කැටයම් හා මූර්ති නිර්මාණය කරයි.

නිපුණතා මට්ටම 5.1 : සාම්ප්‍රදායික සැරසිලි මූලාශ්‍ර භාවිතයෙන් උන්නත කැටයම් නිර්මාණය කරයි.

ක්‍රියාකාරකම 5.1.1 : "මල්, තුරුලතා සහ සත්ත්ව හැඩ කැටයම් කරමු."

කාලච්ඡේද සංඛ්‍යාව : 03 යි

ඉගෙනුම් පල :
- සාම්ප්‍රදායික සැරසිලි මූලාශ්‍ර භාවිතයෙන් සකසාගත් නිර්මාණාත්මක හැඩ සම්පිණ්ඩනාත්මක ව කැටයම් කරයි.
- උන්නත කැටයමක ශිල්පක්‍රම භාවිත කරයි.
- උපකරණ නිවැරදි ව හසුරුවයි.
- මාධ්‍ය භාවිත පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි.
- වර්ණ ගැන්වීමේ කුසලතාව ප්‍රදර්ශනය කරයි.

ගුණාත්මක යෙදවුම් :
- ඇමුණුම 5.1.1.1 ට ඇතුළත් ගවේෂණ/ කාර්ය උපදෙස් පත්‍රිකා
- ඩිමයි කඩදාසි, පැන්සල්, කාබන් කඩදාසි
  නෙළීම සඳහා අවශ්‍ය උපකරණ (Tools) - කුඩා ප්‍රමාණයේ තල සහ පිහි
- වර්ණ (රබර් පේන්ට්, බැනර් පේන්ට්)
- වැලි කඩදාසි (අංක 01), කාබන් කොළ
- අඩි 1 1/2 x අඩි 1 1/2 ප්‍රමාණය අඟල් 1/2, 3/4 හෝ 01 ඝනකම් රෙජිෆෝම් ෂීට්

ක්‍රියාකාරකම් සැලසුම් කිරීම සඳහා උපදෙස්:

පියවර 5.1.1.1 :
- ආදර්ශ උන්නත කැටයම පන්තියේ ප්‍රදර්ශනය කරන්න.
- එම නිර්මාණය පිළිබඳ සිසුන් සමඟ සාකච්ඡා කරමින් අදහස් විමසන්න.
- සාම්ප්‍රදායික සැරසිලි මෝස්තර අතර දැකිය හැකි මල්, තුරු, ලතා සහ සත්ත්ව රූ නිර්මාණාත්මක ව යොදා ගනිමින් උන්නත කැටයමක් නිම කළ හැකි බව පැහැදිලි කරන්න.
- නිවසක ආයතනයක හෝ සුවිශේෂ ස්ථානයක බිත්තියක් අලංකරණය සඳහා උන්නත කැටයම් භාවිත කළ හැකි බවට සිසුන් දැනුවත් කරන්න. (මිනිත්තු 15 යි)

පියවර 5.1.1.2 :
- 5.1.1.1 ට අදාළ ගවේෂණ /කාර්ය උපදෙස් පත්‍රිකා සිසුන්ට ලබාදෙන්න.
- දළ සටහන් ඇඳීමට ඩිමයි කඩදාසි සහ කාබන් කොළ පැන්සල් ලබාදෙන්න.
- තෝරාගත් දළසටහන රෙජිෆෝම් තලයේ ලකුණු කර ගැනීම සඳහා කාබන් කොළ ලබා දෙන්න.

- රෙජිෆෝම් කැපීම සඳහා අවශ්‍ය උපකරණ (පිහි) ලබාදෙන්න.
- කපාගත් කැටයම වැලිකඩදාසිය ආධාරයෙන් සුමට කර නිමහම් කර ගැනීමට උපදෙස් ලබාදෙන්න.
- වර්ණ ගන්වා අවසන් කිරීමට සිසුන් යොමු කරවන්න.
- නිම කළ කෘති පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් කරවන්න.

(මිනිත්තු 90 යි)

පියවර 5.1.1.3 :
- සිසු නිර්මාණ පන්ති කාමරයේ හෝ පාසල් පරිසරයේ සුදුසු ක්‍රමවේදයක් භාවිත කරමින් ප්‍රදර්ශනය කිරීමට කටයුතු කරන්න.
- සිසුන්ගේ නිර්මාණ ස්වයං ඇගයීමකට ඉඩ ලබාදෙන්න.
- ඉදිරිපත් කරන ලද නිර්මාණ පිළිබඳ ව අදහස් දැක්වීමට අනෙක් සිසුන් යොමු කරවන්න.
- නිර්මාණය පිළිබඳ සංවර්ධනාත්මක කරුණු මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.

(මිනිත්තු 15 යි)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

පහත සඳහන් කරුණු පදනම් කරගෙන ඇගයීමේ හා තක්සේරුකරණයේ යෙදෙන්න.

- උන්නත කැටයමක් නිර්මාණය කිරීමේ ක්‍රම ශිල්පය විස්තර කිරීම
- සාම්ප්‍රදායික සැරසිලි මූලාශ්‍ර නිර්මාණාත්මකව භාවිත කරමින් කැටයමක් සඳහා සැලසුම් ඇඳීම
- ප්‍රමාණත්වය පිළිබඳ සැලකිලිමත් වෙමින් හැඩතල කැටයම් කිරීම
- අවශ්‍යතාවට උචිත පරිදි උපකරණය භාවිත කිරීම
- නිර්මාණයට උචිත වර්ණ මාලාවක් භාවිත කිරීම
- මාධ්‍ය භාවිතය පිළිබඳව අවබෝධයෙන් නිර්මාණකරණයේ නියැළීම

ඇමුණුම 5.1.1.1

## ගවේෂණ/ කාර්ය උපදෙස් පත්‍රිකාව

- ඔබට ඉදිරිපත් කර ඇති ආදර්ශ උන්නත කැටයම හොඳින් නිරීක්ෂණය කරන්න.
- එහි දක්නට ලැබෙන හැඩ, වර්ණ, නිමාව, මාධ්‍ය, ත්‍රිමාන බව හොඳින් නිරීක්ෂණය කරන්න.
- ලබා දී ඇති කඩදාසි භාවිත කර ඒ මත තුරු, මල්, වැල් සහ සත්ත්ව හැඩ යොදා බිත්ති සැරසිල්ලක් සඳහා දළ සටහන් අඳින්න.
- ඇඳගත් දළ සටහන කාබන් කොළයක ආධාරයෙන් රෙජිෆෝම් තලයට පිටපත් කරන්න.
- සපයා දී ඇති පිහිතල ඇතුළු උපකරණ භාවිත කරමින් අවශ්‍ය හැඩතල මතුවන පරිදි අනවශ්‍ය කොටස් කපා දමමින් කෘතිය නිම කරන්න.
- කපා මතුකර ගත් නිර්මාණය, වැලිකඩදාසියක ආධාරයෙන් අවශ්‍ය ප්‍රමාණයට සුමට කරගන්න.
- පළමු ව ඇතුළට ගිය කොටස් තද පැහැයෙන් ද ඉහළට මතු වූ කොටස් ක්‍රම ක්‍රමයෙන් ළා පැහැය යොදා වර්ණ කරන්න.
- වර්ණ කර අවසන් වූ පසු නිර්මාණය පන්තියට ඉදිරිපත් කරන්න.

නිපුණතාව 5.0 : විවිධ මාධ්‍ය භාවිතයෙන් කැටයම් හා මූර්ති නිර්මාණය කරයි.

නිපුණතා මට්ටම 5.2 : ඇඹීමේ ශිල්ප ක්‍රමය භාවිතයෙන් මිනිස් රූ නිර්මාණය කරයි.

ක්‍රියාකාරකම 5.2.1 : "මානව රූ සම්පිණ්ඩනයක්"

කාලච්ඡේද සංඛ්‍යාව : 03 යි

ඉගෙනුම් පල :
- මාධ්‍යයෙහි විවිධතා හඳුනාගෙන විස්තර කරයි.
- මාධ්‍ය භාවිතය පිළිබඳ කුසලතාව ප්‍රදර්ශනය කරයි.
- උපකරණ නිවැරදි ව භාවිත කරයි.
- නිමහම් කිරීමේ සහ වර්ණ කිරීමේ කුසලතාව ප්‍රදර්ශනය කරයි.
- අන් නිර්මාණ රසවිඳිමින් අගයයි.

ගුණාත්මක යෙදවුම් :
- ඇමුණුම 5.2.1.1 ට ඇතුළත් ගවේෂණ/කාර්ය උපදෙස් පත්‍රිකා
- ආදර්ශ මූර්ති කිහිපයක්, මූර්ති කිහිපයක්, ඡායාරූප, දළ සටහන්, පින්තූර
- ඩිමයි කඩදාසි, පැන්සල්, මකන, ලී තහඩු (2 x 3 x 30cm) පදම් කළ මැටි, ඇඹීම සඳහා අවශ්‍ය උපකරණ (Tools), වර්ණ (රබර් පේන්ට්, බැනර් පේන්ට්, ලැකර්), පින්සල්, වර්ණ දැමීමට භාජන, කම්බි කුරක්,

ක්‍රියාකාරකම් සැලසුම් කිරීම සඳහා උපදෙස්:

පියවර 5.2.1.1 :
- ආදර්ශ මූර්තිය, ඡායාරූප පන්තියට ප්‍රදර්ශනය කරන්න.
- නිර්මාණ පිළිබඳ ව සිසුන් සමඟ සාකච්ඡා කර අදහස් විමසන්න.
- පදම් කළ මැටි භාවිතයෙන් සාර්ථක මූර්ති නිර්මාණයක් කළ හැකි බව විස්තර කරන්න.
- සිමෙන්ති, ෆයිබර් වැනි ස්ථාවර මාධ්‍යයක් භාවිත කර නිර්මාණය කරන ප්‍රමාණයෙන් විශාල මූර්ති, ගෙමිදුල හෝ උද්‍යාන අලංකාරවත් කිරීමට හැකි බව පැහැදිලි කරන්න.
- මූර්ති නිර්මාණයක ත්‍රිමානත්වය පිළිබඳ සැලකිලිමත් විය යුතු බව පැහැදිලි කරන්න.

(මිනිත්තු 15 යි)

පියවර 5.2.1.2 :
- ඇමුණුම 5.2.1.1 ට අදාළ ගවේෂණ/ කාර්ය උපදෙස් පත්‍රිකාව සිසුන්ට ලබාදෙන්න.
- දළ සටහන් ඇඳීමට මඟ පෙන්වා අවශ්‍ය උපකරණ ලබාදෙන්න.
- මූර්තිය නිර්මාණය කිරීම සඳහා මානව රූප සංරචනයකට දළ සටහන් අඳින්න.
- ලී තහඩු සහ කම්බි ලබාදෙන්න.
- පදම් කළ මැටි සහ අවශ්‍ය උපකරණ (Tools) කණ්ඩායමට ලබා දෙන්න.

- දළ සටහන ඇසුරින් මූර්තිය ගොඩනැගීමට යොමු කරවන්න.
- එහිදී පරිමාණය සහ රිද්මය ඉරියව් නිරූපණයේදී ඉතා වැදගත් බව අවධාරණය කරන්න කරන්න.
- මූර්තියේ පිටතට විහිදී යන කොටස් අවම කරගනිමින් සමස්ත හැඩයක් ලෙස මූර්ති උපාංග යොදා ගැනීම වැදගත් බව පැහැදිලි කරන්න.
- මූර්තියේ ගති ලක්ෂණ මතුවීම සඳහා ඉහළට හා ඉදිරියට නෙරා ගිය කොටස් හොඳින් පෙන්විය යුතු බව පැහැදිලි කරන්න.
- සෑම කෝණයකටම මූර්තියේ ගති ලක්ෂණ හොඳින් දර්ශනය විය යුතු අයුරින් ගොඩනැගීම වැදගත් බව අවධාරණය කරන්න.
- නිර්මාණ පන්තියේ ප්‍රදර්ශනය කිරීමට සූදානම් කරවන්න.

(මිනිත්තු 90 යි)

පියවර 5.2.1.3 :

- සිසු නිර්මාණ පන්තියට ඉදිරිපත් කිරීමට ඉඩ සලස්වන්න.
- සිසුන්ගේ නිර්මාණ පිළිබඳ ස්වයං ඇගයීමකට අවස්ථාව සලසා දෙන්න.
- සංවර්ධනාත්මක අදහස් සහිත ඇගයීම් අවස්ථාවකට අනෙක් සිසුන් යොමු කරවන්න.
- සිසු නිර්මාණවල මූර්තිමය සිද්ධාන්ත ලක්ෂණ මතුකරමින් සමාලෝචනයක යෙදෙන්න.

(මිනිත්තු 15 යි)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

පහත සඳහන් කරුණු පදනම් කරගෙන ඇගයීමේ හා තක්සේරුකරණයේ යෙදෙන්න.

- මූර්ති ඇඹීමේ දී අනුගමනය කළයුතු පියවර විස්තර කිරීම
- මූර්ති විවිධ මාධ්‍යයෙන් කළ හැකි බව පැහැදිලි කිරීම
- මැටි මාධ්‍ය භාවිතයෙන් මූර්තියක් නිර්මාණය කිරීම හා වර්ණ ගැන්වීම
- උපකරණ නිවැරදි ව භාවිත කිරීම

## ගවේෂණ/ කාර්ය උපදෙස් පත්‍රිකාව

- පන්තියේ ප්‍රදර්ශනය කරනු ලැබූ ආදර්ශ මූර්තියේ දක්නට ලැබෙන හැඩතල, ඉරියව්, ත්‍රිමාන බව, පරිමාණය, මාධ්‍ය භාවිතය වැනි ලක්ෂණ හොඳින් නිරීක්ෂණය කරන්න.
- ලබා දී ඇති කඩදාසියේ ඔබ අභිමත ක්‍රම ශිල්පයකට අනුව විවිධ ඉරියව් සහිත මානව රූප සම්පිණ්ඩනයක් දළ සටහනක් අඳින්න.
- පදම් කළ මැටි සකස් කරගන්න.
- පාදම ලෙස ලෑල්ල යොදා ගනිමින් මූර්තිය සඳහා සුදුසු, ඔබ ඇඳගත් දළ සටහන ඇඹීම සඳහා ආරම්භ කරන්න.
- මූර්ති ඇඹීමේ දී එහි උස ප්‍රමාණය 30cm ක් ලෙස තීරණය කරන්න.
- මූර්තිය ඇඹීමේ දී කම්බිය මැටිවලට සවි වීම වැළැක්වීම සඳහා විටින් විට කරකවන්න.
- පරිමාණය, රිද්මය, සමබරතාව, ඉරියව්, හැඟීම් ප්‍රකාශනය පිළිබඳ සැලකිලිමත් වෙමින් මූර්තිය ගොඩනගන්න. එහිදී ඔබට අභිමත ශෛලියකට අනුව මානව රූ නිර්මාණය කිරීමට හැකි ය.
- මූර්තියේ සියුම් කොටස් මතුකර ගැනීම සඳහා උපකරණ භාවිත කරන්න.
- නිම කළ කෘතිය පවනේ වියළීමට තබන්න.
- ඔබගේ නිර්මාණය පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් කරන්න.

නිපුණතාව 6.0 : ආගමික හා සංස්කෘතික අංග, දෙස්, විදෙස් තෝරාගත් ශිල්පීන්ගේ කලා නිර්මාණ, අද්‍යතන දෘශ්‍ය කලා කෘති හා ජනමාධ්‍ය ඇසුරින් හඳුනාගත් කලා නිර්මාණ විචාරශීලී ව රසාස්වාදයට ලක් කරමින් ස්වතන්ත්‍ර නිර්මාණ සඳහා භාවිතයට ගනියි.

නිපුණතා මට්ටම 6.1 : තෝරාගත් දේශීය ශිල්පීන්ගේ නිර්මාණ රසාස්වාදය කරයි.

ක්‍රියාකාරකම 6.1.1 : ''මුදලිඳු ඒ. සී. ජී. එස්. අමරසේකර ශිල්පියාගේ නිර්මාණ අගයමු''

කාලච්ඡේද සංඛ්‍යාව : 01 යි

ඉගෙනුම් පල :
- මුදලිඳු අමරසේකර ශිල්පියාගේ නිර්මාණ නම් කරයි.
- නිර්මාණවල ශිල්ප ක්‍රම සොයා බලයි.
- නිර්මාණ සඳහා පදනම් වූ ශෛලිය හා ආභාස විමසා බලයි.
- නිර්මාණ ආශ්‍රිත ව සංරචන ක්‍රම හා සිද්ධාන්ත ලක්ෂණ විස්තර කරයි.
- මුදලිඳු අමරසේකර ශිල්පියාගේ චිත්‍රවල කලා ලක්ෂණ ඇගයීමට ලක් කරයි.

ගුණාත්මක යෙදවුම් :
- මුදලිඳු ඒ. සී. ජී. එස්. අමරසේකර ශිල්පියාගේ වර්ණ චිත්‍ර
  - යකැදුරාගේ දියණිය
  - විරැකියාව (Unemployed)
- ඇමුණුම 6.1.1.1 ට ඇතුළත් කාර්ය පත්‍රිකාව
- ඇමුණුම 6.1.1.2 ට ඇතුළත් කියවීම් පත්‍රිකාව

ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :

පියවර 6.1.1.1 :
- මුදලිඳු ඒ. සී. ජී. එස්. අමරසේකර ශිල්පියාගේ චිත්‍ර සිසු අවධානයට යොමු කරවන්න.
- එම සිතුවම්වල වස්තු විෂයය, ශෛලිය හා සංරචන ලක්ෂණ සිසුන්ගෙන් විමසන්න.
- ශාස්ත්‍රාලයීය චිත්‍ර කලා ලක්ෂණ සහිත සාමාන්‍ය මිනිස් ජීවිත අත්දැකීම් ඇඳ ඇති ආකාර විමසන්න.

(මිනිත්තු 10 යි)

පියවර 6.1.1.2 :
- ඇමුණුම 6.1.1.1 ට ඇතුළත් කාර්ය පත්‍රිකාව සිසුන්ට ලබා දෙන්න.
- ඇමුණුම 6.1.1.2 ට ඇතුළත් කියවීම් පත්‍රිකාව අධ්‍යයනය කිරීමට සිසුන් යොමු කරවන්න.

- කියවීම් පත්‍රිකාව ඇසුරෙන් ප්‍රශ්නාවලියට පිළිතුරු සැපයීමට සිසුන්ට උපදෙස් දෙන්න.

(මිනිත්තු 20 යි)

**පියවර 6.1.1.3** :

- සිසුන්ගේ පිළිතුරු පත් එකිනෙකා අතර හුවමාරු කරගනිමින් ඇගයීමට සලස්වන්න.
- අනාවරණය කරගත් පිළිතුරු පිළිබඳ සිසු අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදෙන්න.
- මුදලිඳු ඒ. සී. ජී. එස්. අමරසේකර ශිල්පියාගේ නිර්මාණ පිළිබඳ සමාලෝචනයක යෙදෙන්න.

(මිනිත්තු 10 යි)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

පහත සඳහන් කරුණු පිළිබඳ අවධානය යොමු කරමින් ඇමුණුම 6.1.1.1 හා ඇමුණුම 6.1.1.2 පදනම් කරගෙන ඇගයීම හා තක්සේරුකරණ ක්‍රියාවලියේ යෙදෙන්න.

- මුදලිඳු ඒ. සී. ජී. එස්. අමරසේකර ශිල්පියාගේ සිතුවම් නම් කිරීම
- ඔහුගේ නිර්මාණාත්මක ශෛලීය ලක්ෂණ විස්තර කිරීම
- මුදලිඳු ඒ. සී. ජී. එස්. අමරසේකරගේ සිතුවම්වලට යුරෝපීය ශාස්ත්‍රාලයීය චිත්‍ර කලා සිද්ධාන්ත බලපා ඇති ආකාරය විස්තර කිරීම
- මුදලිඳු ඒ. සී. ජී. එස්. අමරසේකර ශිල්පියාගේ චිත්‍ර නිර්මාණවල සුවිශේෂතා හා කලා ලක්ෂණ විස්තර කිරීම

ඇමුණුම **6.1.1.1**

## කාර්ය පත්‍රිකාව

- ඔබට ඉදිරිපත් කර ඇති මුදලිඳු ඒ. සී. ජී. එස්. අමරසේකර ශිල්පියාගේ නිර්මාණ හොඳින් නිරීක්ෂණය කරන්න.
- ඔබට සපයා ඇති කියවීම් පත්‍රිකාව හොඳින් අධ්‍යයනය කරන්න.
- මුදලිඳු ඒ. සී. ජී. එස්. අමරසේකරගේ නිර්මාණවල පවතින සුවිශේෂ ලක්ෂණ හඳුනාගන්න.
- පහත සඳහන් ක්‍රියාකාරකම්හි නිරතවන්න.
    1. මුදලිඳු ඒ. සී. ජී. එස්. අමරසේකර පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.
    2. පහත සඳහන් කරුණු යටතේ මුදලිඳු ඒ. සී. ජී. එස්. අමරසේකරගේ නිර්මාණ අගයන්න.
        i. තේමාව
        ii. ශෛලිය
        iii. ආභාස
        iv. ශිල්ප ක්‍රමය
        v. කලා ලක්ෂණ - රූප භාවිතය
            - වර්ණ භාවිතය
            - තලය භාවිතය
            - භාව ප්‍රකාශන
- ඔබගේ අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් කරගන්න.

ඇමුණුම 6.1.1.2

## කියවීම් පත්‍රිකාව

**මුදලිඳු ඒ. සී. ජී. එස්. අමරසේකර (1883 - 1983)**

- මුදලිඳු ඒ. සී. ජී. එස්. අමරසේකර 20 වන සියවස මුල් භාගයට අයත් ලාංකේය ශාස්ත්‍රාලයීය යථාර්ථවාදී (Academic Realism) චිත්‍ර කලාවේ පුරෝගාමී ව කටයුතු කළ චිත්‍ර ශිල්පියෙකි.
- වර්ෂ 1883 දී ගාල්ල දොඩන්දූවේ උපත ලද මුදලිඳු ඒ. සී. ජී. එස්. අමරසේකර (ඒබ්‍රහම් ක්‍රිස්ටෝපර් ග්‍රෙගරි සූරියආරච්චි අමරසේකර) පළමු ව නිර්මාණකරණයට පිවිසෙන්නේ කාටූන් චිත්‍ර ශිල්පියකු වශයෙනි.
- බ්‍රිතාන්‍ය පාලකයින්ගේ අනුග්‍රහය යටතේ ස්ථාපිත කළ ලංකා කලා සංගමයේ (Ceylon Society of Arts) පුරෝගාමී ශිල්පියකු ලෙස කටයුතු කර ඇත.
- ශ්‍රී ලංකාව යටත් විජිතයක් ව පැවති වකවානුවක බ්‍රිතාන්‍යයෙන් පැමිණි ශිල්පීන්ගෙන් ලබා ගත් ශාස්ත්‍රාලයීය චිත්‍ර කලා ආභාස, ලංකා කලා සංගමයේ ශිල්පීන්ගේ නිර්මාණවල විය.
- මුදලිඳු ඒ. සී. ජී. එස්. අමරසේකරගේ චිත්‍ර නිර්මාණවල බ්‍රිතාන්‍ය ශාස්ත්‍රාලයීය යථාර්ථවාදී චිත්‍ර කලා ශෛලී ලක්ෂණ පෙන්වයි.
- ජීව රූප, තාත්වික රූප සහ භූමි දර්ශන ඇඳීමෙහි දක්ෂයකු වන ඔහු චිත්‍ර නිර්මාණය කිරීම සඳහා දිය සායම් හා තෙල්සායම් යන වර්ණ මාධ්‍ය දෙවර්ගය ම භාවිත කර ඇත.
- මිනිස් රූප සම්පිණ්ඩන චිත්‍රවල බ්‍රිතාන්‍ය ශාස්ත්‍රාලයීය චිත්‍රකලාවේ ප්‍රමුඛතම ලක්ෂණයක් වූ පර්යාලෝක රීතිය පදනම් වී තිබීම දැකිය හැකි ය.
- ත්‍රිමාන ලක්ෂණ සහිත වර්ණ භාවිතය සමග ආලෝකය හා අඳුර පිළිබඳ ශාස්ත්‍රාලයීය ඥානය වන කියරොස්කුරො (Chiaroscuro) වර්ණ කිරීමේ ලක්ෂණ ඔහුගේ නිර්මාණ තුළ දැකිය හැකි විය.
- මුදලිඳු ඒ. සී. ජී. එස්. අමරසේකර විසින් කරන ලද නිර්මාණ කිහිපයක් ද පහත සඳහන් වේ.
    - විරැකියාව
    - යකැදුරාගේ දියණිය
    - පූස් පැටවා
    - රීඩ් මාවත (දිය සායම්)
    - රාජ්‍ය නායකයන්ගේ උඩුකය චිත්‍ර (ආලේඛ්‍ය චිත්‍ර)

## යකැදුරාගේ දියණිය



- වර්තමානයේ කොළඹ ජාතික කලාභවනේ නිත්‍ය ප්‍රදර්ශනයට තබා ඇති යකැදුරාගේ දියණිය නමැති සිතුවම කැන්වසය මත තෙල් සායම් මාධ්‍ය භාවිතයෙන් කරන ලද නිර්මාණයක් වේ.
- මෙම චිත්‍රය තුළින් නිරූපණය කර ඇත්තේ යකැදුරුගේ දියණිය යි. ඇය බලි ශාන්ති කර්මවල ඇඳුම් අයිත්තම් ඇඳ පැලඳ සිටින අතර ක්ෂණික ව බියට පත් වූ ආකාරය ද දක්වයි.
- අභ්‍යන්තර හැඟීම් නිරූපණය කරන යථාර්ථවාදී ශෛලීය ලක්ෂණ හා විස්මයජනක, ගූඪ තේමාවක් වස්තු විෂයය කරමින් නිර්මාණයේ ප්‍රකාශනය ගොඩනගා ඇත.
- චිත්‍රයේ නිරූපිත ගිනි සිළුව මෙන් ම ඇගේ මුහුණේ හැඟීම් හා සැසඳෙන ලෙස නිර්මාණය කර ඇති වෙස් මුහුණත්, විශාල හෙවනැල්ලත් සමස්ත නිර්මාණයේ ප්‍රකාශනශීලීත්වය හා  නාට්‍යානුසාර බව තීව්‍ර කරවයි.
- රූප හා වර්ණ අර්ථාන්විත ව භාවිත කරමින් මෙහි පෙරබිම මත ප්‍රධාන රූපය වන යකැදුරු දියණිය හා පසුබිම සඳහා නිවසේ අභ්‍යන්තර බිත්තියක සීමාව නිරූපණය කිරීම දැකිය හැකි ය.
- නිරූපිත වර්ණමාලාව කියරොස්කුරෝ (Chiaroscuro) ශිල්ප ක්‍රමය අනුව ආලෝකය හා අඳුර මනාලෙස මතු කර දක්වන ආකාරය දැකිය හැකි වේ.
- යොදා ඇති වර්ණ ඒකවාර්ණික ලක්ෂණ ඇති සම්භාව්‍ය වර්ණමාලාවක් වේ.
- වර්ණ භාවිතය තුළ අඳුර හා ආලෝකය හසුරුවනු ලැබ ඇත්තේ චිත්‍රයේ සමස්ත අදහස වඩාත් ඉස්මතු කරවන ලෙසිනි.

## විරැකියාව (Unemployed)



- මුදලිඳු ඒ. සී. ජී. එස්. අමරසේකර විසින් විරැකියාව නමින් නම් කර ඇති මෙම සිතුවම වඩාත් ප්‍රසිද්ධියට පත්ව ඇත්තේ වඩුවාගේ ගෙදර යනුවෙනි.
- මෙම සිතුවම කොළඹ ජාතික කලාභවනේ නිත්‍ය ප්‍රදර්ශනයට තබා ඇති තෙල් සායම් මාධ්‍යයෙන් නිර්මිත කැන්වස් නිර්මාණයකි.
- මෙම සිතුවමෙන් වඩු ගෙදර ඇති දරිද්‍රතාව මතු කිරීම සඳහා ඉතා මැනවින් මානව රූප හා වර්ණ හැසිරවීම දැකිය හැකි ය.
- ජනේලයෙන් නිවසට ලැබෙන ආලෝකය ඉතා ස්වභාවික ලෙස මතු කර දක්වා ඇත. එම ආලෝකයෙන් වඩුගෙදර නිවැසියන්ගේ මුහුණුවල ජනනය වන හැඟීම් ඉතා මැනවින් නිරූපණය කර ඇත.
- ජනේල කවුලුවෙන් දක්වන ආලෝකයේ ස්වභාවය, කියරොස්කුරො (Chiaroscuro) වර්ණ ලක්ෂණවලට අනුව ත්‍රිමාන ලක්ෂණ සහිත ව භාවිත කර තිබීම දැකිය හැකි ය.
- සිතුවමේ දැක්වෙන වර්ණ ඒකවාර්ණික ලක්ෂණ ඇති සම්භාව්‍ය වර්ණමාලාවක් වේ.
- ශාස්ත්‍රාලයීය යථාර්ථවාදී ශෛලීය ලක්ෂණ අනුව යමින් මානව රූපයේ සුන්දරත්වය මෙන්ම අභ්‍යන්තර හැඟීම් ප්‍රකාශනයත් මෙම නිර්මාණයෙන් මනාව පිළිබිඹු කෙරේ.
- නිර්මාණ අවකාශය මත ගැඹුර දක්වමින් පර්යාලෝක ලක්ෂණ සහිත ව පෙරබිම, මැදබිම හා පසුබිම යන තල, පර්යාලෝක ලක්ෂණවලට අනුගත වෙමින් වර්ණ හා හැඩතල සම්පිණ්ඩනය කර ඇත.

**නිපුණතාව 6.0** : **ආගමික හා සංස්කෘතික අංග, දෙස්, විදෙස් තෝරාගත් ශිල්පීන්ගේ කලා නිර්මාණ, අද්‍යතන දෘශ්‍ය කලා කෘති හා ජනමාධ්‍ය ඇසුරෙන් හඳුනාගත් කලා නිර්මාණ විචාරශීලී ව රසාස්වාදයට ලක් කරමින් ස්වතන්ත්‍ර නිර්මාණ සඳහා භාවිතයට ගනියි.**

**නිපුණතා මට්ටම 6.1** : **තෝරාගත් දේශීය ශිල්පීන්ගේ නිර්මාණ රසාස්වාදය කරයි.**

**ක්‍රියාකාරකම 6.1.2** : **''ස්ටැන්ලි අබේසිංහ ශිල්පියාගේ සිතුවම් අගයමු''**

**කාලච්ඡේද සංඛ්‍යාව** : **01 යි**

**ඉගෙනුම් පල** :
- ස්ටැන්ලි අබේසිංහ ශිල්පියාගේ චිත්‍ර නිර්මාණ නම් කරයි.
- ඔහුගෙන් කලාවට සිදු වූ සේවය විමසා බලයි.
- නිර්මාණ සඳහා පදනම් වූ චිත්‍ර මූලිකාංග හා සංරචන සිද්ධාන්ත ලක්ෂණ විස්තර කරයි.
- ස්ටැන්ලි අබේසිංහ ශිල්පියාගේ චිත්‍රවල කලා ලක්ෂණ රස විඳිමින් ඇගයීමට ලක් කරයි.

**ගුණාත්මක යෙදවුම්** :
- ස්ටැන්ලි අබේසිංහ චිත්‍ර ශිල්පියාගේ වර්ණ සිතුවම්
  - කුඹල් හල
  - පෙරහැර
- ඇමුණුම 6.1.2.1 ට ඇතුළත් කාර්ය පත්‍රිකාව
- ඇමුණුම 6.1.2.2 ට ඇතුළත් කියවීම් පත්‍රිකාව

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පියවර 6.1.2.1** :
- ස්ටැන්ලි අබේසිංහ ශිල්පියාගේ වර්ණ සිතුවම් දැක්වෙන පින්තූර සිසු අවධානය යොමු කරවන්න.
- එම සිතුවම්වල ආභාස, වස්තු විෂයය, ශෛලිය පිළිබඳ සිසුන්ගෙන් විමසන්න.

(මිනිත්තු 10 යි)

**පියවර 6.1.2.2** :
- ඇමුණුම 6.1.2.1 කාර්ය පත්‍රිකාව සිසුන්ට ලබා දෙන්න.
- ඇමුණුම 6.1.2.2 ට ඇතුළත් කියවීම් පත්‍රිකාව කියවීමට සලස්වන්න.
- කියවීම් පත්‍රිකාව ඇසුරින් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට සිසුන්ට සහායවන්න.

(මිනිත්තු 20 යි)

**පියවර 6.1.2.3** :
- අහඹු ලෙස තෝරාගත් සිසුන් කිහිපදෙනෙකුගේ, පිළිතුරු පත් ඇගයීමට ලක් කරන්න.

- එක්රැස්කරගත් තොරතුරු හා සිසුන්ගේ පිළිතුරු සැලකිල්ලට ගනිමින් සමාලෝචනයක යෙදෙන්න.

(මිනිත්තු 10 යි)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

පහත සඳහන් කරුණු පිළිබඳ අවධානය යොමු කරමින් ඇමුණුම 6.1.2.1 හා ඇමුණුම 6.1.2.2 පදනම් කරගෙන ඇගයීම හා තක්සේරුකරණ ක්‍රියාවලියේ යෙදෙන්න.

- ස්ටැන්ලි අබේසිංහ ශිල්පියාගේ සිතුවම් නම් කිරීම
- සිතුවම් නිර්මාණය සඳහා ස්ටැන්ලි අබේසිංහ ශිල්පියාට ලැබුණ ආභාස විස්තර කිරීම
- එම නිර්මාණවල ශෛලීය ලක්ෂණ පැහැදිලි කිරීම
- ස්ටැන්ලි අබේසිංහ ශිල්පියාගේ සිතුවම්වල කලා ලක්ෂණ රසවිඳිමින් ඇගයීමට ලක් කිරීම

ඇමුණුම 6.1.2.1

## කාර්ය පත්‍රිකාව

- ස්ටැන්ලි අබේසිංහ ශිල්පියාගේ නිර්මාණ හොඳින් නිරීක්ෂණය කරන්න.
- ඔබට සපයා ඇති කියවීම් පත්‍රිකාව හොඳින් අධ්‍යයනය කරන්න.
- පහතින් දක්වා ඇති ක්‍රියාකාරකම්වල නිරතවන්න.
    1. ස්ටැන්ලි අබේසිංහ ශිල්පියා පිළිබඳ කෙටි විස්තරයක් කරන්න.
    2. පහත සඳහන් කරුණු සැලකිල්ලට ගනිමින් ස්ටැන්ලි අබේසිංහ ශිල්පියාගේ නිර්මාණ ඇගයීමට ලක් කරන්න.
        - i. තේමාව
        - ii. ශෛලීය
        - iii. ආභාස
        - iv. ශිල්ප ක්‍රමය
        - v. කලා ලක්ෂණ
            - රූප භාවිතය
            - වර්ණ භාවිතය
            - රේඛාකරණය
            - තලය භාවිතය
            - භාව ප්‍රකාශනය
- ඔබගේ අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් කර ගන්න.

ඇමුණුම 6.1.2.2

## කියවීම් පත්‍රිකාව

**ස්ටැන්ලි අබේසිංහ (1914 - 1992)**

- 1914 දී උපත ලැබූ ස්ටැන්ලි අබේසිංහ විසිවන සියවසේ නූතන කලා ඉතිහාසයේ මුල් කාලීන ව බිහි වූ ප්‍රතිභාපූර්ණ චිත්‍ර ශිල්පියෙකි.
- ලංකා කාර්මික විද්‍යාලයේ චිත්‍ර කලාව හැදෑරූ ඔහු ඉන්දියාවට ගොස් පෙරදිග චිත්‍ර කලාව හා එංගලන්තයේ දී යුරෝපීය නූතන චිත්‍ර කලාව අධ්‍යයනය කරනු ලබයි.
- පෙරදිග හා අපරදිග විවිධ කලා ආභාස ඇසුරින් තමන්ට ආවේණික නව චිත්‍ර කලා සම්ප්‍රදායයක් ඇති කිරීමට මූලික වූ පෙරටුගාමී ශිල්පියෙකි.
- රජයේ ලලිත කලායතනයේ ගුරුවරයකු ලෙස ද, 1965-1969 කාලය තුළ එහි කලායතනාධිපති ලෙස ද කටයුතු කර ඇත.
- එම කාලය තුළ 43 කණ්ඩායමේ නූතනවාදී ප්‍රකාශනයට සමගාමී ව නූතනවාදී කලා භාවිතය සහිත නව කලා ප්‍රවණතාවක් රජයේ ලලිතකලා ආයතනයේ ගොඩනැගීමට මූලික වූ පුරෝගාමියා ලෙස ද සැලකේ.
- ස්ටැන්ලි අබේසිංහ ශිල්පියාගේ නිර්මාණ සඳහා සාම්ප්‍රදායික කලාවේ ශෛලිගත හැඩ, පශ්චාත් උපස්ථිතිවාදී හා ප්‍රකාශනවාදී චිත්‍ර කලා ප්‍රවණතාවේ වර්ණ භාවිතය ආභාසය වී ඇත.
- නිර්මාණවල පසුබිම සඳහා සනිකවාදී කලාවේ පසුබිම් අවකාශ ලක්ෂණ ආභාස කර තිබීම දැකිය හැකි වේ.
- කෙටි, ඝන රේඛා භාවිතය ද ඔහුගේ නිර්මාණවල දැකිය හැකි සුවිශේෂ ලක්ෂණයක් වේ.
- ස්ටැන්ලි අබේසිංහ ශිල්පියා විසින් කරන ලද නිර්මාණ කිහිපයක් පහත දැක්වේ.
  - වළං කඩේ/ කුඹල් හල
  - ඇසළ පෙරහැර
  - භාවනාව
  - බාල තරුණ (Young and Infant)
  - ලක්ෂ්මීගේ උපත

## කුඹල් හල



- ස්ටැන්ලි අබේසිංහ ශිල්පියා විසින් නිර්මාණය කරන ලද කුඹල් හල නැමති සිතුවම ඔහුගේ නූතනවාදී කලා භාවිතයේ සුවිශේෂ නිර්මාණයක් වේ.
- මැටි භාජන විකුණුම් හලක් හා යුවලක් මින් නිරූපිත ය.
- පර්යාලෝක ලක්ෂණ රහිත අවකාශයක් භාවිත වීම මෙම නිර්මාණයේ කැපීපෙනෙන ලක්ෂණයකි. මෙම සම්පිණ්ඩනයේ පෙරබිම හා පසුබිම එකම තලයක නිරූපිත ය.
- චිත්‍රයේ ගැඹුර හා ත්‍රිමානත්වය පෙන්වන්නේ ස්වභාව ධර්මයට සාපේක්ෂව නොව යොදන ලද වර්ණ කිරීමේ ශිල්ප ක්‍රමයෙනි.
- අඳුරු හා ආලෝකමත් වර්ණ විසංගත ව යෙදවීමෙන් මිනිස් හැඟීම් වඩා තීව්‍ර ලෙස දැක්වීමට ශිල්පියා සමත්ව ඇත.
- චිත්‍රයේ ප්‍රකාශනාත්මක බව තීව්‍ර කිරීම සඳහා යොදන වර්ණ පදාස, සියුම් ලෙස විස්තරාත්මක දැක්වීම හා ප්‍රාණවත් කෙටි, ඝනකමින් යුතු කළු රේඛා භාවිත කර තිබීම හඳුනාගත හැකි ය.
- මුහුණේ හැඟීම් නිරූපණය සඳහා යොදාගත් අඳුරු වර්ණ, නිර්මාණයේ භාව ප්‍රකාශනය මැනැවින් සංවිධානය කිරීමට ඉවහල් ව ඇත.
- ස්ටැන්ලි අබේසිංහ ශිල්පියාගේ නිර්මාණ ශෛලිය සඳහා සාම්ප්‍රදායික කලාවේ ශෛලිගත හැඩ, පශ්චාත් උපස්ථිතිවාදී හා ප්‍රකාශනවාදී චිත්‍ර කලා ප්‍රවණතාවේ වර්ණ භාවිතය මෙන්ම ඝනිකවාදී කලාවේ පසුබිම් අවකාශ ලක්ෂණ ආභාස කර තිබීම දැකිය හැකි වේ.

## පෙරහැර



- ස්ටැන්ලි අබේසිංහ ශිල්පියාගේ නූතනවාදී කලා භාවිතය සහිත නිර්මාණ අතර පෙරහැර නමැති සිතුවම විශිෂ්ට නිර්මාණයකි.
- මහනුවර ඇසළ පෙරහැර වස්තුවිෂය කර ගනිමින් අඳින ලද මෙම නිර්මාණය සඳහා අඳුර හා ආලෝකය විසංගත වර්ණ තුළින් චිත්‍රයේ චමත්කාරය නව මුහුණුවරකින් පිළිබිඹු කර ඇත.
- අඳුරු හා ආලෝකමත් වර්ණ සාර්ථකව යොදාගනිමින් රාත්‍රී කාලය නිරූපණය කිරීමට ගත් උත්සාහය චිත්‍රය වඩාත් අර්ථවත් කරයි.
- රාත්‍රි කාලය නිරූපණය සඳහා යොදා ගැනුණු අඳුරු හා ආලෝක තත්ත්වය, වර්ණ පදාස මගින් දක්වමින් පෙරහැරේ උත්සවශ්‍රීය ස්වභාවය විස්තරාත්මක ව දක්වා ඇත.
- රේඛාකරණයට වඩා වර්ණ මාධ්‍ය හැසිරවීමෙන් රූපක මතු කර ඇත. රූප භාවිතයේ දී තේමාවේ වැදගත්ම අංගය වන දළදා කරඬුව සහිත ඇතා චිත්‍රයේ මධ්‍යගත ව දක්වා ඇත.
- පෙරබිම පසුබිම නොසලකා එකම තලයක රූප සම්පිණ්ඩනය කළ ද වර්ණ කිරීමේ ශිල්පක්‍රමය අනුව පෙරබිම, මැදබිම, පසුබිම මැනැවින් සංවිධානගත ව ස්ථානගත කොට චිත්‍රයේ ගැඹුර දැක්වීමට ශිල්පියා මනාව සමත්ව ඇත.
- ඒ සඳහා සනිකවාදී කලාවේ පසුබිම් අවකාශ ලක්ෂණ යොදා ගැනුන අතර ශෛලිගත හැඩ, පශ්චාත් උපස්ථිතිවාදී හා ප්‍රකාශනවාදී චිත්‍ර කලා ප්‍රවණතාවේ වර්ණ භාවිතය ආභාස කර තිබීම දැකිය හැකි වේ.

නිපුණතාව 6.0 : ආගමික හා සංස්කෘතික අංග, දෙස්, විදෙස් තෝරාගත් ශිල්පීන්ගේ කලා නිර්මාණ, අද්‍යතන දෘශ්‍ය කලා කෘති හා ජනමාධ්‍ය ඇසුරින් හඳුනාගත් කලා නිර්මාණ විචාරශීලී ව රසාස්වාදයට ලක් කරමින් ස්වතන්ත්‍ර නිර්මාණ සඳහා භාවිතයට ගනියි.

නිපුණතා මට්ටම 6.1 : තෝරාගත් දේශීය ශිල්පීන්ගේ නිර්මාණ රසාස්වාදය කරයි.

ක්‍රියාකාරකම 6.1.3 : ''ජී. එස්. ප්‍රනාන්දු ශිල්පියාගේ නිර්මාණ අගයමු''

කාලච්ඡේද සංඛ්‍යාව : 01 යි

ඉගැනුම් පල :
- ජී. එස්. ප්‍රනාන්දු ශිල්පියාගේ නිර්මාණ සොයා බලයි.
- ඔහුගේ නිර්මාණ සඳහා පදනම් වූ මාධ්‍ය හා ශිල්ප ක්‍රම විස්තර කරයි.
- නිර්මාණවල චිත්‍රමය ගුණාංග විමසා බලයි.
- ජී. එස්. ප්‍රනාන්දු ශිල්පියාගේ චිත්‍රවල සුවිශේෂ කලා ලක්ෂණ ඇගයීමට ලක් කරයි.

ගුණාත්මක යෙදවුම් :
- ජී. එස්. ප්‍රනාන්දු ශිල්පියාගේ භූමිදර්ශන චිත්‍ර
  - උළු පෝරණුව
  - ගඩලාදෙණිය
- ඇමුණුම 6.1.3.1 ට ඇතුළත් කාර්ය පත්‍රිකාව
- ඇමුණුම 6.1.3.2 ට ඇතුළත් කියවීම් පත්‍රිකාව

ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :

පියවර 6.1.3.1 :
- සුදුසු ක්‍රමවේදයක් භාවිත කරමින් ජී. එස්. ප්‍රනාන්දු ශිල්පියාගේ භූමිදර්ශන සිතුවම් සිසු අවධානයට යොමු කරවන්න.
- එම නිර්මාණ ඇසුරින් වර්ණ මාධ්‍ය භාවිත කිරීමේ ලක්ෂණ සොයා බැලීමට සිසුන්ට උපදෙස් දෙන්න.
- එම සිතුවම්වල වස්තු විෂය, ශෛලිය හා මාධ්‍ය ලක්ෂණ සිසුන්ගෙන් විමසන්න.

(මිනිත්තු 10 යි)

පියවර 6.1.3.2 :
- ඇමුණුම 6.1.3.1 ට ඇතුළත් කාර්ය පත්‍රිකාව සිසුන්ට ලබා දෙන්න.
- ඇමුණුම 6.1.3.2 ට ඇතුළත් කියවීම් පත්‍රිකාව සිසුන්ට ලබා දෙන්න.
- කියවීම් පත්‍රිකාව ඇසුරින් පිළිතුරු සැපයීමට සිසුන්ට උපදෙස් ලබා දෙන්න.
- පිළිතුරු සැපයීමට සිසුන්ට සහායවන්න.

(මිනිත්තු 20 යි)

**පියවර 6.1.3.3** :
- අහඹු ලෙස තෝරාගත් සිසුන් කිහිප දෙනෙකුගේ පිළිතුරු පත් ඇගයීමට ලක් කරන්න.
- ජී. එස්. ප්‍රනාන්දු ශිල්පියාගේ නිර්මාණ පිළිබඳ සමාලෝචනයක යෙදෙන්න.

(මිනිත්තු 10 යි)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

පහත සඳහන් කරුණු පිළිබඳ අවධානය යොමු කරමින් ඇමුණුම 6.1.3.1 හා ඇමුණුම 6.1.3.2 පදනම් කරගෙන ඇගයීම හා තක්සේරුකරණ ක්‍රියාවලියේ යෙදෙන්න.

- දියසායම් මාධ්‍ය චිත්‍ර කලාවේ නව පෙරළියක් ඇති කළ චිත්‍ර ශිල්පියකු ලෙස ජී. එස්. ප්‍රනාන්දු ශිල්පියාගේ නිර්මාණ සොයා බැලීම
- ඔහුගේ නිර්මාණවල ශෛලීය හා මාධ්‍ය ලක්ෂණ විස්තර කිරීම
- ජී. එස්. ප්‍රනාන්දු ශිල්පියාගේ චිත්‍රවල කලා ලක්ෂණ ඇගයීමට ලක් කිරීම

**ඇමුණුම 6.1.3.1**

## කාර්ය පත්‍රිකාව

- ඔබට ඉදිරිපත් කර ඇති ජී. එස්. ප්‍රනාන්දු ශිල්පියාගේ නිර්මාණ හොඳින් නිරීක්ෂණය කරන්න.
- ඔබට සපයා ඇති කියවීම් පත්‍රිකාව හොඳින් අධ්‍යයනය කරන්න.
- පහත සඳහන් ක්‍රියාකාරකම්හි නිරත වන්න.
  1. ජී. එස්. ප්‍රනාන්දු ශිල්පියා පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.
  2. පහත සඳහන් කරුණු යටතේ ජී. එස්. ප්‍රනාන්දු ශිල්පියාගේ නිර්මාණ ඇගයීමට ලක් කරන්න.
     - i. තේමාව
     - ii. ශෛලීය
     - iii. ආභාස
     - iv. ශිල්ප ක්‍රමය
     - v. කලා ලක්ෂණ - රූප භාවිතය
       - වර්ණ භාවිතය
       - තලය භාවිතය
- ඔබගේ අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් කරගන්න.

## කියවීම් පත්‍රිකාව

**ජී. එස්. ප්‍රනාන්දු (1904 - 1990)**

- වර්ෂ 1904 දී බෙන්තර සුද්දාගොඩ උපත ලැබූ ජී. එස්. හෙවත් ගම්වාරි සරත් ප්‍රනාන්දු දිය සායම් චිත්‍ර කලාවේ ශිල්පීය ප්‍රවණතා පෙන්නුම් කළ ප්‍රකට චිත්‍ර ශිල්පියෙකි.
- රිචඩ් හෙන්රිකස් යටතේ චිත්‍ර කලාව පිළිබඳ අධ්‍යාපනය ලැබූ ඔහු, පළමුව බිතුසිතුවම් කලාවට ප්‍රවේශ වූ චිත්‍ර ශිල්පියෙක් ද වේ.
- පසුකාලීනව ජී.එස් ප්‍රනාන්දු ශිල්පියා හට එම්. සාර්ලිස් හා මුදලිඳු අමරසේකර වැනි ශිල්පීන්ගෙන් ද චිත්‍ර ශිල්පය හැදෑරීම නිසා දිය සායම් මාධ්‍ය පිළිබඳ අනන්‍යතාවක් සහිත නිර්මාණ කිරිමට හැකි විය.
- කාටූන් චිත්‍ර කලාව පිළිබඳ ප්‍රවීණතාවක් පෙන් වූ ජී. එස්. ප්‍රනාන්දු ලංකාවේ ප්‍රථම චිත්‍ර කතාව නිර්මාණය කරනු ලැබූ ශිල්පියා ද වේ.
- වෙළඳ චිත්‍ර ශිල්පියකු ලෙස ඔහු පෝස්ටර්, ලේබල්, පොත් පිටකවර ද නිර්මාණය කිරීමට දායක වී ඇත.
- දිය සායම් මාධ්‍ය ශිල්ප ක්‍රමය අනුව ඔහු විසින් නිර්මාණය කරන ලද චිත්‍ර, යුරෝපීය ශාස්ත්‍රාලයීය චිත්‍ර කලා ආභාසය සහිත ව, ඔහුට ම ආවේණික ස්වභාවිකවාදී චිත්‍ර කලා ශෛලියක් අනුව නිර්මාණය කර තිබීම දැකිය හැකි ය.
- ඔහුගේ දියසායම් නිර්මාණ සඳහා විශේෂයෙන්ම යුරෝපීය භූමිදර්ශන සිතුවම්වල ආභාසය ලැබී ඇත.
- ශ්‍රී ලාංකේය පරිසර ස්වභාවය ඉතා අලංකාර ලෙස මතුකිරීම ඔහුගේ නිර්මාණවල කැපී පෙනෙන ලක්ෂණයක් වේ.
- ජී. එස්. ප්‍රනාන්දු විසින් නිර්මාණය කරන ලද පහත දැක්වෙන දිය සායම් මාධ්‍ය නිර්මාණ විශිෂ්ට නිර්මාණ වශයෙන් සැලකේ.
    - උළු පෝරණුව
    - ගඩලාදෙණිය
- ජී.එස් ප්‍රනාන්දුගේ දියසායම් මාධ්‍ය නිර්මාණවල ශෛලීය ලක්ෂණ හා චිත්‍ර මූලිකාංග සංරචන ක්‍රමවේද පොදුවේ මෙසේ හඳුනාගත හැකි ය.
    - චිත්‍රයේ ගැඹුර හා පර්යාලෝක ලක්ෂණ නිරූපණය
    - මිනිස් ඉරියව් ලාලිත්‍යයෙන් හා හැඟීම් ප්‍රකාශනයෙන් යුතු වීම
    - ත්‍රිමාන ලක්ෂණ සහිත ව දීප්තිමත් වර්ණමාලාවක් භාවිත කිරීම

## උළු පෝරණුව



- ජාතික කලාභවනේ නිත්‍ය ප්‍රදර්ශනයට තබා ඇති මෙම සිතුවම යුරෝපීය ස්වභාවිකවාදී ශෛලිය දක්වෙන නිර්මාණයකි.
- කඩදාසි මත දිය සායම් මාධ්‍යයෙන් කරන ලද නිර්මාණයකි.
- චිත්‍රයේ දක්වන උළු පෝරණුව හා අවට පරිසරය චිත්‍රණය කිරීමේ දී දීප්තිමත් වර්ණමාලාවක් ත්‍රිමාන ලක්ෂණ සහිත ව දියසායම් පදාස ක්‍රමයට ප්‍රකාශනාත්මක ව දක්වා ඇත.
- තලය මත රූප සංරචනය කිරීමේ දී පෙරබිම, මැද බිම හා පසුබිම මත රූප පිහිටුවමින් චිත්‍රයේ ගැඹුර හා පර්යාලෝක ලක්ෂණ සහිත ව නිරූපණය කර ඇත.
- මෙම නිර්මාණ සඳහා ස්වභාවිකවාදී ශෛලීය ලක්ෂණ හා යුරෝපීය භූමිදර්ශන සිතුවම්වල ආභාසය ලැබ් ඇති බව දැකිය හැකි ය.

## ගඩලාදෙණිය



- කොළඹ ජාතික කලාභවනේ නිත්‍ය ප්‍රදර්ශනයට තබා ඇති නිර්මාණයකි.
- යුරෝපීය ස්වභාවිකවාදී ශෛලිය දක්වෙන මෙම සිතුවම දිය සායම් මාධ්‍යයේ නිර්මාණයකි.
- ශාස්ත්‍රාලයීය චිත්‍ර කලාවේ සංරචන සිද්ධාන්ත ලක්ෂණ වන ගැඹුර නිරූපණය කරන පර්යාලෝක ලක්ෂණ හා ත්‍රිමාන ලක්ෂණ භාවිතය මෙම නිර්මාණයේ ද දැකිය හැකි ය.
- තලය මත රූප සංරචනය කිරීමේ දී පෙරබිම, මැද බිම හා පසුබිම මත රූප පිහිටුවමින් චිත්‍රයේ ගැඹුර හා පර්යාලෝක ලක්ෂණ නිරූපණය කර ඇත.
- දීප්තිමත් වර්ණමාලාවක් ත්‍රිමාන ලක්ෂණ සහිත ව දියසායම් පදාස ක්‍රමයට භාවිත කර ඇත.
- මෙම නිර්මාණ සඳහා ද ස්වභාවිකවාදී ශෛලීය ලක්ෂණ හා යුරෝපීය භූමිදර්ශන සිතුවම්වල ආභාසය ලැබී ඇති බව දැකිය හැකි ය.

**නිපුණතාව 6.0** : **ආගමික හා සංස්කෘතික අංග, දෙස්, විදෙස් තෝරාගත් ශිල්පීන්ගේ කලා නිර්මාණ, අද්‍යතන දෘශ්‍ය කලා කෘති හා ජනමාධ්‍ය ඇසුරින් හඳුනාගත් කලා නිර්මාණ විචාරශීලී ව රසාස්වාදයට ලක් කරමින් ස්වතන්ත්‍ර නිර්මාණ සඳහා භාවිතයට ගනියි.**

**නිපුණතා මට්ටම 6.1** : **තෝරාගත් දේශීය ශිල්පීන්ගේ කලාකෘති රසාස්වාදය කරයි.**

**ක්‍රියාකාරකම 6.1.4** : **"කේ. කනකසබාපති ශිල්පියාගේ නිර්මාණ අගයමු"**

**කාලච්ඡේද සංඛ්‍යාව** : **01 යි**

**ඉගෙනුම් පල** :
- කේ. කනකසබාපති ශිල්පියාගේ නිර්මාණ නම් කරයි.
- නිර්මාණවල ශෛලීය ලක්ෂණ පැහැදිලි කරයි.
- ඔහුගේ නිර්මාණ සඳහා ලැබුණු ආභාස විස්තර කරයි.
- සිතුවම් සඳහා යොදා ගත් වර්ණවල ස්වභාවය විමසා බලයි.
- ඔහුගේ චිත්‍ර නිර්මාණවල කලා ලක්ෂණ ඇගයීමට ලක් කරයි.

**ගුණාත්මක යෙදවුම්** :
- කේ. කනකසබාපති ශිල්පියාගේ වර්ණ චිත්‍ර
  - කියවන ළමයා (Reading Boy)
  - කුකුල් පොරය (Cock fight)
- ඇමුණුම 6.1.4.1 ට ඇතුළත් කාර්ය පත්‍රිකාව
- ඇමුණුම 6.1.4.2 ට ඇතුළත් කියවීම් පත්‍රිකාව

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පියවර 6.1.4.1** :
- කේ. කනකසබාපති ශිල්පියාගේ චිත්‍ර නිර්මාණ සිසුන්ට ප්‍රදර්ශනය කරන්න.
- එම නිර්මාණවල පසුබිම පිළිබඳ සිසුන්ගෙන් ප්‍රශ්න කරමින් සිතුවම්වල වස්තු විෂය, ආභාස, ශෛලිය හා ශිල්ප ක්‍රම ගැන සිසුන්ගෙන් විමසන්න.
- දේශීය චිත්‍ර ශිල්පීන්ගේ නිර්මාණ අගය කිරීමේ වැදගත්කම පිළිබඳ සිසුන් දැනුවත් කරන්න.

(මිනිත්තු 10 යි)

**පියවර 6.1.4.2** :
- ඇමුණුම 6.1.4.1 ට ඇතුළත් කාර්ය පත්‍රිකාව සිසුන්ට ලබා දෙන්න.
- ඇමුණුම 6.1.4.2 ට ඇතුළත් කියවීම් පත්‍රිකාව සිසුන්ට ලබා දී එය අධ්‍යයනය කිරීමට අවශ්‍ය උපදෙස් හා මග පෙන්වීම ලබා දෙන්න.
- කියවීම් පත්‍රිකාව කියවා අවබෝධයෙන් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට සිසුන් යොමු කරවන්න.

( මිනිත්තු 20 යි)

පියවර 6.1.4.3 :
- අහඹු ලෙස තෝරාගත් සිසුන් කිහිප දෙනෙකුගේ පිළිතුරු පත් ඇගයීමට ලක් කරන්න.
- කේ. කනකසබාපති ශිල්පියාගේ නිර්මාණ පිළිබඳ සමාලෝචනයක යෙදෙන්න.

(මිනිත්තු 10 යි)

ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

පහත සඳහන් කරුණු පිළිබඳ අවධානය යොමු කරමින් ඇමුණුම 6.1.4.1 හා ඇමුණුම 6.1.4.2 පදනම් කරගෙන ඇගයීම හා තක්සේරුකරණ ක්‍රියාවලියේ යෙදෙන්න.

- කේ. කනකසබාපති ශිල්පියාගේ සිතුවම් නම් කිරීම
- ඔහුගේ සිතුවම්වල කලා ලක්ෂණ සොයා බැලීම
- නූතන චිත්‍ර කලාවේ නව ශෛලියක් ඇති කළ චිත්‍ර ශිල්පියකු බව ප්‍රකාශ කිරීම
- ඔහුගේ නිර්මාණ සඳහා බලපෑ යුරෝපා කලා සම්ප්‍රදායන්වල ආභාස විස්තර කිරීම
- කේ. කනකසබාපති ශිල්පියාගේ සිතුවම් රසවිඳමින් ඇගයීමට ලක් කිරීම

ඇමුණුම 6.1.4.1

## කාර්ය පත්‍රිකාව


- ඔබට ඉදිරිපත් කර ඇති කේ. කනකසබාපති ශිල්පියාගේ නිර්මාණ හොඳින් නිරීක්ෂණය කරන්න.
- ඔබට සපයා ඇති කියවීම් පත්‍රිකාව හොඳින් අධ්‍යයනය කරන්න.
- පහත සඳහන් ක්‍රියාකාරකම්හි නිරතවන්න.
    1. කේ. කනකසබාපති ශිල්පියා පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.
    2. ඔහුගේ ප්‍රසිද්ධ නිර්මාණ නම් කරන්න.
    3. පහත සඳහන් කරුණු යටතේ කේ. කනකසබාපති ශිල්පියාගේ නිර්මාණ ඇගයීමට ලක් කරන්න.
        - i. තේමාව
        - ii. ශෛලීය
        - iii. ආභාස
        - iv. ශිල්ප ක්‍රමය
        - v. කලා ලක්ෂණ
            - රූප භාවිතය
            - වර්ණ භාවිතය
            - තලය භාවිතය
            - භාව ප්‍රකාශනය
- ඔබගේ අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් කරගන්න.

# කියවීම් පත්‍රිකාව

**කේ. කනකසබාපති (1915-1995)**

- කේ. කනකසබාපති විසිවන සියවසට අයත් ශ්‍රී ලාංකේය නූතන චිත්‍ර කලාවේ පුරෝගාමී ව කටයුතු කළ දමිළ ජාතික චිත්‍ර ශිල්පියෙකි.
- වර්ෂ 1915 දී යාපනය උරුම්පිරායි හි උපත ලද කනකසබාපති පළමුව පලාලි ගුරු විද්‍යාලයෙන් චිත්‍ර කලාව පිළිබඳ ශාස්ත්‍රීය අධ්‍යාපනය ලබා ගන්නා ලදී.
- මොහු පලාලි ගුරු පුහුණු විද්‍යාලයෙහි චිත්‍ර කලා ආචාර්යවරයෙකු වශයෙන් කටයුතු කර ඇත.
- චිත්‍ර කලාව පිළිබඳ වැඩිදුර අධ්‍යාපනය ලබා ගැනීම සඳහා වින්සර් චිත්‍ර කලා ආයතනයේ සාමාජිකත්වය ලබා ගන්නා ඔහු අනතුරු ව කොළඹ කාර්මික විද්‍යාලයට ඇතුළත් ව චිත්‍ර කලාව හදාරනු ලබයි.
- ඔහුගේ මුල්කාලීන චිත්‍ර ශෛලියට ශාස්ත්‍රාලයීය චිත්‍ර කලාවේ යථාර්ථවාදී කලා ලක්ෂණ එක්ව තිබුණ ද පසුකාලීන ව ඔහුගේ නිර්මාණ ඝනිකවාදී කලා ආභාසයන්ගෙන් පෝෂණය විය.
- ඝනිකවාදී කලා ලක්ෂණ සහිත ව තමාට ආවේණික චිත්‍ර ශෛලියක් ගොඩනගා ගත් කේ. කනකසබාපති, 43 කණ්ඩායමේ චිත්‍ර ප්‍රදර්ශනවලට ද සහභාගි වූ චිත්‍ර ශිල්පියෙක් වේ.
- කේ. කනකසබාපති විසින් නිම කරන ලද විශිෂ්ට නිර්මාණ අතර කියවන ළමයා, කුකුල් පොරය, විවේක ගැනීම, භූමිදර්ශන (landscapes) සිතුවම් සුවිශේෂ වේ.

## කියවන ළමයා



- කේ. කනකසබාපති විසින් නිර්මාණය කරන ලද කියවන ළමයා නමැති සිතුවම කැන්වසය මත තෙල් සායම් මාධ්‍යයෙන් කරන ලද නිර්මාණකි.
- ශෛලිගත ලක්ෂණ හා ඝනිකවාදී කලා ශෛලීය ලක්ෂණවල ආභාස සහිත නිර්මාණයක් වේ.
- ඝනිකවාදී කලාවේ ලක්ෂණ අනුව චිත්‍රයේ පසුබිම රේඛා සටහන් සහිත තලයක් ලෙස පෙන්වයි.
- එකිනෙක වෙනස් හැඩ සහ විවිධ දිශානතින් සහිත රේඛා ඒකවර්ණික පසුබිමක් මත සංවිධානය කර ඇත.

- චිත්‍රයේ ගැඹුර හා ත්‍රිමානත්වය පෙන්වන්නේ යොදන ලද රේඛා හා වර්ණ කිරීමේ ශිල්ප ක්‍රමයෙනි. එමගින් චිත්‍රයේ අවකාශීය ගැඹුර දැක්වේ.
- චිත්‍රයේ ප්‍රධාන රූපයට වඩා පසුබිම ඝනිකවාදි කලා ආභාසය සහිතව ඛණ්ඩනයට ලක්කර ඇත.
- සිතුවමේ දක්වෙන ළමයා බොහෝ සෙයින් ශෛලිගත හැඩ සහිතව නිරූපණය කෙරේ.
- චිත්‍රයට බහුල වශයෙන් යොදා ඇති වර්ණය කොළ වර්ණය වන අතර එහි ප්‍රභේද සමග දුඹුරු වර්ණ භාවිතය හඳුනාගත හැකි ය.
- ඝන / ගැඹුරු රේඛාකරණය හා වර්ණ භාවිතය මැනවින් යොදාගෙන ඇති අතර එමගින් මාතෘකාව වඩා තීව්‍ර ව හා සංවේදී ව දැනවීමට උත්සාහ ගෙන ඇත.

## කුකුල් පොරය



- කේ. කනකසබාපති ශිල්පියා විසින් නිර්මාණය කරන ලද මෙම සිතුවම සඳහා වස්තු විෂය වී ඇත්තේ කුකුල් පොරයකි.
- තෙල් සායම් මාධ්‍ය භාවිත කොට කැන්වසය මත කරන ලද ඝනිකවාදි ශෛලිය දක්වෙන නිර්මාණයකි.
- කුකුළන් නිරූපණය සඳහා ද්විමාන හැඩතල භාවිත වුවද ත්‍රිමාන ලක්ෂණ මතුවන සේ වර්ණ ගන්වා ඇත.
- චිත්‍රයේ රූප වටා හා පසුබිම මත යොදා ඇති ඝන රේඛාවල ස්වභාවය අනුව කුකුල් පොරයේ වේගය හා රිද්මය මතු කර පෙන්වයි. එම ලක්ෂණ චිත්‍රයේ ප්‍රකාශනය වඩා තීව්‍ර කිරීමට උපකාරී වෙයි.
- ඝනිකවාදී කලාවේ ලක්ෂණ ආභාසය කර ගනිමින් සත්ත්ව රූප සහ පසුබිම සම්පිණ්ඩනය කර ඇත.
- දුඹුරු වර්ණය ප්‍රමුඛව ඒකවර්ණ ස්වභාවය මතුවන ලෙස මෙම නිර්මාණයේ වර්ණ භාවිත කර ඇත.
- සිතුවම මධ්‍යයේ කුකුළන් නිරූපණය කිරීමට භාවිත කළ රේඛා හා හැඩතලවලට සමාන හැඩතල සහ රේඛා, පසුබිමට යොදා ගැනීමෙන් පෙරබිම හා පසුබිම එකම තලයක සම්පිණ්ඩනය වූ බවක් දෘශ්‍යමාන වේ.

**නිපුණතාව 6.0** : **ආගමික හා සංස්කෘතික අංග, දෙස්, විදෙස් තෝරාගත් ශිල්පීන්ගේ කලා නිර්මාණ, අධ්‍යතන දෘශ්‍ය කලා කෘති හා ජනමාධ්‍ය ඇසුරින් හඳුනාගත් කලා නිර්මාණ විචාරශීලී ව රසාස්වාදයට ලක් කරමින් ඒවායේ ස්වතන්ත්‍ර නිර්මාණ සඳහා භාවිතයට ගනියි.**

**නිපුණතා මට්ටම 6.1** : **තෝරාගත් දේශීය ශිල්පීන්ගේ කලාකෘති රසාස්වාදය කරයි.**

**ක්‍රියාකාරකම 6.1.5** : **"ඒ. මාර්ක් ශිල්පියාගේ නිර්මාණ අගයමු"**

**කාලච්ඡේද සංඛ්‍යාව** : **01 යි**

**ඉගෙනුම් පල** :

- ඒ. මාර්ක් ශිල්පියාගේ සිතුවම් නිර්මාණ නම් කරයි.
- නිර්මාණ සඳහා යොදාගත් ශිල්ප ක්‍රම හා ආභාස සොයා බලයි.
- ඔහුගේ නිර්මාණවල දැකිය හැකි ශෛලීය ලක්ෂණ විස්තර කරයි.
- ඒ. මාර්ක් ශිල්පියාගේ නිර්මාණවල කලා ලක්ෂණ ඇගයීමට ලක් කරයි.

**ගුණාත්මක යෙදවුම්** :

- ඒ. මාර්ක් ශිල්පියාගේ නිර්මාණ
  - සකුන්තලා
  - මිනිසා සහ බල්ලන්
- ඇමුණුම 6.1.5.1 ට ඇතුළත් කාර්ය පත්‍රිකාව
- ඇමුණුම 6.1.5.2 ට ඇතුළත් කියවීම් පත්‍රිකාව

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පියවර 6.1.5.1** :

- ඒ. මාර්ක් ශිල්පියාගේ නිර්මාණවල ඡායාපිටපත් පන්තියේ ප්‍රදර්ශනය කර සිසු අවධානය ඒවා කෙරෙහි යොමු කරවන්න.
- එම සිතුවම්වල තේමාව, ශිල්ප ක්‍රම හා ආභාස සිසුන්ගෙන් විමසන්න.
- දේශිය චිත්‍ර ශිල්පීන්ගේ නිර්මාණ ඇගයීමේ වැදගත්කම විස්තර කරන්න.

(මිනිත්තු 10 යි)

**පියවර 6.1.5.2** :

- ඇමුණුම 6.1.5.1 ට ඇතුළත් කාර්ය පත්‍රිකාව සිසුන්ට ලබා දෙන්න.
- ඇමුණුම 6.1.5.2 ට ඇතුළත් කියවීම් පත්‍රකාව සිසුන්ට ලබා දෙන්න
- කියවීම් පත්‍රිකාව කියවා ප්‍රශ්නවලට පිළිතුරු සපයන ලෙස සිසුන්ට උපදෙස් ලබා දෙන්න.
- සිසුන් ක්‍රියාකාරකමෙහි යොදවන්න.

(මිනිත්තු 20 යි)

පියවර 6.1.5.3 : 
- අහඹු ලෙස ශිෂ්‍යයන් කිහිප දෙනෙකුගේ පිළිතුරු පත් තෝරා ඇගයීමට ලක් කරන්න.
- ඒ. මාර්ක් ශිල්පියාගේ නිර්මාණ පිළිබඳ සමාලෝචනයක යෙදෙන්න.

(මිනිත්තු 10 යි)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

පහත සඳහන් කරුණු පිළිබඳ අවධානය යොමු කරමින් ඇමුණුම 6.1.5.1 හා ඇමුණුම 6.1.5.2 පදනම් කරගෙන ඇගයීම හා තක්සේරුකරණ ක්‍රියාවලියේ යෙදෙන්න.

- ඒ. මාර්ක් ශිල්පියාගේ නිර්මාණ නම් කිරීම
- ඔහුගේ නිර්මාණවල කලා ශෛලීය සොයා බැලීම
- නූතන චිත්‍ර මූර්ති කලාවේ නව ශෛලියක් ඇති කළ ශිල්පියකු බව ප්‍රකාශ කිරීම
- නිර්මාණ සඳහා ඒ. මාර්ක් ශිල්පියාට ලැබුණ බලපෑම්/ ආභාස විස්තර කිරීම
- ඒ. මාර්ක්ගේ නිර්මාණවල කලා ලක්ෂණ රසවිඳිමින් ඇගයීමට ලක්කිරීම

**ඇමුණුම 6.1.5.1**

## කාර්ය පත්‍රිකාව

- ඔබට ඉදිරිපත් කර ඇති ඒ. මාර්ක් ශිල්පියාගේ නිර්මාණ හොඳින් නිරීක්ෂණය කරන්න.
- ඔබට සපයා ඇති කියවීම් පත්‍රිකාව හොඳින් අධ්‍යයනය කරන්න.
- පහත සඳහන් ක්‍රියාකාරකම්හි නිරතවන්න.
    1. ඒ. මාර්ක් ශිල්පියා පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.
    2. ඔහුගේ ප්‍රසිද්ධ නිර්මාණ නම් කරන්න.
    3. එම එක් එක් නිර්මාණ පහත සඳහන් කරුණු යටතේ ඇගයීමට ලක් කරන්න.
        i. තේමාව
        ii. ශෛලිය
        iii. ආභාසය
        iv. ශිල්ප ක්‍රමය
        v. කලා ලක්ෂණ - රූප/හැඩතල භාවිතය
            - අවකාශය/ තලය භාවිතය
            - භාව/හැඟීම් ප්‍රකාශනය

- ඔබගේ අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් කරගන්න.

## කියවීම් පත්‍රිකාව

**ඒ. මාර්ක් (1933-2000)**

- විසිවන සියවස අගභාගයට අයත් ශ්‍රී ලාංකේය නූතන දෘශ්‍ය කලාවේ පුරෝගාමී ව කටයුතු කළ දමිළ ජාතික ශිල්පියෙකි.
- යාපනයේ ගුරුනගර් ප්‍රදේශයේ දී වර්ෂ 1933 දී උපත ලැබූ ඒ. මාර්ක් ශිල්පියා චිත්‍ර විෂයයට පමණ-ක් නොව මූර්ති කලාවට ද එක ලෙස ප්‍රවීණතාවක් දැක්වූ ශිල්පියෙක් වේ.
- රජයේ ලලිත කලා ආයතනයට ඇතුළත්ව ඔහු චිත්‍ර කලාව පිළිබඳ උසස් අධ්‍යාපනය ලබා ගෙන ඇත.
- චිත්‍ර පන්ති පැවැත්වීම හා චිත්‍ර ප්‍රදර්ශන සංවිධානය කිරීම සඳහා "විදුමුරෙයික් කල්වි ඕවියක් කලහම්" (විවේක කාලවල චිත්‍ර කලාව හැදෑරීමේ එකමුතුව) නමින් සංගමයක් පිහිටුවීම ඔහුගෙන් සිදුවූ විශිෂ්ට සේවාවක් විය.
- ඔහුගේ චිත්‍ර නිර්මාණවල ලක්ෂණ අනුව ඒවා පහත සඳහන් ලෙස වර්ගීකරණයට ලක් කළ හැකි ය.
  - (1) වර්ණ පදනම් කරගත් යුගය
  - (2) රේඛා පදනම් කරගත් යුගය
- වර්ණ පදනම් කර ගත් යුගය තුළ ද අඳුරු යුගය, සුදු යුගය, නිල් යුගය (Dark period, White Period, Blue Period) ආදී විවිධ වර්ණ යුග හඳුනා ගත හැකි ය.
- රේඛා පදනම් කරගත් යුගය ඝනිකවාදී යුගය වශයෙන් හඳුන්වා ඇත.
- පැස්ටල් වර්ණ, දියසායම්, කොලාජ්, මිශ්‍ර මාධ්‍ය ආදිය භාවිත කරමින් සාමාන්‍ය කඩදාසි මත මෙම නිර්මාණ සිදු කර ඇත.
- ඔහු විසින් නිර්මාණය කරන ලද විශිෂ්ට චිත්‍ර නිර්මාණ කිහිපයක් පහත දැක්වේ.
  - සකුන්තලා
  - තාණ්ඩවම්
  - කාවඩි නැටුම
  - රාගමාලිගෙයි
- ඔහුගේ මූර්ති නිර්මාණවල ඝනිකවාදී ලක්ෂණයන්ට අමතර ව හෙන්රි මූවර්ගේ හැඩවල ලක්ෂණ ආභාස කරගනිමින් ඔහුටම ආවේණික නූතන ශෛලියකින් හා ශිල්පක්‍රමයකින් යුතුව නිර්මාණ කිරීම දැකිය හැකි වේ.

## සකුන්තලා (චිත්‍ර)



- ඒ. මාර්ක් ශිල්පියා විසින් නිර්මාණය කළ සිතුවම් අතර සුවිශේෂ නිර්මාණයක් වන්නේ සකුන්තලා නැමති චිත්‍රයයි.
- කාලිදාස විසින් රචිත සකුන්තලා කාව්‍යයේ ප්‍රධාන චරිතය වන සකුන්තලා මෙම නිර්මාණය සඳහා වස්තු විෂය වී ඇත.
- පැස්ටල් මාධ්‍යයෙන් වර්ණ ගැන්වූ මෙම නිර්මාණයෙහි, ස්වභාවිකත්වය අභිබවා ව්‍යුක්තකරණ (Abstraction) කලා ලක්ෂණ දැකිය හැකි වේ.
- ඝනිකවාදී ශෛලීය ලක්ෂණ මෙම නිර්මාණය සඳහා ආභාසය වී ඇත.
- ඝනික හැඩතල හා ළා පැහැති පැතලි වර්ණ නිසා මෙම නිර්මාණය ද්විමාන කලා ලක්ෂණවලින් යුක්ත වුව ද රූපය වටා යොදා ඇති ඝන රේඛාකරණය නිසා ත්‍රිමාන ලක්ෂණ මතු කර පෙන්වයි.
- චිත්‍රයේ පසුබිම සඳහා යොදා ඇති වර්ණය තලය පුරා විහිදී යන ලෙස වර්ණ ගන්වා ඇත.
- නිර්මාණයේ යොදා ඇති සමස්ත වර්ණ, හැඩතල හා රේඛාකරණයෙන් සකුන්තලාගේ අභ්‍යන්තර භාවමය හැඟීම් ප්‍රකාශ කිරීමට ශිල්පියා උත්සාහ දරා ඇති බව පෙනේ.

## මිනිසා සහා බල්ලන් (මූර්ති)



- ඒ. මාර්ක් ශිල්පියා විසින් නිර්මාණය කළ මූර්ති අතර සුවිශේෂ නිර්මාණයක් වශයෙන් මෙම නිර්මාණය හැඳින්විය හැකි ය.
- ඉදිරිපස ගාත් ඔසවා පසුපස ගාත්වලින් සිටගත් බල්ලන් දෙදෙනෙකු සමග සිටින මිනිසෙකුගේ රුවක් මෙම නිර්මාණයෙන් පිළිබිඹු කෙරේ.
- සිටගත් බල්ලන්ගේ රූපවලට වඩා කුඩාවට මෙහි මිනිස් රුව නිරූපණය කර ඇත.
- ඒ. මාර්ක් ශිල්පියා විසින් නිර්මාණය කරන ලද මෙම මූර්තිය සඳහා පදනම් ව ඇත්තේ ඔහුට ආවේණික නව්‍ය වූ මූර්ති ශිල්ප ක්‍රමයකි.
- නූතන කලා භාවිතයන් සහිත මෙම නිර්මාණය සඳහා ඝනිකවාදී කලා ලක්ෂණ සහ හෙන්රි මුවර්ගේ මූර්ති නිර්මාණවල ලක්ෂණ ආභාස වී ඇති බව විචාරක අදහසයි.
- ඉවතලන/සොයාගත් ද්‍රව්‍ය (found objects) උපයෝගී කර ගනිමින් නිර්මාණය කර ඇති මෙම නිර්මාණය සඳහා ප්ලාස්ටික් බෝතල, ප්ලාස්ටික් තල භාවිත කර ඇත.
- ප්ලාස්ටික් බෝතල්වල දිගටි හා විවර සහිත හැඩ, රිද්මයානුකූල ව හා සමබර ව අවකාශය සමග භාවිත කර ඇති අතර ඉදිරියට නෙරා ගිය හා ඇතුළට නෙරා ගිය කොටස් මතුකරමින් මෙම නිර්මාණය ඉදිරිපත් කර ඇත.
- විස්තරාත්මක බවින් අඩු සරල හැඩ සමග ඇති කරන සරල ප්‍රකාශනය මෙම කෘතියේ ඇති සුවිශේෂ ලක්ෂණයක් වේ.

නිපුණතාව 6.0 : ආගමික හා සංස්කෘතික අංග, දෙස්, විදෙස් තෝරාගත් ශිල්පීන්ගේ කලා නිර්මාණ, අද්‍යතන දෘශ්‍ය කලා කෘති හා ජනමාධ්‍ය ඇසුරින් හඳුනාගත් කලා නිර්මාණ විචාරශීලී ව රසාස්වාදයට ලක් කරමින් ස්වතන්ත්‍ර නිර්මාණ සඳහා භාවිතයට ගනියි.

නිපුණතා මට්ටම 6.1 : තෝරාගත් දේශීය ශිල්පීන්ගේ නිර්මාණ රසාස්වාදය කරයි.

ක්‍රියාකාරකම 6.1.6 : "තිස්ස රණසිංහ ශිල්පියාගේ නිර්මාණ අගයමු"

කාලච්ඡේද සංඛ්‍යාව : 01 යි

ඉගැනුම් පල :
- තිස්ස රණසිංහ ශිල්පියාගේ නිර්මාණ නම් කරයි.
- තිස්ස රණසිංහ ශිල්පියාගේ මූර්ති පිළිබඳ තොරතුරු එක්රැස් කරයි.
- උන්නත මූර්ති කලාවේ නව ප්‍රවණතා පිළිබිඹු කළ නිර්මාණ පිළිබඳ සොයා බලයි.
- නව නිර්මාණාත්මක ශෛලිය සඳහා භාවිත මාධ්‍ය, මූර්ති හා ශිල්ප ක්‍රම විස්තර කරයි.
- තිස්ස රණසිංහගේ නිර්මාණවල කලා ලක්ෂණ ඇගයීමට ලක් කරයි.

ගුණාත්මක යෙදවුම් :
- තිස්ස රණසිංහ ශිල්පියාගේ මූර්ති නිර්මාණ
  - දුෂ්කර ක්‍රියාව මූර්තිය
  - කොළඹ රාජකීය විද්‍යාලයේ අල්ප උන්නත නිර්මාණය
- ඇමුණුම 6.1.6.1 ට ඇතුළත් කාර්ය පත්‍රිකාව
- ඇමුණුම 6.1.6.2 ට ඇතුළත් කියවීම් පත්‍රිකාව

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

පියවර 6.1.6.1 :
- සුදුසු ක්‍රමවේදයක් භාවිත කරමින් තිස්ස රණසිංහ ශිල්පියාගේ නිර්මාණ සිසු අවධානයට යොමු කරවන්න.
- ඔහුගේ නිර්මාණවල පින්තූර එක්රැස් කිරීමට සිසුන්ට උපදෙස් දෙන්න.
- එම නිර්මාණවල භාවිත මාධ්‍ය, මූර්ති මූලිකාංග හා ශිල්ප ක්‍රම සිසුන්ගෙන් විමසන්න.

(මිනිත්තු 10 යි)

පියවර 6.1.6.2 :
- ඇමුණුම 6.1.6.1 ට ඇතුළත් කාර්ය පත්‍රිකාව සිසුන්ට ලබා දෙන්න.
- ඇමුණුම 6.1.6.2 ට ඇතුළත් කියවීම් පත්‍රිකාව සිසුන්ට ලබා දෙන්න.
- කියවීම් පත්‍රිකාව ඇසුරින් පිළිතුරු සැපයීමට සිසුන්ට උපදෙස් ලබාදෙන්න.
- පිළිතුරු සැපයීමට සිසුන්ට සහායවන්න.

(මිනිත්තු 20 යි)

පියවර 6.1.6.3 :
- අහඹු ලෙස තෝරාගත් සිසුන් කිහිපදෙනෙකුගේ පිළිතුරු පත් ඇගයීමට ලක්කරන්න.
- තිස්ස රණසිංහ ශිල්පියාගේ නිර්මාණ පිළිබඳ සමාලෝචනයක යෙදෙන්න.

(මිනිත්තු 10 යි)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

පහත සඳහන් කරුණු පිළිබඳ අවධානය යොමු කරමින් ඇමුණුම 6.1.6.1 හා ඇමුණුම 6.1.6.2 පදනම් කරගෙන ඇගයීම හා තක්සේරුකරණ ක්‍රියාවලියේ යෙදෙන්න.

- මූර්ති කලාවේ නව ශෛලියක් හා ප්‍රවණතාවක් බිහි කිරීමට පුරෝගාමී වූ තිස්ස රණසිංහ ශිල්පියාගේ නිර්මාණ සොයා බැලීම
- තිස්ස රණසිංහ ශිල්පියාගේ නිර්මාණවල භාවිත මාධ්‍ය හා මූර්ති සිද්ධාන්ත ලක්ෂණ විස්තර කිරීම
- ඔහුගේ නිර්මාණාත්මක තේමා පිළිබඳ විස්තර කිරීම
- තිස්ස රණසිංහ ශිල්පියාගේ නිර්මාණවල කලා ලක්ෂණ ඇගයීමට ලක් කිරීම

**ඇමුණුම 6.1.6.1**

## කාර්ය පත්‍රිකාව

- ඔබට ඉදිරිපත් කර ඇති තිස්ස රණසිංහ ශිල්පියාගේ නිර්මාණ හොඳින් නිරීක්ෂණය කරන්න.
- ඔබට සපයා ඇති කියවීම් පත්‍රිකාව හොඳින් අධ්‍යයනය කරන්න.
- තිස්ස රණසිංහ ශිල්පියාගේ නිර්මාණවල පවතින සුවිශේෂ ලක්ෂණ හඳුනාගන්න.
- පහත සඳහන් ක්‍රියාකාරකම්හි නිරත වන්න.
    1. තිස්ස රණසිංහ ශිල්පියා පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.
    2. ඔහුගේ ප්‍රසිද්ධ නිර්මාණ නම් කරන්න.
    3. එම එක් එක් නිර්මාණ පහත සඳහන් කරුණු යටතේ ඇගයීමට ලක් කරන්න.
        - i. තේමාව
        - ii. ශෛලිය
        - iii. ආභාස
        - iv. මාධ්‍ය
        - v. ශිල්ප ක්‍රමය
        - vi. කලා ලක්ෂණ
            - සම්පිණ්ඩන ලක්ෂණ
            - රිද්මය, මතුපිට ස්වභාවය
            - භාව/හැඟීම් හා සමස්ත ප්‍රකාශනය
- ඔබගේ අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් කරගන්න.

ඇමුණුම 6.1.6.2

## කියවීම් පත්‍රිකාව

**තිස්ස රණසිංහ (1925 )**

- විසිවන සියවසේ ශ්‍රී ලංකාවේ නූතන මූර්ති කලාවේ නව ශෛලියක් බිහි කිරීමට පුරෝගාමී වූ විශිෂ්ට නිර්මාණ ශිල්පියා ලෙස තිස්ස රණසිංහ හැඳින්විය හැකි ය.
- දේශීය වශයෙන් හා ජාත්‍යන්තර වශයෙන් ද සම්මානනීයත්වයට පත් තිස්ස රණසිංහ වර්ෂ 1925 දී මීගමුව යෝගියාන නැමැති ප්‍රදේශයේ උපත ලැබී ය.
- මරදාන කාර්මික විදුහලේ ජේ. ඩී. ඒ. පෙරේරා යටතේ චිත්‍ර කලාව හදාරන ලද තිස්ස රණසිංහ එංගලන්තයට ගොස් චෙල්සි කලා පාසලේ (Chelsea School of Art) හා රාජකීය කලා පාසලේ (Royal College of Art) මූර්ති ශිල්පය හදාරනු ලැබී ය.
- එම කලා පාසල්වල අධ්‍යාපනයෙන් හා යුරෝපීය නූතන කලා නිර්මාණයන්ගේ ආභාසය ලබමින් තිස්ස රණසිංහ විසින් තමාටම ආවේණික මූර්ති නිර්මාණ ශෛලියක් ගොඩනගා ගනු ලැබී ය.
- මූර්ති නිර්මාණ ශෛලියේ නිරන්තරව දැකිය හැකි ස්වභාවික හැඩයන්ට වෙනස් වූ වියුක්තවාදී හැඩයන්ගෙන් සංකලනය වූ හැඩ ඔහුගේ නිර්මාණ සඳහා පාදක විය.
- ශ්‍රී ලාංකේය නූතන මූර්ති ශිල්පයට ලෝකඩ මාධ්‍ය හා වාත්තුකිරීමේ ශිල්පක්‍රමය හඳුන්වා දුන්නේ ඔහු ය.
- ශ්‍රී ලාංකික මූර්ති ශිල්පියකු ලැබූ උසස් ම ජාත්‍යන්තර සම්මානය 1963 දී බ්‍රසීලයේ පැවැත්වූ සාවෝපාව්ලෝ ප්‍රදර්ශනය සඳහා ඉදිරිපත් කළ "විපාක" හෙවත් "පව් සමාව" (Penance) නැමැති ලෝහමය මූර්තියට හිමි විය.
- තිස්ස රණසිංහ ශිල්පියාගේ නිර්මාණ සඳහා වස්තු වූ විවිධ විෂය ක්ෂේත්‍ර මෙසේ දැක්විය හැකි ය.
    - ප්‍රභූන්ගේ පුද්ගල රූප /විද්ධ රූප (ආලේඛ්‍ය) මූර්ති - පරණවිතාන පිළිරුව
    - ආගමික සංකල්ප නිරූපිත මූර්ති (බෞද්ධ හා හින්දු)
        - දුෂ්කර ක්‍රියාව මූර්තිය, පව් සමාව හෙවත් විපාක, ගනේෂ
        - ඓතිහාසිකත්වය නිරූපිත නිර්මාණ
        - කොළඹ රාජකීය විද්‍යාලයේ උන්නත නිර්මාණය
- තිස්ස රණසිංහ ශිල් පියාගේ නිර්මාණ ශෛලිය ශ්‍රී ලාංකේය නූතනවාදී මූර්ති කලාවේ ප්‍රවේශය ස්ථාපනය කළ අතර එම ශෛලිය වර්තමාන මූර්ති ශිල්පීන්ගේ ඇතැම් නිර්මාණ සඳහා බලපා ඇති බව පෙනේ.

## දුෂ්කර ක්‍රියාව මූර්තිය



- දුෂ්කර ක්‍රියාව නැමැති මෙම මූර්තිය තිස්ස රණසිංහ ශිල්පියාගේ අති විශිෂ්ට නිර්මාණයක් ලෙසින් පිළිගැනීමට ලක්ව ඇත.
- සිදුහත් බෝසතුන්ගේ දුෂ්කර ක්‍රියාව පිළිබිඹු කරන මෙම මූර්තියෙන් එම අදහස නිරූපණය කිරීම සඳහා දිය වී ගිය හා වියැකුණු මාංශමය කොටස් සහිත අස්ථිමය සැකැස්ම මැනැවින් දක්වා ඇත.
- ස්වාභාවිකවාදී ව මිනිස් ස්වරූපයක බාහිර හා කායික ව්‍යුහයට වඩා අභ්‍යන්තර හැඟීම් නිරූපණය කළ හැකි යථාර්ථවාදී ශෛලියක් සහිත හැඩතල මෙම මූර්තියෙන් නිරූපණය කරයි.
- අක්ෂිගෝචර ස්වභාවිකවාදී කලා භාවිතය මෙම මූර්තිය සඳහා භාවිතයට ගෙන නැත.
- මෙම නිර්මාණය සඳහා වියුක්තවාදි කලා ආභාසයන් දැකිය හැකි ය.
- මෙම නිර්මාණයේ හැඩ අර්ධ වියුක්තවාදී (Semi - Abstract) හැඩ හා අර්ධ නිරූපණාත්මක හැඩයන්ගෙන් සංකලනය වී ඇති බව විචාරක අදහස වේ.
- නූතන කලා භාවිතයන් දක්වෙන මෙම නිර්මාණය ලෝකඩ මාධ්‍යයෙන් නිර්මාණය කරන ලද්දකි.

## කොළඹ රාජකීය විද්‍යාලයේ උන්නත නිර්මාණය



1



2



3



4

- කොළඹ රාජකීය විද්‍යාලයේ නව රඟහලේ නිර්මාණය කර ඇති මෙම නිර්මාණය නූතන මූර්ති කලාවේ නව මානයක් ඇති කළ නිර්මාණයකි.
- ටෙරාකොටා මාධ්‍ය භාවිතයෙන් උන්නත ව නිර්මාණය කර ඇති මෙම නිර්මාණය සඳහා වස්තු විෂය වී ඇත්තේ ලාංකේය නාට්‍ය කලා ඉතිහාසය යි.
- නාට්‍ය කලා ඉතිහාසයට අයත් අවස්ථා මෙහි එකට සංකලනය කර නිරූපණය කෙරේ.
- මෙම කලා නිර්මාණ සඳහා ආභාස වශයෙන් ඝනිකවාදී කලා ලක්ෂණ ලැබී ඇතැයි විචාරක මතයයි.
- ඝනිකවාදී වියුක්ත හැඩතලවලට අමතරව ශෛලිගත හැඩ මෙම නිර්මාණය සඳහා පාදක කරගෙන ඇත.
- මෙම ටෙරාකොටා නිර්මාණය සඳහා යොදාගෙන ඇති වර්ණ, නිර්මාණයේ අලංකරණය මෙන්ම ප්‍රකාශන ගුණය තීව්‍ර කිරීමට උපයෝගී වී ඇත.

නිපුණතාව 6.0 : ආගමික හා සංස්කෘතික අංග, දෙස්, විදෙස් තෝරාගත් ශිල්පීන්ගේ කලා නිර්මාණ, අද්‍යතන දෘශ්‍ය කලා කෘති හා ජනමාධ්‍ය ඇසුරින් හඳුනාගත් කලා නිර්මාණ විචාරශීලී ව රසාස්වාදයට ලක් කරමින් ස්වතන්ත්‍ර නිර්මාණ සඳහා භාවිතයට ගනියි.

නිපුණතා මට්ටම 6.1 : තෝරාගත් දේශීය ශිල්පීන්ගේ නිර්මාණ රසාස්වාදය කරයි.

ක්‍රියාකාරකම 6.1.7 : "එච්. ඒ. කරුණාරත්න ශිල්පියාගේ නිර්මාණ අගයමු"

කාලච්ඡේද සංඛ්‍යාව : 01 යි

ඉගෙනුම් පල :
- එච්. ඒ. කරුණාරත්න ශිල්පියාගේ නිර්මාණ නම් කරයි.
- එච්. ඒ. කරුණාරත්න ශිල්පියාගේ නිර්මාණවල තොරතුරු එක්රැස් කරයි.
- චිත්‍ර කලාවේ නව ප්‍රවණතා පිළිබිඹු කළ නිර්මාණ සොයා බලයි.
- නව නිර්මාණාත්මක ශෛලිය සඳහා භාවිත මාධ්‍ය, මූලිකාංග හා ශිල්ප ක්‍රම විස්තර කරයි.
- එච්. ඒ. කරුණාරත්නගේ නිර්මාණවල කලා ලක්ෂණ ඇගයීමට ලක් කරයි.

ගුණාත්මක යෙදවුම් :
- එච්. ඒ. කරුණාරත්න ශිල්පියාගේ නිර්මාණ
  - සඳපායා
  - නම් නොකළ (untitled)
- ඇමුණුම 6.1.7.1 ට ඇතුළත් කාර්ය පත්‍රිකාව
- ඇමුණුම 6.1.7.2 ට ඇතුළත් කියවීම් පත්‍රිකාව

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

පියවර 6.1.7.1 :
- සුදුසු ක්‍රමවේදයක් භාවිත කරමින් එච්. ඒ. කරුණාරත්න ශිල්පියාගේ නිර්මාණ සිසු අවධානයට යොමු කරවන්න.
- ඔහුගේ නිර්මාණ එක්රැස් කිරීමට සිසුන්ට උපදෙස් දෙන්න.
- එම නිර්මාණවල භාවිත මාධ්‍ය, මූලිකාංග හා ශිල්ප ක්‍රම සිසුන්ගෙන් විමසන්න.

(මිනිත්තු 10 යි)

පියවර 6.1.7.2 :
- ඇමුණුම 6.1.7.1 ට ඇතුළත් කාර්ය පත්‍රිකාව සිසුන්ට ලබා දෙන්න.
- ඇමුණුම 6.1.7.2 ට ඇතුළත් කියවීම් පත්‍රිකාව සිසුන්ට ලබා දෙන්න.
- කියවීම් පත්‍රිකාව ඇසුරින් පිළිතුරු සැපයීමට සිසුන්ට උපදෙස් ලබාදෙන්න.
- පිළිතුරු සැපයීමට සිසුන්ට සහායවන්න.

(මිනිත්තු 20 යි)

පියවර 6.1.7.3 :

- අහඹු ලෙස තෝරාගත් සිසුන් කිහිපදෙනෙකුගේ පිළිතුරු පත් ඇගයීමට ලක්කරන්න.
- එච්. ඒ. කරුණාරත්න ශිල්පියාගේ නිර්මාණ පිළිබඳ සමාලෝචනයක යෙදෙන්න.

(මිනිත්තු 10 යි)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

පහත සඳහන් කරුණු පිළිබඳ අවධානය යොමු කරමින් ඇමුණුම 6.1.7.1 හා ඇමුණුම 6.1.7.2 පදනම් කරගෙන ඇගයීම හා තක්සේරුකරණ ක්‍රියාවලියේ යෙදෙන්න.

- දෘශ්‍ය කලාවේ නව ශෛලියක් හා ප්‍රවණතාවක් බිහි කිරීමට පුරෝගාමී වූ එච්. ඒ කරුණාරත්න ශිල්පියාගේ නිර්මාණ සොයා බැලීම
- එච්. ඒ. කරුණාරත්න ශිල්පියාගේ නිර්මාණවල භාවිත මාධ්‍ය හා සිද්ධාන්ත ලක්ෂණ විස්තර කිරීම
- ඔහුගේ නිර්මාණාත්මක තේමා පිළිබඳ විස්තර කිරීම
- එච්. ඒ. කරුණාරත්න ශිල්පියාගේ නිර්මාණවල කලා ලක්ෂණ ඇගයීමට ලක් කිරීම

**ඇමුණුම 6.1.7.1**

## කාර්ය පත්‍රිකාව

- ඔබට ඉදිරිපත් කර ඇති එච්. ඒ. කරුණාරත්න ශිල්පියාගේ නිර්මාණ හොඳින් නිරීක්ෂණය කරන්න.
- ඔබට සපයා ඇති කියවීම් පත්‍රිකාව හොඳින් අධ්‍යයනය කරන්න.
- එච්. ඒ. කරුණාරත්න ශිල්පියාගේ නිර්මාණවල පවතින සුවිශේෂ ලක්ෂණ හඳුනාගන්න.
- පහත සඳහන් ක්‍රියාකාරකම්හි නිරතවන්න.
    1. එච්. ඒ. කරුණාරත්න ශිල්පියා පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.
    2. ඔහුගේ ප්‍රසිද්ධ නිර්මාණ නම් කරන්න.
    3. එම එක් එක් නිර්මාණ පහත සඳහන් කරුණු යටතේ ඇගයීමට ලක් කරන්න.
        - i. තේමාව
        - ii. ශෛලිය
        - iii. ආභාසය
        - iv. ශිල්ප ක්‍රමය
        - v. කලා ලක්ෂණ - රූප/හැඩතල භාවිතය
            - අවකාශය/ තලය භාවිතය
            - භාව/හැඟීම් ප්‍රකාශනය
- ඔබගේ අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් කරගන්න.

## කියවීම් පත්‍රිකාව

**එච්. ඒ. කරුණාරත්න (1929 )**

- එච්. ඒ. කරුණාරත්න මහතා ශ්‍රී ලංකාවේ නූතන චිත්‍ර කලාවේ නව සම්ප්‍රදායක් වන වියුක්ත කලා සම්ප්‍රදාය බිහි කිරීමට පුරෝගාමී වූ විශිෂ්ට නිර්මාණ ශිල්පියා ලෙස හැඳින්විය හැකි ය.
- දේශීය වශයෙන් හා ජාත්‍යන්තර වශයෙන් ද සම්මානනීයත්වයට පත් එච්. ඒ කරුණාරත්නයන් වර්ෂ 1929 බණ්ඩාරගම ප්‍රදේශයේ දී උපත ලැබීය.
- 1952 රජයේ ලලිත කලා ආයතනයේ චිත්‍ර කලාව හදාරණ ලද එච්. ඒ කරුණාරත්න මහතා පසුකාලීන ව එහි කථිකාචාර්යවරයකු ලෙස සේවය කර ඇත.
- ඔහුගේ නිර්මාණකරණ ක්‍රියාවලිය සඳහා ජපන් හා ඇමරිකානු චිත්‍ර කලා අධ්‍යාපනයෙන් ලද පාඩම් මහත් ආභාසයක් වී ඇත.
- ශ්‍රී ලංකාවේ නූතන කලාවේ නිරූපණාත්මක සංරචනය වෙනුවට ඇමරිකානු වියුක්ත ප්‍රකාශනවාදී (Abstract Expressionism) චිත්‍ර ශෛලියට අනුගත වූ වියුක්ත චිත්‍ර කලා භාෂාවක් ස්ථාපිත කරන ලදී.
- ඔහුගේ නිර්මාණශීලී චිත්‍ර ශෛලියෙහි මධ්‍යගත සංරචනයක් නොමැති අතර තලය පුරා හැඩතල විසුරුවා හරින සංරචනයක් පෙන්වයි.
- එච්. ඒ. කරුණාරත්නයන් පසුකාලීන සිය නිර්මාණ සඳහා තේමාවක් සපයන්නේ නැත. එමගින් ඔහු, නරඹන්නාට සිතීමට අවස්ථාව දී තිබේ.
- ඔහුගේ නිර්මාණයන්ගෙන් ආගමික හැඟීම් සහිත වූ ශාන්ත රසයක් ජනිත කරවන බව කලා විචාරක මතයයි.
- මුල් කාලීන ව තෙල් සායම් මාධ්‍යයෙන් කැන්වසය මත චිත්‍ර සංරචනය කළ ඔහු පසුකාලීන ව එකිනෙකට වෙනස් මාධ්‍ය භාවිත කරන ලදී.
- සිය නිර්මාණයන්ගේ ත්‍රිමාන බව තීව්‍ර කිරීමට ඇණ, කාඩ්බෝඩ් නූල් වැනි විවිධ ද්‍රව්‍ය භාවිතයෙන් උත්සාහ කර ඇත. එමගින් නිර්මාණයේ එකිනෙක විරුද්ධ මතුපිට ස්වභාවයන්ගෙන් (texture) විවිධ රසයන් ජනිත කරයි.
- ඔහුගේ නිර්මාණ අතර දැකිය හැකි සුවිශේෂ නිර්මාණ කිහිපයක් පහත දැක්වේ.

**මුල්කාලීන නිර්මාණ කැන්වසය මත තෙල් සායම් මාධ්‍යයෙන් කරන ලද නිර්මාණ**

- සඳපායා
- චන්ද්‍රකාන්ත පාෂාණය
- මල් සුවඳ
- සුදු වලාකුළු
- මලෙක සුවඳ
- අස්වැන්න ආදී සිතුවම්

**පසුකාලීන නිර්මාණ** - විවිධ මාධ්‍ය භාවිතයෙන් සිදුකරන ලද නිර්මාණ (Assemblage Art)

## සඳපායා



- එච්. ඒ. කරුණාරත්න ශිල්පියා විසින් 1980 දශකය තුළ නිර්මාණය කරන ලද මෙම සිතුවම " සඳපායා " නම් වේ.
- තෙල් සායම් මාධ්‍යයෙන් කැන්වසය මත කරන ලද මෙම සිතුවම ඔහුගේ මුල් කාලීන නිර්මාණයකි.
- මෙම සිතුවමේ මධ්‍යගත සංරචනයක් දක්නට නොමැති අතර, තලය පුරා හැඩතල විසුරුවා හරින සංරචනයක් පෙන්වයි.
- වියුක්ත ප්‍රකාශනවාදී කලා ලක්ෂණ ඔහුගේ මෙම නිර්මාණය සඳහා පදනම් වී ඇත.
- ස්වභාව ධර්මයේ නිශ්චිත අවස්ථාවක් චිත්‍රයේ ප්‍රකාශනය සඳහා වස්තු විෂය කර ගැනීම මින් පෙන්වයි.
- වියුක්ත ප්‍රකාශනවාදී කලා ලක්ෂණ අනුව පවතින රූපීය සැලැස්මේ සැබෑ ස්වරූපයෙන් නොපෙන්වීම හා අභ්‍යන්තර හැඟීම් අනුව ස්වභාවය නිරූපණය කිරීම මෙයින් දක්වයි.
- අහසේ පායන ලද සඳ හා එම සඳ කිරණ වැටුණු ගස්වල චමත්කාරජනක හැඟීම් මතු කිරීම සඳහා නිර්මාණයේ දීප්තිමත් මුහුන් වර්ණ, රේඛා හා හැඩතල භාවිත කර ඇත.
- මෙම නිර්මාණයෙන් ආගමික හැඟීම් සහිත වූ ශාන්ත රසයක් ජනිත කරවන බව කලා විචාරක මතයයි.

## "නම් නොකළ" Untitled



- එච්. ඒ. කරුණාරත්න ශිල්පියා විසින් මෑතකාලයේ දී එනම් 2011 වසරේ දී නිර්මාණය කරන ලද මෙම නිර්මාණය "නම් නොකළ" නමින් හැඳින්වේ.
- මෙය මූර්තිමය ලක්ෂණ දැකිය හැකි එකලස් කිරීමේ ශිල්ප ක්‍රමය අනුව කරන ලද නිර්මාණයකි.
- මෙම නිර්මාණය කිරීම සඳහා කහඩු, කම්බි, ඇණ යනාදී මිශ්‍ර මාධ්‍ය භාවිත කර ඇත.
- මේ සඳහා ඝන හා රළු අමුද්‍රව්‍ය නිරූපණාත්මක අරමුණක් වෙනුවෙන් භාවිත කර තිබීම මෙම නිර්මාණයේ ඇති සුවිශේෂ ලක්ෂණයකි.
- මෙම නිර්මාණය සඳහා විස්තරාත්මක බවින් අඩු, එසේ ම යෝගී ඉරියව්වක දැකිය හැකි මූලික ලක්ෂණ සහිත හැඩතල අනුව කළ නිර්මාණයක් වශයෙන් සැලකිය හැකි ය.
- සරල බව හා සංකේතාත්මක බව නිර්මාණාත්මක ව ඉදිරිපත් කළ කෘතියකි.
- සංස්ලේෂණාත්මක ඝනිකවාදය හා එක්කාසු කලාවේ ආභාස ලක්ෂණ මෙම නිර්මාණය ආශ්‍රිත ව දැකිය හැකි වේ.

නිපුණතාව 6.0 : ආගමික හා සංස්කෘතික අංග, දෙස්, විදෙස් තෝරාගත් ශිල්පීන්ගේ කලා නිර්මාණ, අද්‍යතන දෘශ්‍ය කලා කෘති හා ජනමාධ්‍ය ඇසුරින් හඳුනාගත් කලා නිර්මාණ විචාරශීලී ව රසාස්වාදයට ලක් කරමින් ස්වතන්ත්‍ර නිර්මාණ සඳහා භාවිතයට ගනියි.

නිපුණතා මට්ටම 6.2 : දේශීය මුද්‍රිත මාධ්‍ය ආශ්‍රිත කලාත්මක අංග රසාස්වාදය කරයි.

ක්‍රියාකාරකම 6.2.1 : ''පුවත්පත් කාටූන් ශිල්පීන්ගේ නිර්මාණ අගයමු''

කාලච්ඡේද සංඛ්‍යාව : 01 යි

ඉගෙනුම් පල :
- දේශීය පුවත්පත් කාටූන් චිත්‍ර කලාවේ නව ප්‍රවණතා ඇති කළ පුරෝගාමී ශිල්පීන්ගේ නිර්මාණ සොයා බලයි.
- එක් එක් ශිල්පීන්ට පදනම් වූ නිර්මාණාත්මක ශෛලීය ලක්ෂණ විස්තර කරයි.
- පුවත්පත් කාටූන් සිතුවම් සඳහා යොදා ගත් සිද්ධි හා දර්ශනවල ස්වභාවය විමසා බලයි.
- කාටූන් ශිල්පීන්ගේ නිර්මාණවල කලා ලක්ෂණ ඇගයීමට ලක් කරයි.

ගුණාත්මක යෙදවුම් :
- පුවත්පත් කාටූන් ශිල්පීන්ගේ නිර්මාණ
  - ඔබ්රි කොලට්
  - ජෙෆ්රි යූනුස්
  - ඩබ්. ආර්. විජේසෝම
  - කැමිලස් පෙරේරා
  - ශිවඥානසුන්දරම්
- ඇමුණුම 6.2.1.1 ට ඇතුළත් කාර්ය පත්‍රිකාව
- ඇමුණුම 6.2.1.2 ට ඇතුළත් කියවීම් පත්‍රිකාව

ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :

පියවර 6.2.1.1 :
- පුවත්පත් කාටූන් ශිල්පීන්ගේ නිර්මාණ සිසුන්ගේ අවධානයට යොමු කරවන්න.
- එම නිර්මාණවල පවතින සුවිශේෂ කලා ලක්ෂණ සොයා බැලීමට සිසුන්ට උපදෙස් දෙන්න.
- පුවත්පත් කාටූන් ශිල්පීන්ගේ වස්තු විෂය, ශෛලීය ලක්ෂණ ගැන සිසුන්ගෙන් විමසන්න.

(මිනිත්තු 10 යි)

පියවර 6.2.1.2 :
- ඇමුණුම 6.2.1.1 ට ඇතුළත් කාර්ය පත්‍රිකාව සිසුන්ට ලබා දෙන්න.
- ඇමුණුම 6.2.1.2 ට ඇතුළත් කියවීම් පත්‍රිකාව කියවීමට අවස්ථාව සලස්වන්න.

- කියවීම් පත්‍රිකාව කියවා තේරුම් ගෙන අවබෝධයෙන් පිළිතුරු සැපයීමට සිසුන්ට උපදෙස් දෙන්න.

(මිනිත්තු 20 යි)

**පියවර 6.2.1.3** :
- අහඹු ලෙස තෝරාගත් සිසුන් කිහිප දෙනෙකුගේ පිළිතුරු පත් ඇගයීමට ලක් කරන්න.
- කාටුන් ශිල්පීන්ගේ නිර්මාණ පිළිබඳ සමාලෝචනයක යෙදෙන්න.

(මිනිත්තු 10 යි)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

පහත සඳහන් කරුණු පිළිබඳ අවධානය යොමු කරමින් ඇමුණුම 6.2.1.1 හා ඇමුණුම 6.2.1.2 පදනම් කරගෙන ඇගයීම හා තක්සේරුකරණ ක්‍රියාවලියේ යෙදෙන්න.

- දේශීය පුවත්පත් කාටුන් චිත්‍ර කලාවේ නව ප්‍රවණතා ඇති කළ පුරෝගාමී ශිල්පීන්ගේ නිර්මාණ සොයා බැලීම
- එක් එක් ශිල්පීන්ට පදනම් වූ නිර්මාණාත්මක ශෛලීය ලක්ෂණ විස්තර කිරීම
- පුවත්පත් කාටුන් සිතුවම් සඳහා යොදා ගත් සිද්ධි හා දර්ශනවල ස්වභාවය විමසා බැලීම
- කාටුන් ශිල්පීන්ගේ නිර්මාණවල කලා ලක්ෂණ ඇගයීමට ලක් කිරීම

**ඇමුණුම 6.2.1.1**

## කාර්ය පත්‍රිකාව

- ඔබට ඉදිරිපත් කර ඇති පුවත්පත් කාටුන් චිත්‍ර ශිල්පීන්ගේ නිර්මාණ හොඳින් නිරීක්ෂණය කරන්න.
- ඔබට සපයා ඇති කියවීම් පත්‍රිකාව හොඳින් අධ්‍යයනය කරන්න.
- පහත සඳහන් ක්‍රියාකාරකම්හි නිරතවන්න.
  1. පුවත්පත් කාටුන් චිත්‍ර කලාව පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.
  2. පහත සඳහන් වගුව සම්පූර්ණ කරන්න.

| ශිල්පියා | කාටුන් නිර්මාණය / චරිත | විශේෂ ලක්ෂණ |
|---|---|---|
| ඔබ්රි කොලට් | | |
| ජෙෆ්රි යූනූස් | | |
| ඩබ්. ආර්. විජේසෝම | | |
| කැමිලස් පෙරේරා | | |
| ශිවඥානසුන්දරම් | | |

- ඔබගේ අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් කරගන්න.

ඇමුණුම 6.2.1.2

# කියවීම් පත්‍රිකාව

- කාටූන් චිත්‍ර කලාව පුවත්පත් ක්ෂේත්‍රයට කේන්ද්‍රීයව නිර්මාණය වූ සුවිශේෂ නිර්මාණ කලාවකි.
- පුවත්පතක කාටූන් චිත්‍රවලට ප්‍රමුඛ ආකර්ශනයක් ලැබෙන අතර ඇතැම්විට පුවත්පතක ප්‍රධාන කර්තෘ වාක්‍යයට ද වඩා ඒවා ප්‍රබල වේ.
- වචන රැසකින් කිවයුතු බොහෝ දේ කාටූන් චිත්‍රය මගින් කැටිකොට ප්‍රකාශ කෙරේ.
- කාටූන් නිර්මාණවල අරමුණ වන්නේ පවතින සමාජ, ආර්ථික, දේශපාලන හා සංස්කෘතික දුර්වලතා පිළිබඳ හාස්‍යය දනවන අයුරින් විවරණය කිරීමයි.
- සෑම තරාතිරමක ම පුද්ගලයන්ට මේවා රස විඳීමට හැකිවීම සුවිශේෂ ලක්ෂණයකි.
- කාටූන් චිත්‍රවල සාර්ථක බව හා සිත් ඇදගන්නා බව රැඳී ඇත්තේ එහි හාස්‍යය ගැබ් වී ඇති ප්‍රබලතාව අනුව ය.
- හාස්‍ය රසය නිරූපණය කිරීමේදී මුඛ්‍ය ලක්ෂණය අනුව හැඩතල භාවිත කර ඇති ආකාරය ඉතා වැදගත් වේ.
- රූපවල ක්‍රියාකාරිත්වය හාස්‍ය නිරූපණය සඳහා බලපාන ප්‍රධාන අංගයකි.
- සමාජ, දේශපාලන තත්ත්වය විවරණය කිරීමේ දී ඒ සඳහා වන පුද්ගලයන්ගේ චරිත ලක්ෂණ කාටූනය මඟින් ඉතා මැනැවින් නිරූපණය කළ හැකි ය.
- සිද්ධි නිරූපණයේ දී භාෂාව භාවිත කරන ආකාරය ද වෙනස් වේ.
- ශ්‍රී ලංකාවේ කාටූන් චිත්‍ර නිර්මාණ ක්‍රියාවලියේ පුරෝගාමී ශිල්පීන් අතර
  - ඔබ්රි කොලට්
  - ජෙෆ්රි යූනුස්
  - ඩබ්. ආර්. විජේසෝම
  - කැමිලස් පෙරේරා
  - ශිවඥනසුන්දරම්, යන ශිල්පීන් ප්‍රමුඛස්ථානය ගනියි.

## ඔබ්රි කොලට් (1920 - 1992)

- ශ්‍රී ලංකාවේ පුවත්පත් කාටුන් කලාවේ පුරෝගාමියා ලෙස ඔබ්රි කොලට් ශිල්පියා හැඳින්විය හැකි ය.
- සමාජ, දේශපාලන ක්ෂේත්‍ර හාස්‍යයට ලක්වන අයුරින් කාටුන් නිර්මාණය කළ ශිල්පියකු ලෙස ද ප්‍රසිද්ධියක් ඉසිලූ කෙනෙකි.
- ඔබ්රි කොලට් විසින් 1945 දී පළමුවරට "ද ටයිම්ස් ඔෆ් සිලෝන්" නමැති පුවත්පතට කාටුන් නිර්මාණය කර ඇත.
- කොලට් 43 කණ්ඩායමට අයත් ශිල්පියෙකි.
- ඔහු විසින් අඳින ලද 43 කණ්ඩායමේ සාමාජිකයන් දැක්වෙන කාටුන් නිර්මාණය විශිෂ්ට කෘතියකි.









## ජෙෆ්රි යුනූස් (1932 - 2003)

- ඔබ්රි කොලට්ගේ මඟ පෙන්වීම සමඟ දේශපාලන කාටුන් කලාවට පැමිණි යුනූස් ප්‍රබල කාටුන් ශිල්පියක් වෙයි.
- මුල්කාලීනව "ඇත්ත" පුවත්පතෙහි කාටුන් ශිල්පියකු ලෙස සේවය කළ ඔහු පසුකාලීන ව "රාවය" පුවත්පතෙහි කාටුන් ශිල්පියකු ලෙස සේවය කර ඇත.
- ඔහු විසින් නිර්මාණය කරන ලද ප්‍රබල කාටුන් චරිතය ලෙස "අප්පුහාමි" හැඳින්විය හැකි ය.




## ඩබ්. ආර්. විජේසෝම (1925-2006)


- 1930 දශකය ආරම්භයේ සිට කාටූන් චිත්‍ර සඳහා ජනප්‍රියත්වයට පත් පුද්ගලයකු ලෙස විජේසෝම හැඳින්විය හැකි ය.
- 1950 දශකයේදී "ටයිම්ස් ඔෆ් සිලෝන්" පුවත්පතෙහි කාටූන් විශේෂාංගය නොකඩවා පවත්වා ගෙනයමින් ජනප්‍රිය තත්ත්වයට පත් විය.
- ඔහු පොදුජනතාව අතර වඩාත් ජනප්‍රිය වූයේ "පුංචි සිංඤෝ"නමින් නිර්මාණය කරන ලද කාටූන් චරිතය ආශ්‍රිතව ය.
- ජාතික ඇඳුමෙන් යුතු ව මුලදී නිර්මාණය කළ පුංචි සිංඤෝ ක්‍රම ක්‍රමයෙන් සිරුරෙන් වැහැරී, වැරහැලි සහිත ඇඳුමෙන් සැරසී ජීවත්ව සිටින ආකාරය පෙන්වයි.






## කැමිලස් පෙරේරා (1939 -     )

- විසිවැනි සියවස අග කාටූන් ශිල්පීන් අතර වඩාත් ජනප්‍රියත්වයට පත් ශිල්පියෙකි.
- ඔහු විසින් නිර්මාණය කරන ලද ජනප්‍රිය කාටූන් චරිත ගණනාවක් වේ.
- ගජමෑන් චරිතය ඉතා ජනප්‍රිය කාටූන් චරිතය විය.
- මීට අමතර ව සිරිබිරිස්, දැක්කොත් පද්මාවතී, මගෝඩිස් තුමා, පැටෝ, ටික්කා, දොං සේතං, සිමෝනා, ලපයා, ගොඩ්ඩිං අයියා, ස්වීටි, සෙල්ලං සේන වැනි චරිත ලංකාවේ විවිධ තරාතිරම්වල ජනතාව අතර අතිශය ජනප්‍රියත්වයට පත් ව ඇත.








ගජමෑන්

## සී. ශිවඥානසුන්දරම් (සිරිත්තිරන් සුන්දර්) 1924-1996

- වර්ෂ 1924 -1996 කාලය තුළ ජීවත්ව සිටි සී. සිවඥානසුන්දරම් ජනප්‍රිය දමිළ ජාතික කාටූන් චිත්‍ර ශිල්පියෙකු වශයෙන් සැලකේ.
- ඔහු චිත්‍ර කලාව පිළිබඳ බොම්බායේ ජේ. ජේ ලලිතකලා පාසලෙහි (J.J. School of Arts) පුහුණුව ලැබුවේ ය. එසේම ඉන්දියාවේ සිටි කාලයේ රාජා රවි වර්මා යටතේ රූප ඇඳීමට පුහුණුව ද ලැබුවේ ය.
- ඔහු ලෝකසත්ත නැමැති මරාටි පුවත්පත, BLITZ (බ්ලිට්ස්) හා (කොන්ච්) CONCH නැමැති ඉංග්‍රීසි පුවත්පත් හා විවිධ දෙමළ පුවත්පත්වල කාටූන් ශිල්පියකු ලෙස සේවය කර ඇත.
- වසර 33 කාලයක් පුරා ඔහු "සිරිත්තිරන්" නැමැති පුවත්පත පළ කරමින් එම පුවත්පතට කාටූන් නිර්මාණ ඉදිරිපත් කළ නිසා'සිරිත්තිරන් සුන්දර්' යන නමින් ප්‍රසිද්ධියට පත් විය.
- ඔහු විසින් නිර්මාණය කරන ලද සවාරිත්තම්බර්, සින්නක්කුට්ටි, මයිනර් මච්චාන් වැනි චරිත අතිශය ජනප්‍රියත්වයට පත් වූ ඒවා ලෙස හැඳින්වේ.





නිපුණතාව 6.0 : ආගමික හා සංස්කෘතික අංග, දෙස්, විදෙස් තෝරාගත් ශිල්පීන්ගේ කලා නිර්මාණ, අද්‍යතන දෘශ්‍ය කලා කෘති හා ජනමාධ්‍ය ඇසුරින් හඳුනාගත් කලා නිර්මාණ විචාරශීලී ව රසාස්වාදයට ලක් කරමින් ස්වතන්ත්‍ර නිර්මාණ සඳහා භාවිතයට ගනියි.

නිපුණතා මට්ටම 6.2 : දේශීය මුද්‍රිත මාධ්‍ය ආශ්‍රිත කලාත්මක අංග රසස්වාදය කරයි.

ක්‍රියාකාරකම 6.2.2 : ''සන්නිදර්ශන නිර්මාණ ශිල්පීන්ගේ නිර්මාණ අගයමු''

කාලච්ඡේද සංඛ්‍යාව : 01 යි

ඉගෙනුම් පල :
- සන්නිදර්ශන නිර්මාණ ශිල්පීන් නම් කරයි.
- එම නිර්මාණ ශිල්පීන්ගේ නිර්මාණ, තොරතුරු එක්රැස් කරයි.
- සන්නිදර්ශන නිර්මාණ සඳහා පදනම් වූ නිර්මාණාත්මක ශෛලිය හා ශිල්ප ක්‍රම විස්තර කරයි.
- සංරචන ක්‍රම හා සිද්ධාන්ත ලක්ෂණ විස්තර කරයි.
- සන්නිදර්ශන නිර්මාණවල කලා ලක්ෂණ ඇගයීමට හා රසස්වාදයට ලක් කරයි.

ගුණාත්මක යෙදවුම් :
- සන්නිදර්ශන චිත්‍ර ශිල්පීන්
  - සුමන දිසානායක
  - වී. සිවසුබ්‍රමනියම්
- ඇමුණුම 6.2.2.1 ට ඇතුළත් කාර්ය පත්‍රිකාව
- ඇමුණුම 6.2.2.2 ට ඇතුළත් කියවීම් පත්‍රිකාව

ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :

පියවර 6.2.2.1 :
- සන්නිදර්ශන නිර්මාණ ශිල්පීන්ගේ නිර්මාණ, පන්තියේ ප්‍රදර්ශනය කර එම නිර්මාණ පිළිබඳ සිසු අදහස් විමසන්න.
- එම නිර්මාණවල සුවිශේෂතා සාකච්ඡා කරන්න.

(මිනිත්ත 10 යි)

පියවර 6.2.2.2 :
- ඇමුණුම 6.2.2.1 ට ඇතුළත් කාර්ය පත්‍රිකාව සිසුන්ට ලබා දෙන්න.
- ඇමුණුම 6.2.2.2 ට ඇතුළත් කියවීම් පත්‍රිකාව කියවීමට අවස්ථාව සලස්වන්න.
- කියවීම් පත්‍රිකාව කියවා තේරුම් ගෙන අවබෝධයෙන් පිළිතුරු සැපයීමට සිසුන්ට උපදෙස් දෙන්න.

(මිනිත්තු 20 යි)

පියවර 6.2.2.3 :
- අහඹු ලෙස තෝරාගත් සිසුන් කිහිප දෙනෙකුගේ පිළිතුරු පත් ඇගයීමට ලක් කරන්න.
- සන්නිදර්ශන නිර්මාණ ශිල්පීන්ගේ නිර්මාණ පිළිබඳ සමාලෝචනයක යෙදෙන්න.

(මිනිත්තු 10 යි)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

පහත සඳහන් කරුණු පිළිබඳ අවධානය යොමු කරමින් ඇමුණුම 6.2.2.1 හා ඇමුණුම 6.2.2.2 පදනම් කරගෙන ඇගයීම හා තක්සේරුකරණ ක්‍රියාවලියේ යෙදෙන්න.

- සන්නිදර්ශන චිත්‍ර කලාව විස්තර කිරීම
- පුරෝගාමී වූ ශිල්පීන් සොයා බැලීම
- ඔවුන්ගේ නිර්මාණවල තොරතුරු එක්රැස් කිරීම
- සන්නිදර්ශන චිත්‍ර සඳහා පදනම් වූ ශෛලීය ලක්ෂණ විස්තර කිරීම
- සංරචන ක්‍රම හා සිද්ධාන්ත ලක්ෂණ විස්තර කිරීම
- සන්නිදර්ශන නිර්මාණවල කලා ලක්ෂණ ඇගයීමට හා රසාස්වාදයට ලක් කිරීම

**ඇමුණුම 6.2.2.1**

## කාර්ය පත්‍රිකාව

- ඔබට ඉදිරිපත් කර ඇති සන්නිදර්ශන චිත්‍ර ශිල්පීන්ගේ නිර්මාණ හොඳින් නිරීක්ෂණය කරන්න.
- ඔබට සපයා ඇති කියවීම් පත්‍රිකාව හොඳින් අධ්‍යයනය කරන්න.
- සන්නිදර්ශන චිත්‍ර ශිල්පීන්ගේ නිර්මාණවල සුවිශේෂ ලක්ෂණ හඳුනා ගන්න.
- පහත සඳහන් ක්‍රියාකාරකම්හි නිරතවන්න.
    1. සන්නිදර්ශන චිත්‍ර කලාව පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.
    2. සන්නිදර්ශන චිත්‍ර ශිල්පීන් නම් කරන්න.
    3. පහත සඳහන් කරුණු යටතේ සන්නිදර්ශන චිත්‍ර ශිල්පීන්ගේ නිර්මාණ ඇගයීමට ලක් කරන්න.

        i. ශෛලිය/ ආභාස
        ii. මාධ්‍ය
        iii. කලා ලක්ෂණ - රූප භාවිතය
        - වර්ණ හා රේඛා භාවිතය
        - තලය භාවිතය

- ඔබගේ අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් කරගන්න.

ඇමුණුම 6.2.2.2

## කියවීම් පත්‍රිකාව

### සුමන දිසානායක (1922-1995)

- වර්ෂ 1922 දී මාතර කඹුරුපිටියේ උපත ලැබූ සුමන දිසානායක සන්නිදර්ශන චිත්‍ර කලාවට නව්‍යතාවක් ඇතිකළ පුරෝගාමී ශිල්පියෙක් වෙයි.
- මරදාන කාර්මික විද්‍යාලයෙන් චිත්‍රකලාව පිළිබඳ උසස් අධ්‍යාපනය ලබා ගන්නා ඔහු, පසුව එංගලන්තය හා නෙදර්ලන්තය ආශ්‍රිතව ද චිත්‍ර කලාව පිළිබඳ පුහුණුව ලබා ගති.
- අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ චිත්‍ර කලා පරීක්ෂක හා ග්‍රන්ථ ප්‍රකාශන මණ්ඩලයේ චිත්‍ර කලා අධ්‍යක්ෂක ධූරය ද ඔහු විසින් හොබවන ලදී.
- ඔහු සිය නිර්මාණ සඳහා තෙල් සායම්, දිය සායම් හා ඇක්‍රලික් ආදි විවිධ වර්ණ මාධ්‍ය භාවිත කරමින් නිර්මාණකරණයේ යෙදුණු ශිල්පියෙකි.
- ඔහුගේ නිර්මාණ කොටස් දෙකකි. එනම් තෙල් සායම් චිත්‍ර හා සන්නිදර්ශන චිත්‍ර වශයෙනි.
- මීට අමතර ව සරල හා නූතන හැඩවලට අයත් බතික් නිර්මාණයන්ගේ ආරම්භක පුරෝගාමියා ලෙස ද සැලකෙයි.
- ඔහු විසින් නිර්මාණය කරන ලද සන්නිදර්ශන සඳහා චිත්‍ර පොත් පිටකවර, ළමාපොත් හා සඟරා ආදිය ඇසුරින් දැකිය හැකි ය.
- ඔහු ළමාපොත් නිර්මාණ සඳහා නවතම ශෛලියකින් යුතු චිත්‍ර ආරක් බිහි කළ ශිල්පියෙකු ලෙස ද හැඳින්වේ.
- සරල හා වියුක්ත හැඩතල මෙන් ම වර්ණ සංයුතිය ද ඉතා නිර්මාණශීලී ව ඔහු සිය සන්නිදර්ශන, නිර්මාණකරණය සඳහා භාවිත කර ඇත.
- මුල්කාලයේ නිර්මාණ සඳහා ස්වභාවික රූපක ද පසුකාලීන නිර්මාණ සඳහා අධිතාත්වික හැඟීම් ලබා දෙන සමාධිගත වින්දනයකට තුඩුදෙන හැඩතල ද භාවිත කරන ලද නිර්මාණ වේ.






## වෛතීසවරම් සිවසුබ්‍රමනියම් (රමණී) 1942

- වර්ෂ 1942 දි අලවෙට්ටි ප්‍රදේශයේ උපත ලැබූ සිවසුබ්‍රමනියම් 1961 දී යාපනය 'විඩුමුරෙයි කාල ඕවියක් කලහම්'හිදී මූලික අධ්‍යාපනය ද, චිත්‍ර කලාව පිළිබඳ උසස් අධ්‍යාපනය රජයේ ලලිත කලා ආයතනයෙන් ලබා ගත්තේ ය.
- රජයේ කලා ආයතනයේ චිත්‍ර ඇඳීම පිළිබඳ වැඩිදුරටත් හැදෑරූ ඔහු පසුකාලීන ව යාපනයේ සෞන්දර්ය අධ්‍යාපන නියෝජ්‍ය අධ්‍යක්ෂ ධූරය ද දැරුවේ ය.
- ඔහු සිතුවම් ඇඳීමට අමතර ව දේවරූප බොහොමයක් නිර්මාණය කළ මූර්ති ශිල්පියෙක් ද වේ.
- ස්වාභාවිකවාදී ශෛලිය සමග සංකලනය වූ නූතන ශිල්ප ක්‍රම සමග තමාට ම ආවේණික වූ නිර්මාණ ශෛලියක් ඔහුගේ නිර්මාණ ඇසුරින් හඳුනා ගත හැකි ය.
- ඔහුගේ මුල්ම සන්නිදර්ශන සිතුවම වන්නේ රාධා පුවත්පතෙහි පළ කළ නිර්මාණයකි. ඔහු දෙමළ පුවත්පත් ගණනාවක් සඳහා ද චිත්‍ර නිර්මාණය කර ඇත.
- පොත් පිටකවර නිර්මාණය පිළිබඳව නව අත්හදා බැලීම් කළ ඔහු විසින් විවිධ දෙමළ පොත් සඳහා පිටකවර නිර්මාණය කරන ලදි.
- ඔහුගේ නිර්මාණ අතර අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව හා සම්බන්ධව කරන ලද පොත් කවර සුවිශේෂ නිර්මාණ ලෙස දැක්විය හැකි ය.
- මෙම නිර්මාණ ඔහුටම ආවේණික නිර්මාණ ශෛලීය ලක්ෂණයන්ගෙන් යුතු ව නිම කරන ලද ඒවා වේ.






හතරවන ශ්‍රේණියේ දෙමළ බස පොත සඳහා නිර්මාණය කළ පිටකවරය






"පාට්ටුත්තිරත්තාලේ" නම් පොත් පිටකවරය

නිපුණතාව 6.0 : ආගමික හා සංස්කෘතික අංග, දෙස්, විදෙස් තෝරාගත් ශිල්පීන්ගේ කලා නිර්මාණ, අද්‍යතන දෘශ්‍ය කලා කෘති හා ජනමාධ්‍ය ඇසුරින් හඳුනාගත් කලා නිර්මාණ විචාරශීලී ව රසාස්වාදයට ලක් කරමින් ස්වතන්ත්‍ර නිර්මාණ සඳහා භාවිතයට ගනියි.

නිපුණතා මට්ටම 6.3 : තෝරාගත් විදේශීය ශිල්පීන්ගේ නිර්මාණ රසාස්වාදය කරයි.

ක්‍රියාකාරකම 6.3.1 : ''පැබ්ලෝ පිකාසෝ ශිල්පියාගේ සිතුවම් අගයමු''

කාලච්ඡේද සංඛ්‍යාව : 01 යි

ඉගෙනුම් පල :
- පැබ්ලෝ පිකාසෝ ශිල්පියාගේ චිත්‍ර නිර්මාණ හඳුනාගෙන නම් කරයි.
- නූතන චිත්‍ර කලාව සඳහා ඔහුගෙන් සිදු වූ සේවය හා කලා ක්‍රියාකාරිත්වය පිළිබඳ විමසා බලයි.
- නිර්මාණ සඳහා පදනම් වූ චිත්‍ර ශෛලිය හා සංරචන සිද්ධාන්ත ලක්ෂණ විස්තර කරයි.
- පැබ්ලෝ පිකාසෝ ශිල්පියාගේ චිත්‍රවල කලා ලක්ෂණ රස විඳිමින් ඇගයීමට ලක් කරයි.

ගුණාත්මක යෙදවුම් :
- පැබ්ලෝ පිකාසෝ ශිල්පියාගේ වර්ණ සිතුවම්
  - අවිග්නොන්හි යුවතියෝ
  - ගුවර්නිකා
- ඇමුණුම 6.3.1.1 ට ඇතුළත් කාර්ය පත්‍රිකාව
- ඇමුණුම 6.3.1.2 ට ඇතුළත් කියවීම් පත්‍රිකාව

ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :

පියවර 6.3.1.1 :
- පැබ්ලෝ පිකාසෝ ශිල්පියාගේ වර්ණ සිතුවම් දැක්වෙන පින්තූර සිසු අවධානය යොමු කරවන්න.
- එම සිතුවම්වල ආභාසය, වස්තු විෂයය, ශෛලිය සිසුන්ගෙන් විමසන්න.

(මිනිත්තු 10 යි)

පියවර 6.3.1.2 :
- ඇමුණුම 6.3.1.1 කාර්ය පත්‍රිකාව සිසුන්ට ලබා දෙන්න.
- ඇමුණුම 6.3.1.2 ට ඇතුළත් කියවීම් පත්‍රිකාව කියවීමට සලස්වන්න.
- කියවීම් පත්‍රිකාව ඇසුරින් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට සිසුන්ට සහාය වන්න.

(මිනිත්තු 20 යි)

පියවර 6.3.1.3 :
- අහඹු ලෙස තෝරාගත් සිසුන් කිහිප දෙනෙකුගේ, පිළිතුරු පත් ඇගයීමට ලක් කරන්න.
- එක්රැස්කරගත් තොරතුරු හා සිසුන්ගේ පිළිතුරු සැලකිල්ලට ගනිමින් සමාලෝචනයක යෙදෙන්න.

(මිනිත්තු 10 යි)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

පහත සඳහන් කරුණු පිළිබඳ අවධානය යොමු කරමින් ඇමුණුම 6.3.1.1 හා ඇමුණුම 6.3.1.2 පදනම් කරගෙන ඇගයීම හා තක්සේරුකරණ ක්‍රියාවලියේ යෙදෙන්න.

- පැබ්ලෝ පිකාසෝ ශිල්පියාගේ සිතුවම් නම් කිරීම
- සිතුවම් නිර්මාණය සඳහා පැබ්ලෝ පිකාසෝ ශිල්පියාට ලැබුණ ආභාස විස්තර කිරීම
- එම නිර්මාණවල ශෛලීය ලක්ෂණ පැහැදිලි කිරීම
- නිර්මාණවලට විෂය වූ තේමා සොයා බැලීම
- පැබ්ලෝ පිකාසෝ ශිල්පියාගේ සිතුවම්වල කලා ලක්ෂණ රසවිඳිමින් ඇගයීමට ලක් කිරීම

**ඇමුණුම 6.3.1.1**

## කාර්ය පත්‍රිකාව

- පැබ්ලෝ පිකාසෝ ශිල්පියාගේ නිර්මාණ හොඳින් නිරීක්ෂණය කරන්න.
- ඔබට සපයා ඇති කියවීම් පත්‍රිකාව හොඳින් අධ්‍යයනය කරන්න.
  පහතින් දක්වා ඇති ක්‍රියාකාරකම්වල නිරතවන්න.
  1. පැබ්ලෝ පිකාසෝ ශිල්පියා පිළිබඳ කෙටි විස්තරයක් කරන්න.
  2. පහත සඳහන් කරුණු සැලකිල්ලට ගනිමින් පැබ්ලෝ පිකාසෝ ශිල්පියාගේ නිර්මාණ පිළිබඳ අර්ථවත් ඇගයීමක් කරන්න.
     - i. තේමාව
     - ii. ශෛලිය
     - iii. ආභාසය
     - iv. ශිල්ප ක්‍රමය
     - v. කලා ලක්ෂණ
       - රූප භාවිතය
       - වර්ණ භාවිතය
       - රේඛාකරණය
       - තලය භාවිතය
       - භාව ප්‍රකාශනය
- ඔබගේ අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් කරගන්න.

## කියවීම් පත්‍රිකාව

**පැබ්ලෝ පිකාසෝ (1881-1973)**


- යුරෝපීය චිත්‍රකලාවේ ඝනිකවාදි ප්‍රවණතාව ඉදිරිපත් කළ ප්‍රමුඛ චිත්‍ර ශිල්පියා පැබ්ලෝ පිකාසෝ (Pablo Picasso) ලෙස හඳුන්වා දිය හැකි ය.
- ඔහු 20 වන සියවසේ ප්‍රවීණ සිත්තරුන් අතර අද්විතීය ස්ථානයක් හිමි කර ගත් අයෙකි.
- පැබ්ලෝ පිකාසෝගේ පියා චිත්‍ර ගුරුවරයකු වූ අතර පිකාසෝගේ දක්ෂතා හඳුනා ගත් ඔහු තම පුත්‍රයා චිත්‍ර ශිල්පය වෙත යොමු කරනු ලැබී ය.
- පිකාසෝගේ කලා ජීවිතයේ වැදගත් සන්දිස්ථානයක් වන්නේ 1893-1900 දක්වා පැරීසියට ගොස් එහිදී ප්‍රවීණ ශිල්පීන් සමඟ එකට කටයුතු කරමින් ලබන කලා අධ්‍යයනයන් ය.
- එම අධ්‍යයනයන්ගේ ප්‍රතිඵලයක් වශයෙන් ඔහුගේ චිත්‍ර නිර්මාණවලට අයත් විවිධ සීමාවන් දක්නට ලැබේ.

  නිල් යුගය ( Blue Peiod) 1901-1904

  රෝස යුගය (Rose Period) 1905-1906

  ඝනිකවාදි යුගය (Cubism Period ) 1907න් පසු
- නිල් යුගය හා රෝස යුගය තුළ පැබ්ලෝ පිකාසෝ විසින් අඳින ලද නිර්මාණ සඳහා වස්තු විෂය වූයේ තැන තැන යමින් රඟන නළු නිළියන්, වීදි මිනිසුන්, දුප්පතුන් හා හිඟන්නන් වැනි පුද්ගලයන් ය.
- නිල් යුගය තුළ නිල් වර්ණයන්ගෙන් හා රෝස යුගය තුළ රෝස පැහැති වර්ණ මාලාවන්ගෙන් ද වර්ණ ගැන්වුණු මෙම චිත්‍ර සඳහා යොදා ගත් මානව රූප තාත්වික ශෛලියට සමානුරූපී වේ.
- අප්‍රිකානු මූර්ති හා වෙස් මුහුණුවල ආභාස ලබමින් පිකාසෝ විසින් 1906න් පසු නිර්මාණය කරන ලද කෘතීන් තුළ නව ශෛලීය ලක්ෂණ පිළිබිඹු වේ.
- 1906න් පසුව බිහිවුණ නිර්මාණවල පවත්නා ජ්‍යාමිතික හැඩතල හා පැතලි වර්ණ භාවිතය මෙන්ම බාහිර රේඛාකරණය සහිත රූප, ඝනිකවාදී සම්ප්‍රදායේ අගනා නිර්මාණ අතරට ගැනේ.
- ඝනිකවාදී චිත්‍ර කලාව බිහි කළ පිකාසෝගේ එවැනි සුවිශේෂ නිර්මාණ කිහිපයක් පහත දැක්වේ.
  - අවිග්නොන්හි යුවතියෝ
  - වයලින් වාදකයා
  - වැලපෙන ස්ත්‍රිය
  - ගුවර්නිකා

## අවිග්නොන්හි යුවතියෝ චිත්‍රය



- ස්පාඤ්ඤ ජාතික පැබ්ලෝ පිකාසෝ විසින් 1907 දී අඳින ලද මෙම සිතුවම අවිග්නොන්හි යුවතියෝ නම් වේ.
- චිත්‍රකලා ඉතිහාසයේ නව නිර්මාණාත්මක ශෛලියක් සමග නව යුගයක් උදා කළ නිර්මාණයකි.
- මෙම සිතුවම ඝනිකවාදී කලා සම්ප්‍රදායයේ මුල්ම නිර්මාණය වශයෙන් හැඳින්වේ.
- අප්‍රිකානු වෙස් මුහුණු හා මූර්තිවල කලා ආභාස මෙම නිර්මාණය සඳහා පදනම් වී ඇත.
- ස්පාඤ්ඤයේ බාර්සිලෝනා නගරයේ අවිග්නොන් නම් වීදියේ ජීවත් වූ වීදි ස්ත්‍රීන්ගේ (අභිසරු ලියන්ගේ) ජීවිතය මෙම චිත්‍රය සඳහා වස්තු විෂය වී ඇත.
- ස්ත්‍රී රූප 5 කින් සංරචනය වී ඇති අතර එම රූප ඝනික හැඩයන්ගෙන් යුතු වේ.
- මෙම නව නිර්මාණ ශෛලිය ස්ත්‍රීන්ගේ බාහිර කායික සෞන්දර්ය වෙනුවට ඔවුන්ගේ අභ්‍යන්තර ගති ලක්ෂණ මතු කිරීමට උත්සාහ කිරීමක් විය.
- අභිසරුලියන්ගේ හැඟීම් තීව්‍ර ලෙස ඉදිරිපත් කිරීම සඳහා ඝනික හැඩ හා අප්‍රිකානු වෙස් මුහුණුවල ලක්ෂණ මෙම රූප සඳහා භාවිත කර තිබේ.
- වෙස්මුහුණුවල දක්වෙන ගැඹුරු කැපීම් සහිත ලක්ෂණ මෙම ස්ත්‍රීන්ගේ මුහුණුවලින් දක්වෙමින් මානසික ප්‍රතිවිරෝධී තත්ත්ව හා චිත්ත සන්තාප මනාව නිරූපණය කර ඇත.
- ශාස්ත්‍රාලයීය යථාර්ථවාදී කලාවේ දකිය හැකි පර්යාලෝකය හා ත්‍රිමාන ලක්ෂණ වෙනුවට විෂයානුබද්ධ ව නිරූපිත පර්යාලෝකය හා ත්‍රිමාන ලක්ෂණ මෙම නිර්මාණයෙන් දක්වේ.
- වර්ණ හා ගැඹුරු රේඛා සංයෝජන ද චිත්‍රයේ ප්‍රකාශනය තීව්‍ර කිරීමට මැනැවින් පාදක වී ඇත.
- තෙල් සායම් මාධ්‍ය භාවිත කොට කැන්වසය මත නිර්මාණය කරන ලද මෙම සිතුවම දැනට නිව්යෝර්ක්හි නූතන කලා කෞතුකාගාරයේ (Museum of Modern Art) නිත්‍ය ප්‍රදර්ශනයට තබා ඇත.

## ගුවර්නිකා චිත්‍රය



- පැබ්ලෝ පිකාසෝ විසින් 1937 දී නිර්මාණය කළ ගුවර්නිකා නම් චිත්‍රය සඳහා වස්තු විෂය වී ඇත්තේ 2 වන ලෝක යුද සමයේ දී ගුවර්නිකා නම් නගරයට බෝම්බ හෙළීමේ සිදුවීම යි.
- යුද්ධයේ බිහිසුනු බව දැක්වෙන ප්‍රබල හා විශිෂ්ටතම නිර්මාණයක් වශයෙන් මෙම නිර්මාණය සැලකිල්ලට ලක්ව ඇත.
- යුද්ධයේ අත්දැකීම් අනුව අඳින ලද මෙම නිර්මාණයෙන් හුදෙකලා බව, වැළපීම්, යුක්තිය ඉල්ලා මොරදීම, මළවුන් වැළැඳ ගැනීම ආදී හැඟීම් රාශියක් මැනැවින් ප්‍රකාශ කර තිබේ.
- චිත්‍රයේ හැඟීම් ප්‍රකාශ කිරීම සඳහා පිකාසෝ විසින් යොදන ලද මානව හා සත්ත්ව රූපවල විවිධ කොටස් මැනවින් සංරචනය කර ඇත.
- සංරචනය කරන ලද රූප අතර අශ්ව, ගව හා ස්ත්‍රී පුරුෂ රූ කොටස් මෙන්ම විදුලි බල්බයක කොටස් වන අතර මෙම රූප සුන්බුන් වූ කොටස් ලෙස සම්පිණ්ඩනය කර ඇත.
- චිත්‍රය සඳහා භාවිත රූප ඝනිකවාදී හැඩයන්ගෙන් යුක්ත විය. එම ඝනික හැඩ බාහිර කායික සුන්දරත්වය වෙනුවට අභ්‍යන්තර හැඟීම් මැනැවින් ප්‍රකාශ කිරීමට සමත්ව ඇත.
- පැතලි තලයක් මත විවිධාකාර හැඩතල සංරචනය කර ඇත්තේ, ශාස්ත්‍රාලයීය යථාර්ථවාදී කලාවේ දක්වන පර්යාලෝක හා ත්‍රිමාන ලක්ෂණවලට වඩා වෙනස්ව ය. එනම් විෂයානුගත වන ආකාරයෙනි.
- සීමිත වර්ණ මාලවක් වන අළු, සුදු, කළු පැහැති වර්ණ පමණක් භාවිත කරමින් චිත්‍රයේ ඒකවාර්ණිකත්වයක් ගොඩනගා ඇත.
- හැඩතල හා වර්ණ ආදිය හේතු කොට ගෙන මෙම චිත්‍රය ඝනිකවාදී ශෛලියට අයත් වේ.
- අධිතාත්විකවාදී කලා ලක්ෂණ ද මෙම නිර්මාණයෙන් දැකිය හැකි ය.
- සෙන්ටිමීටර් 135x275 වන ප්‍රමාණයෙන් යුතු තෙල් සායම් මාධ්‍ය භාවිත කරන ලද මෙම විශිෂ්ට කැන්වස් නිර්මාණය වර්තමානයේ ස්පාඤ්ඤයේ මැඩ්රිඩ්හි කලාගාරයක ප්‍රදර්ශනයට තබා ඇත.

**නිපුණතාව 6.0** : **ආගමික හා සංස්කෘතික අංග, දෙස්, විදෙස් තෝරාගත් ශිල්පීන්ගේ කලා නිර්මාණ, අද්‍යතන දෘශ්‍ය කලා කෘති හා ජනමාධ්‍ය ඇසුරින් හඳුනාගත් කලා නිර්මාණ විචාරශීලී ව රසාස්වාදයට ලක් කරමින් ස්වතන්ත්‍ර නිර්මාණ සඳහා භාවිතයට ගනියි.**

**නිපුණතා මට්ටම 6.3** : **තෝරාගත් විදේශීය ශිල්පීන්ගේ නිර්මාණ රසාස්වාදය කරයි.**

**ක්‍රියාකාරකම 6.3.2** : **"හෙන්රි මුවර් ශිල්පියාගේ නිර්මාණ අගයමු"**

**කාලච්ඡේද සංඛ්‍යාව** : **01 යි**

**ඉගෙනුම් පල** :

- හෙන්රි මුවර් ශිල්පියාගේ නිර්මාණ හඳුනාගෙන නම් කරයි.
- නූතන මූර්ති කලාව සඳහා ඔහුගෙන් සිදු වූ සේවය හා කලා ක්‍රියාකාරිත්වය විමසා බලයි.
- නිර්මාණ සඳහා පදනම් වූ ශෛලිය හා සම්පිණ්ඩණ ලක්ෂණ විස්තර කරයි.
- හෙන්රි මුවර් ශිල්පියාගේ නිර්මාණවල කලා ලක්ෂණ රස විඳිමින් ඇගයීමට ලක් කරයි.

**ගුණාත්මක යෙදවුම්** :

- හෙන්රි මුවර් ශිල්පියාගේ නිර්මාණ
  - රජ පවුල
  - වැතිරි සිටින රුව
- ඇමුණුම 6.3.2.1 ට ඇතුළත් කාර්ය පත්‍රිකාව
- ඇමුණුම 6.3.2.2 ට ඇතුළත් කියවීම් පත්‍රිකාව

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පියවර 6.3.2.1** :

- හෙන්රි මුවර් ශිල්පියාගේ මූර්ති දැක්වෙන පින්තූර සිසු අවධානයට යොමු කරවන්න.
- එම මූර්ති ආභාස, වස්තු විෂයය, ශෛලිය සිසුන්ගෙන් විමසන්න.

(මිනිත්තු 10 යි)

**පියවර 6.3.2.2** :

- ඇමුණුම 6.3.2.1 කාර්ය පත්‍රිකාව සිසුන්ට ලබා දෙන්න.
- ඇමුණුම 6.3.2.2 ට ඇතුළත් කියවීම් පත්‍රිකාව කියවීමට සලස්වන්න.
- කියවීම් පත්‍රිකාව ඇසුරින් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට සිසුන්ට සහායවන්න.

(මිනිත්තු 20 යි)

පියවර 6.3.2.3 :
- අහඹු ලෙස තෝරාගත් සිසුන් කිහිපදෙනෙකුගේ, පිළිතුරු පත් ඇගයීමට ලක් කරන්න.
- එක්රැස් කරගත් තොරතුරු හා සිසුන්ගේ පිළිතුරු සැලකිල්ලට ගනිමින් සමාලෝචනයක යෙදෙන්න.

(මිනිත්තු 10 යි)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

පහත සඳහන් කරුණු පිළිබඳ අවධානය යොමු කරමින් ඇමුණුම 6.3.2.1 හා ඇමුණුම 6.3.2.2 පදනම් කරගෙන ඇගයීම හා තක්සේරුකරණ ක්‍රියාවලියේ යෙදෙන්න.

- හෙන්රි මුවර් ශිල්පියාගේ නිර්මාණ නම් කිරීම
- එම නිර්මාණවල ශෛලීය ලක්ෂණ පැහැදිලි කිරීම
- නිර්මාණවලට විෂය වූ තේමා සොයා බැලීම
- හෙන්රි මුවර් ශිල්පියාගේ නිර්මාණවල කලා ලක්‍ෂණ රසවිඳිමින් ඇගයීමට ලක් කිරීම

**ඇමුණුම 6.3.2.1**

## කාර්ය පත්‍රිකාව

- හෙන්රි මුවර් ශිල්පියාගේ නිර්මාණ හොඳින් නිරීක්ෂණය කරන්න.
- ඔබට සපයා ඇති කියවීම් පත්‍රිකාව හොඳින් අධ්‍යයනය කරන්න.
  පහතින් දක්වා ඇති ක්‍රියාකාරකම්වල නිරතවන්න.
  1. හෙන්රි මුවර් ශිල්පියා පිළිබඳ කෙටි විස්තරයක් කරන්න.
  2. පහත සඳහන් කරුණු සැලකිල්ලට ගනිමින් හෙන්රි මුවර් ශිල්පියාගේ නිර්මාණ පිළිබඳ ඇගයීමක් කරන්න.
     i. තේමාව
     ii. ශෛලිය
     iii. ආභාස
     iv. මාධ්‍ය
     v. ශිල්ප ක්‍රමය
     vi. කලා ලක්ෂණ
        - සම්පිණ්ඩන ලක්ෂණ
        - රිද්මය, මතුපිට ස්වභාවය
        - භාව/හැඟීම් හා සමස්ත ප්‍රකාශනය
- ඔබගේ අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් කරගන්න.

# කියවීම් පත්‍රිකාව

## හෙන්රි මුවර් (1898-1986)

- හෙන්රි මුවර් (Henry Moore) 1898 දී එංගලන්තයේ යෝක්ෂයර් (Yorkshire) ප්‍රාන්තයේ කාසල් පෝර්ඩ් නුවර උපත ලැබී ය.
- ග්‍රීක රෝම කලාවේ හා පුනරුද යුගයේ පැවති සාම්ප්‍රදායික මූර්ති නිර්මාණවලින් පසුව නව ආරක මූර්ති කලාවක් ලොවට හඳුන්වා දීමට පුරෝගාමී වූයේ හෙන්රි මුවර් ශිල්පියා ය.
- හෙන්රි මුවර් එතෙක් පැවති දෘශ්‍ය තාත්ත්වික භාවයට වෙනස් වූ වියුක්ත හැඩ මූර්ති ශිල්පයට අනුගත කළ ශිල්පියා වශයෙන් හැඳින්විය හැකි ය.
- ඔහුගේ මානව මූර්ති නිර්මාණ ස්වභාවික පෙනුමෙන් හා ස්වභාවික පරිමාණයෙන් දුරස්වීම පැහැදිලි ලක්ෂණයකි.
- මානව රූපයේ ශරීර හැඩ ඉතා සරල ව නිර්මාණය වීම විශේෂ ලක්ෂණයකි.
- විශාල ප්‍රමාණ ශරීර සහිත වූ මානව රූපවල ඇති හිස කුඩාවට නිරූපණය කිරීම හෙන්රි මුවර්ගේ කෘතිවල දැකිය හැකි වූ ආවේණික ලක්ෂණයකි.
- මුල්කාලීන කෘතීන්වල මිනිස් රුව පැහැදිලි ලෙස මූර්තිමත් කළ ද පසුව ක්‍රමයෙන් සරල වූ හැඩවලට සීමා කරන ලද්දේ ය.
- හෙන්රි මුවර්ගේ මූර්තිවල මූලික තේමාව වූයේ මානව රූපයයි. එවැනි මූර්ති අතර,
  - රජ පවුල
  - වැතිර සිටින රුව සුවිශේෂ ස්ථානයක් ගනී.
- ඔහුගේ නිර්මාණ බොහොමයක් උද්‍යාන මූර්ති වශයෙන් නිර්මාණය වී තිබේ.
- විශාල ලෙස නිර්මාණය කරන මානව රූප මූර්තිමත් කිරීමේ දී කොටස් කිහිපයකින් යුතුව නිර්මාණය කර දක්වයි.
- මූර්ති නිර්මාණ කිරීමේදී භාවිත අමුද්‍රව්‍ය වෙනස් කළ හෙන්රි මුවර් ඒ සඳහා දැව සහ ලෝකඩ, ආදි ද්‍රව්‍ය ආදේශ කරගන්නා ලදි. ඒවා අව්, වැසි, සුළං තත්ත්වයන්ට ඔරොත්තු දීමට හැකිවන මාධ වීම සුවිශේෂත්වයකි.
- අමුද්‍රව්‍ය මෙන් ම මූර්ති මූලධර්ම හා ශිල්ප ක්‍රම ද වෙනස් කළ ශිල්පියෙකි.

## රජ පවුල (King and Queen)



- ස්වභාවික හා තාත්වික හැඩ දැනවීම වෙනුවට නිරූපණාත්මක සහ වියුක්ත හැඩ භාවිත කළ මූර්ති නිර්මාණයක් වශයෙන් රජ පවුල නැමති මූර්තිය හැඳින්විය හැකි ය.
- මෙහි මානව හැඩ ස්වභාවික පෙනුමෙන් හා ස්වභාවික පරිමාණයෙන් දුරස් ව නිරූපණය කර තිබේ.
- හිඳ සිටින ඉරියව්වෙන් නිර්මාණය කර ඇති මෙහි ස්ත්‍රී පුරුෂ හැඩ ඔහුට ම ආවේණික ශෛලියක් තුළ නිර්මාණය කර ඇත.
- මානව රූප ඉතා සරලව හා කොටස් කිහිපයකින් යුතු ව නිර්මාණය කර ඇත.
- විශාල ප්‍රමාණයේ ශරීරය සමඟ හිස කුඩාවට නිරූපණය කිරීම දැකිය හැකි ය.
- සාම්ප්‍රදායික මූර්තිමය ද්‍රව්‍ය වෙනුවට වෙනත් මාධ්‍ය ලෙස ලෝකඩ භාවිත කරමින් කරන ලද නිර්මාණයකි.
- ලෝකඩ මාධ්‍ය නිර්මාණයක් වන මෙය වාත්තු කිරීමේ ශිල්පක්‍රමය අනුව නිර්මාණය කරන ලද්දකි.
- මෙම මූර්තිය උද්‍යාන මූර්තියක් වශයෙන් නිර්මාණය කර ඇත.

## වැතිර සිටින රූපය (Reclining figure)



- වැතිර සිටින ආකාරයෙන් නිර්මාණය කර ඇති මෙම රූපය තුළින් වියුක්ත හැඩ දක්නට ලැබේ.
- ස්වභාවික පෙනුමෙන් හා ස්වභාවික පරිමාණයෙන් දුරස් වූ හැඩ භාවිත කිරීම හෙන්රි මුවර්ගේ මූර්තිවල දැකිය හැකි විශේෂ ලක්ෂණයකි.
- මාධ්‍ය හා මූර්ති නිර්මාණය කිරීමේ මූලධර්ම වෙනස් කිරීමට ගත් උත්සාහයක ප්‍රතිඵලයක් ලෙස මෙම නිර්මාණය හැඳින්විය හැකි ය.
- දිගටි හෝ විවර සහිත හැඩ රිද්මයානුකූල ව හා සමබර ව අවකාශය සමඟ භාවිත කර ඇත.
- ලෝකඩ මාධ්‍යයෙන් හා ලෝහ වාත්තු කිරීමේ ශිල්ප ක්‍රමය අනුව නිර්මාණය කරන ලද නිර්මාණයකි.
- ඉදිරියට නෙරාගිය හා ඇතුළට නෙරාගිය කොටස් සහිත විස්තරාත්මක බවෙන් අඩු සරල හැඩ මෙහි දැකිය හැකි ය.
- මානව ශරීරයේ හැඩ සරල ව නිරූපණය කිරීම හා එම ශරීර හැඩවලට සාපේක්ෂව හිස කුඩාවට නිරූපණය කිරීමේ විශේෂ ලක්ෂණ මෙහි දැකිය හැකි ය.

**නිපුණතාව 7.0** : **දේශීය, විදේශීය ඓතිහාසික චිත්‍ර, මූර්ති, කැටයම් හා ගෘහ නිර්මාණ කලාවන්හි අනන්‍යතා හඳුනාගෙන ඒවායේ කලාත්මක ලක්ෂණ නිර්මාණකරණයේ දී භාවිතයට ගනියි.**

**නිපුණතා මට්ටම 7.1** : **අනුරාධපුර යුගයේ චිත්‍ර, මූර්ති, කැටයම් හා ගෘහ නිර්මාණ අධ්‍යයනය කරයි.**

**ක්‍රියාකාරකම 7.1.1** : **"සීගිරි චිත්‍ර අගයමු"**

**කාලච්ඡේද සංඛ්‍යාව** : **01 යි**

**ඉගෙනුම් පල** :

- සීගිරියේ ඓතිහාසික පසුබිම සොයා බලයි.
- සීගිරි චිත්‍රවල වස්තුවිෂය හා විවිධ මතවාද විමර්ශනය කරයි.
- නිර්මාණාත්මක ශෛලිය සඳහා පදනම් වූ මාධ්‍ය හා ශිල්ප ක්‍රම විස්තර කරයි.
- සීගිරි චිත්‍රවල කලා ලක්ෂණ ඇගයීමට ලක් කරයි.

**ගුණාත්මක යෙදවුම්** :

- සීගිරි චිත්‍ර ඇතුළත් ඡායාරූප, සංයුක්ත තැටි, පරිගණක
- ඇමුණුම 7.1.1.1 ට ඇතුළත් කාර්ය පත්‍රිකාව
- ඇමුණුම 7.1.1.2 ට ඇතුළත් කියවීම් පත්‍රිකාව

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පියවර 7.1.1.1** :

- සීගිරියට අදාළ පින්තූර ප්‍රදර්ශනය කරමින් සිසුන්ගේ අවධානය ලබා ගන්න.
- සීගිරිය පිළිබඳ සිසුන් දන්නා තොරතුරු විමසන්න.

(මිනිත්තු 10 යි)

**පියවර 7.1.1.2** :

- ඇමුණුම 7.1.1.1 ට ඇතුළත් කියවීම් පත්‍රිකාව පන්තියේ කියවීමට හා සවන් දීමට සලස්වන්න.
- සීගිරියේ ඓතිහාසික වටිනාකම පිළිබඳ සිසුන්ගෙන් විමසන්න.
- පින්තූර මගින් විෂය කරුණු තහවුරු කරන්න.
- ඇමුණුම 7.1.1.2 ට ඇතුළත් කියවීම් පත්‍රිකාව කියවීමට සලස්වන්න.
- කියවීම් පත්‍රිකාව ඇසුරින් ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීමට සිසුන් යොමු කරවන්න.

(මිනිත්තු 20 යි)

**පියවර 7.1.1.3** :

- සුදුසු ක්‍රමවේද භාවිත කර පිළිතුරු ඇගයීමට ලක් කරන්න.
- සදොස් පිළිතුරු නිදොස් කර සමස්ත ප්‍රශ්නාවලියට නිවැරදි පිළිතුරු සපයා ගැනීමට සලස්වන්න.
- සමස්ත පාඩම සංක්ෂිප්ත ව සමාලෝචනයක යෙදෙන්න.
- සීගිරිය පිළිබඳ වැඩිදුරටත් තොරතුරු එක් රැස් කරන ලෙස සිසුන් දැනුවත් කරන්න. මිනිත්තු 10 යි)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

පහත සඳහන් කරුණු පිළිබඳ අවධානය යොමු කරමින් ඇමුණුම 7.1.1.1 හා ඇමුණුම 7.1.1.2 පදනම් කරගෙන ඇගයීම හා තක්සේරුකරණ ක්‍රියාවලියේ යෙදෙන්න.

- සීගිරියේ ඓතිහාසික පසුබිම සොයා බැලීම
- සීගිරි චිත්‍රවල වස්තුවිෂය හා විවිධ මතවාද විමර්ශනය කිරීම
- නිර්මාණාත්මක ශෛලිය සඳහා පදනම් වූ මාධ්‍ය හා ශිල්ප ක්‍රම විස්තර කිරීම
- සීගිරි චිත්‍රවල කලා ලක්ෂණ ඇගයීමට ලක් කිරීම

**ඇමුණුම 7.1.1.1**

## කාර්ය පත්‍රිකාව

- ප්‍රදර්ශනය කර ඇති සීගිරි චිත්‍ර නිර්මාණ හොඳින් නිරීක්ෂණය කරන්න.
- ඔබට සපයා ඇති කියවීම් පත්‍රිකාව හොඳින් අධ්‍යයනය කරන්න.
- සීගිරි චිත්‍රවල පවතින සුවිශේෂ ලක්ෂණ හඳුනා ගන්න.
- පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.



1. සීගිරියේ ඓතිහාසික පසුබිම කෙටියෙන් පැහැදිලි කරන්න.
    - යුගය/ කාලය
    - අනුග්‍රහය
2. සීගිරියේ දැකිය හැකි වාස්තු විද්‍යා අංග විස්තර කරන්න.
3. පහත සඳහන් කරුණු සැලකිල්ලට ගනිමින් සීගිරි සිතුවම් පිළිබඳ ඇගයීමට ලක්කරන්න.
    i. සම්ප්‍රදාය / ශෛලිය
    ii. ශිල්ප ක්‍රමය
    iii. කලාත්මක ලක්ෂණ
        - තලය මත රූප භාවිතය
        - වර්ණ භාවිතය
        - රේඛාකරණය
        - භාව ප්‍රකාශනය
4. සීගිරි සිතුවම්වල කලා ප්‍රකාශනය සඳහා පදනම් වූ මතවාද/ අර්ථකථන විස්තර කරන්න.
    - ඔබගේ අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් කරන්න.

# කියවීම් පත්‍රිකාව

## සීගිරිය

- විශිෂ්ට කලාගාරයක් බඳු සීගිරිය මධ්‍යම පළාතේ මාතලේ දිස්ත්‍රික්කයට අයත් ඉනාමලු කෝරලයේ පිහිටා ඇත.
- අනුරාධපුර යුගයේ ක්‍රි.ව.5 වන සියවසට අයත් සීගිරිය, ධාතුසේන රජුගේ දෙවු පුත්‍රයා වන කාශ්‍යප රජුගේ නිර්මාණයක් වේ.
- ශ්‍රී ලාංකේය චිත්‍ර කලා ඉතිහාසයේ සම්භාව්‍ය කලා සම්ප්‍රදායයක ලක්ෂණ සීගිරි චිත්‍ර මගින් පිළිබිඹු කෙරේ.
- සීගිරිය ආසියාවේ ඇති ප්‍රධාන පුරාවිද්‍යාත්මක ස්ථානවලින් එකක් වන අතර අද මෙම ස්ථානය ලෝක උරුමයක් බවට ද පත් ව ඇත.
- සීගිරි පරිශ්‍රයේ ගොඩනගා ඇති වාස්තු විද්‍යාත්මක නිර්මාණ අංග අතර ආරුක්කු, පියගැට පෙළ හා දිය අගල්, පොකුණු ආදියෙන් සැකසුණු ශිලාමය උද්‍යාන සුවිශේෂ වේ.
- සීගිරි පර්වතය පාමුල සිංහපාදය, කැටපත් පවුර හා පර්වතය මුදුනේ රජ මාලිගා නටබුන් වාස්තු විද්‍යාත්මක වශයෙන් ඉතා වැදගත් වේ.




## සීගිරි චිත්‍ර



- සීගිරි චිත්‍ර ලෙස වඩාත් ප්‍රචලිත ව ඇත්තේ පර්වතයේ බටහිර පස කෙවෙනිවල ඇති ස්ත්‍රී රූප ය.
- සීගිරියේ කාන්තා රූප පන්සියයක් පමණ චිත්‍රණය කර තිබුණු බව සීගිරි කුරුටු ගීවල සඳහන් වුවත් දැනට ඉතිරිව ඇත්තේ චිත්‍ර විසි දෙකක් පමණ ය. එයින් ද හොඳ තත්ත්වයෙන් දැකිය හැකිවන්නේ රූප කිහිපයකි.
- මෙම රූප 22 සීගිරි පර්වතයේ බටහිර බෑවුමෙහි කෙවෙනියක (බෙයද) දැකිය හැකි අතර ඊට අමතර ව පර්වත පාමුල ඇතැම් ලෙන් ආශ්‍රිතව ද මෙවැනි සිතුවම් ශේෂව ඇති බව දැකිය හැකි වේ.
- චිත්‍ර ඇඳීමට පෙර ශිල්පියා විසින් සුදුසු පරිදි විසම මතුපිටක් සහිත ගල්තලය මත බදාම ආලේප කර එම ස්ථරය මත චිත්‍ර ඇඳ ඇත.
- ගල් තලය සුමට කර ගැනීමට යොදාගත් බදාමය සඳහා පිදුරු, දහයියා, මැටි, ශාක පත්‍ර කෙඳි, ශාක මැලියම්, හුණු ආදිය යොදා සකස් කරගෙන ඇත.
- බදාම වියළීමට පෙර චිත්‍ර ඇඳ ඇති බව මෙතෙක් පැවති පිළිගත් මතය යි. එම ශිල්ප ක්‍රමය ෆ්‍රෙස්කෝ හෙවත් ෆ්‍රෙස්කෝ බුවනෝ ලෙස හඳුන්වයි. ඇතැම් විද්වතුන්ට අනුව මෙම චිත්‍ර වියළි හුණු බදාමයක් මත ඇඳ ඇති බව දක්වේ.
- සීගිරි චිත්‍ර ශ්‍රී ලාංකේය සම්භාව්‍ය කලා සම්ප්‍රදායකට අයත් ලෙස සැලකේ.
- ඉන්දියාවේ අජන්තා චිත්‍රවල දක්නට ඇති භාවමය හා රූපමය ලක්ෂණ මෙම චිත්‍රවල දක්නට ඇති බව විද්වත් අදහසයි. බොහෝ විට අජන්තා අප්සරා රූපවලට සමාන ලෙස අඳුරු පැහැ සහ ආලෝකමත් පැහැ ස්ත්‍රී රූප යොදා තිබීම අලංකාර වස්ත්‍රාභරණ හා මල්වලින් සැරසී සිටීම වැනි ලක්ෂණ හේතු සාධක ලෙස පෙන්වා දෙයි.

| | | |
|---|---|---|
| සටහන : ෆ්‍රෙස්කෝ (බුවනෝ) | - | තෙත හුණු බදාමය මත ඛණිජවලින් තනා ගන්නා ලද වර්ණවලින් ඇඳීමේ ක්‍රමය. |
| ෆ්‍රෙස්කෝ සිකෝ | - | වියළි හුණු බදාමය මත ඛණිජවලින් තනා ගන්නා ලද වර්ණවලින් ඇඳීමේ ක්‍රමය |
| ටෙම්පරා | - | වියළි බදාමය මත බන්දන මාධ්‍යයක් (මැලියම්) සමඟ මිශ්‍ර කර ගන්නා ලද වර්ණවලින් ඇඳීමේ ක්‍රමය |










## සීගිරි චිත්‍රවල කලා ලක්ෂණ

- කාන්තා උඩුකය රූප පමණක් නිරූපණය කිරීම
- එම රූප එකිනෙකට වෙනස් අනන්‍යතා ලක්ෂණ සහිත ව නිරූපණය කිරීම
- කාන්තා රූප සම්පිණ්ඩනය කිරීමේ දී යුගල හා කේවල රූප වශයෙන් දැක්වීම
- සෑම කාන්තා රූපයක් ම පහළ කොටස වලාකුළුවලින් ආවරණය වූ ස්වභාවයක් දැක්වීම
- ඍජුව ඉදිරිය බලා නොසිටීමත්, සම්පූර්ණයෙන් ම හෝ මඳක් හැරී සිටින ස්වභාවයෙන් යුතු ව දක්වීම
- බොහෝ කාන්තා රූප මල් වට්ටි, මල් පොකුරු අතින් දරා සිටින අයුරු නිරූපණය කර තිබීම
- අලංකාර වස්ත්‍රාභරණයන්ගෙන් සැරසී සිටින ඔවුන්ගේ දත් මත මෙන් ම හිස සැරසීම සඳහා නෙළුම් අරලිය, මානෙල් වැනි මල් වර්ග උපයෝගී කර ගෙන තිබීම
- වර්ණ ගැන්වීම සඳහා කහ, ගුරු, රතු, කොළ, නිල්, කළු ආදී වර්ණ යොදා ගැනීම
- සුළු වශයෙන් වර්ණ ප්‍රභේද භාවිත කරමින් ත්‍රිමාන ලක්ෂණ දැක්වීමට ද උත්සාහ දරා තිබීම
- සිරුර වර්ණ ගැන්වීම සඳහා කහ, රතු වර්ණ යෙදූ අතර අඳුරුවන් කාන්තාවන් දක්වීමේ දී නිලට හුරු අඳුරු කොළ පැහැයක් යොදා ගැනීම
- රූප වටා රිද්මයානුකූල ප්‍රාණ පූර්ණ රේඛාකරණය
- විවිධ ශක්තීන් සමග ත්‍රිමානත්වය (ඝනත්වය) හා චලනය දක්වන රේඛාකරණය

## සීගිරි චිත්‍ර පිළිබඳ විද්වත් මතවාද

**මහාචාර්ය සෙනරත් පරණවිතාන**

සීගිරිය කුවේරයාගේ ආලකමන්දාව නිරූපණය කරන බවත් මෙම රූපවලින් කුවේරයාගේ දියණියන් වන මේඝලතා හා විජ්ජුලතා (වලාකුළු සහ විදුලිය) සංකේතවත් වන බවත් ප්‍රකාශ කරන අතර නිල්වන් ස්ත්‍රීන්ගෙන් මේඝලතා (වලාකුළු) හා රන්වන් ස්ත්‍රීන්ගෙන් විජ්ජුලතා (විදුලිය) නිරූපණය කරන බවත් පෙන්වා දෙයි. සීගිරිය හා සීගිරි චිත්‍ර පිළිබඳ වඩාත් පිළිගත් හා ජනප්‍රිය මතවාදය වන්නේ මෙයයි.

**එච්. සී. පී. බෙල්**

කාශ්‍යප රජුගේ රජ මාළිගාවට සම්බන්ධ බිසෝවරුන් හා සේවිකාවන් මින් නිරූපණය වන බවත්, රාජකීය කතුන් රන්වන් පැහැයෙන් හා පරිචාරිකාවන් නිල්වන් වර්ණයෙන් දක්වා ඇති බවත් පවසයි. එසේ ම ඔවුන් මල් අතින් දරා සිටින්නේ පිදුරංගල විහාරය වැඳීමට යෑමට සූදානම් ව සිටින නිසා බවත් ඔහු පෙන්වා දෙයි.

**ආනන්ද කුමරස්වාමි**

මෙම කාන්තා රූප අප්සරාවන් බව පවසන ඔහු ඊට හේතු වශයෙන් දක්වා සිටින්නේ මෙම සියලු ම කාන්තාවන් ඉනෙන් පහළ වළාකුළුවලින් වැසී ඇති අයුරින් හා ඔවුන් අත මල් දරා සිටින අයුරින් නි-රූපණය කිරීමත් යන කරුණු පදනම් කරගෙන ය.

නිපුණතාව 7.0 : දේශීය, විදේශීය ඓතිහාසික චිත්‍ර, මූර්ති, කැටයම් හා ගෘහ නිර්මාණ කලාවන්හි අනන්‍යතා හඳුනා ගෙන ඒවායේ කලාත්මක ලක්ෂණ නිර්මාණකරණයේ දී භාවිතයට ගනියි.

නිපුණතා මට්ටම 7.1 : අනුරාධපුර යුගයේ චිත්‍ර, මූර්ති, කැටයම් හා ගෘහ නිර්මාණ අධ්‍යයනය කරයි.

ක්‍රියාකාරකම 7.1.2 : "අනුරාධපුර බුදු පිළිම අගයමු"

කාලච්ඡේද සංඛ්‍යාව : 02 යි

ඉගෙනුම් පල :
- අනුරාධපුර යුගයේ බුදු පිළිම නම් කරයි.
- බුදු පිළිම නිර්මාණවල ඓතිහාසික පසුබිම සොයා බලයි.
- නිර්මාණාත්මක ශෛලිය සඳහා පදනම් වූ මාධ්‍ය හා ශිල්ප ක්‍රම විස්තර කරයි.
- බුදු පිළිමවල කලා ලක්ෂණ ඇගයීමට ලක් කරයි.

ගුණාත්මක යෙදවුම් :
- අනුරාධපුර යුගයේ බුදු පිළිම
  - සමාධි පිළිමය
  - තොළුවිල පිළිමය
  - අවුකන බුදු පිළිමය
  - පන්කුලිය බුදු පිළිමය
- ඇමුණුම 7.1.2.1 ට ඇතුළත් කාර්ය පත්‍රිකාව
- ඇමුණුම 7.1.2.2 ට ඇතුළත් කියවීම් පත්‍රිකාව

ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :

පියවර 7.1.2.1 :
- අනුරාධපුර යුගයට අයත් විශිෂ්ට බුදු පිළිමවල ඡායාරූප සිසුන්ගේ අවධානයට යොමු කරවන්න.
- බුදු පිළිම පිළිබඳ සිසුන් සමග සාකච්ඡා කරන්න.
- අනුරාධපුර යුගයේ බුදු පිළිම පිළිබඳ තොරතුරු එක්රැස් කිරීමට සිසුන් යොමු කරවන්න.

(මිනිත්තු 15 යි)

පියවර 7.1.2.2 :
- ඇමුණුම 7.1.2.1 ට අයත් කාර්ය පත්‍රිකාව හා ඇමුණුම 7.1.2.2 ට ඇතුළත් කියවීම් පත්‍රිකාව සිසුන්ට ලබා දෙන්න.
- කියවීම් පත්‍රිකාව ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට සිසුන්ට උපදෙස් දෙන්න.
- ඔවුනොවුන් අතර සාකච්ඡාවෙන් නිවැරදි පිළිතුරු සොයා ගැනීමට මග පෙන්වන්න.

(මිනිත්තු 50 යි)

පියවර 7.1.2.3 : 

- පිළිතුරු සැපයීමෙන් අනතුරු ව අහඹු ලෙස තෝරාගත් සිසුන් කිහිපදෙනෙකුගේ පිළිතුරු ඇගයීමට ලක්කරන්න.
- සමස්ත පාඩම පිළිබඳ සමාලෝචනයක යෙදෙන්න.

(මිනිත්තු 15 යි)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

පහත සඳහන් කරුණු පිළිබඳ අවධානය යොමු කරමින් ඇමුණුම 7.1.2.1 හා ඇමුණුම 7.1.2.2 පදනම් කරගෙන ඇගයීම හා තක්සේරුකරණ ක්‍රියාවලියේ යෙදෙන්න.

- අනුරාධපුර යුගයේ බුදු පිළිම නම් කිරීම
- බුදු පිළිම නිර්මාණය සඳහා ලැබූ අභාස විස්තර කිරීම
- නිර්මාණ ශෛලිය සඳහා පදනම් වූ මාධ්‍ය හා ශිල්ප ක්‍රම විස්තර කිරිම
- බුදු පිළිමවල කලා ලක්ෂණ ඇගයීම හා රස විඳීම

**ඇමුණුම 7.1.2.1**

## කාර්ය පත්‍රිකාව

- ප්‍රදර්ශනය කර ඇති බුදු පිළිම නිර්මාණ හොඳින් නිරීක්ෂණය කරන්න.
- ඔබට සපයා ඇති කියවීම් පත්‍රිකාව හොඳින් අධ්‍යයනය කරන්න.
- අනුරාධපුර බුදු පිළිම නිර්මාණවල පවතින සුවිශේෂ ලක්ෂණ හඳුනාගන්න.
- පහත දැක්වෙන වගුව පිටපත් කර සම්පූර්ණ කරන්න.

01. ඓතිහාසික පසුබිම සමග බුදු පිළිම හඳුනාගැනීම

| බුදු පිළිමය | යුගය/ කාලය | සම්ප්‍රදාය/ශෛලිය | මාධ්‍ය | ශිල්ප ක්‍රමය |
|---|---|---|---|---|
| සමාධි පිළිමය | | | | |
| තොලුවිල පිළිමය | | | | |
| පන්කුලිය පිළිමය | | | | |
| අවුකන පිළිමය | | | | |

02. බුදු පිළිමවල කලාත්මක ලක්ෂණ හඳුනාගැනීම

| බුදු පිළිමය | ඉරියව් | මුද්‍රා හා ආසන ක්‍රමය | උෂ්ණීෂය /සිරස්පත | චීවරය | භාව ප්‍රකාශය |
|---|---|---|---|---|---|
| සමාධි පිළිමය | | | | | |
| තොලුවිල පිළිමය | | | | | |
| පන්කුලිය පිළිමය | | | | | |
| අවුකන පිළිමය | | | | | |

- ඔබගේ අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් කරන්න.

ඇමුණුම 7.1.2.2

## කියවීම් පත්‍රිකාව

### සමාධි බුදු පිළිමය







- අනුරාධපුරයේ අභයගිරි විහාර සංකීර්ණයට අයත් මහමෙව්නා උයනේ දක්නට ලැබෙන (කුට්ටම් පොකුණට නුදුරුව දක්නට ඇති) සමාධි පිළිමය, ශ්‍රී ලංකාවේ බුදු පිළිම අතර අති විශිෂ්ට නිර්මාණයකි.
- බුදු පිළිමයක තිබිය යුතු අධ්‍යාත්මික ශක්තිය හා සමාධි ගුණය මැනවින් පිළිබිඹු වන නිර්මාණයකි.
- ලක්ෂණවත්, අඩවන් නෙත් හා මුහුණේ පිළිබිඹු වන උපශාන්ත බව හා මහාකරුණාව මෙම පිළිමයේ දැකිය හැකි සුවිශේෂ ලක්ෂණ වේ.
- මෙම ප්‍රතිමාව අනුරාධපුර යුගයේ ක්‍රි.ව. 4-5 වන සියවසට පමණ අයත් සේ සැලකේ.
- හෙළුමේ ශිල්ප ක්‍රමයට කරන ලද බුදු පිළිමයකි. එය පූර්ණ වශයෙන් මතුකර තිබේ.
- මෙම ශෛලමය පිළිමයේ ඒකාංශ චීවරය, රැළි රහිත වන අතර ඇඟට ඇළුණු ස්වභාවයෙන් නිරූපිත ය.
- බුදු පිළිමයේ අක්මිමිරු කේශ කලාපය මත මඳ වශයෙන් උෂ්ණීෂය දක්වා ඇත.
- ධ්‍යාන මුද්‍රාවෙන් හා වීරාසන ක්‍රමයෙන් යුත් පිළිමයකි.
- බුදු පිළිමයේ කලා ලක්ෂණ අනුව ඉන්දීය ගුප්ත කලා සම්ප්‍රදායේ ආභාසය පෙන්වයි.

# තොලුවිල බුදු පිළිමය



- අනුරාධපුර තොලුවිලින් සොයාගැනීම නිසා මෙම පිළිමය "තොලුවිල පිළිමය" නමින් හැඳින්වේ.
- අනුරාධපුර යුගයේ ක්‍රි. ව. 7 වැනි සියවස පමණ කාලයට අයත් ලෙස සැලකේ.
- තෙළිඹේ ශිල්ප ක්‍රමයට නිර්මාණය කරන ලද ශෛලමය ප්‍රතිමාවකි. මෙය පූර්ණව මතු කර ඇත.
- ධ්‍යාන මුද්‍රාව හා වීරාසන ක්‍රමයෙන් වැඩ සිටියි.
- ඉතා සුන්දර ප්‍රසන්න උපශාන්ත ස්වභාවයක් පිළිබිඹු කරන මෙම පිළිමය උසස් භාව ප්‍රකාශනයෙන් ද යුක්ත ය.
- ලඹසවන්, අඩවන් නෙත් මෙම පිළිමයේ දැකිය හැකි සුවිශේෂ ලක්ෂණ වේ.
- ඒකාංශ චීවරය, රැළි රහිත වන අතර ඇඟට ඇළුණු ස්වභාවයක් නිරූපිත ය.
- බුදු පිළිමයේ අස්මිමරු කේශ කලාපය මත මිඳ වශයෙන් උෂ්ණීෂය දක්වා ඇත.
- ගුප්ත සම්ප්‍රදායේ ලක්ෂණ මෙම ප්‍රතිමාවෙන් ප්‍රකටවන බව විද්වතුන්ගේ මතය වී තිබේ.
- මෙම පිළිමය කොළඹ කෞතුකාගාරයේ ප්‍රදර්ශනය කෙරේ.

## අවුකන පිළිමය





- අනුරාධපුර යුගයට අයත් මෙම ප්‍රතිමාව හිටි බුද්ධ ප්‍රතිමා අතර සුවිශේෂ නිර්මාණයක් වශයෙන් සැලකේ.
- කලාවැව අසල අවුකන ග්‍රාමයේ පිහිටි කලුගල් පර්වතයක අඩි උන්නත ව හා ආබද්ධ ව නෙළා ඇත.
- පද්මාසනයක් මත සමභංග ඉරියව්වෙන් වැඩ හිඳින අයුරින් නෙළා ඇත.
- දකුණතින් අභය මුද්‍රාව දැක්වෙන අතර වම් අත සිවුරු රැල්ල දරා සිටින අයුරින් දක්වා ඇත.
- ඒකාංශ කළ චීවරය රිද්මයානුකූල රැළිරටාවකින් අලංකාර වන අතර ඇඟට ඇළුණු ස්වභාවයක් දක්වයි.
- බුදු පිළිමයේ අක්බමරු කේෂ කලාපය සමඟ උෂ්ණීෂය දක්වා ඇත.
- උෂ්ණීෂය මත සිරස් පතක් යොදා ඇත. එය පසුව එක් කළ අංගයක් බවට මතයක් පවතී.
- මෙම ප්‍රතිමාවට ඉන්දියාවේ අමරාවති සම්ප්‍රදායේ ඇතැම් කලා ලක්ෂණ බලපා ඇති බව විද්වතුන්ගේ අදහසයි.
- බුදුන් වහන්සේගේ මහා තේජෝ බල පරාක්‍රමය හා මහාපුරුෂ ලක්ෂණ මැනවින් ප්‍රකට කරන බුදුපිළිමයක් ලෙස අවුකන බුදු පිළිමය සැලකනු ලැබේ.
- අවුකන පිළිමය ක්‍රි.ව. 5 - 8 සියවස් අතර කාලයට අයත් නිර්මාණයක් ලෙස සැලකේ.

## පන්කුලිය බුදු පිළිමය





- අනුරාධපුර යුගයට අයත් මෙම ප්‍රතිමාව ධර්ම දේශනා කරන ස්වරූපය දක්වන විශිෂ්ට නිර්මාණයකි.
- මෙම බුද්ධ ප්‍රතිමාව අනුරාධපුර පන්කුලිය නම් ග්‍රාමයේ, අශෝකාරාම විහාරයේ දැකිය හැකි ය.
- ශෛලමය බුදු රුවකි.
- වීරාසන ක්‍රමයට වැඩ හිඳින අයුරින් නෙළා ඇත. පූර්ණ උන්නත ව මතුකර ඇත.
- දකුණතින් විතර්ක මුද්‍රාව දැක්වෙන අතර වමතින් කටක හස්ත මුද්‍රාව පිළිබිඹු වන බවට මතයක් පවතී.
- ලඹසවන්, අඩවන් නෙත්, උපශාන්ත බව මෙම පිළිමයේ ද දැකිය හැකි සුවිශේෂ අංග ලක්ෂණ වේ.
- බුදුන්ගේ මහාකරුණාව සහිත ආධ්‍යාත්මික ගුණ ප්‍රකාශනය බුදු පිළිමයෙන් මතු කර දක්වේ.
- ඒකාංශ කළ චීවරය ඇඟට ඇළුණු රැළි රහිත ස්වභාවයක් දක්වයි.
- අක්බමරු සහිත කේෂ නිරූපණය සමග මද වශයෙන් උෂ්ණීෂය දක්වා ඇත.
- ඒ මත යොදන ලද සිරස් පතක් තිබුණු බවට සාධක විද්වතුන් පෙන්වා දෙයි.
- ක්‍රි.ව. 5-6 වැනි සියවස්වලට අයත් වන ලෙස සැලකෙන මෙම බුද්ධ ප්‍රතිමාවෙන් ගුප්ත කලා ශෛලියේ ලක්ෂණ දැකිය හැකි බව විචාරක මතයයි.

නිපුණතාව 7.0 : දේශීය, විදේශීය ඓතිහාසික චිත්‍ර, මූර්ති, කැටයම් හා ගෘහ නිර්මාණ කලාවන්හි අනන්‍යතා හඳුනා ගෙන ඒවායේ කලාත්මක ලක්ෂණ නිර්මාණකරණයේ දී භාවිතයට ගනියි.

නිපුණතා මට්ටම 7.1 : අනුරාධපුර යුගයේ චිත්‍ර, මූර්ති, කැටයම් හා ගෘහ නිර්මාණ අධ්‍යයනය කරයි.

ක්‍රියාකාරකම 7.1.3 : ''ඉසුරුමුණි කැටයම් අගයමු''

කාලච්ඡේද සංඛ්‍යාව : 02 යි

ඉගෙනුම් පල

- ඉසුරුමුණි කැටයම් හඳුනා ගනිමින් නම් කරයි.
- ඉසුරුමුණියේ ඓතිහාසික පසුබිම සොයා බලයි.
- නිර්මාණ සඳහා පදනම් වූ ආභාස, මාධ්‍ය හා ශිල්ප ක්‍රම විස්තර කරයි.
- ඉසුරුමුණි කැටයම් නිර්මාණවල කලා ලක්ෂණ ඇගයීමට ලක් කරයි.

ගුණාත්මක යෙදවුම් :

- ඉසුරුමුණි කැටයම් ඇතුළත් ඡායාරූප
  - පෙම් යුවල කැටයම
  - රජපවුල කැටයම
  - මිනිසා සහ අශ්ව හිස කැටයම
  - ඇතුන් ජල ක්‍රීඩා කරන විලාස දැක්වෙන කැටයම
- ඇමුණුම 7.1.3.1 ට ඇතුළත් කාර්ය පත්‍රිකාව
- ඇමුණුම 7.1.3.2 ට ඇතුළත් කියවීම් පත්‍රිකාව

ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :

පියවර 7.1.3.1 :

- ඉසුරුමුණි විහාරයේ කැටයම් සහිත පින්තූර ප්‍රදර්ශනය කර ඒ පිළිබඳ සිසු අවධානය යොමු කරවන්න.
- ඉසුරුමුණි කැටයම් නිර්මාණ, ඒවායේ ආභාස, ශෛලිය සිසුන්ගේ පෙර දැනුම විමසන්න.
- ඉසුරුමුණි කැටයම් නිර්මාණවලට අදාළ තොරතුරු එක්රැස් කිරීමට සිසුන් යොමු කරවන්න.

(මිනිත්තු 15 යි)

පියවර 7.1.3.2 :

- ඇමුණුම 7.1.3.1 කාර්ය පත්‍රිකාව සිසුන්ට ලබා දෙන්න.
- ඇමුණුම 7.1.3.2 ට ඇතුළත් කියවීම් පත්‍රිකාව සිසුන්ට ලබා දෙන්න.
- කියවීම් පත්‍රිකාව ඇසුරින් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට සිසුන්ට උපදෙස් දෙන්න.

(මිනිත්තු 50 යි)

පියවර 7.1.3.3 :

- පන්තියේ සිසුන් කිහිපදෙනෙකු අහඹු ලෙස තෝරාගෙන ඔවුන්ගේ පිළිතුරු ඇගයීමට ලක් කරන්න.
- සමස්ත ක්‍රියාකාරකම පිළිබඳ සමාලෝචනයක යෙදෙන්න.

(මිනිත්තු 15 යි)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

පහත සඳහන් කරුණු පිළිබඳ අවධානය යොමු කරමින් ඇමුණුම 7.1.3.1 හා ඇමුණුම 7.1.3.2 පදනම් කරගෙන ඇගයීම හා තක්සේරුකරණ ක්‍රියාවලියේ යෙදෙන්න.

- ඉසුරුමුණි කැටයම් නිර්මාණවල ඓතිහාසික පසුබිම සොයා බැලීම
- ඉසුරුමුණි කැටයම් හඳුනාගනිමින් ඒවා නම් කිරීම
- එම නිර්මාණ සඳහා පදනම් වූ ආභාස, මාධ්‍ය හා ශිල්ප ක්‍රම විස්තර කිරීම
- ඉසුරුමුණි කැටයම්වල කලාත්මක ලක්ෂණ විස්තර කිරීම

**ඇමුණුම 7.1.3.1**

## කාර්ය පත්‍රිකාව

- ප්‍රදර්ශනය කර ඇති ඉසුරුමුණි කැටයම් නිර්මාණ හොඳින් නිරීක්ෂණය කරන්න.
- ඔබට සපයා ඇති කියවීම් පත්‍රිකාව හොඳින් අධ්‍යයනය කරන්න.
- ඉසුරුමුණි කැටයම් නිර්මාණවල පවතින සුවිශේෂ ලක්ෂණ හඳුනා ගන්න.
- පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
    1. ඉසුරුමුණි විහාරයේ ඓතිහාසික පසුබිම කෙටියෙන් පැහැදිලි කරන්න.
        - යුගය/ කාලය
        - අනුග්‍රහය
    2 ඉසුරුමුණි කැටයම් නම් කරන්න.
    3. එම එක් එක් කැටයම් පිළිබඳ පහත කරුණු සැලකිල්ලට ගනිමින් කලාත්මක ඇගයීමක් කරන්න.
        - මාධ්‍ය
        - ශිල්ප ක්‍රමය
        - ශෛලිය/ ආභාස
        - කලාත්මක ලක්ෂණ
            - රූපමය ස්වභාවය ( ශරීර හා ඉරියව් ලක්ෂණ, ඇඳුම් පැලඳුම් ආදී )
            - භාව ප්‍රකාශනය
    4. මානව රූ සහිත ඉසුරුමුණි කැටයම් සඳහා පදනම් වූ මතවාද / අර්ථ කථන විස්තර කරන්න.

- ඔබගේ අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් කරන්න.

ඇමුණුම 7.1.3.2

## කියවීම් පත්‍රිකාව

### ඉසුරුමුණි කැටයම්

- ඉසුරුමුණි විහාරය හා එහි දක්නට ඇති කැටයම් අනුරාධපුර යුගයට අයත් ය.
- ඉසුරුමුණි විහාරය අනුරාධපුර තිසා වැව අසල රන්මසු උයනට දකුණින් පිහිටා ඇත.
- මෙම විහාරය ශ්‍රී ලංකාවේ ප්‍රථමයෙන් ඉදි වූ විශාල සංඝාරාම පන්හෙන් එකක් විය.
- මහාවංශයේ සඳහන් වන ආකාරයට ඉසුරුමුණි විහාරය ක්‍රි.පූ 3 වැනි සියවසේ දේවානම්පියතිස්ස රජු විසින් මිහිඳු මහතෙරුන් වෙතින් පැවිදි බව ලබාගත් අරිට්ඨ කුමරයා ප්‍රධාන ඉසුරු කුල දරුවන් පන්සියයක් දෙනා වැඩසිටීම සඳහා කරවන ලද "ඉසරසමණ"විහාරය වෙයි.



- බෞද්ධ සිද්ධස්ථානයක් වුව ද මෙහි හමුවන කලාකෘති ආගමික වස්තුවිෂයයන්ගෙන් වෙනස් ලක්ෂණ නිරූපණය කොට ඇත.
- අර්ධ උන්නත සහ අල්ප උන්නත නෙළීමේ ශිල්ප ක්‍රමයට සම්පිණ්ඩනය කරන ලද පහත දක්වෙන මානව රූප හා සත්ත්ව රූප කැටයම් ඒ සඳහා සාධක වේ.
  - පෙම් යුවල කැටයම
  - රජපවුල කැටයම
  - මිනිසා සහ අශ්ව හිස කැටයම
  - ඇතුන් ජල ක්‍රීඩා කරන විලාස දැක්වෙන කැටයම
- ඉසුරුමුණි කැටයම්වල වස්තු විෂය හා රූප සංරචනය සඳහා හින්දු ආගමික සංකල්ප හා ගුප්ත හා පල්ලව කලා නිර්මාණවල ලක්ෂණ ආභාසය ලැබී ඇතැයි විද්වතුන් විසින් පිළි ගැනේ.
- මෙම කැටයම්වල දැක ගත හැකි කලාත්මක ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ.
  - තලයට උචිත ලෙස සංරචනය කිරීමේ හැකියාව
  - භාවාත්මක ගුණාංග මුහුණින් හා ඉරියව්වලින් ප්‍රකාශ කිරීම
  - රිද්මයානුකූල ව ස්වභාවික හැඩතල හා ඉරියව් ඉස්මතු කිරීම
  - සියුම් හා මටසිළිටු නිමාවකින් යුතුවීම

## රජපවුල කැටයම



- ඉසුරුමුණි කැටයම් අතර ඇති සුවිශේෂ කැටයමක් ලෙස මෙම රජපවුල කැටයම සැලකේ.
- මෙම කැටයම අඩි 4ක් පමණ දිග අර්ධකවාකාර ගල් පුවරුවක අර්ධ උන්නතව කොටන ලද කැටයමකි.
- අර්ධ කවාකාර ගල් පුවරු තලය මත මනාව රූප මනාව සම්පිණ්ඩනය කර ඇත. මෙහි මධ්‍යයේ මහා රාජ ලීලාවෙන් හිඳින රුවකි. දකුණුපසින් දැත ලය මත බැඳ හිඳගත් පිරිමියෙකු ද ඔහු පිටුපසින් මධ්‍ය රූපයට චාමර සලන තවත් අයෙක් (සේවකයෙක්) ද පෙන්නුම් කරයි.
- මහාචාර්ය සෙනරත් පරණවිතාන සූරීන්ට අනුව මින් නිරූපණය වන්නේ දුටු ගැමුණු රජ පවුලයි.
- රාජකීය වස්ත්‍රාභරණයන්ගෙන් සැරසී හිඳ සිටින රූපයෙන් දුටු ගැමුණු මහ රජතුමන් එම දකුණු පසින් එකත්පස්ව දැත් බැඳ ගෙන සිටින රුවෙන් සාලිය කුමරුන් දක්වෙතැයි පරණවිතාන සූරීන් අදහස් කරයි.
- අලංකාර වස්ත්‍රාභරණ හා පිරුණු අඟපසඟින් යුතු රූපවල ඉරියව් විද්‍යානුකූල ස්වභාවික ස්වරූපයක් ගනියි.
- කැටයමේ සෑම රූපයකම මුහුණෙන් හා ඉරියව්වලින් භාවාත්මක ලක්ෂණ ප්‍රකාශිත වේ.
- සියුම් හා මටසිලිටු නිමාවකින් යුතුව නිර්මාණය කර ඇති කැටයමකි.

## පෙම් යුවල කැටයම



- මෙම කැටයම ගුප්ත කලා සම්ප්‍රදායේ කලා ලක්ෂණ පෙන්වන නිර්මාණයකි.
- මෙම කැටයම හතරැස් ගල් පුවරුවක අර්ධ උන්නතව තෙළන ලද කැටයමකි.
- මෙම නිර්මාණය පිළිබඳ විවිධ මත පවතින අතර ඉන් ජනප්‍රිය මතවාදය වන්නේ මහාචාර්ය සෙනරත් පරණවිතානයන් දක්වන අදහසයි. එනම් මින් නිරූපණය වන්නේ සාලිය අශෝකමාලා බවයි. මෙම අදහස දැක්වීමට හේතු වශයෙන් සාලිය අශෝකමාලා පෙම් පුවත හා සම්බන්ධ රන්මසු උයන මීට සමීපව පිහිටීම දක්වයි.
- මෙම නිර්මාණය පිළිබඳ පවතින වෙනත් මත කිහිපයක් පහත දැක්වේ.
  - ශිව හා පාර්වතී බව
  - මංජුශ්‍රී බෝසතාණන්ගේ වේශයක් බව
  - සෙබලෙක් හා ඔහුගේ පෙම්වතිය බව
- පෙම් යුවල කැටයමේ දැකිය හැකි සුවිශේෂ කලාත්මක ලක්ෂණ අතර අලංකාර වස්ත්‍රාභරණයන්ගෙන් යුතු වීම, ජීව ශක්තියෙන් යුතු පිරිපුන් ශරීරය, ප්‍රේමය පිළිබඳ භාවාත්මක හැඟීම් ප්‍රකාශනය ආදිය දැක්විය හැකි ය.
- සියුම් බව හා මටසිලිටු නිමාව, ස්වභාවික හැඩතල හා රිද්මයානුකූල ඉරියව් ඉස්මතු කිරීම මෙම කැටයමේ දැකිය හැකි අනෙක් සුවිශේෂ ලක්ෂණ වේ.

## මිනිසා සහ අශ්ව හිස කැටයම



- ඉසුරුමුණි විහාරයේ පොකුණ හා සම්බන්ධ පිහිටි පර්වත බිත්තියේ මෙම මිනිසා හා අශ්වහිස දක්වෙන කැටයම නිර්මාණය කර ඇත.
- මෙම කැටයමින් මිනිසෙකු වාඩිවී ඉදිරිය දෙස බලා සිටින අයුරු දක්වා ඇත.
- ඔහු හිඳ සිටින ඉරියව්ව මහරාජලීලාසන ක්‍රමය ලෙස හඳුන්වනු ලැබේ.
- වස්ත්‍රාභරණ ඉතා අඩුවෙන් හා චාම්ව යොදා ඇත. හිස් වැස්මක්, කන්වල හා අත්වල ආභරණ ද ඉතෙහි කෙටි ඇඳුමක් සහිත ව නිරූපණය කර ඇත.
- ඔහුගේ දකුණු බාහුවේ පටලවා ගත් ලණුව අශ්වයාට සම්බන්ධ ය. අශ්වයාගේ හිස පමණක් පෙනෙන්නට ඇත.
- පරණවිතාන මහතාට අනුව මිනිස් රුවෙන් වර්ෂාව ඇති කරන පර්ජන්‍යත්, අශ්ව හිසෙන් විදුලිය නොහොත් අග්නි සංකේතවත් කරයි.
- මෙම නිර්මාණය පිළිබඳ පවතින වෙනත් මත කිහිපයක් පහත දැක්වේ.
    - යුධ සෙබලෙක්/ සෙනෙවියෙක් බව
    - කපිල සෘෂිවරයා බව
- මෙම රූපයේ දක්වෙන ප්‍රතාපවත් බව, චාම් ස්වභාවය හා අඟ පසඟවල දිගටි ස්වරූපය නිසා පල්ලව කලා ලක්ෂණ බලපා ඇතැයි අනුමාන කෙරේ.
- සියුම් හා මටසිලිටි නිමාවකින් යුතුව අර්ධ උන්නත ව කොළන ලද කැටයමකි.

## ජල ක්‍රීඩා කරන විලාස දැක්වෙන කැටයම





- ඉසුරුමුණි විහාරයේ පොකුණ හා සම්බන්ධ පිහිටි පර්වත බිත්තියේ මෙම ඇත් රූප කැටයම දැකිය හැකි වේ.
- අල්ප උන්නත ව නෙළන ලද මෙම කැටයමින් ඇතුන් පොකුණට බැස දිය කෙලින (ජල ක්‍රීඩා කරන) විවිධ ඉරියව් දක්වා ඇත.
- මෙම ඉරියව් අතර පාර්ශවදර්ශී ඇත් රූප හා සෘජුදර්ශී පෙනුමෙන් යුතු රූප වේ.
- ඇතුන්ගේ චලනය හා රිද්මය, ක්‍රියාශීලිත්වය මනාව සම්පිණ්ඩනය කරන ලද නිර්මාණයකි.
- සියුම් හා මටසිලිටි නිමාවකින් යුතුවීම ස්වභාවික හැඩතල හා ඉරියව් ඉස්මතු කිරීම දැකිය හැකි ය.
- ඉන්දියාවේ පල්ලව කලා සම්ප්‍රදායට අයත් මහාබලිපුරම්හි ආකාශ ගංගාවරෝහණ කැටයමේ ඇත් රූපවලට සමාන ලක්ෂණ මින් පෙන්වන බව විචාරක අදහසයි.

**නිපුණතාව 7.0** : **දේශීය, විදේශීය ඓතිහාසික චිත්‍ර, මූර්ති, කැටයම් හා ගෘහ නිර්මාණ කලාවන්හි අනන්‍යතා හඳුනා ගෙන ඒවායේ කලාත්මක ලක්ෂණ නිර්මාණකරණයේ දී භාවිතයට ගනියි.**

**නිපුණතා මට්ටම 7.2** : **පොළොන්නරු යුගයේ චිත්‍ර, මූර්ති හා කැටයම් හා ගෘහ නිර්මාණ අධ්‍යයනය කරයි.**

**ක්‍රියාකාරකම 7.2.1** : **"තිවංක පිළිමගෙයි චිත්‍ර නිර්මාණ අගයමු"**

**කාලච්ඡේද සංඛ්‍යාව** : 01 යි

**ඉගෙනුම් පල** :
- තිවංක පිළිමගෙයි චිත්‍ර නිර්මාණ පිළිබඳ තොරතුරු එක්රැස් කරයි.
- තිවංක පිළිමගෙයි චිත්‍ර නම් කරයි.
- තිවංක පිළිමගෙයි චිත්‍ර නිර්මාණවල ඓතිහාසික පසුබිම සොයා බලයි.
- නිර්මාණාත්මක ශෛලිය සඳහා පදනම් වූ ආභාස, මාධ්‍ය හා ශිල්ප ක්‍රම විස්තර කරයි.
- තිවංක පිළිමගෙයි චිත්‍රවල කලා ලක්ෂණ ඇගයීමට ලක් කරයි.

**ගුණාත්මක යෙදවුම්** :
- තිවංක පිළිමගෙයි බිතු සිතුවම්වල පින්තූර
  - දේවාරාධනය
  - බුදුන් සංකස්ස පුරයට වැඩම කිරීම
  - තේමිය ජාතකය
- ඇමුණුම් 7.2.1.1 ට ඇතුළත් කාර්ය පත්‍රිකාව
- ඇමුණුම් 7.2.1.2 ට ඇතුළත් කියවීම් පත්‍රිකාව

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පියවර 7.2.1.1** :
- තිවංක පිළිමගෙයි චිත්‍ර පිළිබඳ සිසු අවධානය යොමු කරවන්න.
- තිවංක පිළිමගෙයි චිත්‍ර හා අදාළ තොරතුරු එක්රැස් කරවීමට සිසුන් යොමු කරවන්න.
- එම කලා නිර්මාණ පිළිබඳ ව සිසුන්ගේ පෙර දැනුම විමසන්න.

(මිනිත්තු 10 යි)

**පියවර 7.2.1.2** :
- ඇමුණුම 7.2.2.1 ඇතුළත් කාර්ය පත්‍රිකාව සිසුන්ට ලබා දෙන්න.
- ඇමුණුම 7.2.2.2 ට ඇතුළත් කියවීම් පත්‍රිකාව සිසුන්ට ලබා දෙන්න.
- කියවීම් පත්‍රිකාව ආශ්‍රයෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට සිසුන්ට උපදෙස් දෙන්න.

(මිනිත්තු 20 යි)

**පියවර 7.2.1.3** :
- සිසුන් කිහිපදෙනෙකුගේ පිළිතුරු පත් ඇගයීමට ලක් කරන්න.
- සමස්ත ක්‍රියාකාරකම පිළිබඳ සමාලෝචනයක යෙදෙන්න.

(මිනිත්තු 10 යි)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

පහත සඳහන් කරුණු පිළිබඳ අවධානය යොමු කරමින් ඇමුණුම 7.2.1.1 හා ඇමුණුම 7.2.1.2 පදනම් කරගෙන ඇගයීම හා තක්සේරුකරණ ක්‍රියාවලියේ යෙදෙන්න.

- පොළොන්නරු යුගයේ විශිෂ්ට චිත්‍ර නිර්මාණ සහිත තිවංක පිළිමගෙයි ඓතිහාසික තොරතුරු සොයා බැලීම
- තිවංක පිළිමගෙයි චිත්‍ර නිර්මාණවලට විෂය වූ තේමා නම් කිරීම
- නිර්මාණාත්මක ශෛලිය සඳහා පදනම් වූ ආභාස, මාධ්‍ය හා ශිල්ප ක්‍රම විස්තර කිරීම
- තිවංක පිළිමගෙයි බිතු සිතුවම්වල කලා ලක්ෂණ ඇගයීමට ලක් කිරීම

**ඇමුණුම 7.2.1.1**

## කාර්ය පත්‍රිකාව

- ප්‍රදර්ශනය කර ඇති තිවංක පිළිමගෙයි බිතු සිතුවම් හොඳින් නිරීක්ෂණය කරන්න.
- ඔබට සපයා ඇති කියවීම් පත්‍රිකාව හොඳින් අධ්‍යයනය කරන්න.
- තිවංක පිළිමගෙයි බිතු සිතුවම්වල පවතින සුවිශේෂ ලක්ෂණ හඳුනා ගන්න.

- පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
  1. තිවංක පිළිමගෙයි බිතු සිතුවම්වල ඓතිහාසික පසුබිම කෙටියෙන් පැහැදිලි කරන්න.
     - යුගය/ කාලය
     - අනුග්‍රහය
  2. තිවංක පිළිමගෙයි දැකිය හැකි බිතු සිතුවම් නම් කරන්න.
  3. තිවංක පිළිමගෙයි චිත්‍ර පිළිබඳ පහත කරුණු සැලකිල්ලට ගනිමින් කලාත්මක ඇගයීමක් කරන්න.
     - සම්ප්‍රදාය / ශෛලිය
     - ශිල්ප ක්‍රමය
     - කලාත්මක ලක්ෂණ
       - තලය මත රූප භාවිතය
       - වර්ණ භාවිතය
       - රේඛාකරණය
       - භාව ප්‍රකාශනය

- ඔබගේ අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් කරන්න

## කියවීම් පත්‍රිකාව

### තිවංක පිළිමගෙයි චිත්‍ර


- ක්‍රි. ව. 12 වැනි සියවසේ 1වන පරාක්‍රමබාහු රජු විසින් ඉදිකරන ලද තිවංක පිළිමගෙය බෞද්ධ චිත්‍ර කලාවේ විශිෂ්ට නිර්මාණ සාධක පිළිබිඹු කරන පැරණි බෞද්ධ ගෘහ නිර්මාණයක් වේ.
- පොළොන්නරු යුගයේ හින්දු වාස්තු විද්‍යාත්මක ආභාසය සහිත ව නිර්මාණය වූ සුවිශේෂ බෞද්ධ ප්‍රතිමා මන්දිරයක් ලෙස මෙය හැඳින් වේ.
- පොළොන්නරු යුගයේ චිත්‍ර කලාව පිළිබඳ විශිෂ්ට සාධක මෙම ප්‍රතිමා ගෘහයෙන් හමු වේ.
- ශ්‍රී ලාංකේය චිත්‍ර කලා විකාශනයේ යුග දෙකක චිත්‍ර කලා ශෛලීය ලක්ෂණ මෙහි පිළිබිඹු කරයි.
- අන්තරාලයේ දක්නට ලැබෙන ''දේවාරාධනාව'' චිත්‍රය හා ගර්භගෘහයේ දැකිය හැකි ''සංකස්ස පුරයට වැඩම කිරීම'' නැමති සිතුවම් මුල් යුගයේ සිතුවම් ලෙස හඳින්වේ.
- ප්‍රවේශ මණ්ඩපයේ දැකිය හැකි බෝධිසත්ව චරිතය දක්වෙන ජාතක කතා සිතුවම් පසුකලක කරන ලද චිත්‍ර ලෙස සැලකේ.
- ජාතක කතා චිත්‍ර අතර තේමිය ජාතකය, සස ජාතකය, අසංකවතී ජාතකය හා චුල්ල පදුම ජාතකය ප්‍රධාන තැනක් ගනියි.
- මුල්කාලීන චිත්‍ර ලෙස සැලකෙන ගර්භගෘහයේ හා අන්තරාලයේ සිතුවම් අනුරාධපුර චිත්‍ර කලා ලක්ෂණ පෙන්වයි.
- ප්‍රවේශ මණ්ඩපයේ දක්වෙන පසුකාලීන සිතුවම් වන ජාතක කතා සිතුවම් මහනුවර චිත්‍ර සම්ප්‍රදායට සමාන ලක්ෂණ පෙන්වයි.
- තීරු චිත්‍ර සංරචනය, අඛණ්ඩ කථනය, පාර්ශ්වදර්ශී රූප, පසුබිම සඳහා රක්ත වර්ණය භාවිතය ජාතක කතා චිත්‍රවල දැකිය හැකි සුවිශේෂ ලක්ෂණ වේ.
- තිවංක පිළිමගෙයි චිත්‍ර වියළි බදාමයක් මත ඇඳීමේ ශිල්ප ක්‍රමයකට නිර්මාණය කර ඇතැයි සැලකේ.
- ශ්‍රී ලාංකේය චිත්‍ර කලා ඉතිහාසයේ පසු සම්භාව්‍ය කලා සම්ප්‍රදායක ලක්ෂණ මෙම සිතුවම් වලින් පිළිබිඹු වන බව විද්වත් අදහසයි.


## දේවාරාධනාව චිත්‍රය



- මෙම සිතුවම තිවංක පිළිමගෙයි අන්තරාලය නම් වාස්තු විද්‍යා කොටසේ දක්නට ලැබේ.
- මෙම සිතුවමින් තව්තිසා දෙව්ලොව විසූ බෝසතුන්ට මනුලොව උපත ලබන ලෙස දෙවියන් විසින් කරන ලද ආරාධනය නිරූපණය කරයි.
- අලංකාර වස්ත්‍රාභරණයන්ගෙන් සැරසී සිටින බොහෝ දේව රූ ප්‍රමාණයක් අන්තරාල බිත්ති පුරා දක්වා ඇති අතර ඒවා සැබෑ මානව රූප ප්‍රමාණයට වඩා විශාල වේ.
- නමස්කාර හා මල් ඉසින ස්වරූපයෙන් නිරූපිත දේවරූප බොහොමයක් රන්වන් පාටින් දක්වා ඇති අතර නිලට හුරු ලා කොළපාටින් යුතු ශරීර ඇති දේවරූප වෙයි. එය බොහෝ විට අජන්තා පද්මපානි බෝසත් රූපයට සමාන ලක්ෂණ පෙන්වයි.
- වර්ණ ගැන්වීම සඳහා රතු, දුඹුරු සහ කහ වර්ණ බහුල වශයෙන් භාවිත කර තිබීම දැකිය හැකි ය.
- චිත්‍රමය අවකාශය මත සංකීර්ණ ලෙස රූප සම්පිණ්ඩනය කර තිබීම මෙම නිර්මාණවල දැකිය හැකි සුවිශේෂත්වයකි.

## බුදුන් සංකස්ස පුරයට වැඩම කිරීම චිත්‍රය





- සංකස්ස පුරයට වැඩම කිරීම යන සිතුවම ප්‍රතිමාව සඳහා සැකසුණු ගර්භ ගෘහයේ දක්නට ලැබේ.
- බුදුන්වහන්සේ මාතෘ දිව්‍ය රාජයාට දම් දෙසනු පිණිස තව්තිසා දෙව්ලොවට වැඩම කර නැවත සක්දෙව් රජු විසින් මවන ලද රන් හිණිමඟින් සංකස්ස පුරයට වැඩම කිරීම යන අවස්ථාව මින් පිළිබිඹු කෙරේ.
- විශාල තලයක් පුරා මෙම අවස්ථාව සංරචනය කර ඇති අතර එහි බුදුන්ගේ රූපය මානව ප්‍රමාණයට වඩා විශාලව නිරූපණය කර ඇත.
- මුල්කාලීන ව නිර්මාණය කර ලද චිත්‍ර ලෙස සැලකෙන මෙම සිතුවම් අනුරාධපුර චිත්‍ර කලා ලක්ෂණ පෙන්වයි.
- වර්ණ ගැන්වීම සඳහා රතු, දුඹුරු සහ කහ වර්ණ බහුල වශයෙන් භාවිත කර තිබීම දැකිය හැකි ය.
- දේවාරාධනය සිතුවමට සමාන ශෛලීය ලක්ෂණ හා වර්ණ භාවිතය මෙම සිතුවමින් ද දැකිය හැකි ය.

## තේමිය ජාතකය



- තේමිය ජාතකයේ බෝධිසත්ව චරිතය දක්වෙන සුවිශේෂ සිතුවම් කොටසක් ලෙස මෙම සිතුවම හැඳින්විය හැකි ය.
- ජාතක කතා සිතුවම් දක්නට ලැබෙන මණ්ඩපය නම් වාස්තුවිද්‍යා අංගයේ ඉතා පැහැදිලිව පෙනෙන සිතුවම් කොටසක් ලෙස මෙම සිතුවම හඳුනාගත හැකි වේ.
- මෙම සිතුවමින් අස්ව රථයෙහි අත් පා නොසෙල්වා සිටින තේමිය කුමාරයත්, වළක් හැරීමට සැරසෙන සුනන්ද නම් වූ රථාචාරියාත්, ඔහුට ඉදිරිපසින් බෝධිසත්ව විලාසයෙන් සිටින තේමිය කුමාරයාත් දක්වේ.
- වර්ණ ගැන්වීම සඳහා ගුරු, දුඹුරු සහ කහ වර්ණ බහුල වශයෙන් භාවිත කර තිබීම දැකිය හැකි ය.
- මෙම නිර්මාණවල ශෛලීය ලක්ෂණ මහනුවර චිත්‍ර සම්ප්‍රදායට සමාන ලක්ෂණ පෙන්වයි.
- තීරු චිත්‍ර සංරචනය, අඛණ්ඩ කථනය, පාර්ශ්වදර්ශී රූප, පසුබිම සඳහා රක්ත වර්ණය භාවිතය මෙම චිත්‍රවල දැකිය හැකි සුවිශේෂ ලක්ෂණ වේ.

**නිපුණතාව 7.0** : **දේශීය, විදේශීය ඓතිහාසික චිත්‍ර, මූර්ති, කැටයම් හා ගෘහ නිර්මාණ කලාවන්හි අනන්‍යතා හඳුනා ගෙන ඒවායේ කලාත්මක ලක්ෂණ නිර්මාණකරණයේ දී භාවිතයට ගනියි.**

**නිපුණතා මට්ටම 7.2** : **පොළොන්නරු යුගයේ චිත්‍ර, මූර්ති හා කැටයම් හා ගෘහ නිර්මාණ අධ්‍යයනය කරයි.**

**ක්‍රියාකාරකම 7.2.2** : **''පොළොන්නරු යුගයේ ශෛලමය ප්‍රතිමා අගයමු''**

**කාලච්ඡේද සංඛ්‍යාව** : **02 යි**

**ඉගෙනුම් පල** :
- පොළොන්නරු යුගයේ ශෛලමය ප්‍රතිමා නම් කරයි.
- ප්‍රතිමා නිර්මාණවල ඓතිහාසික පසුබිම සොයා බලයි.
- නිර්මාණාත්මක ශෛලිය සඳහා පදනම් වූ මාධ්‍ය හා ශිල්ප ක්‍රම විස්තර කරයි.
- පොළොන්නරු යුගයේ ශෛලමය ප්‍රතිමාවල තොරතුරු එක් රැස් කරයි.
- පොළොන්නරු යුගයේ ශෛලමය ප්‍රතිමා අගයයි, රස විඳියි.

**ගුණාත්මක යෙදවුම්** :
- පොළොන්නරු යුගයේ ශෛලමය ප්‍රතිමා නිර්මාණවල ඡායාරූප
  - ගල්විහාරයේ බුදු පිළිම
  - පොත්ගුල් විහාර ප්‍රතිමාව
- ඇමුණුම 7.2.2.1 ට ඇතුළත් කාර්ය පත්‍රිකාව
- ඇමුණුම 7.2.2.2 ට ඇතුළත් කියවීම් පත්‍රිකාව

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පියවර 7.2.2.1** :
- පොළොන්නරු යුගයේ ශෛලමය ප්‍රතිමා නිර්මාණවල ඡායාරූප සිසු අවධානයට යොමු කරවන්න.
- ගල්විහාරයේ බුදු පිළිමවල හා පොත්ගුල් විහාර ප්‍රතිමාවේ ශෛලිය, සම්ප්‍රදාය පිළිබඳ ව සිසුන්ගෙන් විමසන්න.
- ගල්විහාරයේ බුදු පිළිම හා පොත්ගුල් විහාර ප්‍රතිමාව පිළිබඳ තොරතුරු එක්රැස් කිරීමට සිසුන් යොමු කරවන්න.

(මිනිත්තු 15 යි)

**පියවර 7.2.2.2** :
- ඇමුණුම 7.2.2.1 ට ඇතුළත් කාර්ය පත්‍රිකාව සිසුන්ට ලබාදෙන්න.
- ඇමුණුම 7.2.2.2 ට ඇතුළත් කියවීම් පත්‍රිකාව සිසුන්ට ලබා දෙන්න.
- කියවීම් පත්‍රිකාව ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට සිසුන්ට උපදෙස් දෙන්න.

(මිනිත්තු 50 යි)

**පියවර 7.2.2.3** :
- පන්තියේ සිසුන් කිහිපදෙනෙකුගේ පිළිතුරු ඇගයීමට ලක් කරන්න.
- සමස්ත ක්‍රියාකාරකම පිළිබඳ සමාලෝචනයක යෙදෙන්න.

(මිනිත්තු 15 යි.)

ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

පහත සඳහන් කරුණු පිළිබඳ අවධානය යොමු කරමින් ඇමුණුම 7.2.2.1 හා ඇමුණුම 7.2.2.2 පදනම් කරගෙන ඇගයීම හා තක්සේරුකරණ ක්‍රියාවලියේ යෙදෙන්න.

- ගල්විහාරයේ බුදු පිළිම හා පොත්ගුල් විහාර ප්‍රතිමාව පිළිබඳ ඓතිහාසික තොරතුරු සොයා බැලීම
- ගල්විහාරයේ බුදු පිළිම හා පොත්ගුල් විහාර ප්‍රතිමාවේ දැකිය හැකි මූලික ලක්ෂණ විමසා බැලීම
- පොළොන්නරු යුගයේ බුදු පිළිමවල හා පොත්ගුල් විහාර ප්‍රතිමාවේ නිර්මාණාත්මක ශෛලිය සඳහා පදනම් වූ මාධ්‍ය හා ශිල්ප ක්‍රම විස්තර කිරීම
- ගල්විහාරයේ බුදු පිළිම හා පොත්ගුල් විහාර ප්‍රතිමාවේ කලාත්මක ලක්ෂණ ඇගයීම හා රසවිඳීම

ඇමුණුම 7.2.2.1

## කාර්ය පත්‍රිකාව

- ප්‍රදර්ශනය කර ඇති ගල්විහාරයේ බුදු පිළිම හා පොත්ගුල් විහාර ප්‍රතිමාව හොඳින් නිරීක්ෂණය කරන්න.
- ඔබට සපයා ඇති කියවීම් පත්‍රිකාව හොඳින් අධ්‍යයනය කරන්න.
- පහත දැක්වෙන වගුව පිටපත් කර සම්පූර්ණ කරන්න.

1. ඓතිහාසික පසුබිම සමග බුදු පිළිම හඳුනා ගැනීම

| බුදු පිළිමය | යුගය/ කාලය | අනුග්‍රහය | සම්ප්‍රදාය/ශෛලීය | මාධ්‍ය | ශිල්ප ක්‍රමය |
|---|---|---|---|---|---|
| සමාධි පිළිමය | | | | | |
| විද්‍යාධර ගුහාවේ ප්‍රතිමාව | | | | | |
| හිටි පිළිමය | | | | | |
| සැතපෙන පිළිමය | | | | | |

2. බුදු පිළිමවල දැකිය හැකි කලාත්මක ලක්ෂණ හඳුනාගැනීම

| බුදු පිළිමය | මුද්‍රා හා ඉරියව්ව | ආසනය හා ආසන ක්‍රමය | උෂ්ණීෂය | චීවරය | ශීර්ෂ ලක්ෂණ | වෙනත් කලා ලක්ෂණ |
|---|---|---|---|---|---|---|
| සමාධි පිළිමය | | | | | | |
| විද්‍යාධර ප්‍රතිමාව | | | | | | |
| හිටි පිළිමය | | | | | | |
| සැතපෙන පිළිමය | | | | | | |

3. පොත්ගුල් විහාර පිළිමය පිළිබඳ පහත කරුණු යටතේ ඇගයීමක් කරන්න.

 - යුගය/ කලය
 - මාධ්‍ය
 - ශිල්ප ක්‍රමය
 - කලාත්මක ලක්ෂණ - රූපමය ස්වභාවය ( ශරීර හා ඉරියව් ලක්ෂණ, ඇඳුම් පැළඳුම් ආදී )
 - භාව ප්‍රකාශනය

- ඔබගේ අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් කරන්න.

ඇමුණුම 7.2.2.2

## කියවීම් පත්‍රිකාව

### ගල්විහාරයේ බුදු පිළිම

- ක්‍රි.ව. 12 වැනි සියවසේ පොළොන්නරු යුගයේ දී මහා පැරකුම්බා රජතුමා විසින් ගල් විහාරය හෙවත් උත්තරාරාමය ඉදි කරවන ලදි.
- ගල්විහාරය යන නාමය මේ සඳහා යෙදී ඇත්තේ බුදු පිළිම සතරක් ගලින් නෙළා ඇති හෙයිනි. එසේම ඒවා පිහිටි ගලෙහි ම ස්වභාවය අනුව අධිඋන්නත ශිල්පක්‍රමයට සම්පිණ්ඩනය කර තිබීම දැකිය හැකි ය.
- ගල්විහාරයේ බුදු පිළිම ථේරවාදී බෞද්ධ සංකල්පවලට වඩා මහායාන බෞද්ධ සංකල්පය ඉස්මතු කරන බව විචාරක මතය යි.
- ගල්විහාරයේ බුදු පිළිමවල දැකිය හැකි පොදු ලක්ෂණ
  - මහායාන කලා සම්ප්‍රදායයේ ලක්ෂණ අනුව මහා කරුණා ගුණයට වඩා දශබල ගුණය හා වීරත්වය පෙන්වීම
  - ඒකාංශ කරන ලද ඇඟට ඇළුණු චීවරයෙහි රැළි සමාන්තර ව ද්විත්ව රේඛාකරණයෙන් යුතු වීම
  - ශීර්ෂ ලක්ෂණ වශයෙන් අඩවන් නෙත්, ලඹසවන් හා අක්බමරු සහිත කේෂ නිරූපණය සමග උෂ්ණීෂ ශීර්ෂ ලක්ෂණ දැක්වීම

### සමාධි බුද්ධ ප්‍රතිමාව - විශාල හිඳි පිළිමය





- මෙය ගල්විහාර පූජා භූමිය තුළ වීරාසන ඉරියව්වෙන් වැඩ හිඳින විශාල සමාධි බුද්ධ ප්‍රතිමාවයි.
- අධි උන්නත ව නෙළන ලද මෙම පිළිමය ධ්‍යාන මුද්‍රාවෙන් නිරූපිත ය.
- වජ්‍ර සංකේත හා සිංහ රූ කැටයම් නිසා වැඩ හිඳින ආසනය වජ්‍රාසනය ලෙස හඳුන්වනු ලැබේ.
- බුදුපිළිමයේ හිසට පිටුපසින් නෙළුම් මල් සැරසිලි හා විමාන ලක්ෂණ සහිත අලංකාර තොරණක් දක්වා ඇත.
- මෙම තොරණේ තිරස් සිරස් කුලුනු, විමාන සමග වන කුඩා සමාධි බුදු පිළිම, තිරස් කුලුනු කෙළවර මකර මුඛ හා සිංහ රූප කැටයම් දැකිය හැකි ය.

- පිහිටි ගල මත මටසිලිටි නිමාවකින් නිර්මිත මෙම ප්‍රතිමාවේ ඒකාංශ චීවරය ද්විත්ව රේඛාකරණය සහිත ඇඟට ඇලුණු ස්වරූපයෙන් යුතු ව නෙළා ඇත.
- ලඹසවන් හා අක්බමරු කෙස් සමග උෂ්ණීෂ ශීර්ෂ ලක්ෂණ නිරූපිත ය.
- ප්‍රතිමාවේ පිළිබිඹු වන නිර්මාණ අංග මතින් මහායාන සංකල්පය මතු කිරීමට උත්සාහ දරන බවත් විද්වත් අදහස් වේ.

## විද්‍යාධර ගුහාවේ බුද්ධ ප්‍රතිමාව



- ශ්‍රී ලාංකේය ගල් කැටයම් අතර අභ්‍යන්තරයට කපා සකස් කළ පළමු විශාල ගුහාව වන්නේ විද්‍යාධර ගුහාවයි.
- ගුහාව මධ්‍යයේ වජ්‍ර සංකේත හා සිංහ රූප කැටයම් සහිත වජ්‍රාසනයක් මත බුදුන් වහන්සේ වීරාසන ක්‍රමයෙන් හා ධ්‍යාන මුද්‍රාවෙන් වැඩ හිඳී.
- අධි උන්නත ව නෙළන ලද ප්‍රතිමාවකි.
- බුද්ධ ප්‍රතිමාව සමග විවිධ නිර්මාණාත්මක රූප ගල් බිත්තිය මත උන්නත ව සම්පිණ්ඩනය කර ඇත.
- ප්‍රතිමාවට පිටුපස තොරණකි. හිසට ඉහළින් ඡත්‍රයකි. දෙපස ඉහළින් දේවතා රූප දෙකක් හා පහළ ආසනය දෙපස චාමර දරන්නන් හා ආසනයේ පසු ඇන්ද දෙපස නැගී සිටින ව්‍යාල රූප දෙකකි.
- ඉහළින් දක්වා ඇති දේවතා රූප බ්‍රහ්ම හා විෂ්ණු රූපයත්, පිළිමය දෙපස චාමරධාරී රූපත් දක්වා ඇත.
- ගල් සිවිලිමේ හා බිත්තිවල දෙවියන්ගේ රූප විශාල ප්‍රමාණයක් චිත්‍රණය කර තිබුණු බවට සාධක ඇති අතර බ්‍රහ්ම ඇතුළු දෙවිවරුන් එම සිතුවම්වලින් නිරූපන කෙරේ.
- සියුම් ව නෙළා ඇති ප්‍රතිමාවේ ඒකාංශ කරන ලද චීවරය ද්විත්ව රේඛා මගින් නිරූපිත ය.
- ලඹසවන් හා අක්බමරු කේෂකලාපය මත උෂ්ණීෂ ශීර්ෂ ලක්ෂණ දක්වා ඇත.
- ප්‍රතිමාවේ පිළිබිඹු වන නිර්මාණ අංග මතින් මහායාන සංකල්පය මතු කිරීමට උත්සාහ දරන බවත් විද්වත් අදහස වේ.

## සිටි පිළිමය




- පද්මාසනයක් මත ත්‍රිභංග ලක්ෂණ සහිත ව සිටි ඉරියව්වෙන් අධි උන්නත ව කොටා ඇත.
- සියුම් ව කොටා ඇති ප්‍රතිමාවේ ඒකාංශ කරන ලද චීවරය ද්විත්ව රේඛා මගින් දක්වා ඇත.
- ප්‍රතිමාවේ දෑත් ළය මත බැඳ ගෙන සිටින සේ නිර්මාණය කර ඇති අතර මහාචාර්ය සෙනරත් පරණවිතාන මහතාගේ මතය අනුව එමගින් පරදුක්ඛ දුක්ඛිත මුද්‍රාව නිරූපිත ය.
- මෙම ප්‍රතිමාව, බුදුන්වහන්සේගේ පරිනිර්වාණයේ දී වැලපෙන ආනන්ද තෙරුණුවන්ගේ යැයි අනුමාන කෙරෙන මතයක් ද වේ.
- මෙම පිළිමයෙන් දක්වෙන මුද්‍රාව පිළිබඳ මේ වන විට වෙනස් මතවාද පවතී.
- ලඹසවින්, අක්ෂිබිරු ගෝල කලාපය මත උෂ්ණීෂය පුරුවමින් යොදා තිබීම හා පද්මයක් මත වැඩ සිටීම ආදී කරුණු මූලික කරගෙන මෙය බුදු පිළිමයක් වශයෙන් ද පිළිගැනීමට ලක් වී ඇත.

## සැතපෙන බුද්ධ ප්‍රතිමාව









- ගල්විහාරයේ දකුණුපස කෙළවර දැකිය හැකි මෙම පිළිමය සැතපෙන ඉරියව්වෙන් යුතු බුදු පිළිමය යි.
- මෙම ප්‍රතිමාව පිරිනිවන් මංචකය බවට ඇතැමුන් විශ්වාස කළ ද වර්තමානයේ ඇතැම් විචාරකයින්ගේ අදහස වන්නේ එමගින් බුදුරජාණන් වහන්සේගේ සැතපෙන අවස්ථාව නිරූපිත බවයි.
- උසස් ශිල්පීය ලක්ෂණ පෙන්නුම් කරන මෙම ප්‍රතිමාවේ හිසකෙස් අක්ඛඹරු ස්වභාවය හා සමාන්තර යුගල රේඛා දක්වන සිවුර විශේෂ ලක්ෂණ වේ.
- ප්‍රතිමාවේ ශීර්ෂය සහිත කොට්ටය එබී ඇති ආකාරය දක්වීමෙන් ගල්විහාර කැටයම් ශිල්පියා සතු සියුම් ශිල්පීය හැකියාව මනාව පිළිබිඹු කිරීමක් වශයෙන් හඳුනාගත හැකි වේ.
- මෙම ශෛලමය ප්‍රතිමාව අධි උන්නත ව නෙළන ලද්දකි.

# පොත්ගුල් විහාර ප්‍රතිමාව

- පොළොන්නරුවේ පරාක්‍රම සමුද්‍රය අසල පොත්ගුල් විහාරය ඉදිරිපිට මෙම ශෛලමය ප්‍රතිමාව කොටා ඇත.
- පොළොන්නරු යුගයේ ක්‍රි.ව. 11-12 සියවසට අයත් නිර්මාණයක් ලෙස සැලකේ.
- පිහිටි ගලක අධි උන්නත ව කොටා ඇති ප්‍රතිමාවකි.
- මහාව වැඩුණු ශරීරයකින් යුතු මෙහු එක් පාදයකට බර දී අනෙක් පාදය සැහැල්ලුව තබා ගෙන ත්‍රිභංග ඉරියව්වෙන් සිටීම නිසා ශරීරයේ රිද්මයානුකූල බවක් නිරූපණය වේ.
- ගම්භීර ප්‍රතාපවත් මිනිසා කල්පනාකාරී ස්වරූපයකින් යුක්ත ව තම ගද අත මත ඇති වස්තුව දෙස බලා සිටී.
- ළය පෙදෙස දක්වා වැටී ඇති ගැටී රැවුලක්, දෙකොපුලවරින් පහතට නැමී ගොස් ඇති උඩු රැවුල රූපයට ශාන්ත බවක් ගෙන දෙන අතර මහේශාක්‍ය ලීලාවක් පෙන්නුම් කරයි.
- දෝතියක් වැනි ඇඳුමකින් යටිකය අලංකාර වේ. බඳ පටිය ඉණට තද වී තිබීම නිසා උදරය ඉදිරියට නෙරා ඇති බව පෙනේ.
- මෙම ප්‍රතිමාව පොළොන්නරු යුගයේ මූර්ති ශිල්පයේ ප්‍රබුද්ධ කලා ලක්ෂණ ප්‍රකට කරවන්නකි.

**පොත්ගුල් විහාර ප්‍රතිමාව පිළිබඳ පවතින විවිධ මත**

- පැරකුම්බා රජු බව
- පොළොන්නරුවේ විසූ ගුරුළුගෝමී පඬිවරයා බව
- කපිල ඍෂිවරයා බව
- දැත දරා ඇති දෙයින් රාජ්‍යත්වය සංකේතවත් කරන බව.
- පුලස්ති ඍෂිවරයාගේ නිරූපණයක් බව

නිපුණතාව 7.0 : දේශීය, විදේශීය ඓතිහාසික චිත්‍ර, මූර්ති, කැටයම් හා ගෘහ නිර්මාණ කලාවන්හි අනන්‍යතා හඳුනාගෙන ඒවායේ කලාත්මක ලක්ෂණ නිර්මාණකරණයේ දී භාවිතයට ගනියි.

නිපුණතා මට්ටම 7.2 : පොළොන්නරු යුගයේ චිත්‍ර, මූර්ති හා කැටයම් හා ගෘහ නිර්මාණ අධ්‍යයනය කරයි.

ක්‍රියාකාරකම 7.2.3 : ''හින්දු ආගමික ලෝකඩ ප්‍රතිමා අගයමු''

කාලච්ඡේද සංඛ්‍යාව : 02 යි

ඉගෙනුම් පල :
- පොළොන්නරු යුගයේ හින්දු පිළිමවල ඓතිහාසික පසුබිම සොයා බලයි.
- පොළොන්නරු යුගයේ හින්දු ප්‍රතිමා නම් කරයි.
- නිර්මාණ සඳහා පදනම් වූ ශෛලීය ලක්ෂණ හා ශිල්ප ක්‍රම විස්තර කරයි.
- පොළොන්නරු යුගයේ හින්දු ප්‍රතිමාවල තොරතුරු එක්රැස් කරයි.
- පොළොන්නරු යුගයේ හින්දු ප්‍රතිමාවල කලා ලක්ෂණ අගයමින් රස විඳියි.

ගුණාත්මක යෙදවුම් :
- හින්දු ආගමික ලෝකඩ ප්‍රතිමාවල ඡායාරූප
  – නටරාජ ප්‍රතිමාව
  – පාර්වති පිළිමය
  – ගණදෙවි පිළිමය
  – කාරයික්කාර් අම්මයියාර්
  – සුන්දරමූර්තිස්වාමි
- ඇමුණුම 7.2.3.1 ට ඇතුළත් කාර්ය පත්‍රිකාව
- ඇමුණුම 7.2.3.2 ට ඇතුළත් කියවීම් පත්‍රිකාව

ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :

පියවර 7.2.3.1 :
- පොළොන්නරු යුගයේ හින්දු ප්‍රතිමා පිළිබඳ සිසු අවධානය යොමු කරවන්න.
- පොළොන්නරු යුගයේ හින්දු ප්‍රතිමා නිර්මාණ පිළිබඳ සිසු දැනුම පිරික්සමින් එම නිර්මාණවල වස්තු විෂය, ශෛලිය විමසන්න.
- පොළොන්නරු යුගයේ දැකිය හැකි හින්දු ප්‍රතිමාවල තොරතුරු එක් රැස් කිරීමට සිසුන් යොමු කරවන්න.

(මිනිත්තු 15 යි)

පියවර 7.2.3.2 : 

- ඇමුණුම 7.2.3.1 කාර්ය පත්‍රිකාව සිසුන්ට ලබා දෙන්න.
- ඇමුණුම 7.2.3.2 ට ඇතුළත් කියවීම් පත්‍රිකාව සිසුන්ට ලබා දෙන්න.
- කියවීම් පත්‍රිකාවේ තොරතුරු ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට සිසුන්ට උපදෙස් දෙන්න.

(මිනිත්තු 50 යි)

පියවර 7.2.3.3 : 

- අහඹු ලෙස තෝරාගත් සිසුන් කිහිප දෙනෙකුගේ පිළිතුරු පිළිබඳ ඇගයීමක් කරන්න.
- සමස්ත ක්‍රියාකාරකම පිළිබඳ සමාලෝචනයක යෙදෙන්න.

(මිනිත්තු 15 යි)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

පහත සඳහන් කරුණු පිළිබඳ අවධානය යොමු කරමින් ඇමුණුම 7.2.3.1 හා ඇමුණුම 7.2.3.2 පදනම් කරගෙන ඇගයීම හා තක්සේරුකරණ ක්‍රියාවලියේ යෙදෙන්න.

- පොළොන්නරු යුගයේ හින්දු ප්‍රතිමා නිර්මාණය වීමේ ඓතිහාසික පසුබිම සොයා බැලීම
- නිර්මාණ සඳහා පදනම් වූ ශෛලිය, මාධ්‍ය හා ශිල්ප ක්‍රම විස්තර කිරීම
- පොළොන්නරු යුගයේ හින්දු ප්‍රතිමාවල කලා ලක්ෂණ ඇගයීම හා රසවිඳීම

**ඇමුණුම 7.2.3.1**

## කාර්ය පත්‍රිකාව

- ප්‍රදර්ශනය කර ඇති පොළොන්නරු යුගයේ හින්දු ප්‍රතිමා හොඳින් නිරීක්ෂණය කරන්න.
- ඔබට සපයා ඇති කියවීම් පත්‍රිකාව හොඳින් අධ්‍යයනය කරන්න.
- පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
    1. පොළොන්නරු යුගයේ හින්දු ප්‍රතිමා නම් කරන්න.
    2. මෙම එක් එක් නිර්මාණ පිළිබඳ හැඳින්වීමක් කරන්න.
        - යුගය සහ කාලය
        - හමු වූ ස්ථානය
    3 . මූර්ති නිර්මාණවල කලාත්මක ශෛලිය සඳහා පදනම් වූ පහත අංග විස්තර කරන්න.
        - සම්ප්‍රදාය/ආභාසය
        - මාධ්‍ය
        - ශිල්ප ක්‍රම
        - කලාත්මක ලක්ෂණ - රූපමය ස්වභාවය ( ශරීර හා ඉරියව් ලක්ෂණ, ඇඳුම් පැළඳුම් ආදී )
          - භාව ප්‍රකාශනය
- ඔබගේ අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් කරන්න.

ඇමුණුම 7.2.3.2

## කියවීම් පත්‍රිකාව

### නටරාජ මූර්තිය



- හින්දු ආගමික මූර්තියක් වූ නටරාජ ප්‍රතිමාව ශිව හෙවත් ඊශ්වර දෙවියන්ගේ තාණ්ඩව නර්තන විලාසයක් පෙන්නුම් කරයි.
- කොළඹ ජාතික කෞතුකාගාරයේ ප්‍රදර්ශනයට තබා ඇති මෙම නටරාජා රුව හමුවී ඇත්තේ පොළොන්නරුවේ අංක 1 ශිව දේවාලයෙනි. මෙය ක්‍රි.ව. 12 වැනි සියවස් වලට අයත් ලෙස සැලකේ.
- ලෝකඩ මාධ්‍යයෙන් පූර්ණ උන්නත ව මූර්තිමත් කර ඇති මෙම නිර්මාණය ලෝහ වාත්තු කිරීමේ ඉපැරණි ශිල්ප ක්‍රමය පෙන්වන විශිෂ්ට නිර්මාණයක් ලෙස සැලකේ.
- සමබරතාව රැකෙන පරිදි මූර්ති සිද්ධාන්ත මත පිහිටා ගිනි කදම්භයක් තුළ වේගවත් නර්තනයක යෙදෙන අයුරු දක්වීම මෙම නිර්මාණයේ විශිෂ්ට ශිල්පීය ලක්ෂණයකි.
- මෙම ප්‍රතිමාවේ අත් වලින් දක්වන සංකේත හා මුද්‍රා පහත දක්වේ.

  දකුණුපස ඉහළ හස්තයේ - උඩැක්කිය / බෙරය

  වම්පස ඉහළ හස්තයේ - ගිනිසිළුව

  දකුණු පහළ හස්තය - අභය මුද්‍රාව

  වම්පස පහළ හස්තය - පොළොවට දිගු කරගෙන සිටින ලෙසින් ගජ හස්ත මුද්‍රාව
- වම්පය ඔසවා රඟන ශිව දකුණු පාදයෙන් සිරුරේ බර දරාසිටින අතර එම පාදයෙන් පාගාගෙන සිටින වාමන රුවෙන් අවිද්‍යාව සංකේතවත් කරයි.
- කෙස් කළඹ තුළ ඇති කිඳුරු රුවින් ගංගානම් ගඟ නිරූපණය කෙරෙන අතර, හිස පැළැඳි ඔටුන්නෙහි අඩ සඳක්, මිනිස් හිස්කබලක්, කිඳුරු රූපයක් හා නාග රූපයක් දැක් වේ.
- මුළු රූපයම ගිනි දල් විහිදෙන ආරුක්කුවක් ඇතුළත පිහිටා ඇති අතර මෙම ආරුක්කුව ඇරඹෙන්නේ පද්මාසනයක් මත පිහිටුවා ඇති බද්ධ කරනු ලැබූ මකර මුඛවලිනි.
- මෙම මූර්තියේ දකුණු කනෙහි පුරුෂ කර්ණාභරණයක් හා වම් කනෙහි ස්ත්‍රී කර්ණාභරණයක් දැක්වෙන අතර ග්‍රීවාභරණ ද පැලැඳ ඇත.

## ශිවකාම සුන්දරී ප්‍රතිමාව



- මෙය ශිවගේ පතිනිය වූ පාර්වති දෙවඟන රූපයයි. පර්වතයේ උපන් නිසා පාර්වති ලෙස හඳුන්වන ලබන අතර එසේ ම ඇය ශිවගේ පතිනිය වූ නිසා ශිව ශක්ති, ශිවකාමසුන්දරී ආදී නාමයන්ගෙන් ද හඳුන්වනු ලැබේ.
- පොළොන්නරු අංක 5 දරන ශිව දේවාලයෙන් හමු වී දැනට පොළොන්නරු කෞතුකාගාරයේ ප්‍රදර්ශනය කෙරෙන මෙම ප්‍රතිමාව ස්ත්‍රී ලාලිත්‍ය ප්‍රකට කරන උසස් මූර්තියකි.
- ක්‍රි.ව 12 වැනි සියවසට අයත් නිර්මාණයක් වන මෙය ලෝකඩ මාධ්‍ය භාවිතයෙන් ලෝහ වාත්තු කිරීමේ ශිල්ප ක්‍රමය අනුව කරන ලද නිර්මාණයකි.
- දකුණු අත කටක හස්ත මුද්‍රවෙන් යුක්ත ය. වමත ලෝහ හස්ත මුද්‍රාවෙන් පහත හෙළා ගෙන සිටින ලෙසින් දක්වේ.
- හිස් පලඳනාව, ඇඟට ඇළුණු වස්ත්‍ර හා අලංකාර ආභරණ මෙම ප්‍රතිමාවේ අලංකරණය වැඩි කරයි.
- ස්ත්‍රී ලාලිත්‍ය මැනැවින් මූර්තිමත් කරන ත්‍රිභංග ඉරියව්වෙන් යුතු වූ විශිෂ්ට නිර්මාණයක් වශයෙන් මෙම මූර්තිය සැලකේ.

## ගණදෙවි ප්‍රතිමාව



- පොළොන්නරුවේ අංක 5 දරණ හින්දු කෝවිලෙන් හමු වූ හින්දු ආගමික මූර්තියකි.
- ක්‍රි.ව. 12 වැනි සියවසට අයත් ලෙස සැලකෙන මෙම ගණ දෙවි රූපය මේවන විට පොළොන්නරු කෞතුකාගාරයේ ප්‍රදර්ශිතය.
- ලෝකඩ මාධ්‍ය හා ලෝහ වාත්තු කිරීමේ ශිල්ප ක්‍රමය භාවිත කර ඇත.
- ශිව හා පාර්වතිගේ වැඩිමහල් පුත්‍රයා ගණ දෙවියන් ලෙස සැලකේ.
- ඇත් හිසක් හා විශාල උදරයක් සහිත ශරීරයකින් යුතු ගණ දෙවි ඥානයට අධිපති දෙවියන් මෙන්ම බාධක ඉවත්කරන්නා ලෙස ද සැලකේ.
- මෙම ප්‍රතිමාව අත් සතරකින් යුක්ත ය.

  පිටුපස දකුණතින් - කෙටේරිය

  පිටුපස වමතින් - අක්ෂරමාලාව

  ඉදිරිපස දකුණතින් - බිඳුණු දළයක්

  ඉදිරි පස වමතින් - අඹ ගෙඩියක් දරා සිටියි.
- පද්මාසනයක් මත රාජාසන ලීලාවෙන් හිඳින ලෙසින් මෙම ප්‍රතිමාව නිමවා ඇත.


## කාරයික්කාල් අම්මයියාර් මූර්තිය



- කාරයික්කාල් අම්මයියාර් නැමති මෙම නිර්මාණය පොළොන්නරු යුගයේ හින්දු ආගමික මූර්තියකි.
- පොළොන්නරුව අංක 5 දරණ ශිව දේවාලයෙන් හමුවන මෙම නිර්මාණය දනට පොළොන්නරු කෞතුකාගාරයේ ප්‍රදර්ශනය කෙරේ.
- මෙයින් මූර්තිමත් වන්නේ, ශිව දෙවියන් කෙරෙහි වූ අසාමාන්‍ය භක්තිය නිසා තම නාරි සෞන්දර්ය අහිමි කරවන ලෙස දෙවියන්ගේ ඉල්ලීම නිසා කෘෂ, අශෝභන තැනැත්තියක් බවට පත් වූ කාන්තාවකි.
- ඇය කෘෂ හා විකෘති ශරීරයකින් යුතු ව හිඳගෙන තාලම්පට වයන ස්වරූපයෙන් දක්වා ඇත.
- මෙම ප්‍රතිමාව ශ්‍රී ලාංකේය හින්දු කලා නිර්මාණ අතර සුවිශේෂ කලා ලක්ෂණ පෙන්වන කලාත්මක පරිකල්පනයේ උසස් නිර්මාණයක් වශයෙන් සැලකේ.
- ක්‍රි.ව. 12 වැනි සියවසට අයත් ලෙස සැලකෙන මෙම ප්‍රතිමාව ලෝකඩ මාධ්‍ය හා ලෝහ වාත්තු කිරීමේ ශිල්ප ක්‍රමය භාවිත කර ඇති මූර්තියකි.

## සුන්දරමූර්තිස්වාමි ප්‍රතිමාව





- මෙම ලෝකඩ ප්‍රතිමාවෙන් සුන්දරමූර්තිස්වාමි නැමති ශිව භක්තිකයා නිරූපණය වෙයි.
- පොළොන්නරු යුගයේ ක්‍රි.ව. 11 වැනි සියවසට අයත් ලෙස සැලකෙන මෙය හින්දු ආගමික මූර්තියකි.
- පොළොන්නරුව අංක 5 දරණ ශිව දේවාලයෙන් හමු වී ඇති මෙම ප්‍රතිමාව දැනට කොළඹ ජාතික කෞතුකාගාරයේ ප්‍රදර්ශනය කෙරේ.
- සුන්දරමූර්තිස්වාමි යනු ශිව ආගමේ දක්වෙන හැට තුන්දෙනෙකුගෙන් යුතු ශාන්තුවරයන්ගෙන් කෙනෙක් වේ. ඔහු "තේවාරම්" නැමති හින්දු ස්තෝත්‍ර ලියා දේවාලයෙන් දේවාලයට යමින් ඒවා ගායනා කරන කෙනෙකු ලෙස හැඳින්වේ.
- සුන්දරමූර්තිස්වාමි රූපය නිරූපණය කොට ඇත්තේ මංගල ඇඳුමකින් සැරසුණු යෞවනයකුගේ විලාසයට ය.
- තාරුණ්‍යය, කඩවසම් බව හා ලාලිත්‍යය යන ලක්ෂණවලින් යුතුව ත්‍රිභංග දේහයකින් සමන්විතව නිමවා ඇත.
- ශරීරාංග තාත්වික ලෙස මූර්තිමත් කරන ලද කලාත්මක නිර්මාණයක් වශයෙන් මෙය සැලකේ.
- දැතින් කටක හස්ත මුද්‍රාව දක්වයි. භද්‍රපීඨයක් මත සවිකරන ලද වටකුරු පද්මයක් මත ත්‍රිභංග ඉරියව්වෙන් සිටගෙන සිටී.
- ලෝකඩ මාධ්‍ය හා ඝන ලෝහ වාත්තු කිරීමේ ශිල්ප ක්‍රමය භාවිත කර ඇති මෙම ප්‍රතිමාව හින්දු කලා නිර්මාණ අතර සුවිශේෂ කලා ලක්ෂණ පෙන්වන නිර්මාණයක් ලෙස සැලකේ.

**නිපුණතාව 7.0** : **දේශීය, විදේශීය ඓතිහාසික චිත්‍ර, මූර්ති, කැටයම් හා ගෘහ නිර්මාණ කලාවන්හි අනන්‍යතා හඳුනා ගෙන ඒවායේ කලාත්මක ලක්ෂණ නිර්මාණකරණයේ දී භාවිතයට ගනියි.**

**නිපුණතා මට්ටම 7.2** : **පොළොන්නරු යුගයේ චිත්‍ර, මූර්ති හා කැටයම් හා ගෘහ නිර්මාණ අධ්‍යයනය කරයි.**

**ක්‍රියාකාරකම 7.2.4** : **''පොළොන්නරු ගෘහ නිර්මාණ අගයමු''**

**කාලච්ඡේද සංඛ්‍යාව** : **02 යි**

**ඉගෙනුම් පල** :

- පොළොන්නරු ගෘහ නිර්මාණවල ඓතිහාසික පසුබිම සොයා බලයි.
- වස්තුවිද්‍යා නිර්මාණ සඳහා පදනම් වූ ශෛලීය ලක්ෂණ හා ශිල්ප ක්‍රම විස්තර කරයි.
- පොළොන්නරු යුගයේ වාස්තුවිද්‍යා නිර්මාණ පිළිබඳ තොරතුරු එක්රැස් කරයි.
- පොළොන්නරු යුගයේ වාස්තුවිද්‍යා නිර්මාණවල කලා ලක්ෂණ අගයයි, රස විඳියි.

**ගුණාත්මක යෙදවුම්** :

- පොළොන්නරු යුගයේ වාස්තුවිද්‍යා නිර්මාණවල ඡායාරූප
  - නිශ්ශංකලතා මණ්ඩපය
  - පොළොන්නරු වටදාගෙය
  - ශිව දේවාල - අංක 1 දේවාලය
    - අංක 2 දේවාලය
- ඇමුණුම 7.2.4.1 ට ඇතුළත් කාර්ය පත්‍රිකාව
- ඇමුණුම 7.2.4.2 ට ඇතුළත් කියවීම් පත්‍රිකාව

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පියවර 7.2.4.1** :

- පොළොන්නරු යුගයේ වාස්තුවිද්‍යා නිර්මාණ පිළිබඳ සිසු අවධානය යොමු කරවන්න.
- පොළොන්නරු යුගයේ වාස්තුවිද්‍යා නිර්මාණ පිළිබඳ සිසුන්ගේ දැනුම පිරික්සමින් එම සිතුවම්වල වස්තු විෂය, ශෛලිය/ සම්ප්‍රදාය සිසුන්ගෙන් විමසන්න.
- පොළොන්නරු යුගයේ වාස්තුවිද්‍යා නිර්මාණ පිළිබඳ තොරතුරු එක් රැස් කිරීමට සිසුන් යොමු කරවන්න.

(මිනිත්තු 15 යි)

පියවර 7.2.4.2 :

- ඇමුණුම 7.2.4.1 ට ඇතුළත් කාර්ය පත්‍රිකාව සිසුන්ට ලබා දෙන්න.
- ඇමුණුම 7.2.4.2 ට ඇතුළත් කියවීම් පත්‍රිකාව සිසුන්ට ලබා දෙන්න.
- කියවීම් පත්‍රිකාවේ තොරතුරු ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට සිසුන්ට උපදෙස් දෙන්න.

(මිනිත්තු 50 යි)

පියවර 7.2.4.3 :

- අහඹු ලෙස තෝරාගත් සිසුන් කිහිප දෙනෙකුගේ පිළිතුරු පිළිබඳ ඇගයීමක් කරන්න.
- සමස්ත ක්‍රියාකාරකම පිළිබඳ සමාලෝචනයක යෙදෙන්න.

(මිනිත්තු 15 යි)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

පහත සඳහන් කරුණු පිළිබඳ අවධානය යොමු කරමින් ඇමුණුම 7.2.4.1 හා ඇමුණුම 7.2.4.2 පදනම් කරගෙන ඇගයීම හා තක්සේරුකරණ ක්‍රියාවලියේ යෙදෙන්න.

- පොළොන්නරු යුගයේ වාස්තුවිද්‍යා නිර්මාණවල ඓතිහාසික පසුබිම සොයා බැලීම
- නිර්මාණ සඳහා පදනම් වූ ශෛලිය, මාධ්‍ය හා ශිල්ප ක්‍රම විස්තර කිරීම
- පොළොන්නරු යුගයේ වාස්තුවිද්‍යා නිර්මාණවල කලා ලක්ෂණ ඇගයීම හා රසවිඳීම

ඇමුණුම 7.2.4.1

## කාර්ය පත්‍රිකාව

- ප්‍රදර්ශනය කර ඇති පොළොන්නරු යුගයේ වාස්තුවිද්‍යා නිර්මාණ හොඳින් නිරීක්ෂණය කරන්න.
- ඔබට සපයා ඇති කියවීම් පත්‍රිකාව හොඳින් අධ්‍යයනය කරන්න.
- පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
  1. පොළොන්නරු යුගයට අයත් විශිෂ්ට වාස්තුවිද්‍යා නිර්මාණ නම් කරන්න.
  2. එම වාස්තුවිද්‍යා නිර්මාණවල ඓතිහාසික පසුබිම කෙටියෙන් පැහැදිලි කරන්න.
     - යුගය/ කාලය
     - අනුග්‍රහය
  3. එක් එක් වාස්තුවිද්‍යා නිර්මාණ පිළිබඳ කලාත්මක ඇගයීමක් කරන්න.
     - මාධ්‍ය
     - නිර්මාණාත්මක හා කලාත්මක අංග
- ඔබගේ අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් කරන්න.

ඇමුණුම 7.2.4.2

# කියවීම් පත්‍රිකාව

## නිශ්ශංක ලතා මණ්ඩපය











- ලක්දිව ගෘහ නිර්මාණ ශිල්පයේ සුවිශේෂ වූ නිර්මාණයක් සේ සැලකෙන මෙම ගොඩනැගිල්ල ක්‍රි.ව. 12 වැනි සියවසට (ක්‍රි.ව. 1187-1196 අතර කාලයට) අයත් වේ.
- මෙම නිර්මාණය පොළොන්නරුවේ රාජ්‍යත්වයට පත් නිශ්ශංකමල්ල රජතුමා විසින් කරවන ලද්දකි.
- ගල් කණු දක්වා ඇති මණ්ඩපය සෘජුකෝණාස්‍රාකාර (ආයත චතුරශ්‍රාකාර) හැඩයකින් යුක්තය.
- අනුරාධපුරයේ ජේතවනාරාමය අසල ඇති නිර්මාණවලට සමාන අයුරින් ගල් ගරාදි වැටකින් වට කර ඇත.
- මෙම මණ්ඩපය මධ්‍යයෙහි කුඩා බුබ්බුලාකාර දාගැබක් හා එයට පිවිසීම සඳහා එක් පසක වන දොරටුවකි. දාගැබ පාදමේ වාඩි වී වන්දනාවේ යෙදෙන මානව රූප කැටයම් සහිත ය.
- මෙම ගොඩනැගිල්ලේ දැකිය හැකි සුවිශේෂ ලක්ෂණය වන්නේ අලංකාර කුලුනු නිර්මාණයන් ය. එක කණුවක උස අඩි 07කි.
- මෙම කුලුනු එතෙක් දැකිය හැකි සෘජු බවෙන් යුතු කුලුනුවලින් වෙනස් ව සොබා දහමේ රිද්මයානුකූල හැඩතල අනුව නිර්මාණය කිරීමක් වේ.
- නෙළුම් ශාකයේ අංග රිද්මයානුකූලව භාවිත කර මෙම කුලුනු නිර්මාණය කර ඇත.
- කුලුනු ශීර්ෂය අඩක් පිපුණු නෙළුමක ස්වරූපයට නිර්මාණය කර ඇත.
- ලක්දිව ගෘහ නිර්මාණ ශිල්පයේ සුවිශේෂ වූ නිර්මාණයක් සේ සැලකෙන මෙම ගොඩනැගිල්ල නිශ්ශංකමල්ල රජතුමා ධර්මය ශ්‍රවණය කිරීම, දළදා වහන්සේ වන්දනා කිරීම හා පිරිත් ශ්‍රවණය කිරීම වැනි ආගමික කටයුතු සඳහා ඉදි කළ බව එහි ඇති සෙල්ලිපියක සඳහන් වේ.

# පොළොන්නරුව වටදාගේ






පොළොන්නරු කෞතුකාගාරයෙහි නිර්මාණය කර ඇති පොළොන්නරු වටදාගෙයි ආකෘතිය

- පොළොන්නරු දළදා මළුවට ඇතුළු වූ විට වම්පසින් වටදාගෙය හෙවත් වෘත්තාකාර ධාතු මන්දිරය දැකිය හැකි ය.
- දළදා මළුවේ පිහිටි ගල් පොත නම් සෙල් ලිපියේ සඳහන් වන පරිදි පොළොන්නරු වටදාගෙය නිශ්ශංකමල්ල රජතුමාගේ නිර්මාණයක් ලෙස සලකන අතර එය පරාක්‍රමබාහු රජුගේ නිර්මාණයක් වශයෙන් ද අනුමාන කෙරේ.
- අව් වැසි ආදියෙන් ආරක්ෂා කිරීම සඳහා කුඩා ස්තූපය වටා තැනූ ගෙය වටදාගේ ලෙස හඳුන්වන අතර චෛතියඝර, ථූපඝර, වට්ටධාතුගෙය ආදි නම්වලින් ද මෙම ගොඩනැගිල්ල හඳුන්වයි.

- වටදාගෙයට පිවිසීමේදී ඇති පළමුවැනි සලපතළ මළුවට පසුව ඇති දෙවැනි සලපතළ මළුව මධ්‍යයෙහි දාගැබකි. සලපතළ මළු මාලක යන නමින් ද හඳුන්වන අතර මාලක දෙකෙහි ම බිම ගල් අතුරා ඇත.
- පළමු සලපතළ මළුවට පිවිසීම සඳහා එක් දොරටුවක් හා දෙවන සලපතළ මළුවට පිවිසීමට දොරටු සතරක් ද වේ. මෙම සෑම දොරටුවක් ම කොරවක් ගල්, සඳකඩපහණ, මුරගල් හා පියගැටපෙළකින් අලංකාර වූ ද්වාර මණ්ඩප සහිතව නිර්මාණය කර ඇත.
- ඇතුළු මළුව වටා පෙති සතරේ අලංකාර බිනර මල් රටාවෙන් යුත් ගල් බැම්මකි.
- පොළොන්නරු යුගයේ නිර්මාණය කළ කලාත්මක සඳකඩපහණ සහ නාග රාජ රූපය සහිත මුරගල දැකිය හැකි වන්නේ ඉහළ සලපතළ මළුවට පිවිසීමට ඇති වටදාගෙයි උතුරු දොරටුවේ ය.
- සෑම පියගැටපෙළකම සිරස් මුහුණතෙහි පියගැටපෙළ දරා සිටින සේ සිත්ගන්නා සුලු වාමන රූප කැටයම් කර ඇත.
- චෛත්‍ය සතර පැත්තේ සතරදිශාවට මුහුණලා ධ්‍යාන මුද්‍රාවෙන් වැඩ සිටින බුදු පිළිම සතරකි.
- පොළොන්නරු යුගයේ බුදු පිළිම අතර සුවිශේෂ නිර්මාණ වන මේවායෙහි චීවරය රැළි රහිත වන අතර හිසකෙස් අක්බමරු රහිත ව දක්වා ඇත.









## ශිව දේවාලය අංක 01







- 13 වැනි සියවසේ ඉදි වූ හින්දු දේවාලයක් ලෙස සැලකේ. මෙම දේවාලය දකුණු ඉන්දීය ගෘහ නිර්මාණ ලක්ෂණ පෙන්නුම් කරන බව විද්වත් අදහසයි.
- හින්දු ගෘහනිර්මාණ ලක්ෂණ වන මණ්ඩප, ගර්භගෘහ හා අන්තරාල යනාදියෙන් මෙය සමන්විත වේ.
- මෙම දේවාලයේ ඇති විශේෂත්වය වන්නේ බදාම භාවිත නො කොට නියමිත පරිද්දෙන් කපා කොටස් කරන ලද පාෂාණයන් ඒකාබද්ධ කර ඇති ආකාරයයි.
- එම කපා සකස් කර ගත් කළුගල් මගින් බිත්තියේ බාහිර හැඩ මතු කර ඇති අතර එම ගල් බිත්ති මත බොරදම් හා විමාන හැඩ දක්නට ඇත. කුලුනු සඳහා නෙළුම් මල් හැඩ යොදා ගෙන ඇත.
- මෙහි ශිඛරය නිර්මාණය කර ඇත්තේ ගඩොලින් බව ශේෂ ව ඇති සාධක මගින් පෙන්නුම් කරනු ලැබේ.
- ශිව දෙවියන් ඇදහීම උදෙසා නිර්මාණය කරන ලද ලෝකඩ මූර්ති රැසක් මෙම දේවාලයෙන් හමු වී ඇත.

## ශිව දේවාලය අංක 02



- පොළොන්නරුව පුදබිමේ හමුවන අංක 02 ශිවදේවාලය 10 වන සියවසේ චෝල පාලන සමයේ ඉදි කරන ලද්දක් ලෙස සැලකේ.
- පොළොන්නරු යුගයට අයත් ඉපැරණි ම ශිව දේවාලය වන්නේ මෙයයි.
- මෙම දේවාලය වානවන් - මා දේවි - ඊශ්වරම් - උදෙයියාර් (ඉසාරමුදියර්) යනුවෙන් එහි ඇති ශිලා ලේඛනයක සඳහන් වේ. මෙය මෙකල සොළී රාජ්‍යයේ අග රජ වූ මහරාජරාජගේ මෙහෙසිය සිහිවීම පිණිස ගොඩනංවන ලද්දකි.
- හැඩගන්වන ලද පාදමක් මත ගොඩනගා ඇති මෙම දේවාලයේ පිටස්තර බිත්ති අන්තර් සම්බන්ධතා සහිත ස්ථම්භයන්ගෙන් අලංකාර කර ඇත. මෙම ස්ථම්භවලට ඉහළින් පිරමීඩාකාර පියස්සකි. එම පියස්ස මහල් (කොටස්) තුනකින් සමන්විත විමානයකින් හා එය වසා සිටින අටපට්ටම් ශිඛරයකින් සමන්විත වෙයි.
- මෙම දේවාලය ඉදිකිරීමේ දී බදාම අවම වශයෙන් භාවිත කොට නියමිත පරිද්දෙන් කපා කොටස් කරන ලද පාෂාණයන් එකට එක්වන සේ සවිකර ඇත.
- දකුණු ඉන්දීය චෝල ගෘහ නිර්මාණ ලක්ෂණ හොඳින් නිරූපණය වන මෙහි අභ්‍යන්තර මණ්ඩප, අන්තරාලය හා ගර්භ ගෘහය යනාදි කොටස්වලින් යුතු වේ. ගර්භ ගෘහය තුළ ශෛලමය ශිව ලිංගයක් තැන්පත් කර ඇත.
- මෙම ශිව දේවාලයෙහි පුරාවිද්‍යා කැනීම්වල දී නටරාජා හා පාර්වතී රූප ඇතුළු හින්දු ප්‍රතිමා රැසක් ද හමු වී ඇත.

**නිපුණතාව 7.0** : **දේශීය, විදේශීය ඓතිහාසික චිත්‍ර, මූර්ති, කැටයම් හා ගෘහ නිර්මාණ කලාවන්හි අනන්‍යතා හඳුනා ගෙන ඒවායේ කලාත්මක ලක්ෂණ නිර්මාණකරණයේ දී භාවිතයට ගනියි.**

**නිපුණතා මට්ටම 7.3** : **මහනුවර යුගයට අයත් පහතරට විහාර බිතු සිතුවම් අධ්‍යයනය කරයි.**

**ක්‍රියාකාරකම 7.3.1** : **''මහනුවර යුගයට අයත් පහතරට විහාර බිතු සිතුවම් අගයමු''**

**කාලච්ඡේද සංඛ්‍යාව** : **02 යි**

**ඉගෙනුම් පල** :
- පහතරට විහාර බිතු සිතුවම් කලාවේ ඓතිහාසික පසුබිම සොයා බලයි.
- නිර්මාණාත්මක ශෛලිය සඳහා පදනම් වූ මාධ්‍ය හා ශිල්ප ක්‍රම විස්තර කරයි.
- මහනුවර යුගයේ පහතරට විහාර බිතු සිතුවම්වල තොරතුරු එක්රැස් කරයි.
- සිතුවම් නිර්මාණ අගයයි, රස විඳියි.

**ගුණාත්මක යෙදවුම්** :
- මහනුවර යුගයේ පහතරට විහාර බිතු සිතුවම්වල ඡායාරූප,
  - කතළුව විහාර චිත්‍ර
  - කරගම්පිටිය විහාර චිත්‍ර
- ඇමුණුම 7.3.1.1 ට ඇතුළත් කාර්ය පත්‍රිකාව
- ඇමුණුම 7.3.1.2 ට ඇතුළත් කියවීම් පත්‍රිකාව

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පියවර 7.3.1.1** :
- මහනුවර යුගයේ පහතරට විහාර බිතු සිතුවම් පිළිබඳ සිසු අවධානය යොමු කරවන්න.
- එම සිතුවම්වල වස්තු විෂය ශෛලිය/ සම්ප්‍රදාය සිසුන්ගෙන් විමසන්න.
- කතළුව විහාර චිත්‍ර හා කරගම්පිටිය විහාර චිත්‍ර නිර්මාණ පිළිබඳ තොරතුරු එක්රැස් කිරීමට සිසුන් යොමු කරවන්න.

(මිනිත්තු 15 යි)

**පියවර 7.3.1.2** :
- ඇමුණුම 7.3.1.1 ට ඇතුළත් කාර්ය පත්‍රිකාව සිසුන්ට ලබාදෙන්න.
- ඇමුණුම 7.3.1.2 ට ඇතුළත් කියවීම් පත්‍රිකාව සිසුන්ට ලබා දෙන්න.
- කියවීම් පත්‍රිකාව ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට සිසුන්ට උපදෙස් දෙන්න.

(මිනිත්තු 50 යි)

**පියවර 7.3.1.3** :
- පන්තියේ සිසුන් කිහිපදෙනෙකුගේ පිළිතුරු ඇගයීමට ලක් කරන්න.
- සමස්ත ක්‍රියාකාරකම පිළිබඳ සමාලෝචනයක යෙදෙන්න.

(මිනිත්තු 15 යි)

ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

පහත සඳහන් කරුණු පිළිබඳ අවධානය යොමු කරමින් ඇමුණුම 7.3.1.1 හා ඇමුණුම 7.3.1.2 පදනම් කරගෙන ඇගයීම හා තක්සේරුකරණ ක්‍රියාවලියේ යෙදෙන්න.

- මහනුවර යුගයේ පහතරට විහාර බිතු සිතුවම් කලාවේ ඓතිහාසික තොරතුරු සොයා බැලීම
- මහනුවර යුගයේ පහතරට විහාර බිතු සිතුවම්වල මූලික ලක්ෂණ විමසා බැලීම
- පහතරට විහාර බිතු සිතුවම්වල නිර්මාණාත්මක ශෛලිය සඳහා පදනම් වූ මාධ්‍ය හා ශිල්ප ක්‍රම විස්තර කිරීම
- කතළුව හා කරගම්පිටිය විහාර චිත්‍ර නිර්මාණවල කලාත්මක ලක්ෂණ ඇගයීම හා රසවිඳීම

ඇමුණුම 7.3.1.1

## කාර්ය පත්‍රිකාව

- ප්‍රදර්ශනය කර ඇති කතළුව හා කරගම්පිටිය විහාර චිත්‍ර නිර්මාණ හොඳින් නිරීක්ෂණය කරන්න.
- ඔබට සපයා ඇති කියවීම් පත්‍රිකාව හොඳින් අධ්‍යයනය කරන්න.
- පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
  1. මහනුවර යුගයේ පහතරට විහාර බිතු සිතුවම් කලාවේ ඓතිහාසික පසුබිම කෙටියෙන් පැහැදිලි කරන්න.
  2. කතළුව හා කරගම්පිටිය විහාර චිත්‍ර නිර්මාණවල ඓතිහාසික පසුබිම කෙටියෙන් පැහැදිලි කරන්න.
     - යුගය/ කාලය
     - අනුග්‍රහය
     - ශිල්පියා
  3. කතළුව විහාරය හා කරගම්පිටිය විහාර සිතුවම් නම් කර එම එක් එක් සිතුවම් පිළිබඳ පහත කරුණු යටතේ කලාත්මක ඇගයීමක් කරන්න.
     - වස්තු විෂය
     - සම්ප්‍රදාය / ශෛලිය
     - ශිල්ප ක්‍රමය
     - කලාත්මක ලක්ෂණ
       - තලය මත රූප භාවිතය
       - වර්ණ භාවිතය
       - රේඛාකරණය
       - අදහස් ප්‍රකාශනය
- ඔබගේ අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් කරන්න.

## කියවීම් පත්‍රිකාව

- මහනුවර යුගයේ පහතරට චිත්‍ර කලා ලක්ෂණ සහිත බිතු සිතුවම් දිවයිනේ බස්නාහිර හා දකුණු මුහුදුබඩ ප්‍රදේශ කේන්ද්‍රීය ව හමු වේ.
- 16 වන ශත වර්ෂයෙන් පසු මෙම ප්‍රදේශ පෘතුගිසි, ලන්දේසි හා ඉංග්‍රිසි යන විදේශීය පාලනයට නතුවීම හේතු කොට ගෙන මහනුවර යුගයේ චිත්‍ර කලාවේ ශෛලීය ලක්ෂණ වෙනස් වී බටහිර සංස්කෘතික ලක්ෂණ සහිත ව නිරූපණය වීම දැකිය හැකි ය.
- දහනවවන සියවස අග භාගයේ ප්‍රචලිත වී හා පහතරට ප්‍රදේශවල ව්‍යාප්ත වූ මෙම චිත්‍ර ශෛලිය සඳහා විදේශීය ආභාස හා සමකාලීන සමාජ පසුබිම බලපා ඇත.
- මෙම පහතරට විහාර චිත්‍ර ඇඳීම සඳහා භාවිත කර ඇත්තේ වියළි බදාම මත සිතුවම් ඇඳීමේ ශිල්ප ක්‍රමයකි.
- ප්‍රධාන වශයෙන් බෞද්ධාගමික සිදුවීම් සහ බෞද්ධ ජාතක කථා වස්තු විෂය වී තිබේ.

### පහතරට විහාර චිත්‍ර ශෛලියේ දැකිය හැකි පොදු ලක්ෂණ

- තීරු චිත්‍ර සංරචනය, අඛණ්ඩකථන ක්‍රමය හා පාර්ශ්වදර්ශී රූප නිර්මාණය
- රූප වටා නිමාව දක්වන ප්‍රශස්ත මට්ටමින් යුතු සියුම් රේඛාකරණය
- සමස්ත සංරචනය තුළ පරිමාණ රීතීන් නොසැලකීම
- පර්යාලෝක රීතීන් පෙන්වීමට උත්සාහ කර තිබීම
- පසුබිම අවකාශය පිරවීම සඳහා විවිධ අලංකරණ සැරසිලි මෝස්තර භාවිතය
- වස්ත්‍රාභරණ අලංකාරව හා විස්තරාත්මක ව දැක්වීම
- යුරෝපීය ලක්ෂණ සහිත වාස්තුවිද්‍යා, ගෘහ භාණ්ඩ හා සංගීත භාණ්ඩ, ඇඳුම් පැලඳුම් වැනි අංග දැක්වීම
- වර්ණ සඳහා කහ, නිල්, කොළ, රතු, අළු, කළු, සුදු ආදී වර්ණ භාවිතය හා වර්ණවල තද හා ළා පැහැය සමග ඉතා සියුම් ව මතු කරන ත්‍රිමාන ලක්ෂණ දැක්වීම
- බහුල වශයෙන් පසුබිම සඳහා රක්ත වර්ණයට වඩා අළු, කළු හා තද නිල් වැනි වර්ණ භාවිතය

## කතළුව විහාර චිත්‍ර

- දකුණු පළාතේ ගාල්ල නගරයට ආසන්නව පිහිටා ඇති කතළුව විහාර බිතු සිතුවම් දහනව වන සියවසේ අගභාගයට (ක්‍රි.ව 1886) අයත් නිර්මාණ ලෙස සැලකේ.
- මෙම විහාරයේ බිතු සිතුවම් නිර්මාණය කළ ශිල්පීන් වශයෙන් කඩොල්ගල්ලේ මහ සිත්තරා හා පොඩ්ඩ සිත්තරා යන ශිල්පීන් හඳුන්වා ඇත.
- පහතරට විහාර බිතුසිතුවම් සඳහා විදේශීය ආභාස හා සමකාලීන සමාජ පසුබිම බලපා ඇති ආකාරය දක්වන හොඳම නිදසුනක් වශයෙන් මෙම විහාර සිතුවම් සැලකේ.
- කතළුව විහාරයට අයත් සිතුවම්වල වස්තු විෂය පහත ලෙස වර්ග කළ හැකි ය.
  - බෞද්ධ ජාතක කථා (වෙස්සන්තර, මහා සුතසෝම, තේමිය, චුල්ලපදුම)
  - බුද්ධ චරිතයට සමකාලීන සමාජ සිදුවීම් (මහාධන සිටුවරයාගේ කථාව, පටාචාරා කථාව, නන්දිය උපාසක කථා වස්තුව)
- එම නිර්මාණවලට අමතර ව සූවිසිවිවරණය, අපාය දර්ශන, වියන්තල සිතුවම් හා දිව්‍යලෝක දර්ශන සහිත සිතුවම් ද වේ.

## මහාධන සිටුවරයාගේ කථාව සංගීතය හා විනෝද වීම



- කතළුව විහාරයේ දැකිය හැකි චිත්‍රයක් වන මෙයින් මහාධන සිටුවරයාගේ නිවසේ පැවති නැටුම් හා ගැයුම් සංදර්ශනයක අවස්ථාවක් නිරූපණය කෙරේ.
- මෙහි දක්වෙන සංගීත කණ්ඩායමේ සාමාජිකයෝ යුරෝපීය ක්‍රමයට ඇඳ පැළඳගෙන බටහිර සංගීත භාණ්ඩ වාදනය කරමින් සිටිති.
- පසුබිමෙන් දක්වෙන ගොඩනැගිල්ල යුරෝපීය ලක්ෂණයන්ගෙන් යුතු වේ.
- මෙම සිතුවමේ නිරූපිත ඇඳුම් පැළඳුම්, සංගීත භාණ්ඩ, ගෘහනිර්මාණ අංග හා ගෘහභාණ්ඩ මෙන්ම විනෝදාංශ ද එකල ලාංකේය සිත්තරුන් දුටු යුරෝපීය ලක්ෂණවලට අනුගත වූ ඒවා වේ.
- අඛණ්ඩ කථන ක්‍රමයට අඳින ලද කථාවක එක් කොටසක් මෙයින් දක්වේ.
- සම්පූර්ණ තලය භාවිත කොට සිද්ධිය සංරචනය කොට තිබේ.
- රේඛා හා හැඩතල යොදා ගනිමින් සංකීර්ණ ලෙස අවකාශය පුරවා ඇත.
- කහ, කළු, සුදු, නිල්, රතු, කොළ සහ දුඹුරු යන වර්ණ සහ ඒවායේ ප්‍රභේද භාවිත කොට සිතුවම් වර්ණ කොට තිබේ.
- රූප වටා කළු පැහැති බාහිර රේඛා යොදා ඇත.
- පසුබිම වර්ණ කිරීම සඳහා කහ, කළු, දුඹුරු යන වර්ණ භාවිත කොට ඇත.
- ත්‍රිමාන ලක්ෂණ පෙන්වීම සඳහා සියුම් ලෙස වර්ණ ප්‍රභේද දක්වීමට ගත් උත්සාහය දැකිය හැකි ය.
- සමස්ත චිත්‍රයේ ශෛලිගත ආකාරයට වඩා ජීවී බවක් ප්‍රකාශනය වේ. එසේ ම වර්ණ පැතලි ව දක්වීමට වඩා වර්ණ පදාස දක්වීම ද දැකිය හැකි ය.

### සුතසෝම ජාතකය රජමැදුරේ කාන්තාවෝ



- කතළුව විහාරයේ දැකිය හැකි මෙම සිතුවමින් බ්‍රහ්මදත්ත රජුගේ මාළිගාවේ සිටින කාන්තාවන් දෙදෙනකු පිළිසඳරේ යෙදී සිටිනු දැක්වේ. මින් රජ බිසව හා ඇයට පවන් සලන සේවිකාව නිරූපණය කෙරේ.
- අඛණ්ඩ කථන ක්‍රමයට අඳින ලද සිතුවමක එක් සිද්ධියක් මෙයින් දැක්වේ. එහි රූප පාර්ශ්වදර්ශී ස්වරූපයෙන් හා ශෛලීගත ව නිරූපණය කර ඇත.
- මෙහි නිරූපණය වන කාන්තාවන්ගේ ඇඳුම් පැළඳුම් විසිතුරු මල් මෝස්තර හා හැඩතලවලින් සරසා තිබේ.
- මාලිගාව යුරෝපීය ක්‍රමයට සරසා ඇත. විශේෂයෙන් යුරෝපීය ලාම්පු, ගෘහය අලංකරණය සඳහා යොදා ගෙන ඇත.
- කහ, කළු, සුදු, නිල්, රතු, කොළ සහ දුඹුරු යන වර්ණ සහ ඒවායේ ප්‍රභේද භාවිත කොට සිතුවම් වර්ණ කොට තිබේ.
- කළු පැහැති බාහිර රේඛා රූප වටා යෙදීමට මෙන් ම චිත්‍රයේ විස්තරාත්මක බව දැක්වීම සඳහා භාවිත කර ඇත.
- රූප එකම තලයක පිහිටුවා තිබීම දැකිය හැකි ය.
- පසුබිම සඳහා කළු වර්ණය භාවිතය හා පසුබිම් අවකාශය පිරවීම සඳහා විවිධ සැරසිලි මෝස්තර භාවිතය මෙහි සුවිශේෂ ලක්ෂණ වේ.

### කරගම්පිටිය විහාර චිත්‍ර

- බස්නාහිර පළාතේ දෙහිවල නගරයට ආසන්නව පිහිටා ඇති සුබෝධාරාමය හෙවත් කරගම්පිටිය විහාරය පහතරට විහාර චිත්‍ර ශෛලීය ලක්ෂණ සහිත නිර්මාණවලින් සමන්විත විහාරයකි.
- මෙම විහාරයේ ඉතිහාසය පොළොන්නරු යුගයේ පළමු වැනි පරාක්‍රමබාහු හා මහනුවර යුගයේ රාජධිරාජසිංහ රජුගේ කාලය (ක්‍රි.ව 1795) දක්වා අයත් වේ.
- මෙහි ඇති පහතරට විහාර චිත්‍ර ශෛලීය ලක්ෂණ සහිත බිතු සිතුවම් 19 වැනි සියවස අග භාගයට (ක්‍රි.ව 1897) අයත් නිර්මාණ ලෙස සැලකේ.
- කරගම්පිටිය විහාරයේ සිතුවම් අතර බෞද්ධ ජාතක කථා, බුද්ධ චරිතයේ සිදුවීම්, අපාය දර්ශන, සුවිසි විවරණය හා දිව්‍යලෝක දර්ශන දක්වන සිතුවම් දැකිය හැකි වේ.
- කරගම්පිටිය විහාර චිත්‍රවල ආවේණික වූ පොදු ලක්ෂණ
  - ස්වාභාවික වස්තු සඳහා ත්‍රිමාන ලක්ෂණ සහිත වර්ණ භාවිත කිරීම
  - වලාකුළු හා ජලය සඳහා "ඉන්ඩිගෝ" නිල භාවිත කිරීම හා නිල් වර්ණය සමග සුදු හා කළු වර්ණ මිශ්‍ර කර ත්‍රිමාන ලක්ෂණ මතු කර දැක්වීම
  - තද රතු, තද කොළ, කළු සමග දුඹුරු වර්ණ භාවිතය
  - අවශ්‍ය අවස්ථාවන්හි ත්‍රිමානත්වය මතුවන ලෙස වර්ණ ප්‍රභේද යොදා ගැනීම

**පෙළඹවීම (මාර දූවරු)**



- කරගම්පිටිය විහාරයේ දැකිය හැකි මෙම සිතුවමින් බුද්ධත්වය ලැබීම වැළැක්වීම සඳහා පෙළඹවීමට පැමිණි මාරයාගේ දූවරු වන තන්හා, රතී හා රගා යන මරඟනන් නිරූපණය කෙරේ.
- මාර දූවරු සංගීත භාණ්ඩ වාදනය කරමින් පවත්වන සංදර්ශනයක ස්වරූපයක් මෙ මගින් පිළිබිඹු කෙරේ.
- මෙම මාර දූවරු හැඳ සිටින ඇඳුම් පැලඳුම් හා ඔවුන් අත දරා සිටින සංගීත භාණ්ඩ 19වන සියවසට අයත් ලාංකේය සමාජයේ භාවිත දේවල් ලෙස සැලකේ.

- පහතරට චිත්‍ර කලාවේ පොදු ලක්ෂණ වන අධික සැරසිලි බව හා විස්තරාත්මක බව මෙම නිර්මාණයේ ඇඳුම් පැලඳුම් ආශ්‍රිත ව පැහැදිලි ව දක්වා තිබේ.
- අඛණ්ඩ කථන ක්‍රමයට අඳින ලද කථාවේ එක් කොටසක් මෙයින් දක්වෙන අතර සම්පූර්ණ තීරුව පුරා සිද්ධිය සංරචනය කොට තිබීම ද දැකිය හැකි සුවිශේෂ ලක්ෂණයකි.
- කහ, කළු, සුදු, නිල්, රතු, කොළ සහ දුඹුරු යන වර්ණ භාවිත කොට ඇති අතර එම වර්ණවල දක්වන සියුම් වර්ණ ප්‍රභේද මගින් ත්‍රිමාන ලක්ෂණ පෙන්වීමට උත්සාහ දරා ඇත.
- අලංකරණ ලෙස රූප වටා කළු පැහැති රේඛා හා පසුබිම වර්ණ කිරීම සඳහා නිල් වර්ණය භාවිත කිරීම මෙහි දැකිය හැකි විශේෂ ලක්ෂණ වේ.

## සිදුහත් උපත



- මෙම සිතුවමෙන් ලුම්බිණි සල් උයනේ සිදුහත් උපත නිරූපණය කෙරේ.
- අඛණ්ඩ කථන ක්‍රමයට අඳින ලද මෙහි මහාමායා දේවිය සල්ගස් වෙත ළඟා වන අයුරු හා අනතුරු ව දේවිය සල් අත්තක් අල්ලා සිටියදී දරුවා බිහිවන අයුරු දක්වේ.
- ගස් දෙක අතර එල්ලන ලද තිරයකින් ඇගේ සිරුරේ යට කොටස ආවරණය වී ඇති අතර බිහිවූ දරුවා සතරවරම් දෙවිවරුන් විසින් පිළිගනු ලබයි.
- පහතරට විහාර චිත්‍ර කලාවේ පොදු ලක්ෂණ වන සැරසිලිමය හා විස්තරාත්මක බව මෙහි දක්වේ.
- විසිතුරු මල් මෝස්තරයන්ගෙන් සමන්විත ඇඳුම්, පැලඳුම් මෙන්ම මහමායා දේවිය ආවරණය කරන ලද තිර රෙද්ද හා මල් සහිත සල් ගස් දෙකක මෙම නිර්මාණයේ දැකිය හැකි විශේෂ ලක්ෂණ වේ.
- මෙම සිතුවමේ දැකිය හැකි වර්ණ අතර කහ, කළු, සුදු, නිල්, රතු සහ කොළ යන වර්ණ ප්‍රමුඛ වේ. පසුබිම සඳහා නිල් හෝ කොළ පැහැයට හුරු අඳුරු පැහැති වර්ණයක් භාවිත කොට ඇත.
- වර්ණ පැතලි ලෙස භාවිත වුව ද සමහර ස්ථානවල ඉතා සියුම් ලෙස ආලෝකය හා අඳුර (ත්‍රිමාන බව) හඟවන ලක්ෂණ මතු කිරීම දැකිය හැකි වේ.
- රූප වටා මෙන් ම සැරසිලි අංග විස්තරාත්මක ව දක්වීම සඳහා රේඛාකරණය භාවිත කර ඇත.

නිපුණතාව 7.0 : දේශීය, විදේශීය ඓතිහාසික චිත්‍ර, මූර්ති, කැටයම් හා ගෘහ නිර්මාණ කලාවන්හි අනන්‍යතා හඳුනාගෙන ඒවායේ කලාත්මක ලක්ෂණ නිර්මාණකරණයේ දී භාවිතයට ගනියි.

නිපුණතා මට්ටම 7.4 : ඉන්දීය ඓතිහාසික යුගවල කලා නිර්මාණ අධ්‍යයනය කරයි.

ක්‍රියාකාරකම 7.4.1 : "මෞර්ය, සුංග සහ සාතවාහන යුගවල කලා නිර්මාණ අගයමු"

කාලච්ඡේද සංඛ්‍යාව : 02 යි

ඉගෙනුම් පල :
- මෞර්ය, සුංග හා සාතවාහන යුගයට අයත් සුවිශේෂ කලා කෘති සොයා බලයි.
- සාංචි තොරණ කැටයම් නම් කරයි.
- සාංචි ස්ථූපය හා තොරණ නිර්මාණවල ඓතිහාසික පසුබිම විස්තර කරයි.
- නිර්මාණාත්මක ශෛලිය සඳහා පදනම් වූ මාධ්‍ය හා ශිල්ප ක්‍රම විස්තර කරයි.
- සාංචි ස්තූපය හා තොරණ නිර්මාණවල කලා ලක්ෂණ ඇගයීමට ලක් කරයි.

ගුණාත්මක යෙදවුම් :
- මෞර්ය, සුංග හා සාතවාහන යුගයට අයත් සුවිශේෂ කලා නිර්මාණවල ඡායාරූප
  - සාංචි ස්ථූපය
  - සාංචි තොරණ කැටයම්
    - ඡද්දන්ත ජාතකය
    - බුදුරජුන් සංකස්ස පුරයට වැඩම කිරීම
- ඇමුණුම් 7.4.1.1 ට ඇතුළත් කාර්ය පත්‍රිකා
- ඇමුණුම 7.4.1.2 ට ඇතුළත් කියවීම් පත්‍රිකා

ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :

පියවර 7.4.1.1 :
- මෞර්ය, සුංග හා සාතවාහන යුගයට අයත් කලා නිර්මාණ සිසුන්ට ප්‍රදර්ශනය කරන්න.
- එම නිර්මාණ පිළිබඳ සිසුන්ගෙන් අදහස් විමසන්න.

(මිනිත්තු 15 යි)

පියවර 7.4.1.2 :
- ඇමුණුම් 7.4.1.1 ට ඇතුළත් කාර්ය පත්‍රිකාව සිසුන්ට ලබා දෙන්න.
- ඇමුණුම් 7.4.1.2 ට ඇතුළත් කියවීම් පත්‍රිකා සිසුන්ට බෙදා දෙන්න.
- සිසුන් අදාළ ක්‍රියාකාරකමෙහි යොදවන්න.

(මිනිත්තු 50 යි)

පියවර 7.4.1.3 :

- සිසු අනාවරණ සමස්ත පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදෙන්න.
- එම අනාවරණ පිළිබඳ සිසුන්ගේ සංවර්ධනාත්මක අදහස් විමසන්න.
- මෞර්ය, සුංග හා සාතවාහන යුගයට අයත් කලා නිර්මාණ පිළිබඳ සමාලෝචනයක යෙදෙන්න.

(මිනිත්තු 15 යි)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

පහත සඳහන් කරුණු පිළිබඳ අවධානය යොමු කරමින් ඇමුණුම 7.4.1.1 හා ඇමුණුම 7.4.1.2 පදනම් කරගෙන ඇගයීම හා තක්සේරුකරණ ක්‍රියාවලියේ යෙදෙන්න.

- මෞර්ය, සුංග හා සාතවාහන යුගයට අයත් සුවිශේෂ කලා කෘති සොයා බැලීම
- සාංචි තොරණ කැටයම් නම් කිරීම
- සාංචි ස්තූපය හා තොරණ නිර්මාණවල ඓතිහාසික පසුබිම සොයා බැලීම
- නිර්මාණාත්මක ශෛලිය සඳහා පදනම් වූ මාධ්‍ය හා ශිල්ප ක්‍රම විස්තර කිරීම
- සාංචි ස්ථූපය හා තොරණ නිර්මාණවල කලා ලක්ෂණ ඇගයීමට ලක් කිරීම

**ඇමුණුම 7.4.1.1**

## කාර්ය පත්‍රිකාව


- ප්‍රදර්ශනය කර ඇති සාංචි ස්ථූපය හා තොරණ කලා නිර්මාණ හොඳින් නිරීක්ෂණය කරන්න.
- ඔබට සපයා ඇති කියවීම් පත්‍රිකාව හොඳින් අධ්‍යයනය කරන්න.
- සාංචි ස්තූපය හා තොරණ නිර්මාණවල පවතින සුවිශේෂ ලක්ෂණ හඳුනා ගන්න.
- පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
  1. සාංචි ස්තූපය හා තොරණ නිර්මාණවල ඓතිහාසික පසුබිම කෙටියෙන් පැහැදිලි කරන්න.
     - යුගය සහ කාලය
     - හමුවන ස්ථානය
     - අනුග්‍රහය
  2. සාංචි ස්තූපයේ වාස්තු විද්‍යාත්මක ආකෘති ලක්ෂණ ඇඳ පැහැදිලි කරන්න.
     - සම්පිණ්ඩන ලක්ෂණ (දිග / පළල / උස ආදී)
     - නිර්මාණාත්මක හා කලාත්මක හැඩ / අංග
  3. සාංචි තොරණ කැටයම් නම් කර එක් එක් නිර්මාණ පිළිබඳ පහත සඳහන් කරුණු ඔස්සේ ඇගයීමක් කරන්න.
     - වස්තු විෂය
     - මාධ්‍යය
     - ශිල්ප ක්‍රමය
     - කලාත්මක ලක්ෂණ
       - තලය මත රූප භාවිතය
       - රූපමය ස්වභාවය ( ශරීර හා ඉරියව් ලක්ෂණ, ඇඳුම් පැලඳුම් ආදී )
       - සංකේත භාවිතය
       - භාව ප්‍රකාශනය
- ඔබගේ අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් කරන්න.

# කියවීම් පත්‍රිකාව



## සාංචි ස්තූපය

- ඉන්දිය ගෘහ නිර්මාණ අතර අශෝක අධිරාජයා විසින් ඉදි කළා යැයි සැලකෙන සාංචි ස්තූපය ඉතා විශිෂ්ට නිර්මාණයකි.
- මධ්‍යම භාරතයේ සුන්දර වූත්, කලාත්මක වූත් කඳු ගැටයක් මත ඉදි වී ඇති සාංචි ස්තූපය හා අවට ප්‍රදේශය කලාගාරයක් වැනි ය.
- සාංචි මහා ස්තූපයට අමතර ව තවත් චෛත්‍යය දෙකක් ඇති අතර මහා තූපය ඒ අතරින් සුවිශේෂ නිර්මාණයක් ලෙස සැලකේ.
- එය අඩි 120 ක විෂ්කම්භයකින් යුතු අතර අඩි 54ක් උස ය.




සාංචි ස්තූපය හා එහි ප්‍රධාන අංග

- මෙය බුබ්බුලාකාර හැඩයෙන් යුත් චෛත්‍යයකි. පොළොව මට්ටමේ සිට අඩි 16 ක් උසින් චෛත්‍යය වටා යා හැකි ප්‍රදක්ෂිණා පථයක් වේ. මෙම කොටස "මේධිය" නමින් හඳුන්වයි. මෙය වටා ගලින් කරන ලද ගරාදි වැටකි. ප්‍රදක්ෂිණා පථයට නැඟීමට සෝපාන පන්ති දෙකකි.
- "මේධිය" මත ගර්භය පිහිටා ඇත. ස්තූපයේ මුදුන ශෛලමය ගරාදි වැටකින් යුත් සතරැස් කොටු වකි. මෙය "හර්මිකාව"යනුවෙන් හැඳින්වේ.
- හර්මිකාව මැද (ස්තූපය මුදුනේ) මුදුන උල් වූ අටපට්ටම් කෙල්මුවා ටැඹක් පිහිටා ඇත. එය "යූපය" යනුවෙන් ද "යෂ්ටිය" යනුවෙන් ද හඳුන්වයි.
- යූපය මුදුනේ ඡත්‍රාකාර පැතලි ගල් පුවරු තුනකි. මේවා පහළ සිට ඉහළට කුඩාවන ලෙස සකස් වී ඇත. 'ඡත්‍ර' යනුවෙන් මෙම ඡත්‍රාකාර ගල්පුවරු හඳුන්වයි.


## සාංචි තොරණ

- සාංචි ස්තූපයේ සතර පැත්තේ ඇති තොරණ ඉන්දීය කලා නිර්මාණ අතර හමුවන විශිෂ්ට කලා නිර්මාණ ලෙස සැලකේ.
- සාංචි තොරණ සාතවාහන යුගයට අයත් නිර්මාණ ලෙස සැලකේ.
- සාංචි තොරණ සතරම එකම ආකෘතියකට අනුව සකස් කරනු ලැබ ඇත.
- දෙපසින් ඉදි වූ සත්ත්ව රූප සහිත කුලුනු ශිර්ෂයෙන් යුතු සතරැස් ගල් කුලුනු දෙකක් හා ඒ මත තිරස් අතට සමාන්තර ව පිහිටුවා ඇති ගල් පුවරු තුනකි. තිරස් ව දක්වා ඇති විශාල ගල් පුවරු හෙවත් උඩෙලිපත් තල්පතක ස්වභාවය දක්වමින් ඒවා ඇතුළු පැත්තට එතුණු ආකාරයෙන් කලාත්මක ව නිර්මාණය කර ඇත. මෙම තිරස් ගල් පුවරු එකිනෙකට සම්බන්ධවන ලෙස වූ කුඩා ගල් කණු තුන බැගින් දක්වා ඇත.
- මෙම සෑම තිරස් සිරස් ගල් කණුවක් ම සාංචි ශිල්පියා කැටයමින් අලංකාර කර ඇත. ප්‍රධාන සිරස් කුලුනු අග ඇත් රූ, වාමන රූප, සිංහ රූපවලින් යුතු ශිර්ෂයකින් සමන්විත වන අතර එහි පළමු තිරස් අතට ඇති ගල් පතුරට කුඤ්ඤයක් ලෙස සම්බන්ධ වූ ''සාලබංජිකා'' නම් ස්ත්‍රී රූ මූර්තිමත් කර ඇත.
- තොරණ ඉහළින් ම ඇති තිරස් ගල් පුවරුව හෙවත් උඩෙලිපත මත ත්‍රිශූලය, මිනිස් රූප සහ සත්ත්ව රූප නිර්මාණය කර ඇත.

- **සාංචි තොරණ කැටයම් නිර්මාණ සඳහා වස්තු විෂය පහත දැක්වේ.**
  1. ජාතක කතා - උදා :- ඡද්දන්ත, වෙස්සන්තර, මහාකපි ජාතක ය
  2. බුද්ධ චරිතයේ සිද්ධි - උදා :- බුදුවීම, බුදුරදුන් සංකස්ස පුරයට වැඩම කිරීම
  3. සිදුහත් චරිතයේ සිද්ධී - උදා :- කේශ ඡේදනය, අභිනිෂ්ක්‍රමණය
  4. ඓතිහාසික සිද්ධි - උදා :- අශෝක රජු ශ්‍රී මහා බෝධිය වැඳීම, ධාතු කෝලහලය

- **සාංචි තොරණ කැටයම් නිර්මාණවල දැකිය හැකි සුවිශේෂ ලක්ෂණ**
- සිරස් ගල් කණු මත කැටයම් පනේල වශයෙන් දැක්වීම හා තිරස් ගල් පුවරු මත බොහෝ විට අඛණ්ඩ කථන ක්‍රමය අනුව කැටයම් නිර්මාණය කර තිබීම
- කැටයම් ඉතා සියුම් ලෙස අල්ප උන්නත ව මතු කොට තිබීම
- රූපයකට රූපයක් මුවාවන සේ රූප තලය මත සංරචනය කිරීම
- ඉතා කුඩා ඉඩක් ඇති ස්ථාන පවා මානව රූප, සත්ත්ව හා ශාක හැඩ අවකාශය පුරා සම්පිණ්ඩනය කිරීම
- මිනිස් රූප ශෛලිගත ස්වභාවයෙන් කැටයම් කර ඇති අතර සත්ත්ව රූප ඉතා ස්වාභාවික ලක්ෂණයන්ගෙන් යුතු ව දැක්වීම
- සතුන්ගේ ඉරියව්, ගති ලක්ෂණ හා චලනයන් තාත්ත්වික ව නිරූපණය කර දැක්වීම
- සාංචි කැටයම් ශිල්පියා බුදුරජාණන් වහන්සේ සහ සිදුහත් කුමරු දැක්වීම සඳහා බෝගස, ඡත්‍රය, ස්තූපය, ධර්මචක්‍රය සහ ශ්‍රී පාද ලාංඡනය වැනි සංකේත යොදා ගනු ලැබීම

## සාංචි තොරණ හා කොටස්



ත්‍රිශූලය සහිත ඵලකය



සිංහ රූප



තිරස් ගල් පුවරු කෙළවර තල්පතක් ලෙස හකුලා ඇති ආකාරය (උඩලිපත් කෙළවර)



ඇත් රූප සහ සාලභංජිකා රූප



සිරස් ගල් කණු

තිරස් ගල් පුවරු (උඩලිපත්)

## ඡද්දන්ත ජාතකය




උතුරු තොරණ ඇතුල් පැත්ත



ඡද්දන්ත ජාතකයේ සමීප රූපයක්

- සාංචි තොරණ කැටයම් අතර ඉතා විශිෂ්ට නිර්මාණ වශයෙන් ජාතක කතා කැටයම් පෙළක්.
- එම ජාතක කතා කැටයම් අතර ඡද්දන්ත ජාතකය කැටයම ඉතා සුවිශේෂ වේ. එය සාංචි තොරණ කිහිපයක දැකිය හැකි කැටයමකි.
- මෙහි දක්වෙන්නේ උතුරු තොරණේ කැටයමකි.
- එය තොරණේ ඇතුල් පැත්තේ ඉහළම උඩලිපතෙහි දැකිය හැකිය.
- තිරස් ගල් පුවරු මත අඛණ්ඩ කරන ක්‍රමය අනුව මෙම කැටයම් නිර්මාණය කර ඇත.
- ඉහත රූපයේ දක්වෙන්නේ ඡද්දන්ත ජාතකයේ නුග ගස මුල සිටින ඇතුන්ගේ දර්ශනයකි.
- මෙහි ඇති ඇත් රූප ඉතා ස්වභාවික ලක්ෂණයන්ගෙන් යුතු වේ. ඇතුන්ගේ ඉරියව්, ගති ලක්ෂණ හා චලනයන් තාත්ත්වික ව නිරූපණය කර ඇති ආකාරය දැකිය හැකි වේ.
- රූපයකට රූපයක් මුවාවන සේ රූප තලය මත සංරචනය කර තිබීම විශේෂත්වයකි.
- ඉතා කුඩා අවකාශ පවා භාවිත කර රූප කැටයම් කර තිබීම දැකිය හැකි ය.
- ඇත් දත් කැටයම්වල දැකිය හැකි සියුම්, මටසිලුටු නිමාව සහිත ලක්ෂණ මෙම අල්ප උන්නත කැටයම්වල දැකිය හැකි වේ.

## බුදුරජාණන්වහන්සේ සංකස්ස පුරයට වැඩම කිරීම



- මෙම කැටයම ඇත්තේ උතුරු තොරණේ ඉදිරි පසය.
- බුදුරජාණන්වහන්සේ සංකස්ස පුරයට වැඩම වීම දැක්වෙන මෙම කැටයමේ බුදුන් වහන්සේගේ රූපකාය වෙනුවට සෝපාන සංකේත ව දක්වා ඇත. ඒ අනුව ඉණිමඟ උඩ හා පහළ බෝධිය නිරූපණය කර ඇත.
- මෙහි දැක්වෙන මිනිස් රූප ශෛලිගත ස්වභාවයෙන් කැටයම් කර ඇත.
- රූපයකට රූපයක් මුහුණුවන සේ රූප තලය මත සංවිධානය කර ඇත.
- ඉතා කුඩා අවකාශය උපරිම භාවිතා කර රූප කැටයම් කර තිබේ.
- ඇත් දත් කැටයම්වල දැකිය හැකි සියුම්, මටසිලුටු නිමාව සහිත ලක්ෂණ මෙම කැටයම්වල දැකිය හැකි වේ.
- අල්ප උන්නත ව කොටන ලද කැටයමකි.

**නිපුණතාව 7.0** : **දේශීය, විදේශීය ඓතිහාසික චිත්‍ර, මූර්ති, කැටයම් හා ගෘහ නිර්මාණ කලාවන්හි අනන්‍යතා හඳුනා ගෙන ඒවායේ කලාත්මක ලක්ෂණ නිර්මාණකරණයේ දී භාවිතයට ගනියි.**

**නිපුණතා මට්ටම 7.4** : **ඉන්දීය ඓතිහාසික යුගවල කලා නිර්මාණ අධ්‍යයනය කරයි.**

**ක්‍රියාකාරකම 7.4.2** : **''ගුප්ත යුගයට අයත් කලා නිර්මාණ අගයමු''**

**කාලච්ඡේද සංඛ්‍යාව** : **02 යි**

**ඉගෙනුම් පල** :

- ගුප්ත යුගයට අයත් කලා නිර්මාණ සොයා බලයි.
- අජන්තා සිතුවම් නම් කරයි.
- ගුප්ත යුගයට අයත් කලා නිර්මාණවල ඓතිහාසික පසුබිම සොයා බලයි.
- නිර්මාණාත්මක ශෛලිය සඳහා පදනම් වූ මාධ්‍ය හා ශිල්ප ක්‍රම විස්තර කරයි.
- ගුප්ත යුගයේ නිර්මාණවල කලා ලක්ෂණ ඇගයීමට ලක් කරයි.

**ගුණාත්මක යෙදවුම්** :

- ගුප්ත යුගයට අයත් කලා නිර්මාණවල වර්ණ ඡායාරූප
  - සාරනාත් බුදු පිළිමය
  - අජන්තා චිත්‍ර
    * පද්මපානි බෝසත් රුව
    * බුදුන් වහන්සේ කිඹුල්වත් පුරයට වැඩම කිරීම
- ඇමුණුම් 7.4.2.1 ට ඇතුළත් කාර්ය පත්‍රිකාව
- ඇමුණුම් 7.4.2.2 ට ඇතුළත් කියවීම් පත්‍රිකාව

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පියවර 7.4.2.1** :

- ගුප්ත යුගයට අයත් කලා නිර්මාණ පිළිබඳ ව සිසු අවධානය යොමු කරවන්න.
- එම කලා නිර්මාණ පිළිබඳ ව සිසුන්ගෙන් විමසන්න.
- ගුප්ත යුගයට අයත් කලා නිර්මාණවලට අදාළ තොරතුරු එක්රැස් කිරීමට සිසුන් යොමු කරවන්න.

(මිනිත්තු 15 යි)

**පියවර 7.4.2.2** :

- ඇමුණුම 7.4.2.1 ට ඇතුළත් කාර්ය පත්‍රිකාව සිසුන්ට ලබා දෙන්න.
- ඇමුණුම 7.4.122 ට ඇතුළත් කියවීම් පත්‍රිකාව සිසුන්ට ලබා දෙන්න.
- කියවීම් පත්‍රිකාව ඇසුරින් පිළිතුරු සැපයීමට සිසුන්ට උපදෙස් දෙන්න.
- පිළිතුරු සැපයීමට සිසුන්ට සහාය වන්න.

(මිනිත්තු 50 යි)

පියවර 7.4.2.3 : • අහඹු ලෙස තෝරාගත් සිසුන් කිහිප දෙනෙකුගේ පිළිතුරු පත් ඇගයීමට ලක් කරන්න.
• සමස්ත පාඩම පිළිබඳ සමාලෝචනයක යෙදෙන්න.

(මිනිත්තු 15 යි)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

පහත සඳහන් කරුණු පිළිබඳ අවධානය යොමු කරමින් ඇමුණුම 7.4.2.1 හා ඇමුණුම 7.4.2.2 පදනම් කරගෙන ඇගයීම හා තක්සේරුකරණ ක්‍රියාවලියේ යෙදෙන්න.

- ගුප්ත යුගයට අයත් කලා නිර්මාණවල වස්තු විෂයන් හා එම නිර්මාණ නම් කිරීම
- ගුප්ත යුගයට අයත් කලා නිර්මාණවල ඓතිහාසික පසුබිම සොයා බැලීම
- නිර්මාණාත්මක ශෛලිය සඳහා පදනම් වූ මාධ්‍ය හා ශිල්ප ක්‍රම විස්තර කිරීම
- ගුප්ත යුගයට අයත් කලා නිර්මාණවල සුවිශේෂ කලා ලක්ෂණ ඇගයීම

ඇමුණුම 7.4.2.1

## කාර්ය පත්‍රිකාව

- ප්‍රදර්ශනය කර ඇති ගුප්ත යුගයට අයත් කලා නිර්මාණ හොඳින් නිරීක්ෂණය කරන්න.
- ඔබට සපයා ඇති කියවීම් පත්‍රිකාව හොඳින් අධ්‍යයනය කරන්න.
- සාරනාත් බුදු පිළිමය හා අජන්තා චිත්‍ර නිර්මාණවල පවතින සුවිශේෂ ලක්ෂණ හඳුනා ගන්න.
- පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
  1. ගුප්ත යුගයට අයත් සාරනාත් බුදු පිළිමය හා අජන්තා චිත්‍ර නිර්මාණවල ඓතිහාසික පසුබිම කෙටියෙන් පැහැදිලි කරන්න.
  2. සාරානත් බුදු පිළිමය පිළිබඳ පහත කරුණු ඔස්සේ ඇගයීමක් කරන්න.
     - යුගය සහ කාලය
     - හමුවන ස්ථානය
     - සම්ප්‍රදාය / ශෛලිය
     - ශිල්ප ක්‍රමය
     - කලාත්මක ලක්ෂණ
       - තලය මත රූප නිරූපණය හා සම්පිණ්ඩන ලක්ෂණ
       - භාව ප්‍රකාශනය
  3. අජන්තා චිත්‍ර නම් කර, එම එක් එක් නිර්මාණ පිළිබඳ පහත කරුණු ඔස්සේ ඇගයීමක් කරන්න.
     - යුගය සහ කාලය
     - හමුවන ස්ථානය
     - සම්ප්‍රදාය / ශෛලිය
     - ශිල්ප ක්‍රමය
     - කලාත්මක ලක්ෂණ
       - තලය මත රූප භාවිතය
       - වර්ණ භාවිතය
       - රේඛාකරණය
       - භාව ප්‍රකාශනය
- ඔබගේ අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් කරන්න.

ඇමුණුම 7.4.2.2

## කියවීම් පත්‍රිකාව


## සාරානාත් බුදුපිළිමය



- ගුප්ත යුගයේ නිර්මාණය වූ මෙම බුදුපිළිමය ඉන්දියාවේ සාරානාත් ප්‍රදේශයෙන් හමු වූ නිර්මාණයකි.
- සාරානාත් බුද්ධ ප්‍රතිමාව චූනාර් නැමති ගල් විශේෂය භාවිත කරමින් නෙළා ඇත.
- පද්මාසන ක්‍රමයෙන් වැඩ හිඳින ප්‍රතිමාවේ දෑත් දක්වා ඇත්තේ ධම්මචක්ක මුද්‍රාවෙන් ය.
- මෙමගින් බරණැස ඉසිපතන මිගදායේ දී බුදුන්වහන්සේ පස්වග තවුසන්ට ප්‍රථම ධර්මදේශනාව පවත්වන අවස්ථාව නිරූපණය වන බව විචාරක මතය යි.
- බුදුරජාණන්වහන්සේ වැඩ හිඳින ආසනයේ මැද ධර්මචක්‍රයක්, දෙපස මුවන් දෙදෙනාත්, අනෙකුත් මානව රූප සමූහයෙනුත් ඒ බව පැහැදිලි වේ.
- පිළිමයේ හිසට පිටුපසින් අලංකාර ප්‍රභා මණ්ඩලයක් දැක්වෙන අතර එහි සියුම් ව නෙළන ලද බිංදු රටා හා ලියවැල් මෝස්තරයක් හා ප්‍රභා මණ්ඩලය දෙපස දේවතා රූප දෙකක් වේ.
- ප්‍රභා මණ්ඩලයට පහතින් පිළිමය දෙපස මකර හා අශ්ව රූප සම්බන්ධ අලංකාර කැටයමකි.
- උෂ්ණීෂය, අක්බඹරුවන් හිසකෙස්, අඩවන් දෙනෙත්, ලඹ සවන් හා මුහුණින් උපශාන්ත බව හා මහා කරුණාව සහිත මහා පෞරුෂ ලක්ෂණ ඉස්මතු කර දක්වයි.
- දෙවුර වසා ඇති චීවරය, ශරීරයට ඇළුණු ස්වරූපයෙන් පෙන්වන අතර සියුම් රේඛා කිහිපයකින් චීවරය ඉස්මතු කර දක්වයි.
- සාරානාත් කෞතුකාගාරයේ ප්‍රදර්ශනයට තබා ඇති ගුප්ත සම්ප්‍රදායට අයත් මෙම සාරානාත් බුද්ධ ප්‍රතිමාව ඉන්දීය ප්‍රතිමා කලාවේ අග්‍රගණ්‍ය නිර්මාණයක් වෙයි.

# අජන්තා චිත්‍ර

- ඉන්දියාවේ වයඹ දිග, මහාරාෂ්ට්‍ර ප්‍රාන්තයේ හයිද්‍රාබාද්හි වඝෝරා ගඟට මායිම්ව අශ්ව ලාඩමක හැඩය ගත් උස් පර්වතයක අජන්තා ලෙන් පන්තිය පිහිටා ඇත.





- අජන්තා ලෙන් 29කි. ක්‍රි.පූ. 2 වැනි සියවසේ සිට ක්‍රි.ව. 7 වැනි සියවස දක්වා  කාලවකවානුවක වරින්වර නිර්මාණය කළ බවත් ඒ අනුව අජන්තා චිත්‍ර එක පරම්පරාවක අනුග්‍රහය යටතේ  නිර්මාණය නොවූ බවත් සැලකේ.
- වාස්තු විද්‍යාත්මක ව අජන්තා ලෙන් කොටස් දෙකකට වර්ග කළ හැකි ය.
    1. චෛත්‍ය ශාලා
    2. ආවාස ශාලා
- වැඩි වශයෙන් බිතු සිතුවම් දක්නට ඇත්තේ මෙම ලෙන් තුළ ය.
- අජන්තා චිත්‍ර සඳහා වස්තු විෂය වී ඇත්තේ බුද්ධ චරිතය, ජාතක කථා හා ඓතිහාසික සිද්ධීන් ය.
- අංක 17 දරණ ලෙනෙහි දැකිය හැකි අප්සරා රූප අජන්තා චිත්‍ර අතර සුවිශේෂ නිර්මාණයක් වේ.





අප්සරා රූප

- මෙම රූප, සීගිරි අප්සරා රූපවලට සමාන ලක්ෂණ පෙන්වන බව විචාරක අදහසයි.
- සීගිරි චිත්‍රවල මෙන් දිගු නෙත්, මඳ සිනහව හා කර්ණාභරණ, ග්‍රීවාභරණ අප්සරා රුවේ අලංකාරය මතු කර පෙන්වයි.
- අජන්තා චිත්‍ර වියළි බදාමය මත ඇඳීමේ ශිල්ප ක්‍රමයකට නිර්මාණය කර ඇතැයි සැලකේ.
- චිත්‍ර ඇඳීම සඳහා ලෙන් බිත්තිය සකසා ගෙන ඇත්තේ මැටි, ගොම, දහයියා, පිදුරු, ඝන සත්ත්ව ලොම්, මැලියම් එකට අඹරා සකස් කළ බදාමයක් ආලේප කිරීමෙනි. පසුව ඒ මත මකුළු මැටි දිය කර ආලේප කොට වියළුණු පසු චිත්‍ර ඇඳීම ආරම්භ කොට ඇත.

**අජන්තා චිත්‍රවල දැකිය හැකි සුවිශේෂ ශෛලීය ලක්ෂණ**

- අවස්ථාවෝචිත ලෙස හැඟීම් ප්‍රකාශනය හා සිද්ධියට අනුරූප වන ලෙස නාට්‍යමය අයුරින් අවස්ථා නිරූපණය කිරීම
- මිනිස් රූප හා සත්ත්ව රූප නිර්මාණයේ දී ඔවුන්ගේ ගති ස්වභාවය, චලනය, පරිමාණ ලක්ෂණ මෙන් ම ජීවමාන බව මතු කිරීම
- අඛණ්ඩකථන ක්‍රමය අනුව මුල, මැද, අග සහිතව කථාව රූපණය කර තිබීම
- ස්වභාවික පරිසරය දිය ඇලි, ගස්වැල්, වනසතුන් සමග චමත්කාර ලෙස දැක්වීම
- ලෙන් වියන්තල මල් ලියකම්, හස්ති, මානව හා පක්ෂී රූප සම්මිශ්‍රණය කරන ලද නිර්මාණශීලී රටා මෝස්තරවලින් අලංකාර කිරීම
- ගුරු වර්ණයෙන් රේඛා සටහන් ඇඳ පසුව වර්ණ යෙදීම
- චිත්‍ර වර්ණ කිරීම සඳහා රතු, කහ, නිල්, කළු හා කොළ වර්ණ භාවිතය
- තේමාව තීව්‍ර කිරීම සඳහා අඳුරු වර්ණ සහ දීප්තිමත් වර්ණ භාවිතය


## පද්මපානි බොධිසත්ව රුව





- අජන්තා චිත්‍ර අතර ඉතා විශිෂ්ට නිර්මාණයක් ලෙස සලකනු ලබන්නේ අංක 01 ලෙනෙහි ඇති පද්මපානි බෝධිසත්ව රූපය යි.
- මෙයින් සිද්ධාර්ථ කුමරු සමග චම්පසින් යශෝධරා දේවිය ද නිරූපණය කරන බව විද්වත් අදහසයි. චිත්‍රයේ සෙසු රූප සම්පිණ්ඩනයේ දී අහසේ වීණා වාදනය කරන දෙවියන් ද වන අතර ගස් උඩ වඳුරන් කිහිප දෙනෙකු ද නිරූපණය වේ.
- සෙසු රූපවල ප්‍රමාණයට වඩා විශාල ව දක්වා ඇති බෝසත් රුව ත්‍රිභංග හැඩයෙන් යුක්ත ය.
- මඳ සිනාව සහිත ව මුහුණෙහි ගැඹුරු හැඟීම් ප්‍රකාශනයෙන් යුතු, අධ්‍යාත්මික ගුණයෙන් පිරිපුන්, තාරුණ්‍යය විදහා පෙන්වන නිර්මාණයකි.
- දකුණතින් නිල් මහනෙල් මලක් දරා සිටින අතර අලංකාර වස්ත්‍රාභරණවලින් සැරසී සිටියි.
- ආභරණ අතර කුණ්ඩලාභරණ, අත්වළලු හා සියුම් කැටයමින් අලංකාර කර ඇති දිගටි ඔටුන්න (ශිර්ෂ පලඳනාව) විශේෂිත ය.
- වර්ණ ගැන්වීමේ දී ප්‍රධාන රූපය වන පද්මපානි රූපය දීප්තිමත් කහපාටකින් මතුකර සෙසු චරිත හා හැඩ අඳුරු වර්ණ සහිත පසුබිමකින් මතු කර ඇත.
- ගුප්ත කලා ලක්ෂණ පෙන්වයි.

## බුදුරජාණන්වහන්සේ කිඹුල්වත් පුරයට වැඩම කිරීම



- කිඹුල්වත් පුර පිඬු සිඟා වඩින බුදුරජාණන්වහන්සේ දැක්වෙන චිත්‍රය අජන්තා ලෙන් අංක 17 හි දැකිය හැකි ය.
- නෙළුම් මලක් මත වැඩ සිටින බුදු රජාණන් වහන්සේ ගේ හිසට ඉහළින් ඡත්‍රයක් දරා සිටින දේවතා රුවක් නිරූපණය කර ඇත.
- මාළිගයේ සිට යශෝධරා දේවිය රාහුල කුමරුට ඔහුගේ පියාණන් හඳුන්වා දෙන ආකාරය දැක් වේ.
- බුදුරජාණන්වහන්සේ ගේ රුව විශාලව ද, අවශේෂ රූප කුඩාවට ද දක්වා තිබීම බුදුරජාණන් වහන්සේගේ උත්තරීතර භාවය පෙන්නුම් කිරීමට ගත් උත්සාහයක් ලෙස දැක්විය හැකි ය.
- පර්යාලෝක ලක්ෂණ සහිත ව මෙම චිත්‍රය නිර්මාණය කර ඇතැයි ද අනුමාන කෙරේ.
- ගුප්ත කලා ලක්ෂණ පෙන්වයි.

**2015 සිට ක්‍රියාත්මක චිත්‍ර කලාව 10 ශ්‍රේණිය ගුරු මාර්ගෝදේශයෙහි වැරදි නිවැරදි කිරීම්**

| පිටුව | පෙළ | වැරදි | නිවැරදි |
|---|---|---|---|
| 21-23 | | | 5.2.1 ක්‍රියාකාරකම් මාතෘකාවට අනුව අදාළ ක්‍රියාකාරකම සැලසුම් කර ගන්න |
| 26 | 18 | දුෂ්කර ක්‍රියාව | ඉවත් කරන්න. |
| 30 | 37 | ප්‍රෙස්කෝ සිකෝ | ටෙම්පරා |
| 43 | 19 | දැකිය හැකි වේ. | තිබූ නිර්මාණයකි. |
| 44 | 01 | දැකිය හැකි | දක්නට තිබුණු |
| 52 | 13 | ලන්ඩන් | ලූවර් |
| 52 | 08 | ප්‍රෙස්කෝ සිකෝ | ප්‍රෙස්කෝ බුවනෝ |
| 53 | 14 | ප්‍රෙස්කෝ සිකෝ | ටෙම්පරා |
| 58 | 09 | ප්‍රෙස්කෝ සිකෝ | ප්‍රෙස්කෝ බුවනෝ |
| 59 | 11 | ප්‍රෙස්කෝ සිකෝ | ප්‍රෙස්කෝ බුවනෝ |
| 62 | 07 | ප්‍රෙස්කෝ සිකෝ | ප්‍රෙස්කෝ බුවනෝ |
| 63 | | | මෙම පිටුව 63 අංකයෙන් ම ඉදිරිපත් කර ඇත. 10 පොතට ඇතුළු කර ගන්න. |
| 77 | 01 | නෙළුම | බිනර මල |
| 82 | 20 | ශිල්පියා | ඉවත් කරන්න |
| 86 | 21 | තුවක්කුවක් අතින් ගත් මාරයකු | තුවක්කු අතින් ගත් මාරයන් |
| 89 | 10 | සැතපෙන | ඉවත් කරන්න |
| 89 | 18 | ජාතක කතා | ඉවත් කරන්න |
| 100 | 05 | දුව මාධ්‍යයෙන් | ඉවත් කරන්න |
| 105 | 04 | යුගයට අයත් | ඉවත් කරන්න. ''හෙලනිස්තික් (Helanistic) යුගයට අයත් ලෙස සැලකේ.'' ඇතුළත් කරන්න. |
| 105 | 11 | ඇන්ටිසොච් | ඇලෙක්සැන්ඩ්‍රෝස් (Alexandros) |

වාරතුනට ඇතුළත් ක්‍රියාකාරකම් වගුව පහත දැක්වේ. මෙය 10 පොතට ඇතුළත් කර ගන්න.

| 1 වාරය | | | 2 වාරය | | | | 3 වාරය | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| ක්‍රියාකාරකම් අංකය | | | ක්‍රියාකාරකම් අංකය | | | | ක්‍රියාකාරකම් අංකය | | |
| 1.1.1 | 3.1.1 | 7.1.1 | 1.13 | 3.1.2 | 6.2.1 | 7.2.3 | 1.1.5 | 3.2.2 | 7.2.4 |
| 1.1.2 | 4.1.1 | 7.1.2 | 1.1.4 | 3.1.3 | 6.2.2 | 7.4.1 | 1.2.2 | 3.3.1 | 7.3.1 |
| 2.1.1 | 5.1.1 | | 1.2.1 | 4.1.2 | 6.2.3 | | 2.2.4 | 4.2.1 | 7.4.2 |
| 2.1.2 | 6.1.1 | | 2.2.1 | 4.1.3 | 7.1.3 | | 2.2.5 | 6.1.4 | |
| | 6.1.2 | | 2.2.2 | 5.2.1 | 7.2.1 | | 2.2.6 | 6.1.5 | |
| | | | 2.2.3 | 6.1.3 | 7.2.2 | | 3.2.1 | 6.1.6 | |

2015 සිට ක්‍රියාත්මක 10 ශ්‍රේණියේ චිත්‍ර කලා ගුරු මාර්ගෝපදේශයෙහි වැරදි නිවැරදි කිරීම
10 ශ්‍රේණිය ගුරු මාර්ගෝපදේශයේ පිටු අංක 63 ට ඇතුළත් කර ගන්න. (මෙතැනින් වෙන් කරන්න)

## මැඩෝනා චිත්‍ර

- රෆායෙල්ගේ නිර්මාණ අතර ප්‍රකට තේමාවක් වූයේ මැඩෝනා හෙවත් කන්‍යා මරියතුමිය හා ජේසු බිළිඳා දක්වෙන නිර්මාණයන් ය.
- පුනරුද යුගයේ වෙනත් චිත්‍ර ශිල්පීන් නිර්මාණය කළ මැඩෝනා චිත්‍රවලට වඩා රෆායෙල් විසින් නිර්මාණය කරන ලද මැඩෝනා චිත්‍ර සුවිශේෂ නිර්මාණ ලෙස සැලකේ.
- මෙම සිතුවම් තෙල් සායම් මාධ්‍යයෙන් කැන්වස්, ලී පුවරු හා බිත්ති මත නිර්මාණය කර ඇත.
- ත්‍රිකෝණාකාර ආකෘතියක් මත හැඟීම් දනවන සුළු ප්‍රකාශනයන් සහිත ව රූප පිහිටුවීම මෙම චිත්‍රවල විශේෂතාවකි.

## තණපිටියේ සිටින මැඩෝනා (Madonna of the Meadows)



- පර්යාලෝක ලක්ෂණ සහිත භූමි දර්ශනයක ගහකොළ මල් සහිත සැබෑ පිටිසර ගැමි පසුබිමක සාමාන්‍ය ගැහැනියක ලෙස රූපණය කිරීම මෙම නිර්මාණයේ සුවිශේෂත්වයකි.
- මරියතුමිය පිරුණු ශරීරයෙන් හා මෘදු සොම්නස් හා සෙනෙහසින් පිරුණු මුහුණකින් යුතු හැඟීම් ප්‍රකාශනය සහිත ව ඉදිරිපත් කිරීමට ශිල්පියා උත්සාහ ගෙන ඇත.
- ලී පුවරුවක් මත තෙල් සායම් මාධ්‍යයෙන් නිම කරන ලද සිතුවමකි.
- මෙම සිතුවම වියානාවල කලා කෞතුකාගාරයක ප්‍රදර්ශනයට තබා ඇත.

10 ශ්‍රේණිය ගුරු මාර්ගෝපදේශයේ පිටු අංක 63 ට ඇතුළත් කර ගන්න.